# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

දහතුන්වන කලාපය – 2022 ජූනි

ISSN 1800-1459
eISSN 2673-1177

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
# දහතුන්වන කලාපය - 2022 ජූනි

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනයකි

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දහතුන්වන කලාපය 2022 ජූනි
ISSN 1800-1459
eISSN 2673-1177
ප්‍රථම මුද්‍රණය: 2022 ජූනි

**සංස්කාරක** : ආචාර්ය චම්පා එස්. ද සිල්වා

**<u>සියලු ම විමසීම්</u>**

සංස්කාරක
සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
තැ.පෙ. 02
බෙලිහුල්ඔය
දුරකථන/ෆැක්ස් - 045 22 80013
විද්‍යුත් තැපැල - sjseditor@crkd.sab.ac.lk

පරිගණක පිටු සැකසුම : යූ. ඒ. පී. කේ. රූපසිංහ
සම්බන්ධීකරණය සහ සංස්කරණ සහයක : ජී. පී. එම්. එස්. නන්දසේන සහ
කේ. පී. ජී. ඩී. එම්. පොල්වත්ත

ප්‍රකාශනය : ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
බෙලිහුල්ඔය

# සංස්කරණ ප්‍රතිපත්තිය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය වූ කලී අඛණ්ඩ ව වාර්ෂික ව පළ වන විමර්ශිත සඟරාවකි. ඕනෑ ම විෂය ක්ෂේත්‍රයකට අදාළ ව සිංහල භාෂාවෙන් රචිත, පුරෝගාමී ඥානයක් සම්පාදනය කෙරෙන, උසස් ප්‍රමිතියෙන් යුතු ලිපි මෙහි පළ කෙරේ. සියලු ම ලිපි ප්‍රවීණ විමර්ශන මඬුල්ලකට යොමු කෙරෙන අතර ආරාධිත ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන්ගේ ලිපි සංස්කාරක මණ්ඩලයේ විමර්ශනයට පමණක් යොමු කෙරේ. සඟරාවේ පළ කෙරෙන ලිපිවල අන්තර්ගතය පිළිබඳ වගකීම ඒ ඒ ලේඛකයන් සතු ය.

## සංස්කාරක මණ්ඩලය


මහාචාර්ය ආර්. එම්. ඩබ්ලිව්. රාජපක්ෂ

මහාචාර්ය මනෝජ් ආරියරත්න

මහාචාර්ය කේ. වී. දීපානි එදිරිසූරිය මැණිකේ

මහාචාර්ය ඒ. සරත් ආනන්ද

මහාචාර්ය ආර්. ඒ. ඩී. ප්‍රියංකා වීරසේකර

ආචාර්ය ජී. කේ. චම්පා එස්. ද සිල්වා

සම්බන්ධීකරණ සංස්කාරක : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්. සී. පල්ලියගුරුගේ

ඉංග්‍රීසි භාෂා සංස්කාරක : ආචාර්ය මහේෂ් හපුගොඩ

# සංස්කාරක සටහන

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහයෙහි 13 වන කලාපය මෙසේ විද්වත් ඔබ සැම වෙත සමර්පණය කිරීමට ලැබීම අපගේ නොවක් සොම්නසට හේතුවකි. අධික කාර්ය බහුලත්වය සහ නොයෙකුත් ගැටලු හමුවේ මෙම කලාපය එළිදැක්වීමට තරමක් ප්‍රමාද වුව ද හැකි ඉක්මනින් මෙය පළ කිරීමට හැකි සැම ප්‍රයත්නයක් ම දැරුවෙමු. මෙම කලාපය විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය වන පර්යේෂණ පත්‍රිකා 06කින් සමන්විත වන අතර එය විද්‍යාර්ථීන්ගේ ඥාන ගවේෂණය උදෙසා ද අනාගත අභිවෘද්ධිය සඳහා ද මහගු පිටිවහලක් වනු ඇත. පර්යේෂණ හිතකාමීන් විසින් යොමු කරන ලද මෙම පර්යේෂණ පත්‍රිකා ප්‍රාමාණික විද්වත් මණ්ඩලයක් වෙත යොමු කර ඇති බැවින් ගුණාත්මකබවින් පරිපූර්ණ විමර්ශිත සඟරාවක් වශයෙන් මෙම ශාස්ත්‍රීය සඟරාව ඇගයිය හැකි ය. ස්වකීය පර්යේෂණ අප වෙත යොමු කළ එම ශාස්ත්‍ර ගවේෂී විද්‍යාර්ථීන්ට ප්‍රථමයෙන් ම අපගේ ප්‍රණාමය හිමි විය යුතු ය.

ජාතික මට්ටමෙන් ක්‍රමක්‍රමයෙන් අභිවෘද්ධිය වෙත පියමන් කරමින් සිටින ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය දැනුම සම්පාදනය කිරීමේ අංශයෙන් පමණක් නොව දැනුම බෙදා හැරීමේ අංශයෙන් ද ප්‍රමුඛ ව සිටින විද්‍යාස්ථානයකි. එය සබරගමුව ප්‍රදේශයට පමණක් නොව සමස්ත ශ්‍රී ලාංකේය විද්‍යාර්ථීන්ට ද මහත් ආලෝකයක් සපයන ප්‍රදීපස්ථානයකි.

එහි අභිමානය රැකගනු වස් නිරන්තරයෙන් ඇප කැප වී කටයුතු කරන වත්මන් උපකුලපති ධුරන්දර ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදය රත්නායක මැතිඳුන්ට සැබවින් ම ස්තුතිය පළ කළ යුතු ය. එසේ ම පර්යේෂණ හා දැනුම බෙදා හැරීමේ මධ්‍යස්ථානයේ වත්මන් අධ්‍යක්ෂ මහාචාර්ය බී. ටී. ජී. එස්. කුමාර මහතාගේ මනා කැපවීම සහ නිහතමානී ගුණය මෙහි උද්දීප්තිය තවත් වර්ධනය කරනු ඇත. තව ද මෙම ශාස්ත්‍රීය සඟරාවෙහි සම්බන්ධීකරණ කටයුතු අනලස් ව ඉටු කරමින් මහගු සේවයක් සපයන ජී. පී. එම්. එස්. නන්දසේන මෙනවිය ද සමස්ත සඟරාවෙහි ම බර තම උර මත දරමින් පරිගණක පිටු සැකසුම සහ මුල් කවරය නිර්මාණය කරමින් විශාල වගකීම් සම්භාරයක් උසුලන යූ. ඒ. පී. කේ. රූපසිංහ මහත්මිය ද විශේෂයෙන් ම ඇගයිය යුතු ය.

එසේ ම මෙහි අන්තර්ගත ඉංග්‍රීසි බසින් රචිත සාරසංක්ෂේප සංස්කරණය කර දෙමින් අප වෙත සහයෝගය ලබා දීම සම්බන්ධයෙන් භාෂා අධ්‍යයනාංශයෙහි ආචාර්ය මහේෂ් හපුගොඩ මහතාට ද කෘතවේදීත්වය පුද කර සිටිය යුතු ම ය. තව ද ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්. සී. පල්ලියගුරුගේ මහතා සම්බන්ධීකරණ කටයුතුවල දී නොමසුරු ව දැක් වූ සහයෝගය අගයන අතර ම තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ මහාචාර්ය එච්. ඒ. ඩී. රුවන්දීපිකා මැතිනිය දක්වන සහයෝගය ද මෙම අවස්ථාවේ දී සිහිපත් කරන්නේ ඉමහත් ගෞරවයෙනි.

**ආචාර්ය චම්පා එස්. ද සිල්වා**
**ප්‍රධාන සංස්කාරක**
**සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය.**

# ලිපි සම්පාදකයෝ

**කේ. ඒ. දිනිති ප්‍රතිභා කලුආරච්චි**
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බළංගොඩ

**චාමර මධුෂාන්**
දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**කේ.වී. දිනිති දිල්හාරා කරඳන සහ චම්පා එස්. ද සිල්වා**
භාෂා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා භාෂා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**එච්. එම්. එන්. අයි. සඳරුවන්**
භූගෝල විද්‍යා හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා භාෂා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**ඉන්දික ජයරත්න**
ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

**කිත්සිරි මිහිරි බණ්ඩාර**
සිංහල අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය

# පටුන


පරිච්ඡේදය | පිටු අංකය

1. ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය අලි මිනිස් ගැටුම නිර්මාණය වීම සඳහා බලපානු ලබන ආකාරය හඳුනා ගැනීම (හම්බන්තොට දිස්ත්‍රික්කය ඇසුරෙන්) — 1-10
**කේ. ඒ. දිනිති ප්‍රතිභා කලුආරච්චි**

2. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වන සමෘද්ධි ව්‍යාපාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් : ගාල්ල දිස්ත්‍රික්කයේ නෙළුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින් — 11-22
**චාමර මධුෂාන්**

3. සිංහල නවකතාවෙහි නිරූපිත සාංදෘෂ්ටිකවාදී ලක්ෂණ ෴ තෝරාගත් සිංහල නවකතා ඇසුරින් කෙරෙන විමර්ශනයකි — 23-31
**කේ.වී. දිනිති දිල්හාරා කරදන සහ චම්පා එස්. ද සිල්වා**

4. විවෘත භූමියට ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා ඇති වී තිබෙන සමාජීය, පාරිසරික බලපෑම සහ විවෘත කසළ භූමියක යෝග්‍යතාව තක්සේරුව ෴ මහනුවර ගොහාගොඩ තේක්ක වත්ත කසළ කන්ද ඇසුරින් — 32-54
**එච්. එම්. එන්. අයි. සඳරුවන්**

5. බදුලු ටැම් ලිපිය ඔස්සේ හෙළි වන අතීත වෙළෙඳ පොළ ඇතුළු සමාජ ක්‍රමය පිළිබඳ විමසුමක් — 55-66
**ඉන්දික ජයරත්න**

6. සිංහල ශිලාලේඛනවල අන්තර්ගත ප්‍රාස්තාවික භාෂා ස්වරූප පිළිබඳ සමාජවාග්විද්‍යාත්මක අධ්‍යයනයක් — 67-74
**කිත්සිරි මිහිරි බණ්ඩාර**

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දහතුන්වන කලාපය 2022 ජූනි
පිටු 1-10
ISSN 1800-1459 eISSN 2386-2041
© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය අලි මිනිස් ගැටුම නිර්මාණය වීම සඳහා බලපානු ලබන ආකාරය හඳුනා ගැනීම (හම්බන්තොට දිස්ත්‍රික්කය ඇසුරෙන්)

# (Identifying How Sri Lanka's Development Process Influences the Creation of Elephant-Human Conflict (With References to Hamabantota District)

කේ. ඒ. දිනිති ප්‍රතිභා කලුආරච්චි

ප්‍රදේශීය ලේකම් කාර්යාලය, බළංගොඩ
**dinithiprathibha5@gmail.com**

## Abstract

Elephant - Human conflict has become a serious social and environmental issue due to the unsustainable development programs currently being implemented in Sri Lanka. In such a context, a problematic situation has been created regarding the direction of development and the balance of sustainable development goals in a country. The main objective of this study is to analyze how the development process of the country, which has created a current social discourse, affects the creation of human-elephant conflicts. The data and information for this research paper was primarily obtained from existing researches. The study is based on the secondary data that has been published specially in Hambantota district. Human-elephant conflict has become a very serious social problem in Hambantota area, which was identified as a rural area until recently. The development achieved in this way, many positive results have been achieved for the area, but due to the heavy damage done to the natural environment illegally, the forest population as well as the animal population are facing many difficulties. Some of these issues include blocking the daily routes of wild animals, lack of food for animals, and blocking elephant passes. Therefore, it has become a very common phenomenon for wild elephants and other animals to damage lives and property in villages. Human-Elephant conflict in these areas has become a major factor that disrupts the lives of rural people. Especially family life, children's education, rural agricultural economy as well as other social, economic, cultural, political and environmental aspects are also significantly affected. In this way, due to the development process taking place in Sri Lanka, it can be seen that part of the people are fighting with the government and another part of the people are accepting the risk of life in the face of human conflict and adapting to the existing environment.

**Keywords**: Human- elephant conflict, Sustainable development, Livelihoods, Economy, Rural society

## සාරසංක්ෂේපය

ශ්‍රී ලංකාවෙහි වර්තමානයේ ක්‍රියාත්මක වෙමින් පවතින තිරසාර නොවන සංවර්ධන වැඩසටහන් හේතුවෙන් අලි මිනිස් ගැටුම බරපතල සමාජ, පාරිසරික ගැටලුවක් බවට පත් වී තිබේ. මෙවැනි වාතාවරණයක් තුළ රටක සංවර්ධනයේ දිශානතිය සහ සංවර්ධනයේ තුල්‍යතාව සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් නිර්මාණය වී ඇත. මෙම අධ්‍යයනයේ ප්‍රධානතම  අරමුණ බවට පත්වූයේ වර්තමාන සමාජ කතිකාවක් ද නිර්මාණය වී පවතින රටේ සංවර්ධන ක්‍රියාවලිය අලි මිනිස් ගැටුම් නිර්මාණය වීම සඳහා බලපානු ලබන්නේ කෙසේ ද යන්න විශ්ලේෂණයට ලක් කිරීම යි. මෙම පර්යේෂණ ලිපිය සඳහා මූලික වශයෙන් ම දත්ත හා තොරතුරු ලබාගන්නා ලද්දේ දැනට සිදුකොට ඇති පර්යේෂණ ආශ්‍රයෙනි. විශේෂයෙන් ම හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සිදු කරන ලද පර්යේෂණ ආශ්‍රයෙන් ප්‍රකාශයට පත් වී ඇති ද්විතීයික දත්ත මත මෙම අධ්‍යයනය පදනම් වේ. මෑතක් වන තුරු ම ග්‍රාමීය ප්‍රදේශයක් වශයෙන් හඳුනා ගන්නා ලද හම්බන්තොට ප්‍රදේශයෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් අලි මිනිස් ගැටුම වර්තමානය තුළ ඉතා බරපතල සමාජ ගැටලුවක් බවට පත් ව ඇත. මෙලෙස අත්කර ගත් සංවර්ධනය තුළ ප්‍රදේශයට සාධනීය ප්‍රතිඵල රැසක් අත් වී ඇතත්, නීති විරෝධී වශයෙන් ස්වාභාවික පරිසරයට සිදු කරන ලද දැඩි හානිය හේතුවෙන් වන ගහනය මෙන් ම සත්ත්ව ගහනය ප්‍රබල අසීරුතාවන්ට මුහුණ දී ඇත. වන සතුන්ගේ සංක්‍රමණික මාර්ග අවහිරතාවට ලක්වීම, සතුන්ට ආහාර හිඟවීම, අලි මංකඩ අවහිරතාවට ලක්වීම ආදී කාරණා ඉන් කීපයකි. මෙනිසා වන අලි ප්‍රමුඛ අනෙකුත් වනසතුන් ගම් වැද ජීවිත හා දේපළ හානි සිදු කිරීම ඉතා සුලභ සංසිද්ධියක් බවට පත් ව ඇත. මෙම ප්‍රදේශවල අලි මිනිස් ගැටුම යනු සාමාන්‍ය ජන ජීවිතය ව්‍යාකූලත්වයට පත් කරන ප්‍රධාන සාධකයක් බවට පත් ව ඇත. විශේෂයෙන් ම පවුල් ජීවිතය, දරුවන්ගේ අධ්‍යාපනය, ග්‍රාමීය කෘෂි ආර්ථිකය සඳහා මෙන් ම අනෙකුත් සමාජ, ආර්ථික, සංස්කෘතික, දේශපාලනික, පාරිසරික පැතිකඩ කෙරෙහි ද සැලකිය යුතු බලපෑමක් එල්ල කරනු ලබයි. ඒකරාශී කරන ලද දත්ත උද්ගාමී ප්‍රවේශයක් යටතේ තේමා නිර්ණය කරගත් අතර තේමා ආශ්‍රයෙන් ගුණාත්මක දත්ත

විශ්ලේෂණයට ලක් කරන ලදී. මෙම ගැටලුව සඳහා උචිත ප්‍රතිපත්ති සහ යෝජනා සකස් කිරීම අතිශයින් වැදගත් වන අතර එහි දී නිලධාරීන් බිම් මට්ටමට ගොස් තොරතුරු ඒකරාශී කර ගැනීම, මිනිස් ජීවිත හානි මෙන් ම වන අලි හානිය අවම කර ගැනීම සඳහා ගම්වාසීන්ගෙන් මෙන් ම වන සතුන් විසින් අලි වැටවල් සඳහා සිදු කරනු ලබන අයහපත් ක්‍රියා පාලනය කිරීමට කටයුතු කිරීම, තෘණ මූල මට්ටමෙන් ඉදිරිපත් වන කාරණා විශේෂයෙන් පාරම්පරික ඥානය යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ. මේ ආකාරයට ශ්‍රී ලංකාවෙහි සිදුවන සංවර්ධන ක්‍රියාවලිය හේතුවෙන් කොටසක් රජය සමඟ අරගලවලට මැදිවෙමින් ද තවත් කොටසක් අලි මිනිස් ගැටුම හමුවේ ජීවිත අවදානම බාර ගනිමින් පවතින තත්ත්වයන්ට අනුවර්තනය වෙමින් ද කටයුතු කිරීම දැකගත හැකි ය.

**කේන්ද්‍රීය වචන:** අලි-මිනිස් ගැටුම, තිරසාර සංවර්ධනය, ජන ජීවිතය, ආර්ථිකය, ග්‍රාමීය සමාජ

## හැඳින්වීම

දකුණු ආසියාතික කලාපයේ විවිධත්වයකින් යුතු පරිසර පද්ධති රැසක් පිහිටා ඇති රටක් වශයෙන් ශ්‍රී ලංකාව හඳුනාගත හැකි ය. පාරිසරික විවිධත්වය හා ආවේණිකත්වය ශ්‍රී ලංකාව තුළ ඉහළ ය. නමුත් සංවර්ධන ක්‍රියාවලිය නිසා වනහරණය, වනාන්තර හායනය සහ ජෛව විවිධත්වය පහත වැටීම යන ක්‍රියාවලි රට තුළ අඛණ්ඩ ව සිදුවෙමින් පවතී. සංවර්ධන ක්‍රියාවලියෙහි දී ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වශයෙන් අලි-මිනිස් ගැටුම හඳුනාගත හැකි ය. ආසියානු මහාද්වීපය තුළ වැඩි ම අලි සංඛ්‍යාවක් සිටින රට ශ්‍රී ලංකාව යි. නමුත් මෙම අලි සමූහයට ජීවත්වීම සඳහා අප රටෙහි තිබෙන රක්ෂිත බිම් ප්‍රමාණය ඉතා පහළ අගයක් ගනී.

ගෝලීයකරණය හේතුවෙන් ලෝකයේ බොහොමයක් සමාජ සරල සමාජ තත්ත්වයේ සිට සංකීර්ණ සමාජයක් දක්වා ගමන් කර ඇත. විශේෂයෙන් ම කාර්මීකරණය, නාගරීකරණය මඟින් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්ති මෙයට ප්‍රබල බලපෑමක් සිදු කර ඇත. විශේෂයෙන් ම ලෝකය තරඟකාරී මාවතකට පිවිසීමත් සමඟ සම්පත් අත්පත් කර ගැනීමේ තරඟයකට පුද්ගලයා නිරායාසයෙන් යොමුවිය. ජනගහන වර්ධනයත් සමඟ වාසස්ථාන පිළිබඳ ව ගැටලුව උද්ගත විය. එහි දී වනාන්තර එළි කරමින් නව ගම්මාන ඉදි කිරීම ලංකාව තුළ බොහෝ විට දැකගත හැකි විය. මෙහි දී උද්ගත වූ බරපතල ම අර්බුදයක් වූයේ අලින්ගේ වාසස්ථාන අහිමි වී යාම යි. පසුකාලීන ව අලින් ගම්වලට පැමිණීම, පුද්ගල හා දේපළ හානි සිදු කිරීම පිළිබඳ ව සුලබ ව කතාබහට ලක්වන මාතෘකාවක් බවට පත් විය. වර්තමානයේ ද බොහෝ ප්‍රදේශවල අලි - මිනිස් ගැටුම පවතින අතර එය රටේ සංවර්ධන ක්‍රියාවලියට ද ප්‍රබල බලපෑමක් සිදු කරනු ලබන මාතෘකාවක් බවට පත් ව ඇත. පාරිසරික තිරසාරභාවය ආරක්ෂා කර ගනිමින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම කෙරෙහි ශ්‍රී ලංකා රජය අවධානය යොමු කර සිටියත්, ප්‍රායෝගික ව ක්‍රියාත්මක වීම තුළ බොහෝ දුබලතාවන් දැකගත හැකි ය.

නූතන සංවර්ධන ක්‍රියාවලිය තුළ අලින්ගේ වාසස්ථාන අහිමි වීම, අභය භූමි ජනපද බවට පත්වීම, හේන් ගොවිතැන් කටයුතු සඳහා විශාල වශයෙන් වනාන්තර එළිපෙහෙළි කිරීම මත වන අලි සමූහයා ගම්මාන කරා ළඟා වීමේ තත්ත්වයක් උදා වී තිබේ. වනාන්තර තුළ තමන්ගේ වාසස්ථාන සහ ආහාරපාන අහිමි වීම මත වන අලි මනුෂ්‍ය ඝාතන සිදු කරමින් හා ගොවිතැන් කටයුතු විනාශ කරමින් ගම් තුළට කඩා වැදීම අද වන විට ඉතා සුලබ කරුණක් බවට පත් ව ඇත. මේ හේතුවෙන් වන අලින් පමණක් නොව කැලෑව තුළ වෙසෙන අනෙක් සතුන් රැසක් ද තම ආහාර හා ජල අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා ගම්මානවලට කඩා වැදීම දක්නට ඇත. මේ අතරින් අලි මිනිස් ගැටුම පිළිබඳ ව වර්තමානය වන විට වැඩි අවධානයක් යොමු වී ඇත. වන අලි ගම්මානවලට කඩා වැදීමත් සමඟ ගම්වැසියන් ද ඊට ප්‍රතිචාර දක්වන්නට යෑම හරහා අලි මිනිස් ගැටුම නිර්මාණය වේ. මෙනිසා වර්තමානය වන විට ජීවිත හානි, දේපළ හානි, වගා හානි පමණක් නොව අලි මරණ ද සැළකිය යුතු මට්ටමකින් ඉහළ ගොස් ඇත. සංවර්ධනය අත්පත් කර ගැනීමට නම් දෙපාර්ශවයේ ම සමබරතාව, සහජීවනය අවශ්‍ය වේ. එබැවින් මේ පිළිබඳ ව අවධානයට ලක් කිරීම කාලීන වැදගත්භාවයකින් යුක්ත ය (Mahees and Rajapasha, 2020).

## සාහිත්‍ය විමර්ශනය

### ශ්‍රී ලංකාවේ අලි

අතීතයේ සිට ශ්‍රී ලාංකිකයන්ට අලි සමඟ ඇත්තේ ඉතා සමීප සම්බන්ධතාවකි. පුද්ගලයාගේ දෛනික කටයුතුවලට මෙන් ම සමාජ, ආගමික, සංස්කෘතික කටයුතු සඳහා ද පුද්ගලයා අලින්ගේ සහාය ලබාගෙන තිබේ. ලෝකයේ ආසියානු අලි ජීවත්වෙනු ලබන්නේ රටවල් 13ක ය. අලියා ගොඩබිම වසන විශාලතම සත්ත්වයා ය. අප්‍රිකානු අලියා සහ ආසියානු අලියා ලෙස අලි විශේෂ දෙකක් දිවි ගෙවන අතර අප රටේ දිවිගෙවන්නේ ආසියානු අලියා ය. විද්‍යාත්මක ව මෙම විශේෂය **Elephas Maximus Maximus** ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකාවේ දිවිගෙවන වන අලියා ඉන්දියානු හෝ ආසියානු වෙනත් රටවල තරමක් වෙනස්කම් දරන බැවින් ශ්‍රී ලංකානු අලියා අප රටට ආවේණික උප විශේෂයක් ලෙස සැලකේ. එබැවින් ශ්‍රී ලංකානු අලියා හැඳින්වීමට **Elephas Maximus Maximus** යන උප විශේෂ නාමය භාවිත වේ. එසේ ම ආසියානු අලි ජීවත් වන රටවල් අතුරින් වැඩි ම ආසියානු අලි ප්‍රමාණයක් සිටින රට ලංකාවයි (ද සිල්වා, 1998).

අලියා යනු දිගු කලක් ජීවත් වන සත්ත්වයෙකි. ඔවුන්ගේ පැවැත්ම රඳා පවතිනු ලබන්නේ ආහාර, ජලය, ප්‍රජනනය වැනි අවශ්‍යතා මතයි. විශේෂයෙන් ම මොවුන් ප්‍රජනනය සඳහා සහකරුවෙකු හෝ සහකාරියක සෙවීම සඳහා විශාල දුරක් දිනපතා සංචාරය කරයි. සාමාන්‍යයෙන් අලියෙකු දිනකට ආහාරයට කිලෝග්‍රෑම් 150ක ආහාර ප්‍රමාණයක් සහ ජලය ලීටර් 190ක් පරිභෝජනය කරයි. ඔවුන් තම ආහාර අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා විවිධ තණකොළ, පඳුරු, කොළ වර්ග, මුල්, පලතුරු ආදිය සෙවීමට විශාල ප්‍රමාණයක දුරක් සංචරණය කරයි. ආසියානු අලි ඇතුන්ගේ රංචුවකට අලි ඇතුන් 5 සිට


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

20 දක්වා ප්‍රමාණයක සාමාජිකයෝ සිටිති. එසේ ම මෙවැනි කණ්ඩායමක් ජීවත් වීම සඳහා වර්ග කිලෝ මීටර 100-1000 භූමි ප්‍රමාණයක් අවශ්‍ය වේ (Fernando and Lande, 2000., Williams et al, 2001., Alfred et al, 2012). අප්‍රිකානු අලි රැවුවක් ජීවත්වීම සඳහා අවශ්‍ය භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර 11-500 දක්වා අගයක් ගනී (Shannon et al, 2006., Thomas et al., 2008).

වාර්ෂික ව අලි 250ක් පමණ ද , මිනිසුන් 50ක් පමණ ද අලි මිනිස් ගැටුම් හේතුවෙන් ජීවිතක්ෂයට පත්වන අතර වාර්ෂික ව විශාල වශයෙන් සිදු වන දේපළ හා වගා හානිය හේතුවෙන් සමාජීය හා ආර්ථික ගැටලු රාශියකට මුහුණ දීමට සිදුව ඇත. වර්තමානය වන විට ප්‍රදේශ කිහිපයක සිදුවන මෙම අලි මිනිස් ගැටුමට ප්‍රධාන වශයෙන් අලි ගහනය හා මිනිස් ගහනය වර්ධනය වීම, අලින්ගේ වාස භූමි මිනිසා විසින් ආක්‍රමණය කරනු ලැබීම, කෘෂිකාර්මික කටයුතු හේතුවෙන් අලි, මිනිස් ජනාවාස වෙත ආකර්ෂණය වීම ප්‍රධාන වශයෙන් බලපෑ ඇති බව හඳුනා ගෙන ඇත. මිනිසුන් වනාන්තර එළිකර වගා භූමි සැකසීම හේතුවෙන් එම වගා භූමි ආශ්‍රිත ප්‍රදේශ අලින්ට ජීවත් වීමට සුදුසු ප්‍රදේශ බවට පත්වේ. එමෙන් ම ඔවුන්ගේ ස්වාභාවික වාසභූමි අහිමි වීම නිසා වගා බිම් වෙතට අලින් පැමිණීමේ සම්භාවිතාව ඉහළ යමින් පවතී. ශ්‍රී ලංකාවේ අලි මිනිස් ගැටුම සම්බන්ධ විශේෂ විගණන වාර්තාව (2020)

**සංවර්ධනය**

සංවර්ධනය යනු කුමක් දැයි යන්න පිළිබඳ ව නිශ්චිත අර්ථකථනයක් දැක්විය නොහැකි ය. මන්ද ඒ සඳහා විවිධ පුද්ගලයන් හා ආයතන නොයෙක් නිර්වචන ඉදිරිපත් කර ඇති බැවිනි. සරල ව දැක්වුවහොත් " යම් රටක, ප්‍රදේශයක හෝ ගෝලීය වශයෙන් පුද්ගලයන්ගේ සමාජීය, ආර්ථික, දේශපාලන යන අංශවල ඇතිවන යහපත් මෙන් ම ප්‍රමාණාත්මක වර්ධනය" සංවර්ධනය ලෙස අර්ථකථනය කළ හැකි ය.

සංවර්ධනය යනු රටක දුප්පත්කම අඩුවීම හෝ තුරන් කිරීම මෙන් ම අසමානතාව සහ විරැකියාව අත්විඳින අවස්ථාවයි (Seers, 1969).

සංවර්ධනය යනු ජන සංඛ්‍යාව සමාජීය, සංස්කෘතික හා සදාචාරාත්මක යන සාධක ඇතුළත් වෙනස් වීම් හා වර්ධනය පිළිබඳ ක්‍රියාදාමයකි (එක්සත් ජාතීන්ගේ සංවිධානය, 2022).

සංවර්ධනය යන්න පිළිබඳ ව බටහිර ලෝකයේ පිළිගත් අර්ථ නිරූපණය වන්නේ **Growth On change** යන්නයි. සාම්ප්‍රදායික ව සංවර්ධනය යන්න රටක සුභසාධනය හා ජනතාවගේ ජීවන තත්ත්වය සහ අවස්ථාවන්ගේ වැඩිවීමක් මෙන් ම වාණිජකරණය, නවීකරණය, කාර්මීකරණය හෝ ගෝලීයකරණය හා සම්බන්ධ ක්‍රියාවලියක් සේ ම රාජ්‍ය සුජාතකරණය වීම හා සම්බන්ධ ක්‍රියාවලියක් යනාදී වශයෙන් හැඳින්විය හැකි ය (විතාරණ, 2016). එහි ඓතිහාසික පසුබිම ඇත්තේ යුරෝපයේ ය. සංවර්ධන ක්‍රියාවලියේ දී ආර්ථික, සමාජ, සංස්කෘතික, ආධ්‍යාත්මික, දේශපාලනික ආදී සෑම අංශයක ම එකට බැඳුණු සංවර්ධනයක් සිදුවීම වැදගත් වේ. විශේෂයෙන් ම සංවර්ධනය තුළ කිසියම් රටක පවත්නා ස්වාභාවික හා මානව සම්පත් පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම පිණිස මෙය බුද්ධිමත් ව උපයෝගී කර ගැනීම වැදගත් වේ.

නූතන ලෝකයේ සමාජ, ආර්ථික රටාව තුළ සංවර්ධනය යන්නෙහි අරුත අතිශය සංකීර්ණ වී ඇත. ඉතිහාසයේ සිට සිදු වූ සමාජ ක්‍රම විකාශනයේ ප්‍රතිඵලයක් ලෙස එය සිදු වී ඇති බව සඳහන් කළ හැකි ය. මේ අනුව සංවර්ධනය යන්නෙහි අර්ථය වඩාත් පුළුල් බව පැහැදිලි ය. ඒ අනුව සමාජ විද්‍යාත්මක ව සලකා බලන විට සංවර්ධනය යනු සියලු ම ජනතාවට වඩාත් යහපත් ජීවිත ගත කිරීමට අවශ්‍ය සුදුසු ම පසුබිම නිර්මාණය කිරීම ලෙස දැක්විය හැකි ය. සංවර්ධනය පිළිබඳ කලින් කලට කුමන නිර්වචනයන් ප්‍රකාශ වුව ද, සංවර්ධනය මිනිසාගේ සුබසිද්ධිය සඳහා වූවක් විය යුතු ය.

**ශ්‍රී ලංකාවේ අලි මිනිස් ගැටුම**

ලංකාවේ අලි මිනිස් ගැටුම් සංවර්ධනය ක්‍රියාවලියට සිදු කරන බලපෑම පිළිබඳ ව අධ්‍යයනයට ලක් කිරීමේ දී ගෝලීය සන්දර්භය තුළ මේ සම්බන්ධයෙන් පවතින තත්ත්වය අවධානයට යොමු කිරීම වැදගත් වේ. ඉන්දියාව තුළ අලි මිනිස් ගැටුම් මඟින් වාර්ෂිකව පුද්ගලයින් 400 ක් සහ අලි 100 ක් මිය යන බව වාර්තා කරයි (MOEF, 2010). කෙන්යාව තුළ සෑම වසරක ම අලි 50-120 ක ප්‍රමාණයක් වනජීවී බලධාරීන් විසින් වෙඩි තබා ඝාතනය කර ඇත. එසේ ම 2010 සිට 2017 දක්වා කාලය තුළ අලි මිනිස් ගැටුමෙන් පුද්ගලයින් 200 ක් පමණ මිය යන බවත් වාර්තා වී තිබේ (Mariki et al, 2015).

ශ්‍රී ලංකාවේ මුළු බිම් ප්‍රමාණයෙන් 60% ක ප්‍රමාණයක් වන අලි ඇතුන් ජීවත් වේ. එම ප්‍රතිශතය ආසියානු අලින් දිවි ගෙවන අනෙක් රටවලට සාපේක්ෂ ව ඉතාමත් ඉහළ අගයක් ගනී. මෙම වන අලි ගහනයෙන් 70% ක් රක්ෂිත ප්‍රදේශවලින් බැහැර ව ජීවත් වේ. පසුගිය වසර 55 ක කාල පරාසය තුළ වන අලින්ගේ වාසභූමිවලින් 16% ක් අහිමි වී ඇත. එසේ ම ඔවුන් මෙරට මුළු භූමි ප්‍රමාණයෙන් 1.6% ක නව වාසභූමි ඇති කරගෙන තිබේ. එනම් පසුගිය දශක හයක පමණ කාලය තුළ අලි ඇතුන්ගේ වාස භූමිවලින් 15% ක් පමණ ඔවුන්ට අහිමි වී තිබේ. එම වාසස්ථාන අහිමි වීම නිසා එම ප්‍රදේශවල වාසය කළ අලි ඇතුන් සඳහට ම වඳ වී ගොස් ඇත. එබැවින් ලංකාවේ අලි ගහනය වැඩිවෙමින් පවතින බවට ඇතැමුන් දරන මතය වැරදි බව මෙම පර්යේෂණයෙන් පෙන්වා දී ඇත (Fernando et a1, 2019., Channa., De Silva et a1, 2019., Jayasinghe et a1, 2019., Janaka et a1, 2019 and, Jennifer Pastorini, 2019).

**පෙර අධ්‍යයන**

අලි මිනිස් ගැටුම ශ්‍රී ලංකාවේ සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ ව අවධානයට ලක් කිරීමේ


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දී මේ සම්බන්ධයෙන් සිදු කර ඇති පෙර අධ්‍යයන පිළිබඳ ව සැලකිලිමත් වීම වැදගත් වේ.

පෘතුවිරාජ් ප්‍රනාන්දු (2000) විසින් වන සංවර්ධන කටයුතු හේතුවෙන් ඇති වී තිබෙන අලි මිනිස් ගැටුම පිළිබඳ ව **Elephant Conversation Sri Lanka** ලිපිය මඟින් විස්තර කර ඇත. මේ සඳහා මූලික ව ම හේතුව අනවශ්‍ය ඉදිකිරීම් හා වනජීවී නිලධාරීන්ගේ නොසැලකිලිමත් ප්‍රතිපත්ති කටයුතු බව ඔහු ප්‍රකාශ කරයි. අලි වැට නිවැරදි ව ඉදි නොකිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇති බව ඔහු දක්වයි. එමෙන් ම අලි වෙඩි කල් ඉකුත් වීම, වන අලීන් මුදා හැරීම සඳහා වනජීවී නිලධාරීන් තුළ පවතින මන්දෝත්සාහී බව ආදිය ද මෙහි දී සඳහන් කර ඇත (Fernando, 2000).

රන්ජන් බණ්ඩාර (2022) විසින් සම්පාදිත **Willingness to Pay for Conversation of Asia Elephant in Sri Lanka** නැමති පර්යේෂණ පත්‍රිකාව මගින් දක්වා ඇත්තේ ගෝලීය ආර්ථිකයකට මුහුණ දීම සඳහා මිනිසා නිරන්තරයෙන් ම වෙනස්වන ආර්ථිකය සමග ගැටුම් ඇතිකර ගන්නා බව යි. එහි දී පුද්ගලයා යන සාධකය ගැන පමණක් අවධානය යොමු කරන අතර පරිසරයට හා වන සතුන්ට වන හානිය ගැන නොහිතන බව සඳහන් කර ඇත.

**න්‍යායාත්මක පසුබිම**

නවීකරණ ක්‍රියාවලිය මඟින් මූලික ව ම පෙන්වා දෙනු ලබන්නේ එක්තරා ඓතිහාසික ක්‍රියාවලියකි. එමඟින් සමාජයක් සරල අවධියක සිට සංකීර්ණ අවධියක් දක්වා ගමන් කිරීම විද්‍යාත්මක ව විග්‍රහ කරනු ලබයි. සමාජයක් වෙනස්වීම සඳහා අදාළ සමාජයේ සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික කාරණා බලපානු ලබයි. එමෙන් ම යම් රාජ්‍යයක් තුළ ක්‍රියාත්මක වන්නා වූ ප්‍රතිපත්ති, නීති රීති ආදී අභ්‍යන්තරික කාරණා ද මේ කෙරෙහි බලපෑමක් සිදු කරයි.

සරල අර්ථයෙන් ගත් විට සමාජ නවීකරණය යනුවෙන් අදහස් කෙරෙනුයේ සමාජ පරිණාමයයි. එක් අතකින් එය සමාජ වෙනස් වීමකි. කාලයක් පුරා පැවතගෙන ආ පුද්ගල ජන සම්ප්‍රදාය වෙනස් වීමට ලක් වීම ඕනෑම සමාජයක් තුළ සිදුවන ක්‍රියාදාමයකි. සමාජ වෙනස් වීම යනුවෙන් අදහස් කරනු ලබන්නේ කිසියම් සමාජයක ජීවත් වන පුද්ගල සමූහ අතර පවතින අන්තර් සබඳතාවල ස්වභාවය සහ ප්‍රමාණය මෙන් ම ඔවුන්ගේ තත්ත්වයන් හා කාර්යභාරවල වෙනස් වීමයි (පෙරේරා, 2002).

දේශපාලනය හා සම්බන්ධ බලය යන සංකල්පය නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී බලපානු ලබන ආකාරය පිළිබඳ ව අධ්‍යයනයට ලක් කිරීම සඳහා දේශපාලන පරිසර විද්‍යාව යන සංකල්පය භාවිත කෙරේ. තීරණ ගැනීම, ක්‍රියාත්මක කිරීම සහ සම්පත් අයත් කර ගැනීමේ දී දේශපාලන සංස්ථාව කටයුතු කරන ආකාරය ආදී කරුණු පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට මින් හැකිවනු ඇත (විතාරණ, 2016).

දේශපාලන පරිසර විද්‍යාව යනු බල සබඳතා පිළිබඳ ව මෙන් ම ස්වභාවධර්මයේ සහ සමාජයෙහි ක්‍රියාකාරිත්වය කෙරෙහි අවධානය යොමු කරන පාරිසරික අධ්‍යයනය තුළ ක්‍රියාත්මක වන ක්ෂේත්‍රයකි. දේශපාලන ආර්ථිකය, පශ්චාත් ව්‍යුහවාදය සහ ග්‍රාමීය සමාජ පිළිබඳ ව සිදු කරන ලද අධ්‍යයනයන් මගින් මෙම විෂය සන්දර්භය සඳහා න්‍යායික පදනම සපයා තිබේ. ප්‍රධාන වශයෙන් ම මෙහි දී ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් සතු බලය ප්‍රශ්න කිරීම, විමර්ශනයට ලක් කිරීම සිදු කරනු ලබයි (Simon, 2018).

දේශපාලන පරිසර විද්‍යාව කිසිසේත් ම අලුත් සංකල්පයක් නොවේ. න්‍යායක් ලෙස එය දේශපාලන, ආර්ථික සහ සමාජ පරිසරයන් අතර පවතින සම්බන්ධතා සහ පාරිසරික සංවර්ධනය පිළිබඳ ව මෙන් ම එහි ආරක්ෂාව කෙරෙහි ඇති කරනු ලබන බලපෑම පිළිබඳ අවබෝධ කර ගැනීමට උත්සාහ දරයි. (Greenburg and Park,1994).

**පර්යේෂණ ගැටලුව**

අතීතයේ සිට මිනිස් සමාජය මේ තාක් පැමිණි ඇති මග මානව පරිණාමයේ ප්‍රතිඵලයකි. සරල ව පැවති සමාජ කාර්මික විප්ලවය, ප්‍රංශ විප්ලවය වැනි සමාජ පරිවර්තන ක්‍රියාවලින් ඔස්සේ සංකීර්ණ සමාජයක් දක්වා පැමිණ ඇත. එහි දී සමාජ, ආර්ථික, සංස්කෘතික, පරිසරමය ආදී සෑම අංශයක ම විශාල වෙනස්කම් රාශියක් ඇති විය. පුද්ගල වාදය ඉස්මතු වූ අතර ස්වාභාවික සම්පත් අසීමිත ලෙස පරිභෝජනයට ලක් කරමින් මානව අවශ්‍යතා තෘප්ත කර ගැනීමට පුද්ගලයා විසින් කටයුතු කරන ලදී. මෙවැනි තත්ත්වයක් තුළ වන සතුන්ගේ වාසභූමි ප්‍රබල තර්ජනයකට ලක්විය. මන්ද පුද්ගල අවශ්‍යතා සඳහා වනාන්තර එළි කිරීම සහ සත්ත්වයන්ට ද අයත් ව පවතින පාරිසරික සම්පත් මිනිසා තම ග්‍රහණයට නතු කරගත් බැවිනි.

මේ නිසා ලෝකයේ අලි ගහනයක් පවතින බොහෝ රටවල් මුහුණ දෙනු ලබන ප්‍රධාන ගැටලුවක් බවට අලි මිනිස් ගැටුම පත් ව ඇත (ද සිල්වා, 1998). එය අලි ඇතුන්ගේ පැවැත්මට හා මනුෂ්‍ය ප්‍රජාවගේ ද පැවැත්මට විශාල අභියෝගයක් වී ඇත. මන්ද ජනගහන ව්‍යාප්තියත් සමඟ වනාන්තර එළි කිරීම මඟින් අලින්ට තම වාස භූමින්හි ප්‍රමාණය අවම වෙමින් යන බැවිනි. වඩාත් සමීප ව මෙම කොට්ඨාසයන් ද්විත්වය ම වාසය කිරීම නිසා ගැටුම් ඇතිවීමේ ප්‍රවණතාව ඉතා ඉහළ අගයක් ගනී. බොහෝ විට ජීවිත විනාශ බොහොමයක් මෙම ප්‍රදේශවලින් වාර්තා වීම ඉතා සුලභ කරුණක් බවට වත්මනේ පත් ව ඇත.

ලංකාවේ අලි මිනිස් ගැටුම් සංවර්ධන ක්‍රියාවලියට සිදු කරන බලපෑම පිළිබඳ ව අධ්‍යයනයට ලක් කිරීමේ දී ගෝලීය සන්දර්භය තුළ මේ සම්බන්ධයෙන් පවතින තත්ත්වය අවධානයට යොමු කිරීම වැදගත් වේ. කෙන්යාව තුළ සෑම වසරක ම අලි 50-120ක ප්‍රමාණයක් වනජීවී බලධාරීන් විසින් වෙඩි තබා ඝාතනය කරනු ලැබ ඇත. එසේ ම 2010 සිට 2017 දක්වා කාලය තුළ අලි මිනිස් ගැටුමෙන් පුද්ගලයින් 200ක් පමණ මිය යන බවත් වාර්තා වී තිබේ. ඇත්


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දළ වෙළඳාම සඳහා නීතිවිරෝධී ලෙස අලි ඇතුන් ඝාතනය කිරීම අප්‍රිකාවේ අලි මරණ සංඛ්‍යාව වර්ධනය කිරීමට ප්‍රධාන හේතුවක් වී ඇත (Mariki et al, 2015).

ඉන්දියාවේ වගා කටයුතු හා සම්බන්ධ පවුල් 500,000කට සෘජු බලපෑම් ඇති කරමින් ගැටුම් සිදුවන අවස්ථාවල දී පුද්ගලයන් 400ක් සහ අලි ඇතුන් 100ක් වාර්ෂික ව මිය යන බව ඉන්දියාව වාර්තා කරයි (MOEF, 2010).

ලෝකයේ අලි මිනිස් ගැටුම් පවතින රටවල් අතුරින් ශ්‍රී ලංකාව ඉදිරියෙන් ම සිටින රටකි. ශ්‍රී ලංකාවේ වාර්ෂික ව අලි මිනිස් ගැටුම්වලින් මිනිස් මරණ 70කට අධික සංඛ්‍යාවක් සහ අලි ඇතුන් මරණ 200කට අධික සංඛ්‍යාවක් වාර්තා වේ. (Santiapillai et al, 2010., Fernando and Pastorini, 2011). ලංකාවේ මෙම ගැටුම් අවම කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගත්ත ද නොයෙකුත් හේතූන් මත ඒවා අසාර්ථක වී ඇති ආකාරය දැකගත හැකි ය. අලි අනාථාගාර ඉදි කිරීම, අලි වැටවල් ඉදි කිරීම මේ සඳහා ගත් ක්‍රියාමාර්ග කීපයකි. කෙසේ හෝ නූතනයේ සංවර්ධන ක්‍රියාවලිය තුළ අලි මිනිස් ගැටුම තව තවත් උත්සන්න වෙමින් පවතින ආකාරයක් නිරීක්ෂණය කළ හැකි ය. මෙනිසා ශ්‍රී ලංකාවේ අලි - මිනිස් ගැටුම සංවර්ධන ක්‍රියාවලියට කුමනාකාරයේ බලපෑමක් සිදු කරනු ලබන්නේ ද යන පර්යේෂණ ගැටලුව අධ්‍යයනයට ලක් කිරීම කාලෝචිත ය.

## පර්යේෂණයේ අරමුණ

ශ්‍රී ලංකාව යනු ජෛව විවිධත්වය අතින් ප්‍රමුඛත්වයෙහි ලා සැලකෙන රටකි. ඕනෑ ම රටක තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට නම් මිනිසා, ස්වාභාවික පරිසරය හා සත්ත්වයන් ආරක්ෂා විය යුතු ය. මේවායෙහි තුල්‍යතාව නොමැති වීම විශාල හානිදායක තත්ත්වයන් ඇති කරයි. විශේෂයෙන් ම ශ්‍රී ලංකාවෙහි බහුල ව ම කතා බහට ලක්වන අලි මිනිස් ගැටුම් නිර්මාණය වන්නේ ද මේ හේතුව මුල් කොට ගෙන ය. අලින්ගේ වාසස්ථානවල ගුණාත්මක බව පිරිහීම නිසා ඔවුන්ගේ පැවැත්ම විශාල තර්ජනයකට ලක්ව ඇත. සංවර්ධන කටයුතු හේතුවෙන් සිදු වන වන සංහාරය ඉතා අධික වන අතර මේ හේතුවෙන් මිනිස් ජීවිත, අලි මරණ සහ දේපළවලට සිදුවන හානිය ඉතා විශාල ය (ද සිල්වා, 1998). මෙවැනි විශාල හානි වාර්ෂික ව වාර්තා වුව ද මේ සඳහා තවමත් නිශ්චිත පිළිතුරක් සොයාගෙන නැත.

මෙනිසා ඇතිවී තිබෙන අහිතකර බලපෑම් ලෙස කෘෂි භෝග හානිය, දේපළ හානිය, මිනිසුන්ට ශාරීරික ආබාධ සිදුකිරීම හෝ මරණයට පත් කිරීම, මානසික පීඩා ඇති කිරීම දැක්විය හැකි ය. වන අලින්ට එල්ල වන බලපෑම් වශයෙන් ඔවුන්ට ශාරීරික ආබාධ සිදු කිරීම, ඝාතනය වීම, බියට පත් කිරීම, හිංසනයකට ලක්වීම, තම පාරම්පරික වාස භූමි අහිමි වී යාම සහ නිරාහාර ව මියයාමට සිදුවීම යනාදිය දැක්විය හැකි ය. වන අලින්ට එල්ලවන බලපෑම් බොහොමයක් සිදුවන්නේ අලි-මිනිස් ගැටුම් පාලනය කිරිම සඳහා යොදා ගන්නා විවිධ ක්‍රමවේදයන් හේතුවෙනි. එනිසා මෙම අධ්‍යයනයේ ප්‍රධානතම අරමුණ බවට පත් වන්නේ ශ්‍රී ලංකාවේ අලි - මිනිස් ගැටුම නිර්මාණය වීම සඳහා සංවර්ධන ව්‍යාපෘති මඟින් සිදු කර ඇති බලපෑම හඳුනා ගැනීම යි.


## පර්යේෂණයේ වැදගත්කම

ගොඩබිම මත වාසය කරන විශාල ම ජීවියා වශයෙන් සැලකෙන අලියාට ලාංකේය සංස්කෘතික සන්දර්භය තුළ හිමි වන්නේ ඉතා සුවිශේෂ ස්ථානයකි. නමුත් වර්තමානය වන විට අලි සම්බන්ධයෙන් බොහෝ සංකථන ගොඩ නැඟී ඇත්තේ අලි මිනිස් ගැටුම හේතු කොට ගෙන ය. එම ඝට්ටනය මේ වන විට විසඳුමක් සොයාගත නොහැකි මට්ටමේ සංකීර්ණත්වයට පත් ව ඇත. වර්තමාන ශ්‍රී ලංකාවේ වන අලින් සැරිසරන ඕනෑ ම ප්‍රදේශයක අලි මිනිස් ගැටුම හට ගැනීම ඉතා සුලබ කාරණාවක් බවට පත් ව ඇත. මෑතකාලීන වාර්තාවලට අනුව මෙම ගැටලුවේ කැපී පෙනෙන වර්ධනයක් දැකගත හැකි ය. මේ ආකාරයට වාර්ෂික ව අලි මිනිස් ගැටුම වර්ධනය වීම සඳහා බලපානු ලබන ප්‍රධාන හේතුවක් වන්නේ ග්‍රාමීය වශයෙන් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතින් ය. ශීඝ්‍රයෙන් වර්ධනය වන ජනගහනය හේතුවෙන් ඔවුන්ට අවශ්‍ය නිවාස, වගා කටයුතු සඳහා ඉඩම් මෙන් ම සංවර්ධන ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සැපයීම සඳහා වන අලින්ගේ වාස භූමි බවට පත් ව ඇති කැලෑ පෙදෙස් මිනිසා විසින් අත්පත් කරගනු ලැබ ඇත. මෙම භූමි අත්පත් කර ගැනීම නිශ්චිත සැලසුමකට අනුව සිදු නොකරන අතර වන අලියාට අවශ්‍ය වන ආහාර, ජලය හා අනෙකුත් අවශ්‍යතා තෘප්ත කර ගැනීම සඳහා ඔවුන් මිනිස් වාස භූමි වෙත පැමිණීමෙන් අලි මිනිස් ගැටුම් නිරන්තරයෙන් හටගනී. අලි මිනිස් ගැටුම හේතුවෙන් මිනිසා මෙන් ම අලින් ද බොහෝ හිරිහැරයන්ට ලක් වේ. විශේෂයෙන් ම අද වන විට අලියා යනු මිනිසාගේ ප්‍රධාන සතුරෙකු වශයෙන් සලකන තත්ත්වයට පත් ව ඇත. මෙනිසා රට තුළ ප්‍රධාන කතාබහට ලක්ව තිබෙන රටේ සංවර්ධන ක්‍රියාවලිය හා අලි මිනිස් ගැටුම පිළිබඳ ව අවධානයට ලක් කිරීම ඉතා කාලෝචිත වනු ඇත.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## පර්යේෂණ ක්‍රමවේදය

*රූපසටහන් අංක 2.1 අධ්‍යයන ප්‍රදේශයේ පිහිටීම*




මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය - 2018

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ නැගෙනහිර දිශාවට වන්නට පිහිටා ඇති හම්බන්තොට ප්‍රදේශිය ලේකම් කොට්ඨාසය අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරා ගෙන ඇත. හම්බන්තොට ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය සඳහා අයත් භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර 322 කි. මෙය ග්‍රාම නිලධාරි වසම් 30 කින් සමන්විත වේ. හම්බන්තොට නගර සභා බල ප්‍රදේශය ද හම්බන්තොට ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇත. මෙයට හම්බන්තොට නැගෙනහිර සහ හම්බන්තොට බටහිර යන ග්‍රාම නිලධාරි වසම් දෙක ඇතුළත් වූ අතර එයට අයත් ව පැවතී භූමි ප්‍රමාණය කිලෝමීටර 9.19 කි. 1639 අංක 12 දරණ 2010.02.02 ප්‍රකාශයට පත් කළ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් හම්බන්තොට නගර සභා බල ප්‍රදේශය මහ නගර සභාවක් ලෙස ප්‍රකාශයට පත් කරමින් එහි භූමි ප්‍රමාණය පුළුල් කරන ලදී. ඒ සඳහා හම්බන්තොට බටහිර, හම්බන්තොට නැගෙනහිර, සිරිබෝපුර, කොහොලංකල, කැලියපුර, සාමෝදාගම, මිරිජ්ජවිල යන ග්‍රාම නිලධාරි වසම් අයත් වේ. මේ සඳහා අයත්වන මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර 83 කි (හම්බන්තොට මහ නගර සභා සැලැස්ම - වෙළුම 1, 2019 - 2020).

මේ සඳහා ප්‍රධාන වශයෙන් ම භාවිත කරන ලද්දේ ද්විතීයික දත්ත මූලාශ්‍රයන් ය. මෑතකාලීන ව විද්වතුන් විසින් සිදු කළ පර්යේෂණ හා අන්තර්ජාතික ලිපි හා සඟරා මේ සඳහා මූලාශ්‍රය වශයෙන් භාවිත කර ඇත. එමෙන් ම මේ යටතේ ලියවී ඇති වාර්තා, පොත් පත්, පුවත්පත්, සඟරා, අන්තර්ජාලය මෙන් ම වනජීවී දෙපාර්තමේන්තුවේ මේ සම්බන්ධ ව ලියවී ඇති ලිඛිත මූලාශ්‍රය පරිශීලනය කරන ලදී.

## ප්‍රතිඵල සාකච්ඡාව

සංවර්ධන ව්‍යාපෘති සඳහා වනාන්තර ප්‍රදේශ අත් කර ගැනීම යටත් විජිත යුගයේ සිට සිදු වන්නකි. 19 වන ශත වර්ෂයේ අග භාගයේ සිට කෝපි, තේ සහ රබර් වගාව සඳහා මහා පරිමාණයෙන් කැලෑ එළි කිරීම සිදුවිය. අධිරාජ්‍යවාදීන් විසින් මෙලෙස සිදු කළ මහා පරිමාන වනාන්තර හෙළි කිරීම නිසා වල් අලි විශාල ප්‍රමාණයක් විනාශයට ලක්වූහ. මේ ආකාරයට මහා පරිමාණයේ වගා කටයුතු ක්‍රියාත්මක වීම නිසා බොහෝ වල් අලි දඩයම්කරුවන්ගේ වෙඩි උණ්ඩයට ලක් වූ අතර අනෙක් අලි හීලෑ කර අපනයනය කරන ලදී (ද සිල්වා, 1998).

වන අලියා යනු ස්වභාවයෙන් ම සංචාරක සත්ත්වයෙකු වන අතර ඔවුන් තමාට ආවේනික සුපුරුදු මාර්ග ඔස්සේ ගමන් කරයි. සංවර්ධන ව්‍යාපෘති සඳහා වන අලින්ගේ භූමි එළි කිරීම සිදු කළත් ඔවුන් තම සුපුරුදු ගමන් මාර්ග වෙනස් කිරීමට කටයුතු නොකරයි. වන අලින්ට නිදහසේ සංචරණය කිරීමට ඉඩ සැලසීම සඳහා 2019 සැප්තැම්බර් වන විට අලි පිවිසුම් 03ක් පමණ ගැසට් මඟින් ප්‍රකාශ කර තිබුණු අතර 2015 මැයි මස සිදු කළ වන අලි මිනිස් ගැටුම කළමනාකරණය සඳහා වූ ව්‍යාපෘති යෝජනාව මඟින් තවත් ව්‍යාපෘති 16ක් හඳුනාගෙන මේ වන විට පිවිසුම් 07ක සමීක්ෂණ කටයුතු සිදු කළ ද මෙතෙක් එක් වන පිවිසුමක් හෝ ප්‍රකාශයට පත් කිරීමට


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

අපොහොසත් වී ඇත. ස්වාභාවික පරිසර තුල්‍යතාව නොසලකා හරිමින් වන අලි පිවිසුම් අවහිර කරමින් ජනාවාස ස්ථාපිත කිරීම, වගා කටයුතු සිදු කිරීම, සංචාරක ස්ථාන, හෝටල් ආදිය ඉදි කිරීම වැනි කරුණු ප්‍රධාන වශයෙන් ම අලින් ගම් වැදීමට හේතු වී තිබේ (ශ්‍රී ලංකාවේ අලි මිනිස් ගැටුම සම්බන්ධ විශේෂ විගණන වාර්තාව, 2020).

වගු අංක 01
2017-2021 දක්වා වර්ෂවල සිදු වී ඇති අලි මරණ හා ජීවිත හානි

| වර්ෂය | වාර්ෂික අලි මරණ | ජීවිත හානි |
|---|---|---|
| 2017 | 87 | 256 |
| 2018 | 96 | 319 |
| 2019 | 121 | 405 |
| 2020 | 113 | 327 |
| 2021 | 142 | 375 |

(ප්‍රකාශ්, 2022.03.31)

මෑතකාලීන ලංකාවේ ඉතා බහුල ව සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලද දිස්ත්‍රික්කයක් වන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයයි. පසුගිය වසර 15ක පමණ කාලයක සිට හම්බන්තොට දිස්ත්‍රික්කයේ වන සතුන් වෙසෙන ප්‍රදේශ හෙළි කරමින් සිදු කෙරෙන මහා පරිමාණ සංවර්ධන කටයුතු හේතුවෙන් වන සතුන්ගේ වාසභූමි අහිමි වෙමින් පවතී. එහි ප්‍රතිඵලයක් වශයෙන් දිස්ත්‍රික්කයේ අලි මිනිස් ගැටුම වර්ධනය වූ අතර අනෙක් කැලෑ ප්‍රදේශය තුළ වෙසෙන මුවන් ගෝනුන් ඇතුළු වනසතුන් දඩයක්කරුවන්ගේ ගොදුරු බවට පත්වෙමින් තිබේ.

ප්‍රදේශයේ සිදුවන සංවර්ධනය නිසා හෙක්ටයාර 8000ක පමණ ප්‍රදේශයක් අලින්ගේ සංචරණ සඳහා වෙන් කර ඇති අතර ඉන් හෙක්ටයාර 1400ක් මහා නගර සභා ප්‍රදේශයට ඇතුළත් වේ. මෙම කලාපය තුළ වන අලි 400ක් පමණ ජීවත් වෙතැයි ගණන් බලා ඇත (නාගරික සංවර්ධන අධිකාරිය - හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය, 2018).

නව සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් අලිමංකඩවල් වැසීයාම, වන අලින් ගම් වැදීම හා ඔවුන්ගේ වාසභූමි සීමා වීම වැනි තත්ත්වයන් දැකගත හැකි ය. විශේෂයෙන් ම නව නිවාස ව්‍යාපෘති, පරිපාලන සංකීර්ණය, දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව හේතු කොට ගෙන අලින්ගේ සංචරණ භූමි සීමාවීම හා අලිමංකඩ ඇහිරී ගොස් ඇත. හම්බන්තොට ප්‍රදේශය තුළ අලි මිනිස් ගැටුම් උග්‍ර වීමට එය ප්‍රධාන හේතුවක් වී තිබේ. 2017 වර්ෂය තුළ ජීවිත හානි 10ක්, නිවාස හානි 95ක් හා අලින් 04ක් ජීවිතක්ෂයට පත් ව ඇත (නාගරික සංවර්ධන අධිකාරිය - හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය, 2018).

සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් අලි ගහනය සඳහා අහිමි වන භූමිය සඳහා අලි කළමනාකරණ රක්ෂිතයක් වෙන් කිරීමට යෝජනා වී ඇතත් එය ප්‍රමාද වී තිබේ. මේ වන විට එලෙස යෝජනා වී තිබූ භූමිය ද නොයෙකුත් ව්‍යාපෘති සඳහා භාවිතයට ගනී. අයිරිෂ්, ඇනෝවි, ෆාර්නා, නැව්ටාස් යන සමාගම් විසින් සූර්ය බලශක්ති බලාගාර ඉදිකිරීම සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සපුර, බුරුතංකන්ද ප්‍රදේශයේ වනාන්තර අක්කර 600ක් එළිපෙහෙළි කර තිබේ. වල්සපුගල, දිවුල්පැලැස්ස වැව් ඉහත්තෑවේ අලි - ඇතුන් ජීවත් වූ අක්කර 300කට වැඩි වනාන්තර භූමි ප්‍රදේශයක් සම්පූර්ණයෙන් ම එළිපෙහෙළි කර සූර්යය බලශක්ති ගම්මානයක් ඉදි කර තිබේ. මෙම වැව ආශ්‍රිත ප්‍රදේශය අලි - ඇතුන් විශාල රංචු වශයෙන් ජීවත් වූ ප්‍රදේශයකි. නමුත් මෙම බලාගාරය නිසා ඔවුන්ගේ ඒ වාස භූමි අහිමි වී ඇත.

ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපළ ඉදි කිරීම සඳහා මත්තල ප්‍රදේශයේ අලි - ඇතුන්ගේ ප්‍රධාන වාසස්ථානයක් වූ දැවැන්ත වනාන්තර පද්ධතියේ අක්කර 5000ක් සම්පූර්ණයෙන් යොදා ගන්නා ලදී. ඉන්පසු ව ඒ ආශ්‍රිත මාර්ග පද්ධති හා යටිතල පහසුකම් නැංවීමට, හම්බන්තොට වරාය ඉදි කිරීමට, හම්බන්තොට ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, මිරිජ්ජවිල ආයෝජන කලාපය, හම්බන්තොට පරිපාලන සංකීර්ණය හා ක්‍රිකට් ක්‍රීඩාපිටිය ඉදි කිරීම සඳහා ද විශාල කැලෑ ප්‍රමාණයක් එළි කරන ලදී. මේ හේතුවෙන් වාසස්ථාන අහිමි වූ වන අලි පහළ අන්දරගස්වැව, දිමුතුගම, එලල්ල, පහළ මත්තල, උඩ මත්තල, පුංචිඅප්පු ජදුර, බදගිරිය ආදී ගම්මානවලට වාසස්ථාන අහිමි වූ අලි - ඇතුන් පිවිසීමෙන් දැවැන්ත අලි - මිනිස් ගැටුමක් අලුතින් නිර්මාණය වී තිබේ. මේ නිසා වගා බිම්වලට හා දේපොළවලට සිදු වී ඇති හානිය විශාල වන අතර ඇතැම් ගොවි ජනතාව වගා කටයුතුවලින් ඉවත් වීමට පවා මේ තත්ත්වය බලපා තිබේ.

හම්බන්තොට වරාය පරිශ්‍රය, මිරිජ්ජවිල ආයෝජන කලාපය, හම්බන්තොට පරිපාලන සංකීර්ණය කොටස, ක්‍රීඩා පිටිය ආශ්‍රිත නුගේගලයාය එඩිසන් කන්ද ප්‍රදේශය ආශ්‍රිත ව සංවර්ධන කටයුතු හේතුවෙන් විශාල වන ප්‍රමාණයක් එළි කර ඇත. මේ නිසා විශාල වනාන්තර බොහොමයක් පවතින්නේ කොටස් වශයෙන් අතර මානජ්ජාව කැලය, මදුනාගල වනාන්තරය, නාගරවැව ප්‍රදේශය, ඉහළ කුඹුක්වැව හා කුමාරගම කැලෑ ප්‍රදේශයේ අලි ඇත්තු විශාල ප්‍රමාණයක් හුදකලාව සිටිති. මේ සියලු සතුන් අතරමංව සිටින්නේ හම්බන්තොට ප්‍රදේශය තුළ මෑතකාලීන ව ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රතිඵලයක් ලෙස ය. මාතර සිට හම්බන්තොට දක්වා අධිවේගී මාර්ගය ඉදි කර ඇති අතර මාතර සිට ඉහළ අන්දර වැව හරහා මත්තල ගුවන්තොටුපොළ දක්වා ඉදිකර ඇති අධිවේගී මාර්ගය හා මාගම්පුර වරායේ සිට ඉහළ අන්දරවැව දක්වා ඉදිකර ඇති අධිවේගී මාර්ග පිවිසුම හේතුවෙන් මෙම රක්ෂිතයේ වනාන්තර පද්ධති දැඩි ලෙස ඛණ්ඩනය වීමට ලක් ව තිබේ. මේ වන විට අධිවේගී මාර්ගය සකස් කිරීම සඳහා මීටර් 150ක් පමණ පළල හා කිලෝමීටර් 8ක් පමණ දිග වනාන්තර තීරයක් සම්පූර්ණයෙන් ම ඉවත් කර ඇත. මෙම අධිවේගී මාර්ග හේතුවෙන් සීනුක්කුගල, වල්සපුගල, කරුවලවැව වනාන්තර ප්‍රදේශය සම්පූර්ණයෙන් ම අලි - ඇතුන් සමඟ ම හුදකලා වීම සිදු ව තිබේ. මේ පිළිබඳ ව අදාළ සැලසුම් සකස් කරන්නන්ගේ අවධානය යොමු නොකිරීමෙන් සිදු ඇත්තේ අවට ජනතාව අලි - මිනිස් ගැටුමට තව තවත් ගොදුරු වීම ය (චාමිකර, 2019 ඔක්තෝබර් 16).


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

හම්බන්තොට වරාය හා මත්තල ගුවන් තොටුපොළ ඉදිකිරීමට ප්‍රථම සකස් කළ පරිසර බලපෑම් ඇගයීම් වාර්තාවල පැහැදිලි කර ඇත්තේ මේ සංවර්ධන කටයුතු හේතුවෙන් අවතැන්වන අලි - ඇතුන්ට රැකවරණය සැලසීම සඳහා හම්බන්තොට වන අලි කළමනාකරණ රක්ෂිතය ප්‍රකාශයට පත් කළ යුතු බව ය. නමුත් එය එම වාර්තාවලට පමණක් සීමා වී ඇති අතර හම්බන්තොට සංවර්ධනය සඳහා එම නිර්දේශිත භූමිය ද භාවිතයට ගනිමින් පවතී. මෙනිසා වල්සපුගල, කරුවලවැව, මදුනාගල, හැඩිල්ල, කරඹගහමුල්ල, නබඩගස්වැව කටු වැව, පතලයාගම, ආරබැද්ද, කැලිගම, ගල්වැව හොඩවැල් පොකුණ, බැල්ලගස් වැව බැරගම, අම්බලන්තොට, මානජ්ජාව, වැවේගම, වැලි ආර, වැලි වැව, මීගහජඳුර, මත්තල, උඩමත්තල, ගොන්නෝරුව, බඳගිරිය, තම්මැන්නාව, කැරුස වැව, ජූල්ගමුව, යහන්ගල, අන්දරවැව, පන්වැව, සීනුක්කුගල, නාගරවැව, කුඩා ඉදිවැව, කැටැන්වැව හා උණුදිය පොකුණ ආදී ප්‍රදේශවල අලි - මිනිස් ගැටුම උග්‍ර තත්ත්වයකට පත් ව තිබේ.

මේ ආකාරයට සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම තුළ සිදුවන වන විනාශයේ ප්‍රතිඵලය වී ඇත්තේ මෙතෙක් අලි - මිනිස් ගැටුම නොපැවති බොහෝ ප්‍රදේශ එහි ගොදුරු බවට පත් වීමයි.

අලින් බොහොමයක් තම වාස භූමි ලෙස තෝරා ගනු ලබන්නේ වියලි කලාපයට අයත් ප්‍රදේශයන් ය. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ දකුණ, වයඹ, උතුර වැනි පළාත්වල බහුල ව අලි වාසය කරති. හම්බන්තොට, වැල්ලවාය, තණමල්විල, කතරගම, හම්බෙගමුව වැනි ප්‍රදේශවල බොහෝ අලි ඝාතනයට ලක් වූයේ ගම්මුන්ගේ හේන් ගොවිතැන් ආරක්ෂා කර ගැනීමට යාමෙනි. විශේෂයෙන් ම ලංකාව තුළ ක්‍රියාත්මක වන ලද බොහෝ සංවර්ධන ව්‍යාපෘති අලින්ගේ වාස භූමි සමීප ව ක්‍රියාත්මක කිරීමට යාම මීට බලපාන ලද මූලික ම සාධකයක් වී ඇත.

මේ ආකාරයට හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ මහා පරිමාණ ආකාරයෙන් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වීම ප්‍රදේශයේ සමාජ, ආර්ථික, දේශපාලනික, පාරිසරික වශයෙන් වෙනස්කම් රැසක් ඇති කිරීමට හේතු වී තිබේ.

නවීකරණය න්‍යායේ ප්‍රධානතම අදහස වන්නේ සාම්ප්‍රදායික ගමක් ක්‍රමානුකූල සංවර්ධනයට ලක් වීමේදී සිදු වී ඇති බලපෑම හඳුනා ගැනීමයි. එනම්, සාම්ප්‍රදායික හෝ ඌන සංවර්ධිත රටවල් නූතනත්වය කරා පැමිණීමේ ක්‍රියාවලියයි.

නවීකරණ සංකල්පය තුළ සමාජයක සිදු වන නවීකරණ විධි තුනක් අදහස් වේ. එනම් ආර්ථික නවීකරණය, දේශපාලන නවීකරණය,සමාජ සංස්කෘතික නවීකරණය වශයෙනි. ආර්ථික නවීකරණයේ දී සලකා බලන්නේ ආර්ථික සංස්ථාවේ සිදු වන නවීකරණමය පරිවර්තනය යි. එනම් සාම්ප්‍රදායික වැඩවසම් ආර්ථික ව්‍යුහය වෙනුවට වෙළඳපොළ ආර්ථික ක්‍රමයක් වර්ධනය වීම, කාර්මිකරණය ආර්ථිකයේ ගාමක බලවේගය බවට පත් වීම, වැටුප් ක්‍රම ස්ථාපිත වීම, දියුණු තාක්ෂණ ආදේශය, කුලී ශ්‍රමය, ශ්‍රම විභජනය, මූල්‍ය සංරක්ෂණය, බැංකු හා රක්ෂණ කටයුතු මෙන් ම වෘත්තීය මට්ටම්වල සිදු වන වෙනස්වීම් වැනි ලක්ෂණ ආර්ථික නවීකරණයේ දී සලකා බැලේ. නවීකරණය යනු සමාජයේ එක්තරා ස්වරූපයක සිට එයට වඩා අලුත් තත්ත්වයකට හැඩගැසීම යි. මෙම හැඩගැසීම සාම්ප්‍රදායික තත්ත්වයේ සිට නවීන තත්ත්වයක් දක්වා සිදුවිය හැකි ය.

ඉහත දක්වන ලද අදහස් අනුව හම්බන්තොට ග්‍රාමීය සමාජ සාපේක්ෂ ව සංවර්ධනයට ලක්ව ඇති අයුරු හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම නව ව්‍යාපාර ආරම්භ වීම, මාර්ග පද්ධතිය දියුණු වීම නිසා තම නිෂ්පාදන ප්‍රවාහනය කිරීම සඳහා පහසුකම් සැලසීම, අග නගරය හා සම්බන්ධ වීමට පහසු වීම, ඉඩම් සඳහා ඉහළ වටිනාකමක් හිමිවීම වැනි සාධනීය කාරණා රැසක් මේ මගින් ග්‍රාමීය ජනයාට හිමි ව තිබේ. නාගරික ප්‍රදේශ හා සම්බන්ධ වීම නිසා පුද්ගල ජන ජීවිතය තුළ ද එනම්, ඇඳුම් පැළඳුම්, භාෂා භාවිතය, සන්නිවේදය වැනි අංශ රැසක පරිවර්තනයන් දැකගත හැකි ය.

නමුත් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ දී වන සංහාරයන් සිදු වීම, වන ජීවීන්ට අයිති භූමිය මනුෂ්‍යයන් නීති විරෝධී ලෙස අත්පත් කොටගෙන තිබීම නිසා වන ජීවීන්ගේ ප්‍රශස්ත ගුණාත්මකභාවයෙන් යුතු වාස භූමි සීමා වී ඇත. මේ හේතුවෙන් වන අලින් පමණක් නොව කැලෑව තුළ තම ආහාර හා ජල අවශ්‍යතාව සපුරාගත් වන සතුන් රැසක් අවට ගම්මානවලට හා කෘෂිකාර්මික ඉඩම්වලට කඩා වැදීම සිදු වී ඇත. ගම්මානවලට කඩාවදින වන සතුන් අතරින් අලි ඇතුන් පිළිබඳ ව වර්තමානය වන විට වැඩි අවධානයක් යොමු වී ඇත. වන අලින් ගම්මානවලට කඩා වැදීමත් සමඟ ගම්වැසියන් ද ඊට ප්‍රතිචාර දක්වන්නට යෑම හරහා අලි මිනිස් ගැටුම නිර්මාණය වේ. එලෙස ආරම්භ වූ අලි මිනිස් ගැටුම වර්තමානය වන විට ජීවිත හානි, දේපළ හානි, වගා හානි පමණක් නොව අලි මරණ ද සැලකිය යුතු මට්ටමකින් ඉහළ දැමීමට සමත් වී ඇත. ඒ අනුව ග්‍රාමීය සමාජය සංවර්ධනය කරා යන්නේ නම් දෙපාර්ශවයේ ම සමබරතාව නැත්නම් සහජීවනය අවශ්‍ය බව වර්තමානයේ බොහෝ දෙනෙකු අවබෝධ කරගෙන ඇති නමුත් තවමත් ඊට විසඳුමක් සොයා ගැනීමට අසමත් ව ඇති බව පැහැදිලි වන කරුණකි. හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ඉදි කරනු ලබන නව ව්‍යාපෘති හේතුවෙන් අහිමි වන වනාන්තර ප්‍රදේශ සඳහා විකල්ප ක්‍රමවේද යෝජනා කර ඇතත්, ඒවා බොහොමයක් ක්‍රියාත්මක වී නැත. රක්ෂිත සඳහා ප්‍රකාශයට පත් කළ භූමි මේ වන විට නොයෙකුත් ව්‍යාපෘති සඳහා භාවිතයට ගනු ලබයි. පවතින අණ පනත්, නීති රීති ආදිය සැලකිල්ලට නොගැනීම, දේශපාලනික බලය අයුතු ලෙස භාවිතයට ගැනීම යන කාරණා මෙයට මූලික ව ම හේතු වී තිබේ.

1980 අංක 47 දරන සංශෝධිත ජාතික පාරිසරික පනතට අනුව ප්‍රකාශිත 1993 ජුනි 24 වන දින අංක 772/22 දරන ගැසට් නිවේදනයට අනුව අක්කර 2.5 කට වඩා විශාල වනාන්තරයක් එළි කර සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා යොදා ගැනීමට ප්‍රථමයෙන් පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලියට යටත් ව ඒ සඳහා පූර්ව ලිඛිත පාරිසරික අනුමැතිය ලබා ගත යුතු


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ය. 2006 වසරේ දී ප්‍රකාශයට පත් කළ වන අලි සංරක්ෂණය හා කළමනාකරණ ජාතික ප්‍රතිපත්තියට අනුව අලි කළමනාකරණ රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ ව ප්‍රධාන අවධානය යොමු කර තිබේ. එනම්, එම සතුන්ගේ වාසස්ථාන ආරක්ෂිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කළ යුතු ය. හම්බන්තොට අලි කළමනාකරණ රක්ෂිතය කඩිනමින් ප්‍රකාශයට පත් කළ හැකි වුවත්, ඒ සඳහා නිසි යොමුවක් ලබා දී නොමැත. යෝජිත හම්බන්තොට අලි කළමනාකරණ රක්ෂිතය ප්‍රකාශයට පත් නොකර එම වනාන්තර බිම් සංවර්ධනයට, වාණිජ වගාවන් ව්‍යාප්ත කිරීමට හා ජනාවාස ව්‍යාප්ත කිරීමට යොදා ගන්නා අතර තවත් විශාල භූමි ප්‍රදේශයක් චීන සමාගම්වලට කර්මාන්ත ස්ථාපිත කිරීමට ලබා දීමට කටයුතු කරමින් සිටී.

## නිගමනය

මේ අනුව පැහැදිලි වන්නේ ග්‍රාමීය ප්‍රදේශයක් ව පැවති හම්බන්තොට ප්‍රදේශය තුළ ශක්‍යතා අධ්‍යයන වාර්තා අසමත් වුවත්, ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් අලි මිනිස් ගැටුම වර්ධනය කිරීමට සාධකයක් වී ඇති බවයි. ප්‍රදේශයේ යටිතල පහසුකම්, තාක්ෂණික මෙවලම්, සන්නිවේදන පහසුකම් ආදියට නවීකරණය හරහා හුරු විය. නමුත් ඒ සමග නීති විරෝධි ලෙස වනාන්තර හෙළි කිරීමත් වන සතුන්ගේ සංක්‍රමණික මාර්ග අවහිර වීමත් සිදු විය. සීමිත ඉඩකඩ තුළ සතුන්ට සරිලන ආහාර හිඟ විය. අලිමංකඩ අවහිරතාවයට ලක් විය. අලි ඇතුන් ප්‍රමුඛ වන සතුන් ගම් බිම්වලට කඩා වැදී, බෝගවලට පමණක් නොව මිනිස් ජීවිතවලට ද බලපෑම් කරන්නට විය. අද වන විට අලි මිනිස් ගැටුම රජය සහ ගම්වාසීනුත්, අලි ඇතුනුත් අතර පවතින ගැටුමක් බවට පත් වී ඇත. අලි මිනිස් ගැටුම තුළ බොහෝ දෙනෙකු චෝදනා නගන්නේ වන අලින් නිසා තම ජීවිතවලට හා තම දේපළවලට වන හානිය පිළිබඳ ව යි. සංවර්ධනය ළඟා කර ගැනීම තුළ තුළ අලි ගහනය ආරක්ෂා කර ගැනීම වැනි මාතෘකා පිළිබඳ ව අවධනය යොමු කරනුයේ අවම වශයෙනි.

විශේෂයෙන් ම මෙම ගැටුම් උග්‍ර වීමට රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරිත්වය ද බලපා තිබේ. අලි ඇතුන් සංරක්ෂණය කිරීම සඳහා 2006 දී සම්මත කළ අලි සංරක්ෂණ හා කළමනාකරණ ප්‍රතිපත්තිය සමස්තයක් ලෙස ක්‍රියාත්මක මට්ටමෙන් පවතින අයුරු දක්නට නොලැබේ. විදුලි වැට ඉදි කිරීමට සාපේක්ෂ ව නඩත්තු කිරීමට එතරම් අවධානයක් යොමු නොකිරීම මෙහි දී සැලකිල්ලට ගත යුතු කරුණකි.

ඕනෑ ම ප්‍රදේශයක සංවර්ධනය ජෛව සමතුලනයට බාධා පමුණුවන්නේ නම් ළඟා කරගත් සංවර්ධනයට වඩා වැඩි පිරිවැයක් දැරීමට ප්‍රජාවට මෙන් ම රජයට ද සිදු වේ. එනිසා තිරසාර සංවර්ධන සංකල්පය පිළිබඳ ව පවතින අදහස් සැලකිල්ලට ගැනීම වැදගත් වේ. මේ සඳහා යෝජනා වශයෙන් අලි මිනිස් ගැටුමට විසඳුම් සෙවීමේ දී නිලධාරීන් ක්ෂේත්‍රයට ගොස් නිරීක්ෂණය කර සැලසුම් සකස් කිරීම, ප්‍රජාව හා අලි ඇතුන් යන කොට්ඨාස දෙක ම කෙරෙහි ම අවධානයට ලක් කර තීරණ ගැනීම, අලි වැට නඩත්තු කිරීමේ දී වන සතුන්ගෙන් වන උපද්‍රව මෙන් ම ප්‍රදේශවාසීන්ගේ අයහපත් ක්‍රියාකලාපයන් පාලනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, නිලධාරින් නිරන්තර අධීක්ෂණයට ලක් කිරීම, ප්‍රදේශවාසීන්ගේ යෝජනා හා අදහස් කෙරෙහි මෙන් ම පාරම්පරික ඥානය භාවිත කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් කොට සැලකිය හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රය


අතපත්තු, එන් (2012) අලි ඇතුන්ගේ සැගවුණු ලෝකය, කොළඹ, සූරිය ප්‍රකාශකයෝ.

අතපත්තු, එන් (2018) අවසාන කුංචනාදය, කොළඹ, සුසර ප්‍රකාශකයෝ.

අමරසේකර, ඩී (1997) සමාජ විද්‍යා විමර්ශන, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ද සිල්වා පද්මා කුමාරි (1998) ශ්‍රී ලංකාවේ වල් අලියාගේ අද තත්ත්වය, වල් අලි සංරක්ෂණය සහ මිනිස් - අලි ගැටුම ඌන කිරීම, සත්ත්ව විද්‍යා අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

නාගරික සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය - හම්බන්තොට, (2019-2020) හම්බන්තොට මහා නගර සභා සැලැස්ම - වෙළුම 1, නාගරික සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය, හම්බන්තොට.

වනජීවී සංරක්ෂණ වාර්තා (2013, 2014, 2015, 2016, 2017) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව.

විතාරණ, සරත් (2016) සංවර්ධනයඃ සංකල්පීය ගෙඩ නැඟීම සහ ක්‍රියාකාරිත්වය, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමා පොඩිමැණිකේ අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය ISBN 978-955-4563-71-1.

සජීව චාමිකර, (2019) හම්බන්තොට යෝජිත අලි කළමනාකරණ රක්ෂිතයේ ඉඩම් කට්ටි කර විකිණීමේ මහා ජාවාරමක්, ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය.

Batterbyry, Simon (2018) Political Ecology

Fernando P (2000) Elephants in Sri Lanka: past, present, and future. Loris 22:38-44.

Jayawardene, J (1994) The Elephant in Sri Lankan wildlife Heritage trust of Sri Lanka, Baththaramulla.

Jayawardene, J (1996) The Elephant Management and Conservation in the Mahaweli Project areas Gajan, Baththaramulla.




© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

Mahees. M. T. M (2012) 'සංවර්ධනය හා පාරිසරික දේශපාලනය' In Parlimentary Research Journal, Sri Jayawardanapura: Parliment of Sri Lanka.

Naughton. L. Rose, R. and Treves. A., 1999. The social dimension of human-elephant conflict in Africa: A literature review and case studies from Uganda and Cameroon. A eport to the African Elephant Specialist, Human-elephant Task, Conflict Task Force Group of IUCN, Glands, Switzerland.

Seers, D (1969) The Meaning of Development, IDS Communication 44, Brighton: IDS.

ප්‍රකාශ් ළහිරු (2022.03.31) ඉබාගාතේ යන ශ්‍රී ලංකාවේ අලි-මිනිස් ගැටුම් කළමනාකරණය retrieved from http://vivaranews.com/archives/45747 accessed on 1st November 2022.

ශ්‍රී ලංකාවේ අලි මිනිස් ගැටුම සම්බන්ධ විශේෂ විගණන වාර්තාව (2020) retrieved from http://www.auditorgeneral.gov.lk/web/images/special_report/2020/10_xv/Final-Report-Elephant-Conflict.pdf accessed on 02nd November 2022.

Fernando, Prithiviraj., Channa, M.K., De Silva, R., Jayasinghe, L.K.A., Janaka H.K and Jennifer Pastorini (2019) First country-wide survey of the Endangered Asian elephant: towards better conservation and management in Sri Lanka, Published online by Cambridge University Press retrieved from https://doi.org/10.1017/S0030605318001254 accessed on 30th November 2022.

Fernando, P, Lande, R (2000) Molecular genetics and behavioral analysis of social organization in the asian elephant (Elephas maximus) retrieved from https://www.frontiersin.org/articles/10.3389/fevo.2018.00235/full accessed on 03rd September 2022.

Fernando, P, and Pastorini, J (2011) Range-wide status of Asian elephants retrieved from http://www.ccrsl.org/userobjects/2602_662_Fernando-11-ElephantStatus.pdf accessed on 31st November 2022.

Mahees. M. T. M., Rajapaksha R. D. S. (2020) අලි මිනිස් ගැටුම වියලි කලාපයේ ජන ජීවිතයට හා පවුල් ඒකකයට සිදු කරන බලපෑම හා එය අවම කිරීමට සමාජ වෘත්තවේදී දායකත්වය, E-Journal of Social Work 2020 - 4 (2): 39-52 retrived from https://www.nisd.ac.lk/images/pdf/ejournal_2020_issue2/5_The_Impact_Of_Human_Elephant_Conflicts_On_The_Family_Life_Of_DryZone.pdf

Mariki, S. B., Svarstad, H., and Benjaminsen, T. A (2015) Elephants over the cliff: explaining wildlife killings in Tanzania retrieved from https://www.frontiersin.org/articles/10.3389/fevo.2018.00235/full accessed on 03rd November 2022.

MOEF (2010) Securing the Future for Elephants in India, New Delhi: Ministry of Environment and Forests (MOEF), Government of India retrieved from https://www.frontiersin.org/articles/10.3389/fevo.2018.00235/full accessed on 1st November 2022.



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දහතුන්වන කලාපය 2022 ජූනි
පිටු 11-22
ISSN 1800-1459 eISSN 2386-2041
© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වන සමෘද්ධි ව්‍යාපාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් : ගාල්ල දිස්ත්‍රික්කයේ නෙළුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්

# (An Investigative Study on the Inefficiency of the Samurdhi Movement in Rural Development in Sri Lanka: From Neluwa Divisional Secretariat, Galle District)

චාමර මධුෂාන්

දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**mkandabadage@gmail.com**

## Abstract

Although various development programs have been initiated for the welfare of the genaral public of this country since the time of the British colonial period, they have shown some growth after independence. With the attainment of universal suffrage in Sri Lanka, the beginning of representative democracy can be seen as a temptation to carry out the welfare of the people by the representatives. Therefore, the people's leaders did not have the opportunity to neglect the interests of the common people. Particular attention was paid to the rural population. Because it was the reason why the people got their votes in the elections and those votes were decisive. In the past, a large number of rural programs were implemented and some programs failed. However, the Samurdhi development program introduced by the government that came to power in 1994 has had some success but has failed to eradicate its intended poverty. This research could fine that the Samurdhi program has failed to achieve the real progress of due to the irregularities in the selection of Samurdhi recipients in the rural community, political interference, bureaucracy, negative attitudes of the Samurdhi beneficiaries, improper monitoring of the beneficiaries and lack of targeted programs. The research was conducted in four Grama Niladhari Divisions in the Neluwa Divisional Secretariat Division in the Galle District of the Southern Province of Sri Lanka for this purpose and about 100 Samurdhi recipient families were used for this purpose.

**Keywords**: Rural Programs, Poverty Alleviation Projects, Poverty, Samuddhi, Development

## සාරසංක්ෂේපය

බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ සිට ම මෙරට සාමාන්‍ය ජනයාගේ සුබසිද්ධිය උදෙසා සුබසාධන වැඩසටහන් ආරම්භ වූ අතර, නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ආරම්භ වීමත් සමඟ ජනතා සුබසාධනය වර්ධනය විය. එහි විශේෂයෙන් අවධානය යොමු වූයේ ග්‍රාමීය ජනතාව කෙරෙහි ය. එයට හේතුව මැතිවරණවල දී තීරණාත්මක සාධකය වූයේ ග්‍රාමීය ජනතා ඡන්ද බැවිනි. අතීතයේ ග්‍රාමීය වැඩසටහන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක වූ අතර ඇතැම් වැඩසටහන් අසාර්ථක විය. එහෙත් 1994 දී බලයට පැමිණි ආණ්ඩුව මඟින් හඳුන්වා දෙන ලද සමෘද්ධි සංවර්ධන වැඩපිළිවෙළ යම් සාර්ථකත්වයක් ලැබුව ද, දුප්පත්කම තුරන් වී නැත. එහෙයින් මෙම පර්යේෂණයේ ගැටලුව වූයේ ග්‍රාමීය ජනතාවගේ දුප්පත්කම තුරන් කිරීමට සමෘද්ධි සංවර්ධන වැඩසටහනට නොහැකි වූයේ ඇයි ද? යන්නයි. පර්යේෂණයේ අරමුණ වූයේ සමෘද්ධි සංවර්ධන වැඩසටහන අසාර්ථක වීමට බලපාන හේතු අධ්‍යයනය කිරීම ය. ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ නෙලුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම සේවා වසම් හතරක් තුළ සමෘද්ධිලාභී පවුල් 100 ක් ස්තරානුභූත නියැදුම් ක්‍රමය යටතේ තෝරාගත් අතර, විවෘත ප්‍රශ්නාවලියක් සහ සම්මුඛ සාකච්ඡා වැනි සමාජ විද්‍යාත්මක ක්‍රමවේද භාවිත කරමින් තොරතුරු රැස් කරන ලදී. ග්‍රාමීය සමාජයේ සමෘද්ධිලාභීන් තෝරා ගැනීමේ දී සිදුවන අකටයුතුකම්, දේශපාලන මැදිහත් වීම්, නිලධාරීවාදය, සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ සෘණාත්මක ආකල්ප, ප්‍රතිලාභීන්ගේ අධීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු නොවීම, ඉලක්කගත ව වැඩසටහන් නොමැති වීම සමෘද්ධි සංවර්ධන වැඩසටහන අසාර්ථක වීමට බලපා ඇති බව පර්යේෂණ අධ්‍යයනයෙන් සොයා ගැනීමට හැකි විය. එහෙයින් ග්‍රාමීය දුප්පත්කම තුරන් කිරීම උදෙසා හඳුන්වා දුන් සමෘද්ධි සංවර්ධන වැඩසටහන වර්තමානයේ ද ප්‍රධාන සුබසාධන වැඩසටහනක් වශයෙන් ක්‍රියාත්මක වුව ද සැබෑ ලෙස ම දුප්පත්කම තුරන් වී නොමැති බව නිගමනය කළ හැකි ය.

**කේන්ද්‍රීය වචන:** ග්‍රාමීය වැඩසටහන්, දිළිඳුකම පිටුදැකීමේ ව්‍යාපෘති, දිළිඳුබව, සමෘද්ධිය, සංවර්ධනය

## හැඳින්වීම

රටක සංවර්ධනය යන සංකල්පය අර්ථකථනය කිරීමේ දී ග්‍රාමීය සංවර්ධනය ඉතා ම වැදගත්කොට සැලකේ. සංවර්ධනය වෙමින් පවතින හා සංවර්ධනය නොවූ රටවල සංවර්ධන ක්‍රියාවලියක් හඳුන්වා දීමටත්, ඒවාට අවශ්‍ය පහසුකම් සලසා දීමටත් අවශ්‍ය තාක්ෂණය, දැනුම ලබා දීමටත් විවිධ රටවල් ඉදිරිපත් ව සිටී. යම් දෙයක ක්‍රමානුකූල වැඩිවීමක් නැතිනම් වෙනස් වීමක් ඔස්සේ එය උසස් තත්ත්වයකට පත්වේ නම් එහි දී වඩාත් හොඳ වර්ධනයක් හෙවත් සංවර්ධනයක් දක්නට ලැබේ. විශේෂයෙන් ම සංවර්ධනය පිළිබඳ ව අවධානයක් යොමු වන්නේ විසිවන ශතවර්ෂයේ දෙවන භාගයෙන් පසු ව ය. තෙවන ලෝකයේ රටවල යටත්විජිත සමයෙන් පසු එම ජන සමාජයන්හි ආර්ථික අභිවෘද්ධිය පිළිබඳ ව අවධානයට ලක් විය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) 1990 දී සිය මානව සංවර්ධන වාර්තාව මඟින් හඳුන්වා දුන් "මානව සංවර්ධන දර්ශකය" (Human Development Index) (හඳරාගම, 2011:14) ට අනුව සංවර්ධනය මැනීම සඳහා යොදා ගන්නා ලද මිනුම් වශයෙන් උපතේ දී ආයු අපේක්ෂාව, සාක්ෂරතා අනුපාතය සහ ආදායම් නිර්ණායක යන ප්‍රධාන නිර්ණායක තුනක් සැලකිය හැකි ය.

ග්‍රාමීය ජන සමාජවල දරිද්‍රතාවෙන් ජීවත් වන සුවිශේෂ ජන කණ්ඩායමක සමාජීය, ආර්ථික ජීවිතය වැඩි දියුණු කිරීම සඳහා සකස් වී ඇති ක්‍රමෝපායන් ග්‍රාමීය සංවර්ධනය ලෙස හඳුන්වනු ලැබේ. මේ තුළ අවධානය යොමු කරනු ලබන්නේ නිෂ්පාදන ඵලදායිතාව වැඩි කිරීම, වර්ධනය වන රැකියා වෘත්තීකයින් සහ ඉඩම්, ශ්‍රමය හා ප්‍රාග්ධනය ක්‍රියාවට නැගීම පිළිබඳ ව ක්ෂේත්‍රයන් ය (ජිනදාස, 2014). ග්‍රාමීය සංවර්ධනයෙහි කැපී පෙනෙන ලක්ෂණ දෙකක් වේ.

1. සංවර්ධන වැඩසටහන් අක්‍රමවත් ව විටින් විට දේශපාලන අවශ්‍යතා මත සැලසුම් කිරීම.
2. ඵලදායි නොවන ආකාරයෙන් ඒවා ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපායන් සකස් කිරීම.
   වශයෙන් එම ලක්ෂණ පෙන්වා දිය හැකි ය.

ග්‍රාමීය සංවර්ධනය යනු දරිද්‍රතාව අඩු කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන වෙනස්වීම් සිදු කිරීමේ ක්‍රියාවලියයි. ග්‍රාමීය ජන ප්‍රදේශයන්ගේ ජීවත් වන මිනිසුන්ගේ දැනුම හා නිර්මාණශීලීභාවය උපයෝගී කර ගැනීමෙන් ඔවුන්ගේ නිෂ්පාදනය වැඩි කර ජීවිතවල ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා මූලික සාධක දෙකක් අවශ්‍ය වේ.

1. සමාජ ආර්ථික යටිතල පහසුකම් සැපයුම.
2. දරිද්‍රතා සීමාවෙන් පහළ සිටින පවුල්වල ආදායම් මට්ටම ඉහළ නැංවීම.

දිළිඳුකම යනු සමාජයක ජීවත් වන එක් ජන කොටසක් එම සමාජයේ ම ජීවත්වන අනෙක් ජන කොටස් සමග සසඳා බැලීමෙන් හඳුනා ගන්නා වාස්තවික තත්ත්වයකි. දුගීකම ස්ථිතික තත්ත්වයක් ලෙසට හඳුනාගනු ලැබුව ද එය පරිභෝජනයට පමණක් (ආර්ථික දුෂ්කරතාවයකට) සීමාවූවක් නොවේ. දුගී පවුල් යනු යම් සමාජයක් තුළ ජීවත් වන අනෙක් ජන කොටස්වලට සාපේක්ෂ ව පිළිගත හැකි ජීවන තත්ත්වයක් පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් තරම් ආහාර, රෙදිපිළි, හිසට සෙවණක් හා මූලික සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට නොහැකි වූ කණ්ඩායමකි (රත්නායක, 2017).

ග්‍රාමීය සංවර්ධනය උදෙසා ශ්‍රී ලංකාවේ අවධානය කොතෙක් දුරට යොමු වී ඇත් දැයි සොයා බැලිය යුතු කාරණයකි. විශේෂයෙන් ම ශ්‍රී ලංකාව යනු නව්‍යමය පූර්ණ සංවර්ධිත තත්ත්වයන්ට පත් නොවුණු රාජ්‍යයකි. එහෙයින් ශ්‍රී ලංකාව තුළ දිළිඳුකම නැතිනම් දරිද්‍රතාව සමාජය තුළ මුල් බැසගෙන තිබේ. විශේෂයෙන් ම 1833 ප්‍රතිසංස්කරණය මඟින් ලංකාවේ වතු ක්ෂේත්‍රය ආරම්භ කරන අතර එමඟින් සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය බිඳ වැටිණ. එතැන් පටන් දිළිඳුකම සමාජය පුරා පැතිරී යන්නට විය. ශ්‍රී ලංකාවේ සුබසාධන වැඩපිළිවෙලවල් ආරම්භ වීම 1930 දශකයේ සිට ම සිදු විය. එනම් ලංකාවට සර්වජන ඡන්ද බලය ලබා දීමත් සමග නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ලංකාවේ ස්ථාපිත වූ අතර ඒ හරහා සුබසාධන වැඩපිළිවෙලවල් ආරම්භ විය. විශේෂයෙන් ම එය තව දුරටත් ශක්තිමත් වූයේ නිදහසින් පසුව ය.

සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවේ වැඩිවන ජනගහනයට සාපේක්ෂ ව ආර්ථික අභිවෘද්ධියක් ළඟා කරගත නොහැකි වීමත්, කුටුම්භ ඒකක ගණන වැඩි වීමත් නිසා කුටුම්භ වියදම් වැඩි වීමත් සිදු විය. එහෙයින් ඉතුරුම් ශීඝ්‍රයෙන් පහළ යාම නිසා ආයෝජනය කෙරෙහි ඇති කරන සෘණාත්මක බලපෑම හේතුවෙන් නැවත නිෂ්පාදන හා ආර්ථික අභිවෘද්ධියේ පසුබෑමක් ඇති විය. මේ අනුව රජයක් ලෙස කළ යුතු ව ඇත්තේ ජනතාව හෙවත් ප්‍රජාවගේ ආර්ථික විෂමතාවන් හඳුනා ගනිමින් ඒ සඳහා ප්‍රතිපත්ති ගොඩනගා ප්‍රජා සංවර්ධනය කිරීමයි. ප්‍රජා සංවර්ධනය යනු අලුත් දෙයක් නොවන අතර එය පුරාණයේ සිට භාවිතයේ යෙදුන සේවාවකි. සමූහය, රංචුව හා කණ්ඩායම් යනාදි විවිධ නම්වලින් පුද්ගලයන් තමන්ගේ ඕනෑ එපාකම් සඳහා ඒකරාශී වී ඇත. එපමණක් ද නොව පුරාණ මානව ප්‍රජාව එමඟින් ලබාගෙන ඇති ජයග්‍රහණයන් ද සුවිශාල ය (ජයසිංහ, 2014:28).

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය පිළිබඳ ව 2020 මහා බැංකු වාර්තාවට අනුව, ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය වන ශ්‍රම බලකාය, 2019 වසරේ වාර්තා වූ මිලියන 8.592 සිට, 2020 වසරේ දී මිලියන 8.467ක් දක්වා පහළ වැටුණි. එය 2021 වන විට 8.553 ක් බව 2021 මහා බැංකු වාර්තාවේ සඳහන් වේ. ඒ අනුව, ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනය 2019 වසරේ වාර්තා වූ මිලියන 7.832 සිට, 2020 වසරේ මිලියන 8.273ක් දක්වා ඉහළ ගියේ ය. ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනයේ සැලකිය යුතු වර්ධනය සඳහා රැකියා අහිමි වූ පුද්ගලයන්ට රැකියාවක නියුතු වීමට ඇති අවස්ථා හෝ රැකියා අවස්ථා සක්‍රීය වශයෙන් සෙවීමට ඇති අවස්ථා තාවකාලික ව අහිමි වීම ඊට හේතු විය. රැකියාවක නියුතු වීමට දක් වූ උනන්දුවක් නොමැති ස්වභාවය සඳහා, කොවිඩ්-19 වසංගතය


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පැතිරීම වැළැක්වීම සඳහා පැන වූ සංචරණ සීමා, නව රැකියා අවස්ථා අඩුවීම හේතුවෙන් ඇති වූ අධෛර්යමත් වීම් සහ වසංගතය පැතිරීමත් සමඟ ඇති වූ සෞඛ්‍යමය අවධානම බොහෝ දුරට හේතු විය.

ශ්‍රී ලංකාවෙහි මන්දපෝෂණය වැනි විවිධ පෝෂණ ඌණතාවලින් පෙළෙන පවුල් ග්‍රාමීය මට්ටමින් දැකිය හැකි වුව ද නාගරික වශයෙන් එම තත්ත්වයේ වෙනසක් දැකිය හැකි ය. එයට හේතුව වන්නේ ඔවුන් අතර ආහාර සඳහා වැය කරන මුළු මුදල පැහැදිලි නොවන බැවිනි. උපකල්පනය කළ හැක්කේ නාගරික පුද්ගලයින් නිවසින් බැහැර ව ගොස් ආහාර ගනු ලබන ප්‍රමාණය ඉහළ යාම බවයි.

විශේෂයෙන් ම අතීතයේ අරගලකාරී තත්ත්වයෙන් අලාභහානි සිදු වූ උතුරු නැගෙනහිර ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කළ ද ඒවා එතරම් හොඳින් සාර්ථක වූ බවක් නොපෙනේ. විශේෂයෙන් ම ග්‍රාමීය ජනතාව සවිබල ගැන්වීම, දිළිඳු සහන වැඩසටහන්, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නගා සිටුවීම වැනි දෑ මගින් අපේක්ෂා කරන ලද්දේ සංවර්ධන ක්‍රියාදාමයකි.

2020 කොවිඩ් ව්‍යසනය හේතුවෙන් ලංකාවේ පසුගිය වසරට සාපේක්ෂ ව ආර්ථික තත්ත්වය 3.6% කින් පහත වැටී තිබේ. එය කුටුම්භ ආදායම් කෙරෙහි අහිතකර ලෙස බලපාමින්, සේවා වියුක්ති අනුපාතිකය, 2009 වසරින් පසුව වාර්තා වූ ඉහළ ම අගය වන සියයට 5.5ක් දක්වා ඉහළ ගිය අතර, ප්‍රධාන වශයෙන්, ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්වයේ පහළ යෑම හේතුවෙන් ශ්‍රම බලකාය සැලකිය යුතු ලෙස පහළ ගියේ ය. කෘෂිකර්මාන්තය තුළ 2019 වසරේ දී වාර්තා කළ සියයට 1.0ක වර්ධනයට සාපේක්ෂ ව 2020 වසරේ දී සියයට 2.4ක පහත වැටීමක් වාර්තා කරන ලදී (මහබැංකු වාර්තාව, 2020). 2021 වසර වන විට කෘෂි කර්මාන්තයෙන් නියලෙන පිරිස 27.3%කි. රසායනික ද්‍රව්‍ය නොලැබීම, කෘෂිකර්මාන්තයේ යම් පසුගාමී ස්වභාවයක් පෙන්නුම් කිරීමට බලපා තිබේ (මහා බැංකු වාර්තාව, 2021).

ශ්‍රී ලංකාව තුළ නාගරික සමාජය ඉක්මවා ගිය ග්‍රාමීය ජනතාවක් සිටීම මත ග්‍රාමීය දිළිඳුකම වර්ධනය වී ඇති බව පැහැදිලි ය. ලංකාවේ ග්‍රාමීය දිළිඳුකම තුරන් කිරීම සඳහා විවිධ වැඩසටහන් අතීතයේ සිට ම ක්‍රියාත්මක වූ බව පෙනේ. විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ 1930 දශකයෙන් පසු ව විවිධ සුබසාධන වැඩපිළිවෙලවල් මඟින් ග්‍රාමීය ජනතාව නගා සිටුවීමක් දක්නට ලැබුණි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධන හා ග්‍රාමීය දිළිඳුකම තුරන් කිරීම සඳහා හඳුන්වාදුන් වැඩ සටහන් අතර, ග්‍රාම සංවර්ධන වැඩසටහන් (1948), ආයතනික ප්‍රතිසංස්කරණ වැඩසටහන (1950), ජනසවිය වැඩසටහන (1989 - 1995) සහ ගැමි දිරිය (2004), දිවිනැගුම (2012) වැනි වැඩසටහන් වැදගත් වේ.

නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීමේ ක්‍රියාමාර්ග හරහා මූලික ව ම අරමුණ වූයේ ඉඩම් හිඟය සඳහා විසඳුම් ලබා දීම හා ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීමයි. වක්‍ර බලාපොරොත්තුව වූයේ දුගීකම සඳහා විසඳුම් සෙවීමයි. 1960න් පසු කෘෂිකර්මාන්තය සඳහා නවීන තාක්ෂණය යටතේ බීජ හඳුන්වා දීම, නව යන්ත්‍ර සූත්‍ර භාවිතය හඳුන්වා දීම මෙමගින් සිදුවිය. ග්‍රාම සංවර්ධන වැඩසටහන් මඟින් සිදු වූයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අවධානය යොමු කිරීමයි. විශේෂයෙන් ම 1973 දී දිස්ත්‍රික් මට්ටමින් ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති දියත් කිරීමත් සිදු කර තිබේ. ආයතනික ප්‍රතිසංස්කරණ වැඩසටහන මඟින් (1950) සිදු වූයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමයි. විශේෂයෙන් ම මෙහි දී සිදු කරනු ලැබුවේ අඳගොවි පනත හඳුන්වා දීමයි. මෙමඟින් දරිද්‍රතාවෙන් පෙළෙන සමාජ අසාධාරණයන්ට ලක්වන අඳගොවියන්ගේ අයිතිය රැක ගැනීමක් සිදු කර ඇත.

ශ්‍රී ලංකාවේ දුගීබව ඉලක්ක කරගත් වැඩසටහන් ලෙස ආහාර සහනාධාර වැඩසටහන්වලට සුවිශේෂ වැදගත් තැනක් හිමි වේ. මෙවැනි වැඩසටහන් බොහෝමයක් මඟින් අපේක්ෂා කළේ ග්‍රාම සංවර්ධනයයි. 1939 දී වියළි සලාක ලෙස සහල් ලබා දී ඇති අතර ම මේ නිසා ම දිළිඳුබව සඳහා යම් සහනාධාරයක් ලබා දීමත් සිදුකර ඇත. මෙයට අමතර ව ජනසවිය වැඩසටහන ලංකාවේ 1989 - 1995 කාලය තුළ ක්‍රියාත්මක කරන ලද්දේ ග්‍රාමීය දිළිඳුකම තුන් කිරීමේ අරමුණෙනි. මෙමඟින් විරැකියාව සහ මන්දපෝෂණය අඩු කිරීම සඳහා වැදගත් යෝජනා ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් අතර දිළිඳුකම තුරන් කිරීම සඳහා හඳුන්වා දෙන සුවිශේෂ වැඩසටහන වූයේ සමෘද්ධි වැඩසටහනයි. දුප්පත්කම අවම වූ ලංකාවක් ගොඩනැගීම යන තේමාව පදනම් කොට ගත් සමෘද්ධි වැඩසටහන, සමෘද්ධි කොමසාරිස් දෙපාර්තමේන්තුව හා 1995 අංක 30 දරණ සමෘද්ධි අධිකාරී පණත යටතේ ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය විසින් 1996 පෙබරවාරි 1 දින සිට ක්‍රියාත්මක කරනු ලැබී ය.

1994 දී බලයට පත් වූ රජය විසින් ඒ දක්වා ක්‍රියාත්මක වූ ජනසවිය වැඩසටහන වෙනුවට සමෘද්ධි වැඩසටහන ඉදිරිපත් කරන ලදී. ජනසවිය වැඩසටහනේ පැවති දුර්වලතා මඟහරවා ගනිමින් ඵලදායී ප්‍රතිඵල අත්පත් කර ගැනීම සඳහාත්, විශේෂයෙන් ම ග්‍රාමීය සංවර්ධනය මෙන් ම ග්‍රාමීය දිළිඳුබව තුරන් කිරීමේ විශේෂ අරමුණ මේ තුළ ගැබ් ව තිබුණි. විශේෂයෙන් ම 2005 වසරේ දී විශාල වශයෙන් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් හඳුන්වා දෙමින් ඒ සඳහා ශ්‍රම දායකත්වය සමෘද්ධි ලාභීන්ගෙන් ලබා ගන්නා ලදී. සමෘද්ධි වැඩසටහන මුල් කාලීන ව වැඩසටහන් 4ක් මූලික කොට ගනිමින් ක්‍රියාත්මක විය.

1. සහනාධාර වැඩසටහන - අඩු ආදායම්ලාභී පවුල් සඳහා එදිනෙදා අත්‍යවශ්‍ය ආහාර මිලට ගැනීමට මාසික දීමනාවක් ලබා දීම.
2. සමාජ ආරක්ෂණ වැඩසටහන - මුදල් ආධාර, වියළි සලාක පෝෂණ වැඩසටහන්, ආපදා වැඩසටහන්
3. ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති - ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති, ජල සම්පාදන ව්‍යාපෘති


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

4 බැංකු සංගම් ව්‍යාපෘති - දිළිඳු ජනයාගේ ඉතුරුම් ශක්‍යතාව වර්ධනය, ණය පහසුකම් ලබාදීම

2021 වසර වන විට දරිද්‍රතාව හෙවත් දිළිඳුකම තුරන් කිරීම අරමුණු කරගෙන දුප්පත් ජනතාව සවිබල ගැන්වීම උදෙසා මෙම සමෘද්ධි වැඩසටහන යටතේ සමෘද්ධිලාභීන් 1,760,485ක් තෝරාගෙන තිබෙන අතර ඒ සඳහා වැය වූ වියදම රුපියල් මිලියන 55,400 කි (මහාබැංකු වාර්තාව, 2021). මෙම වැඩසටහන මගින් විවිධ කමිටු ඇති කරමින් සාමාජිකයින්ට ණය පහසුකම්, සහනාධාර, ඉතිරි කිරීම් යනාදි පහසුකම් සලසා දෙමින් සමාන්‍ය දුගී ජනයාගේ ජීවන තත්ත්වය ඉහළ දැමීමට කටයුතු කරනු ලැබේ. එහෙත් විවිධ ක්‍රමෝපායන් හඳුන්වා දෙනු ලැබුවත්, සෑම වර්ෂයක දී ම සමෘද්ධිලාභීන් පිරිස වැඩි වීම, දීර්ඝ කාලීන ව සමෘද්ධිලාභියෙකු වුවත් ඔවුන් නිසි පරිදි අධීක්ෂණයකට ලක් නොවීම, නුසුදුසු පිරිස් වෙත සමෘද්ධි ප්‍රතිලාභය හිමි වීම යනාදී ප්‍රායෝගික ගැටලු රාශියක් මෙමගින් උද්ගත වී තිබේ. වර්තමානය වන විට සමෘද්ධි වැඩසටහන තුළ විවිධ තනතුරු දරමින් නිලධාරින් 27000කට අධික පිරිසක් සේවයෙහි නිරත වෙති. මෙමගින් තහවුරු වන්නේ සමෘද්ධිලාභීන් 63 දෙනෙකු සඳහා එක් නිලධාරියකු සිටින බවයි. එක් නිලධාරියකුගේ මාසික වැටුප (දීමනා සහිතව) රුපියල් 40000 ක් ඉක්මවයි. සමෘද්ධි වැඩසටහන් තුළ අපේක්ෂිත අරමුණු 1997 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි පණතේ විස්තර කර ඇත. තරුණයින් ස්ත්‍රීන් හා අවාසි සහගත තත්ත්වයකට පත් ව ඇති කණ්ඩායම්වල ආර්ථික සහ සමාජීය තත්ත්වය වැඩි දියුණු කිරීම එහි ප්‍රධාන අරමුණ විය. එයට අමතර ව ඔවුන්ගේ ආදායම් මාර්ග කිරීම සහ රැකියා අවස්ථා පුළුල් කිරීම, සමෘද්ධිලාභීන් ව ආර්ථික හා සමාජීය සංවර්ධන කටයුතුවලට සම්බන්ධ කර ගැනීම, පවුල් මට්ටමේ ආර්ථික කටයුතු ප්‍රජා ව්‍යාපෘති සමග ගම්, දිස්ත්‍රික්, ප්‍රදේශීය සහ පළාත් මට්ටමින් සම්බන්ධ කිරීම, ඔවුන්ගේ අභිවෘද්ධිය සඳහා ව්‍යාපෘති සහ යෝජනා ක්‍රම සැලසුම් කිරීම හා කළමනාකරණය කිරීම, ඔවුන් අතර සහයෝගීතාව ඇති කිරීම, ඔවුන් අතර ඉතිරි කිරීම් වර්ධනය කිරීම හා ණය පහසුකම් ලබා ගැනීමට ඔවුන්ට සහාය දීම යනාදිය අනෙකුත් සෙසු අරමුණු වේ. එහෙත් මෙම අරමුණු වර්තමානයෙහි ප්‍රායෝගික ව සිදු නොවීමේ ප්‍රවණතාවක් දැකිය හැකි ය. එහෙයින් සමෘද්ධි සංවර්ධන වැඩසටහනෙහි ක්‍රියාකාරීත්වය පිළිබඳ ව සිදු කරනු ලැබූ පර්යේෂණයක් වශයෙන් මෙම පර්යේෂණය හැඳින්විය හැකි ය.

## සාහිත්‍ය විමර්ශනය

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සමෘද්ධි වැඩසටහන සම්බන්ධයෙන් විවිධ අධ්‍යයනයක් සිදු කර තිබුණත්, ප්‍රායෝගික ව එම වැඩසටහනේ පවතින දුර්වලතා කෙරෙහි අවධානය යොමු කර ඇත්තේ අවම වශයෙනි. විශේෂයෙන් ම සමෘද්ධිලාභීන් තෝරා ගැනීමේ දී ඇතිවන ගැටලු, නිලධාරීවරුන්ගේ අකාර්යක්ෂමතාව, සමෘද්ධිලාභීන් අධීක්ෂණය කිරීමේ වැදගත්කම, සමෘද්ධිලාභීන්ගේ ආර්ථික පැවැත්ම පිළිබඳ ව අධීක්ෂණය කිරීම යනාදිය සම්බන්ධයෙන් අවම අවධානයක් එම අධ්‍යයනයන් මගින් සිදුකර තිබේ.

2015 වර්ෂයෙහි තුළ සන්නිවේදන දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන ලද "සටහන" නැමති ශාස්ත්‍රීය සංග්‍රහය තුළ ගෝලීය වශයෙන් සහ ලංකාව තුළ පවත්නා දරිද්‍රතාව පිළිබඳ ව අවධානය යොමුකර තිබේ. ගෝලීය වශයෙන් ගත්විට අන්ත දුගී ජනගහනයක් වැඩි වශයෙන් ජීවත් වන්නේ ආසියාතික කලාපයේ සහ උප - සහරා අප්‍රිකා කලාපය තුළ ය. එනම් 80%ක් පමණ ජනගහනයක් මෙම කලාප තුළ ජීවත් වෙති. 2011 වන විට ලෝකයේ බිලියනයක් පමණ වූ දුගී ජනතාවෙන් 60%ක් පමණ ජීවත් වන්නේ ඉන්දියාව, නයිජීරියාව, බංගලාදේශය, චීනය හා කොංගෝව යන රටවල් තුළ ය (The Millennium Development Goals Report 2015, United Nations). තවදුරටත් එම අධ්‍යයනය මගින් ලංකාවේ දුගීභාවය පිළිබඳවත් අවධානය යොමුකර ඇති අතර නිදහසින් පසු නව ආණ්ඩු මගින් හඳුන්වා දෙන ලද සුබසාධන ප්‍රතිපත්ති මගින් දරිද්‍රතාවට යම් පිටිවහලක් සැපයුන බව ඉන් සඳහන් වේ. නමුත් සමෘද්ධි වැටසටහන පිළිබඳ ව දීර්ඝ වශයෙන් අවධානයක් එමගින් යොමු නොවුණි.

2013 වසරේ දී මයාදුන්නේ සහ රොමේෂන් යන පර්යේෂකයන් දෙදෙනා විසින් "නාගරික දරිද්‍රතාව මැනීම සඳහා ශ්‍රී ලංකාවේ භාවිත කරන මිනුම්වල යෝග්‍යතාවය" කොළඹ නගරයේ සිද්ධි අධ්‍යයනක් ලෙසින් පර්යේෂණයක් සිදුකොට ඇත. මෙමගින් නාගරික දරිද්‍රතාව මැනීම සඳහා භාවිත කරන මිනුම්දඬු පිළිබඳ ව, දරිද්‍රතාව සම්බන්ධයෙන් ඇති මූල්‍ය ප්‍රවේශයන්, පෝෂණය හා එහි විලායන් පදනම් කොටගත් දරිද්‍රතා මට්ටම්, නාගරික දරිද්‍රතාවයන්ට බලපාන සාධක පිළිබඳව අධ්‍යයනය කර තිබීම වැදගත් වුවත්, ග්‍රාමීය දරිද්‍රතාව පිළිබඳ ව සහ සමෘද්ධි ව්‍යාපාරය පිළිබඳ ව අවධානය යොමුකර ඇත්තේ අවම වශයෙනි.

2016 වර්ෂය තුළ හේරත් විසින් "ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටු දැකීම සඳහා සමෘද්ධි ව්‍යාපාරයේ දායකත්වය" පිළිබඳ ව පර්යේෂණයක් සිදුකර ඇති අතර එමගින් ග්‍රාමීය සංවර්ධනයට සමෘද්ධි ව්‍යාපාරය කොතරම් දායක වී තිබේ ද යන්න පිළිබඳ ව අධ්‍යයනය කර තිබීම වැදගත් ය. එහෙත් ප්‍රායෝගික ව සමෘද්ධිලාභින් තෝරා ගැනීම පිළිබඳ ගැටලු, නිලධාරීන්ගේ ගැටලු පිළිබඳව අවධානය යොමු කර ඇත්තේ සීමිත අයුරිනි.

2016 වර්ෂය තුළ ජයසිංහ විසින් "මෑතකාලීනව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන දිළිඳුබව පිටුදැකීමේ ව්‍යාපෘති යනුවෙන්" අධ්‍යයනයක් සිදුකර ඇති අතර එමගින් ලංකාවේ දිළිඳුබව තුරන් කිරීම සඳහා පැවති විවිධ ව්‍යාපෘති සම්බන්ධයෙන් අවධානය යොමුකර තිබේ. ආහාර මුද්දර ක්‍රමය, ජනසවිය, ජනසවිය භාරකාර අරමුදල, සමෘද්ධිය, දිවිනැගුම, ගැමිදිරිය යනාදි ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් පිළිබඳව අවධානය යොමු කළත් ග්‍රාමීය සමාජයේ දිළිඳුබව තුරන් කිරීම සඳහා සමෘද්ධි වැඩසටහන දක්වන


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දායකත්වය සම්බන්ධයෙන් දක්වා ඇත්තේ අඩු අවධානයකි. එමෙන් ම සමෘද්ධි නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව, සමෘද්ධිලාභීන්ව අධීක්ෂණය කිරීමේ වැදගත්කම සම්බන්ධ ව අඩු අවධානයක් යොමුකර තිබේ. එහෙයින් එම රික්තකය මෙම පර්යේෂණය මඟින් අවම කිරීමට හැකියාව ලැබිණ.

## පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දිළිඳුබව තුරන් කිරීම උදෙසා විවිධ සංවර්ධන වැඩසටහන් මීන් පෙර හඳුන්වා දෙනු ලැබුවත්, වර්තමානයේ දී සමෘද්ධි සංවර්ධන වැඩසටහන ප්‍රධානත්වයක් හිමි කරගනී. එහෙත් ලංකාවේ ග්‍රාමීය දිළිඳුබව දිනෙන් දින වර්ධනය වීමක් දැකිය හැකි ය. 2019 වසරේ දී දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත්වන ජනගහනය 14.3% කි. යාවත්කාලීන කරන දරිද්‍රතා රේඛාවට අදාළ ව, දරිද්‍රතා රේඛාවට පහළින් පුද්ගලයෝ මිලියන 3.04ක් සිටිති. එය 2002 වසරට වඩා 4.4% ක වැඩි වීමකි. ඒ තුළ ග්‍රාමීය ජනතාව 16.6%ක් සිටින අතර, වතු ජනතාව 51.3%ක් සිටිති. 2019 වසරේ ගෘහ ඒකක අදායම් හා වියදම් සමීක්ෂණයට අදාළ ව දළ වශයෙන් ශ්‍රී ලාංකික පුද්ගලයින් හය දෙනෙකුගෙන් එක් අයෙකු දරිද්‍රතාවයට අදාළ බහුවිධමානයන්ට අනුව දුප්පත් වේ. එමෙන් ම 2017 සිට 2021 දක්වා විවිධ සුබසාධන වැඩසටහන්වල ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව ද වර්ධනය වී තිබේ. 2017 වසරේ දී 1,388,242ක් ද 2018 වසරේ දී 1,384,021ක් ද, 2019 වසරේ දී 1,800,182ක් ද, 2020 වසරේ දී 1,770,086ක් ද සහ 2021 වසරේ දී 1,760,485ක වශයෙන් සුබසාධන ප්‍රතිලාභීන්ගේ වර්ධනයක් දැකිය හැකි ය (මහාබැංකු වාර්තාව, 2021). එබැවින් සමෘද්ධි වැඩසටහන මඟින් අපේක්ෂා කළ ඉලක්ක සම්පූර්ණ වූවානම් දරිද්‍රතාව මෙලෙස වර්ධනය නොවේ. එබැවින් මෙම පර්යේෂණයේ ගැටලුව බවට පත් වූයේ ග්‍රාමීය සංවර්ධනය හා සුබසාධන වැඩසටහනක් ලෙස සමෘද්ධි සංවර්ධන වැඩසටහන සාර්ථක වී තිබේ ද? යන්නයි.

## පර්යේෂණ අරමුණු

### ප්‍රධාන අරමුණ

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දිළිඳුබව තුරන් කිරීමේ අරමුණින් හඳුන්වා දෙන ලද සමෘද්ධි සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳව අධ්‍යයනය කිරීම.

### උප අරමුණු

- වර්තමානයේ සමෘද්ධිලාභීන් තෝරා ගන්නා ආකාරය අධ්‍යයනය කිරීම හා එහි දුර්වලතා අධ්‍යයනය කිරීම.
- සමෘද්ධිලාභීන් අතර සමෘද්ධිය ලබා දීමේ දී ඇති වන ගැටලු හඳුනා ගැනීම.
- නිලධාරි යාන්ත්‍රණයේ පවතින ගැටලුකාරීත්වය හඳුනා ගැනීම.

## පර්යේෂණයේ වැදගත්කම

ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් අතර ප්‍රධාන ම වැඩසටහන සමෘද්ධි සංවර්ධන වැඩසටහනයි. එමගින් සමෘද්ධිලාභීන්ට කොරෝනා වසංගතය සහ පවතින ආර්ථික අර්බුදතාව තුළ බොහෝ සහන සැලසුණි. එමෙන් ම රජය මඟින් ගන්නා ලද දිළිදු සහන ව්‍යාපෘතිවල ප්‍රධාන තැනක් හිමි වන්නේ ද සමෘද්ධි ප්‍රතිලාභීන්ට ය. එනිසා මෙම වැඩසටහන යාවත්කාලීන කළ යුතු වේ. මන්ද යත් දැනට සමෘද්ධි ප්‍රතිලාභය හිමිකර දෙන නිර්ණායක සහ සමෘද්ධි නිලධාරීන්ගේ මෙන් ම සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ප්‍රගතිය සමාලෝචනය කළ යුතු ය. ඇතැම් විට සමෘද්ධි ප්‍රතිලාභය ලබන්නන් දිළින්දන් නොවේ. තවත් විටක සමෘද්ධිය ලැබිය යුතු පිරිසට එය හිමි වී නැත. එනිසා මෙම පර්යේෂණය තුළ අවධානය යොමු කරන්නේ සාර්ථක ව සමෘද්ධි සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් ග්‍රාමීය ජනතාව සවිබල ගන්වා දිළිදුභාවය අඩු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳවයි. සුබසාධනය, සංවර්ධනය පිළිබඳව බොහෝ අධ්‍යයනයක් සිදුකර තිබුණත්, ග්‍රාමීය ජනතාවගේ සුබසාධනය සඳහා සමෘද්ධි වැඩසටහන ඵලදායිතාවයකින් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම මෙම පර්යේෂණය මඟින් පෙන්වා තිබීම වැදගත්කොට සැලකිය හැකි ය.


## පර්යේෂණ ක්‍රමවේදය

### අධ්‍යයන ප්‍රදේශය

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ නෙළුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම සේවා වසම් 34ක් පවතින අතර, මෙම අධ්‍යයනය සඳහා යොදාගනු ලැබුවේ මාවිට බටහිර, දනවල, ඉහළ මද්දේගම සහ කොස්වත්ත යන ග්‍රාමසේවා වසම් හතර වේ. මෙම ප්‍රදේශය තුළ ජීවත්වන බොහෝ ජනතාව තේ වගාව තම ජීවනෝපාය කරගෙන ජීවත් වෙති. එමෙන් ම අමතර අදායම් වශයෙන් රබර්, කුරුඳු, ගම්මිරිස් වගා කරන්නෝ ද වෙති. බොහෝමයක් අය තම වගාවට අමතර ව කුලී රැකියාවල නිරත වෙති. ඇතැම් ජනයාට ඉඩකඩම් නොමැත. ඔවුහු කුලී රැකියාවලින් පමණක් යැපෙති. ඇතැමුන්ට සමෘද්ධි ආධාර හිමි වේ. ඇතැම් පවුල් රණවිරු පවුල් ය. සාමාන්‍යයෙන් බොහෝ ගෙවල්වල ගෙවතු වගාව යම් ප්‍රමාණයකට කෙරේ. මෙවැනි සමාජ තත්ත්වයක් සහිත ඉහත ග්‍රාමසේවා වසම් හතරක් මෙම පර්යේෂණයට යොදා ගන්නා ලදී.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**සිතියම් අංක 01 - අධ්‍යයන ප්‍රදේශයේ සිතියම**




(මූලාශ්‍රය : මිනුම්දොරු දෙපාර්තමේන්තුවේ අංකිත දත්ත ඇසුරින්)

**නියැදිය**

නෙළුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පවුල් 8502ක් සිටින අතර එහි ආදායම් බෙදී ගොස් ඇති ආකාර වන්නේ, මාසික ආදායම 6,000 හෝ ඊට අඩු, 6,000 - 12,000 දක්වා, 12,000 - 20,000 දක්වා, 20,000 - 50,000 දක්වා, 50,000 -70,000 හෝ ඊට වැඩි යනාදී වශයෙනි (සම්පත් පැතිකඩ - නෙළුව ප්‍රදේශීය ලේකම් කාර්යාලය, 2021). මෙම කොටස් අතුරින් අඩු ආදායම්ලාභී, සමෘද්ධිය ලබන පවුල් 100ක් මෙම පර්යේෂණය සඳහා යොදා ගත් අතර එමගින් ලැබුණු තොරතුරු මත මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

**දත්ත රැස් කිරීම**

1 ප්‍රාථමික දත්ත

අධ්‍යයනය සඳහා අපේක්ෂිත සමස්ත නියැදිය පූර්ණය කරගනු සඳහා දත්ත දායකයින් 100 තෝරා ගත් අතර, නියැදියට අනුව තොරතුරු ලබාගැනීමේ දී ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය වැනි සමාජ විද්‍යාත්මක ක්‍රමවේද භාවිත කෙරිණ. මෙහි දී විවෘත ප්‍රශ්න මාලාවක් සකස් කර එය 100ක් වූ දත්ත දායකයින්ට ලබා දී තොරතුරු ලබාගන්නා ලදී.

2 ද්විතීයික දත්ත

දත්ත එක්රැස් කිරීමේ දී ජන හා සංඛ්‍යා ලේඛන වාර්තා ආදී රාජකාරීමය ලේඛන භාවිතයට ගැනුණු අතර ඊට අමතර ව න්‍යායාත්මක තොරතුරු ඇතුළත් ග්‍රන්ථ, සඟරා, අන්තර්ජාල ලිපි සහ පුවත්පත් ලිපි ආදී ද්විතීයික මූලාශ්‍රය භාවිත කරමින් පර්යේෂණයට අදාළ තොරතුරු ලබාගැනීම සිදු කරන ලදී.

**දත්ත විශ්ලේෂණය**

පර්යේෂණයට අදාළ ව ලබාගත් තොරතුරු විශ්ලේෂණය කිරීමේ දී ප්‍රමාණාත්මක ක්‍රමවේදයන් භාවිත කරන ලදී. ඔහි දී දත්ත විශ්ලේෂණය සඳහා සංඛ්‍යානමය (Statistical) විධික්‍රමය යටතේ Ms EXCEL මෘදුකාංගය භාවිත කළ අතර සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රම ශිල්ප එනම් සංඛ්‍යා, ප්‍රතිශත, දත්ත වගු සහ ප්‍රස්තාර සටහන් භාවිත කරමින් විශ්ලේෂිත දත්ත නිරූපණය සිදු කෙරිණ. ගුණාත්මක දත්ත විශ්ලේෂණයේ දී ප්‍රමාණාත්මක වශයෙන් විග්‍රහ කළ නොහැකි දත්තයන් ගුණාත්මක ප්‍රවේශය යටතේ විග්‍රහ කළ අතර, රැස් කරගනු ලැබූ දත්ත තුළ ගැබ්වී ඇති ගුණාත්මක අගයන් ඉස්මතු කිරීම සඳහා විස්තරාත්මක ප්‍රවේශය භාවිත කරනු ලැබී ය.

**සංඛ්‍යාත්මක දත්ත විශ්ලේෂණය**

මෙම පර්යේෂණයේ දී ප්‍රතිචාර දැක්වූ බහුතරය වූයේ අවුරුදු 40 - 49 අතර සිටි පිරිස් ය. ඒ සඳහා ප්‍රතිචාර දැක්වූ පුරුෂයින්ගේ සංඛ්‍යාව ඉහළ යාමක් සිදු විය. එය 53%ක් වූ අතර, ස්ත්‍රීන් ප්‍රමාණය 47% කි. ප්‍රතිචාර දැක්වූ බහුතරයක් විවාහක වූ අතර, මෙම ප්‍රදේශවල අඩු අධ්‍යාපන මට්ටමේ බහුතරයක් සිටින බව හඳුනාගත හැකි විය.

මෙම පර්යේෂණය සඳහා විවෘත ප්‍රශ්නාවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ නෙළුව ප්‍රදේශීය මෙම පර්යේෂණය සඳහා විවෘත ප්‍රශ්නාවලි ක්‍රමය සහ


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය


සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධිලාභී පවුල් 100ක් (කාන්තාවන් 47 දෙනෙකු සහ පුරුෂයන් 53 දෙනෙකු) තොරතුරු සපයන ලදී. අධ්‍යයනය සඳහා තොරතුරු ලබා දීමට පුරුෂ පාර්ශවය දැඩි උනන්දුවකින් පසු වූ බව දැකගත හැකි විය. එම තොරතුරුවලට අදාළ ව මෙම අධ්‍යයනය සිදු කෙරිණ.

**වගු අංක 01 - නියැදියේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ව්‍යාප්තිය**

| ස්ත්‍රී පුරුෂ භාවය | ප්‍රතිචාර දැක්වූ අය |
|---|---|
| ස්ත්‍රී | 47 |
| පුරුෂ | 53 |
| එකතුව | 100 |

මූලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022)

**ප්‍රස්තාර අංක 01 - නියැදියේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ව්‍යාප්තිය**




මූලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022)


අංක 01 වගුවෙහි දත්ත අනුව අධ්‍යයනය සඳහා ස්ත්‍රීන් 47%ක් තොරතුරු සැපයූ අතර පුරුෂ පාර්ශවය 53%ක් තොරතුරු ලබා දීමට කටයුතු කරන ලදී. ඒ අනුව තොරතුරු සැපයූ බහුතරය පුරුෂ පාර්ශවයයි.

**වගු අංක 02 - ග්‍රාම සේවා වසම් තුළ පවුල් සහ සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව**

| ග්‍රා. වසම | පවුල් සංඛ්‍යාව | සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව |
|---|---|---|
| මාවිට බටහිර | 259 | 30 |
| දනවල | 351 | 67 |
| කොස්වත්ත | 188 | 47 |
| ඉ/මද්දෙගම | 198 | 31 |
| එකතුව | 996 | 175 |

මූලාශ්‍රය : (සම්පත් පැතිකඩ - නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2021)

**ප්‍රස්තාර 02 - ග්‍රාම සේවා වසම් තුළ පවුල් සහ සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව**




මූලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022)

2021 නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවතින සම්පත් පැතිකඩට අදාළ ව (වගු අංක 02 දත්ත) මෙම ග්‍රාමසේවා වසම් සියල්ලෙහි ම සිටින පවුල් සංඛ්‍යාව 996 කි. ඉන් සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව 175ක් වේ. කොස්වත්ත ග්‍රාමසේවා වසම තුළ පවුල් 188ක් තිබෙන අතර, ඉන් 47ක් සමෘද්ධිලාභී පවුල් වෙති. නමුත් එහි රුපියල් 6,000 ට වඩා අඩු ආදායම්ලාභී පවුල් සිටින්නේ 21ක් පමණි. එමගින් සමෘද්ධිලාභීන් තෝරා ගැනීමේ යම් යම් දුර්වලතා පවතින බව පෙනේ. අඩු ම ආදායම්ලාභීන් ප්‍රමාණයක් සිටින්නේ මාවිට - බටහිර ග්‍රාම සේවා වසම තුළ ය. එහි පවුල් සංඛ්‍යාව 259 කි. නමුත් සමෘද්ධිලාභී පවුල් ලෙස හඳුනාගත හැකිවන්නේ පවුල් 30ක් පමණි. ප්‍රතිශතයක් ලෙස මාවිට - බටහිර ග්‍රාමසේවා වසමේ සමෘද්ධිලාභී ප්‍රතිශතය 17%ක් ලෙසත්, ඉහළ මද්දෙගම ග්‍රාමසේවා වසම තුළ එය 18%ක් බවත් බහුතරයක් වූ සමෘද්ධිලාභී ප්‍රතිශතය ඇත්තේ දනවල ග්‍රාමසේවා වසම තුළ බවත් පැහැදිලි ය. 021 නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවතින සම්පත් පැතිකඩට අදාළ ව (වගු අංක 02 දත්ත) මෙම ග්‍රාමසේවා වසම් සියල්ලෙහි ම සිටින පවුල් සංඛ්‍යාව 996 කි. ඉන් සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව 175 ක්වේ. කොස්වත්ත ග්‍රාමසේවා වසම තුළ පවුල් 188ක් තිබෙන අතර, ඉන් 47ක් සමෘද්ධිලාභී පවුල් වෙති. නමුත් එහි රුපියල් 6,000ට වඩා අඩු ආදායම්ලාභී පවුල් සිටින්නේ 21ක් පමණි. එමගින් සමෘද්ධිලාභීන් තෝරා ගැනීමේ යම් යම් දුර්වලතා පවතින බව පෙනේ. අඩු ම ආදායම්ලාභීන් ප්‍රමාණයක් සිටින්නේ මාවිට - බටහිර ග්‍රාම සේවා වසම තුළ ය. එහි පවුල් සංඛ්‍යාව 59 කි. නමුත් සමෘද්ධිලාභී පවුල් ලෙස හඳුනාගත හැකිවන්නේ පවුල් 30ක් පමණි. ප්‍රතිශතයක් ලෙස මාවිට - බටහිර ග්‍රාමසේවා වසමේ සමෘද්ධිලාභී ප්‍රතිශතය 17%ක් ලෙසත්, ඉහළ මද්දෙගම ග්‍රාමසේවා වසම තුළ එය 18%ක් බවත් බහුතරයක් වූ සමෘද්ධිලාභී ප්‍රතිශතය ඇත්තේ දනවල ග්‍රාමසේවා වසම තුළ බවත් පැහැදිලි ය.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**වගු අංක 03 - පවුලේ ඉතිරි කිරීම් සහ ණය පිළිබඳ ස්වභාවය**

| ඉතිරි කිරීම් | | ණය | |
|---|---|---|---|
| ආයතන වර්ගය | සංඛ්‍යාව | ආයතන වර්ගය | සංඛ්‍යාව |
| බැංකු | 13 | බැංකු | 55 |
| වෙනත් මූල්‍යමය | - | වෙනත් මූල්‍යමය | 6 |
| කුඩා කණ්ඩායම් | - | කුඩා කණ්ඩායම් | 12 |
| එකතුව | 13 | එකතුව | 73 |

මූලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022)

වගු අංක 03 ට අනුව සමස්ත ග්‍රාමසේවා වසම් තුළ බැංකු ණය හිමියන් බහුල වශයෙන් හඳුනාගත හැකි ය. එමෙන් ම එම ණය ගෙවීමට දැඩි දුෂ්කරතා පවතී. කොරෝනා මුල් කාලයේ දී ඒ සඳහා යම් සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කළත්, පසු ව ඇති වූ ආර්ථික අර්බුදය හමුවේ එම ණය ගෙවීමට අපහසුතා පවතින බව මෙම අධ්‍යයනය මගින් හෙළිවිය. එමෙන් ම කණ්ඩායම් ණය බහුල වශයෙන් ගැනීමට සමෘද්ධිලාභීන් පෙළඹී තිබේ. සමෘද්ධිය මගින් ලබා දෙන අනිවාර්ය ඉතිරි කිරීම් හැරුණු විට, වෙනත් ඉතිරි කිරීම් සඳහා ජනතාවගේ අඩු සැලකිල්ලක් ඇති බව මෙමගින් පැහැදිලි විය. විශේෂයෙන් ම එම පවුල්වලට ඉතිරි කිරීම් සඳහා ප්‍රමාණවත් මුදලක් නොමැති බවත්, වර්තමාන ආර්ථික අර්බුදය ඒ සඳහා බලපා ඇති බවත් අධ්‍යයනයෙන් තහවුරු විය. විශේෂයෙන් ම දරුවන්ගේ අධ්‍යාපනයට සහ නිවසේ වියදම් පිළිබඳ ව විශාල මුදලක් වැය වන බවත්, එබැවින් බොහෝ කටයුතු සඳහා ණය වීමට සිදුවන බවත් ජනතාවගේ මතයයි.

**වගු අංක 04 - පවුලේ සාමාජික සංඛ්‍යාව**

| සාමාජික සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව |
|---|---|
| 4 දෙනෙකු හෝ ඊට වැඩි | 22 |
| 3 දෙනෙකු සිටින පවුල් | 63 |
| 1 හෝ 2 සිටින පවුල් | 15 |
| එකතුව | 100 |

මූලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022)


වගු අංක 04 ට අදාළ ව තෝරාගත් සමෘද්ධිලාභී පවුල් 100 අතුරින් පවුලේ සාමාජික සංඛ්‍යාව 4 හෝ ඊට වැඩි පවුල් 22ක් තිබුණි. මෙම පවුල් සඳහා සමෘද්ධි සහනාධාරය රුපියල් 3500ක් ලැබේ. එහෙත් මෙම අධ්‍යයන ප්‍රදේශය තුළ සහනාධාරය රුපියල් 3,500 ට අඩු විශාල පිරිසක් සිටින බව පැහැදිලි ය. මෙම ප්‍රදේශ 4 තුළ ම පවුලේ සාමාජික සංඛ්‍යාව තුන් දෙනෙකු සිටින පවුල් 63ක් තිබුණු අතර එම පවුල් ප්‍රමාණයේ වර්ධනයක් ඇති බව තහවුරු විය. එම පවුල් සඳහා රුපියල් 2,500ක් පමණක් ලැබෙන අතර, රුපියල් 1,500ක් ලැබෙන පවුල් 15ක් ද සිටින බව හඳුනාගත හැකි විය.

**වගු අංක 05 - සමෘද්ධිය ලැබීම පිළිබඳ ස්වභාවය**

| සමෘද්ධිය ලැබීම | පවුල් සංඛ්‍යාව |
|---|---|
| වසර 5 ට වැඩි | 22 |
| වසර 5 ට අඩු | 78 |

මූලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022)

**ප්‍රස්තාර අංක 03 - සමෘද්ධිය ලැබීම පිළිබඳ ස්වභාවය**




මූලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022)

මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වූයේ සමෘද්ධිය ලැබීම වසර පහකට අඩු පවුල් සංඛ්‍යාව 78ක් වන බව ය. එසේ ම වසර පහකට වැඩි පවුල් සංඛ්‍යාව 22ක් ලෙස දැකගත හැකි විය. පවතින දේශපාලන අධිකාරියේ වෙනස්වීම් මත සමෘද්ධිය ලබාදීම ද යම් යම් අවස්ථාවල වෙනස් වීම සිදුවන බව ඇතැමුන් පෙන්වා දෙන කරුණකි. මෙම තොරතුරුවලට අනුව දීර්ඝ කාලයක් සමෘද්ධිය ලබන පවුල් 22%ක් සිටින බව හඳුනා ගත හැකි විය.


**වගු අංක 06 - සමෘද්ධි වැඩසටහන ග්‍රාමීය සංවර්ධනයට දායකත්වයක් ලබා දීම හෝ නොදීම**

| සමෘද්ධි වැඩසටහන ක්‍රියාකාරීත්වය | ප්‍රතිචාරය (පවුල් සංඛ්‍යාව) | |
|---|---|---|
| | ඔව් | නැත |
| 1. සමෘද්ධි වැඩසටහන් ප්‍රදේශයේ ක්‍රියාත්මක වේද? | 13 | 87 |
| 2. සමෘද්ධි වැඩසටහන් මගින් ප්‍රදේශයට සේවාවක් සැපයීම | 22 | 78 |
| 3. පවුල්වලට ස්වයං රැකියා ලැබීම | - | 98 |
| 4. ලැබෙන මාසික මුදල ප්‍රමාණවත් වීම | 6 | 94 |
| 5. සමෘද්ධිය නිසා පවුලේ ආදායම ඉහළ යාම | 11 | 89 |
| 6. ග්‍රාමීය සංවර්ධනයට මෙම වැඩසටහන යහපත් වීම | 32 | 68 |
| 7. දූගීබව තුරන් කිරීම සිදුවීම | 12 | 88 |

මූලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022)


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**ප්‍රස්තාර අංක 04 - සමෘද්ධි වැඩසටහන ග්‍රාමීය සංවර්ධනයට දක්වන දායකත්වය**




මුලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022)

දීර්ඝ කාලයක් තිස්සේ සමෘද්ධි සහනාධාරය ලබන පිරිස් සිටිය ද ඔවුන්ගේ ආදායම ඉහළ නොගිය බව බොහෝ පවුල් සංඛ්‍යාවකගේ අදහස විය. සමෘද්ධි වැඩසටහන ප්‍රදේශයට සේවාවක් සපයා තිබේ ද? යන්න ගැටලු සහගත ය. එයට හේතුව වන්නේ අදායම් ප්‍රමාණය වර්ධනය කිරීම උදෙසා මෙම වැඩසටහන මගින් ක්‍රමාණුකූල යෝජනා, අදහස් ඉදිරිපත් නොවීමයි.

ග්‍රාමීය සංවර්ධනයට සමෘද්ධි ව්‍යාපාරය යහපත් වේ ද? යන්න විවාදාත්මක ය. මන්ද යත් ඇතැම් පිරිස් මෙම සමෘද්ධිය ලබා ගැනීමෙන් ම ජීවත් වීමට උත්සාහ කරන අතර ම, නිලධාරී මට්ටමින් උපදෙස් මෙම පිරිස්වලට ලබා දෙන්නේ නම් මෙම තත්ත්වය බොහෝ සෙයින් ම වෙනස් වීමට ඉඩ තිබෙන බව පැහැදිලි ය. විශේෂයෙන් ම කොරෝනා කාලය තුළ රුපියල් 5000 බැගින් සමෘද්ධිලාභීන්ට සහන ලැබුණු අතර, එයට අමතර ව තවත් සහන බොහෝමයක් ඔවුන්ට හිමි විය. එනිසා ඇතැමුන් මෙම සමෘද්ධි දීමනාව තම යහපත උදෙසා ම තබාගැනීමට උත්සාහ කරන ස්වභාවයක් දැක ගැනීමට හැකි විය.

තව ද වගු අංක 06 ට අනුව ග්‍රාමසේවා වසම් තුළ පොදුවේ ගත් විට සමෘද්ධි වැඩසටහන තුළ ඇති විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වීමේ දුර්වලතා දැකිය හැකි ය. ලැබුණු තොරතුරුවලට අනුව එම වැඩසටහන් ක්‍රියාත්මක නොවන බව 88%ක ගේ මතය විය. ප්‍රදේශයට සමෘද්ධිය ලැබීම හරහා සේවාවක් ඉටු නොවුණු බව ද පෙන්වා දෙන අතර, යහපත් බව පෙන්වා දෙන්නේ 22%ක් පමණි. කිසිදු පවුලකට ස්වයං රැකියා හිමි වී නැත. එය ප්‍රබල දුර්වලතාවකි. සමෘද්ධි සහනාධාරය මගින් මාසික ව ලැබෙන මුදල ප්‍රමාණවත් නොමැතිබව 94% ගේ අදහස් විය. පවුලේ ආදායම් මට්ටම ඉහළ නොගිය බව 89% දෙනෙකුගේ ප්‍රතිචාරය විය. දුගීබව තුරන් කිරීම සම්බන්ධ ව මෙම වැඩසටහන ප්‍රමාණවත් නොවන බව 88%ක ජනතාවගේ අදහසයි.

මේ අනුව මෙම වැඩසටහනෙහි ප්‍රගතිශීලීභාවය සම්බන්ධයෙන් ගැටලු පවතින බවත්, දරිද්‍රතාවෙන් පෙළෙන පවුල්වල ආර්ථිකයෙහි වෙනසක් සිදු කිරීමට මෙම වැඩසටහන ප්‍රායෝගික ව අවධානය යොමු නොකළ බවත්, බොහෝ දෙනාගේ අදහස විය.

ප්‍රදේශයේ විවිධ පැළ වර්ග බෙදා දීම හැරුණු විට වෙනත් වැඩසටහන් ක්‍රියාත්මක නොවන බව තොරතුරු අනුව පෙනේ.


මෙම පවුල් සඳහා ස්වයං රැකියා ලැබීම සිදු නොවන බවත්, කුඩා කණ්ඩායම් ක්‍රියාත්මක වුව ද ඒවායේ ප්‍රගතියක් නොවන බවත් පවුල් 98කගේ මතය විය. මේ අනුව මෙම වැඩසටහන මඟින් අර්ථාන්විත වැඩසටහන් ක්‍රියාත්මක නොවන බව බහුතරයක මතය බවත් පැහැදිලි ය. ග්‍රාමීය දිළිඳුබව තුරන් කිරීම උදෙසා මෙම සමෘද්ධි වැඩසටහන හඳුන්වා දෙන අතර එහෙත් මෙමඟින් ග්‍රාමීය ජනයාගේ ආර්ථිකය ශක්තිමත් නොවූ බවත්, නිරන්තරයෙන් ණය මත ජීවත් විමට ග්‍රාමීය ජනයාට සිදු වී ඇති බවත් ඇතැමුන්ගේ මතයයි. මේ නිසා 88%කගේ මතය වූයේ මෙම සංවර්ධන වැඩසටහන සාර්ථක නොවන බවයි.

**වගු අංක 07- සමෘද්ධිලාභීන්ගේ සංගණනය අනුව වැඩසටහනෙහි පැන නගින ගැටලුකාරී තත්ත්වය**

| සමෘද්ධිලාභීන්ගේ සංගණනය අනුව සමෘද්ධි වැඩසටහන තුළ ඇති ගැටලු | ප්‍රතිචාරය | |
|---|---|---|
| | ඔව් | නැත |
| 1. සමෘද්ධි වැඩසටහන පිළිබඳ ව සමෘද්ධි නිලධාරිතුමා ජනතාව දැනුවත් කරයි | 36 | 64 |
| 2. සමෘද්ධි නිලධාරිතුමාගේ සේවාව පිළිබඳව සෑහීමකට පත් වීම | 19 | 81 |
| 3. සමෘද්ධිය ලබා දීමේ දී අපේක්ෂිතයන් තෝරා ගන්නා ආකාරය පිළිබඳව ඔබ සෑහීමකට පත් වන්නේ ද? | 24 | 76 |
| 4. සමෘද්ධි ණය පහසුකම් ලබා දීම නිසි පරිදි සිදුවීම | 33 | 67 |
| 5. ප්‍රජා සහභාගීත්වය අඩුවීම | 45 | 55 |
| 6. නිලධාරීන්ගේ තීරණ ගැනිමේ දුර්වලතා ඇතිවීම | 75 | 25 |

මුලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022)

**ප්‍රස්තාර අංක 05 - සමෘද්ධිලාභීන්ගේ සංගණනය අනුව වැඩසටහනෙහි උද්ගත වූ ගැටලු**




මුලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022)


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වගු අංක 07 ට අනුව අධ්‍යයන ප්‍රදේශය තුළ සමෘද්ධිය පිළිබඳ ව දැනුවත්භාවයේ ගැටලු පවතී. එනම් පවුල් 64 ක් පෙන්වා දෙන්නේ සමෘද්ධිය පිළිබඳව නිවැරදි දැනුවත්භාවයක් නොමැති බව ය. එසේ ම සමෘද්ධි නිලධාරිතුමාගේ සේවාව සම්බන්ධව 19%ක් සෑහිමකට පත් වුවත්, 81%ක් පෙන්වා දෙන්නේ එම සේවාව පිළිබඳව සෑහීමකට පත් නොවිය හැකි බව ය. ඉහත වගු අංක 07 හි 04 වන ප්‍රශ්නයට අදාළ ව දත්ත දායකයින්ගේ අදහස වූයේ විශේෂයෙන් ම සමෘද්ධි ණය ලබා දීමේ දී යම් යම් අකටයුතුකම් සිදු වන බව ය.

සමෘද්ධි නිලධාරීතුමා පත් වන්නේ ගම කේන්ද්‍ර කොට ගෙන බව ඇතැමුන්ගේ මතයයි. මේ නිසා ම හිතවත්කම මත නව සමෘද්ධිලාභීන් තෝරා ගැනීමත්, ණය ලබා ගැනීමේ දී පවා නිලධාරීන්ගේ වුවමනාවන් ඉටු කිරීමට මෙම සමෘද්ධිලාභීන්ට සිදුවන බවත් බොහෝ දෙනාගේ අදහසයි. මේ නිසා ම නුසුදුසු පුද්ගලයින් සමෘද්ධිලාභීන් ලෙස පත් කර ගන්නා බවත්, තව බොහෝ දෙනෙකුට සමෘද්ධි සහනාධාරය ලබා දීමට සුදුසුකම් පවතින බවත් ඔවුගේ අදහසයි.


ඉහත වගු අංක 07 ට අදාළ ව (ප්‍රශ්න අංක 03) සමෘද්ධිය සඳහා අපේක්ෂකයින් තෝරා ගැනීමේ දී හිතවත්කම්, දේශපාලනයේ බලපෑම් බහුල වශයෙන් ම හඳුනා ගත හැකි ය. එම නිසා ම සමෘද්ධිය සඳහා අපේක්ෂකයින් තෝරා ගැනීම සුදුසු නොවන බව සමෘද්ධිලාභී පවුල් 76%ගේ මතය විය. ප්‍රජා සහභාගිත්වය සම්බන්ධ ව ප්‍රතිචාර සහ නිලධාරීන්ගේ තීරණ ගැනීමේ දුර්වලතා ඇති බව 75%ක් පවුල් පෙන්වා දෙති. මේ නිසා පැහැදිලි වන්නේ ප්‍රායෝගික ව සමාජය තුළ ගැටලු ඇතිවන බවයි. සාම්ප්‍රදායික ක්‍රමවේදයන් අනුව ම නිලධාරීන් කටයුතු කිරීමත්, මේ නිසා කාලය, ශ්‍රමය අපතේ යන බවත් ඇතැමුන්ගේ චෝදනාවන් ය. මේ නිසා ම ප්‍රජාවගේ සහභාගීත්වය අඩු වීමට හේතුවන බව ඔවුන් පෙන්වා දෙයි.

**වගු අංක 08 - සමෘද්ධිලාභීන් තෝරා ගැනීමේ දී ඇතිවන ගැටලුකාරීත්වය**

| සමෘද්ධිලාභීන් තෝරා ගැනිමේ දී ඇතිවන ගැටලු | ප්‍රතිචාරය (පවුල් සංඛ්‍යාව) | |
|---|---|---|
| | ඔව් | නැත |
| 1. ප්‍රදේශයේ සමෘද්ධිය ලබා දීමට නුසුදුසු අයට සමෘද්ධිය ලැබී තිබීම | 35 | 65 |
| 2. පවතින දේශපාලන සබඳතා මත එය ලැබී තිබීම | 45 | 55 |
| 3. සමෘද්ධිය ලබා දීමට සුදුසු පිරිස් තව දුරටත් ප්‍රදේශයේ සිටිම | 78 | 22 |

මූලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022)

**ප්‍රස්තාර අංක 06 - සමෘද්ධිලාභීන් තෝරා ගැනිමේ දී ඇතිවන ගැටලු**




මූලාශ්‍රය : (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022)

වගු අංක 08 ට අදාළව අධ්‍යයන ප්‍රදේශය තුළ සමෘද්ධි සහනාධාරය නුසුදුසු අයට ලබාදෙන බවට, පවුල් 35 කගේ ම අදහස විය. මේ අනුව පැහැදිලි වන්නේ මෙම වැඩසටහනට අපේක්ෂකයන් තෝරාගනු ලැබීමේ දී යම් යම් ගැටලු පවතින බව ය. පවතින දේශපාලන සබඳතා මත එය ලැබෙන බව පවුල් 45 ක් පෙන්වා දෙන අතර, තවදුරටත් සෑම ග්‍රාමසේවා වසමක ම සමෘද්ධිය ලබාදීමට සුදුසු, අඩු ආදායම්ලාභී, ඉඩම් නොමැති, පිරිස් සිටින බව පවුල් 78 ක අදහස විය.

වගු අංක 08 තුළ සඳහන් පරිදි විශේෂයෙන් ම සමෘද්ධි සහනාධාරය ලබාදීමට අපේක්ෂකයන් තෝරා ගැනීමේ දී එය ලබාදීම නුසුදුසු, යහපත් ආර්ථිකයක් සහිත (ත්‍රීරෝද රථ සහ මෝටර් සයිකල් සහිත) පවුල්වලට එය ලැබී ඇති බව ප්‍රායෝගික ව දැකිය හැකි ය. මෙම තත්ත්වය ප්‍රායෝගික ව ගැටලු රාශියක් සමාජය තුළ පැන නැගීමට බලපා තිබේ. පොල්අතු සෙවිලි කළ නිවාස පවතින ඇතැම් පිරිස්වලට පවා මෙම සහනාධාරය නොලැබීම දුර්වලතාවක් ලෙස ජනතාව පෙන්වා දෙති. පවතින දේශපාලන ඕනෑ එපාකම් මත මෙම සහනාධාරය ලැබෙන බව ඇතැමුන්ගේ මතය විය. දේශපාලන රැස්වීම්වලට යන, එසේ ම මැතිවරණ කාලවල දී පක්ෂවලට සහයෝගය ලබා දෙන පිරිස්වලට මෙම සහනාධාරය දීමේ දී වැඩි වාසි සහගත තත්ත්වයක් උදාවන බව ජනතාවගේ අදහසයි. එසේ ම ඇතැම් අයගේ සහනාධාරය කපා හරිමින් දේශපාලන පළිගැනීම් සිදු වන බව ද අනාවරණය කර ගත හැකි විය.

## නිගමනය

ශ්‍රී ලංකාවේ දුප්පත්කම අවම කිරීම සහ ග්‍රාම සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම වැඩසටහනක් ලෙස සමෘද්ධි ව්‍යාපාරය සඳහන් කළ හැකි ය. එහෙත් ක්‍රියාත්මක තත්ත්වය තුළ සමෘද්ධි සංවර්ධන වැඩසටහන යම් යම් ගැටලුවලට මුහුණපා ඇති බවක් දැකිය හැකි ය. විශේෂයෙන් ම දුප්පත්කම අවම කිරීම උදෙසා සමෘද්ධි වැඩසටහන හඳුන්වා


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දෙනු ලැබුවත්, එම ප්‍රතිලාභය ලැබිය යුතු පිරිස් බොහෝමයක් සිටිය දී නිර්ණායක නොසලකා දේශපාලන පක්ෂ, හිතවත්කම් මත එම ප්‍රතිලාභය ලබා දීම දැකිය හැකි ය. එහි ප්‍රතිඵලය වන්නේ දුප්පත්කම අවම නොවී තව තව දුප්පතුන් බිහිවීමයි. සැබැවින් ම දුප්පත් පිරිස් වෙත මෙම සමෘද්ධි ප්‍රතිලාභය නොලැබෙන හෙයින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධනය උදෙසා පවතින සමෘද්ධි සංවර්ධන වැඩසටහන අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී ඇති බව පෙන්වා දිය හැකි ය.

## යෝජනා

සමෘද්ධි සංවර්ධන වැඩසටහන මගින් ග්‍රාමීය ජන සමාජයේ දිළිඳු බව තුරන්කොට ග්‍රාමීය ජන ජීවිතය නංවාලීමට නම් එම වැඩසටහනෙහි යම් යම් ආකාරයේ දුර්වලතා හඳුනා ගැනීම අවශ්‍ය වේ. එම කරුණු පහත දැක්වෙන පරිදි දැක්විය හැකි ය.

1 සමෘද්ධි සංවර්ධන වැඩසටහන සැලසුම් කිරීමේ දී බිම් මට්ටමේ අදහස් විමසීම,
2 දේශපාලන අභිලාෂයන් ඉටුකර ගැනීමට කටයුතු නොකිරීම,
3 ප්‍රතිලාභි ප්‍රජාව යැපීම් මානසිකත්වයකින් මුදවා ගැනීම හා එයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4 සමාජ සජීවිකරණය තුළ පවතින ගැටලු මෙන් ම ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ පවතින දුර්වලතා හඳුනා ගැනීම.
5 නිවැරදි පුහුණුවක් හා නිවැරදි ඉලක්ක සහිත සමෘද්ධි නිලධාරීන් තෝරා පත් කිරීමට කටයුතු කිරීම.
6 දිළිඳු පවුල් තෝරා ගැනීමේ දී විධිමත් නිර්ණායක ඉදිරිපත් කිරීම.
7 දිළිඳු අයට තම ජීවන තත්ත්වය ඉහළ නංවා ගැනීමට ඇති අවස්ථා වැඩි කිරීම.
8 තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීමට හැකිවන අයුරින් දිළිඳු ජන කොටස් සවිබල ගැන්වීම.
9 දිළිඳු ජනතාව නිරන්තරයෙන් ම මුහුණ දෙන ආර්ථික අනාරක්ෂිතභාවයට පිළියම් වශයෙන් ආර්ථික රැකවරණයන් ලබා දීම.
10 දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල සමාජ හා ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
11 රැකියාවක් කළ නොහැකි, අබාධිත හා වියපත් පුද්ගලයන් රැකබලා ගැනීමට සමාජ ආරක්ෂණ විධිවිධාන සකස් කිරීම.
12 දීර්ඝ කාලයක් තිස්සේ එක ම ප්‍රදේශයක් තුළ , එක ම සමෘද්ධි නිලධාරීන් නොයෙදීම.
13 සමෘද්ධි ණය ලබා දීමේ දී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීම.
14 මාසික ඇගයීම් වාර්තා ලබා ගැනීමට සමෘද්ධි නිලධාරීන් යොමු කිරීම.

ඉහත කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම මගින් ග්‍රාමීය දිළිඳුබව යම් ප්‍රමාණයකට හෝ අඩු කර ගත හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රය


එදිරිසිංහ, ඩී. (2010) සමාජය හා සංවර්ධනය, දෙහිවල, වත්මා ප්‍රකාශකයෝ.

කලුආරච්චිල ආර්. (2014) සංවර්ධන සංකල්ප හා ශ්‍රී ලංකා ආර්ථිකය, කොළඹ, කර්තෘ ප්‍රකාශන.

ගමගේ, එස්. අයි. (1998) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය, කොළඹ 11, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ජයසිංහ, ආර්. (2014) ප්‍රජා සංවර්ධනය සඳහා සමාජ වැඩ විධික්‍රම, පොතුහැර, ලේඛක පාඨක සමාජය.

දිවි නැගුම පනත (2013) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

දිවි නැගුම කාර්ය සාධන වාර්තාව (2014) නිවාස හා සමෘද්ධි අමාත්‍යංශය.

දිසානායක, ඩී. (2016) දිවිනැගුම විභාග ජයමඟ, කොළඹ, කර්තෘ ප්‍රකාශන.

ප්‍රේමසිරි, බී. අයි. කේ. බී. (2007) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාව පිටුදැකීමේ ව්‍යාපාරයේ විකාශනය, කැලණිය විශ්වවිද්‍යාලය.

මිත්‍රරත්න, ඩබ්ලිව්. ජී. (2000) සමෘද්ධි ව්‍යාපාරයේ ත්‍රිවිධ සංවර්ධන ප්‍රවේශල කොළඹ, සමෘද්ධි යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යංශයේ ප්‍රකාශනයකි.

රත්නායක, ආර්. එම්. කේ. (2017) දුගිකම තුරන් කිරීම සහ සෞභාග්‍යය බෙදා ගැනීම, බත්තරමුල්ල, නෙප්චූන් පබ්ලිකේෂන්ස්.

වාර්ෂික වාර්තාව (2011) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, රජයේ නීතිගත සංස්ථාව.

වාර්ෂික වාර්තාව (2017) සමාජ සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යංශය, රජයේ නීතිගත සංස්ථාව.

ශ්‍රී ලංකා මහාබැංකු වාර්තාව :2020* කොළඹ, ශ්‍රී ලංකා මහාබැංකුව.

ශ්‍රී ලංකා මහාබැංකු වාර්තාව :2021* කොළඹ, ශ්‍රී ලංකා මහාබැංකුව.

සම්පත් පැතිකඩ, (2021) නෙළුව ප්‍රදේශීය ලේකම් කාර්යාලය.

සමෘද්ධි අධිකාරි පනත :1995* ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

සමෘද්ධි පුවත්පත , 2012 ඔක්තෝබර් 1, ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටු දැකීමට සමෘද්ධි බැංකු ලබාදුන් දායකත්වය.



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

හඳරාගම, එස්. (2011) සංවර්ධන සමාජ විද්‍යාව, බත්තරමුල්ල, සමීර ප්‍රකාශකයෝ.

හිඳැල්ල, ඒ. (2011) සංවර්ධන අධ්‍යයනය, නුගේගොඩල සරසවි ප්‍රකාශකයෝ.

හෙට්ටිආරච්චි, එච්. (2008) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව තුරන් කිරීමේ ක්‍රියාමාර්ග, කැලණිය, සරසවි මුද්‍රණාලය.

Amarasinghe, D. P. (2000) Rural urban linkage in Monaragala : *some hypothesis*, *Journal of Urban Development in Sri Lanka*

Ratnayake, R. M. K. (2007). *Rural-urban linkage in regional development: the experience of North Central Sri Lanka*, Malambe : Piyasiri Printers.



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දහතුන්වන කලාපය 2022 ජූනි
පිටු 23-31
ISSN 1800-1459 eISSN 2386-2041
© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# සිංහල නවකතාවෙහි නිරූපිත සාංදෘෂ්ටිකවාදී ලක්ෂණ : තෝරාගත් සිංහල නවකතා ඇසුරින් කෙරෙන විමර්ශනයකි

# (Existentialism Features Depicted in the Sinhala Novel: An Analysis Based on Selected Sinhala Novels)

කේ.වී. දිනිති දිල්හාරා කරඳන[1] සහ චම්පා එස්. ද සිල්වා[2]

භාෂා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා භාෂා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
**dinithikarandana1995@gmail.com**

## Abstract

Existentialism is a philosophy of man. Studying Existentialism will be beneficial to understand the reality of life and what the absolute truth is. The main purpose of this research is to examine the characteristics in humanistic psychology, religious perspective, and Marxist analysis of the creation of humanity of the philosophical thought of existentialism, which are represented by the creativity of literary fiction. All the selected novels (1955-1965) are chosen as primary sources and critical essays that are published on novels under the theme of existentialism, as well as articles published in newspapers and online articles are selected as secondary sources. Between 1955 and 1965, the Sinhala novels tended to take a new path. The novels feature characters who were isolated from the outside world, who acted in a way that was inherently isolated and challenged against social norms. Acting in their own will, they also became isolated figures among intellectual thinking, bringing to life the philosophy of existentialism. The subject of humanistic psychology is entirely a reflection of existentialism. Existentialism is an oasis of psychology as it explores the spirituality of man. And it also exemplifies the plight of man. Existentialism tends to look at man from a humanistic point of view, stating that a practical and coherent solution must arise within man, rather than the concept of nirvana in Buddhism. Marxists' acceptance of alienation cannot be ruled out that there was an alienation behind the dark side to the moods of the characters raised in real-time Sinhala novels. Therefore, it can be concluded that existentialism, both psychologically and religiously, were influenced by the reflection of humanity in Sinhala novels in the 1955-1965 decades.

**Key Words**: Existentialism, Sinhala Novels, Alienation, Humanistic Psychology, Religious Morality

## සාරසංක්ෂේපය

සාංදෘෂ්ටිකවාදය වනාහි මිනිසා පිළිබඳ වූ දර්ශනයකි. ජීවිතයේ යථාර්ථය හා පරම සත්‍ය යනු කුමක් ද යන්න අවබෝධ කර ගැනීම උදෙසා සාංදෘෂ්ටිකවාදය හැදෑරීම බෙහෙවින් ඉවහල් වේ. සාහිත්‍ය කලාවේ එන නවකතා සාහිත්‍යාංගයේ නිර්මාණශීලීභාවය හා නිරූපණය වන්නා වූ මනුෂ්‍යත්වය නිර්මාණය වීම කෙරෙහි සාංදෘෂ්ටිකවාදය නම් දාර්ශනික චින්තාවේ ලක්ෂණයන් මානුෂික මනෝවිද්‍යාත්මක වශයෙන්, ආගමික දෘෂ්ටිකෝණයෙන් හා පරාරෝපණය රැගත් මාක්ස්වාදී විග්‍රහයට අනුකූලවත් විමර්ශනයට ලක් කිරීම මෙම පර්යේෂණයේ අපේක්ෂාව යි. මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ සාංදෘෂ්ටිකවාදී ලක්ෂණ සිංහල නවකතා කෙරෙහි කෙතරම් දුරට බලපා තිබේ ද? යන්නයි. එහි දී මූලික වශයෙන් තෝරාගත් නවකතා (1965-1955) සියල්ල ප්‍රාථමික මූලාශ්‍රය වශයෙනුත් ද්විතීයික මූලාශ්‍රය වශයෙන් සාංදෘෂ්ටිකවාදය යන තේමාව ඔස්සේ රචිත නවකතා පිළිබඳ ලියවුණු විචාර කෘතීන් හා පුවත්පත්වල පළ වූ ලිපි ලේඛන හා අන්තර්ජාල ලිපි භාවිත කොට ඇත. 1955ත් 1965 අතර කාලයේ දී සිංහල නවකතාව පෙරළියක් ඇති කරමින් නව මාවතකට ප්‍රවේශ වීමේ ප්‍රවණතාවක් දැකිය හැකි විය. තමන්ට ආවේණික හුදෙකලා චින්තනයකින් කටයුතු කළ, සමාජ සම්මතයට එරෙහි ව අභියෝගාත්මක ව හැසිරුණු, බාහිර සමාජයට ආවෘත වූ චරිතයෝ එම නවකතාවලින් හමු වෙති. සිය අභිමතය මත හැසිරුණු ඔවුහු සාංදෘෂ්ටිකවාදී දර්ශනයට ද පණ පොවමින් බුද්ධිමය චින්තාවන් අතර හුදකලා වූ චරිත වූහ. මානුෂික මනෝ විද්‍යාවේ විෂය පථය මුළුමනින් ම සාංදෘෂ්ටිකවාදයේ පිළිබිඹුවකි. සාංදෘෂ්ටිකවාදය මිනිසාගේ අධ්‍යාත්මය ගවේෂණය කරන්නක් බැවින් එය මනෝවිද්‍යාවේ අංගයකි. එමෙන් ම සාංදෘෂ්ටිකවාදය මිනිසාගේ දුක්ඛදායක තත්ත්වය හුවා දක්වයි. බුදු දහමේ දැක්වෙන දුකින් මිදීමේ නිර්වාණ සංකල්පයට වඩා ප්‍රායෝගික වූත් සහේතුක වූත් විසඳුමක් මිනිසාගේ අභ්‍යන්තරයෙන් ම ඇති විය යුතු බව දක්වමින් මානව භක්තියකින් මිනිසා දෙස බැලීමට සාංදෘෂ්ටිකවාදය පෙළඹෙයි. මාක්ස්වාදයේ පරාරෝපණ ගැටලුව සාංදෘෂ්ටිකවාදීහු පිළිගනිති. තත්කාලීන සිංහල නවකතාවන්හි මතු කළ චරිතවල මනෝභාවයන්ගේ අඳුරු පැතිකඩ පිටුපස පරාරෝපණය පැවති බවට වන තර්කය බැහැර කළ නො හැකි වේ. එහෙයින් සාංදෘෂ්ටිකවාදය

මනෝවිද්‍යාත්මකවත්, ආගමික විග්‍රහයට හා මාක්ස්වාදී විග්‍රහයට අනුකූලවත් 1965 -1955 දශකයෙහි නිර්මාණය වූ සිංහල නවකතාවන්හි මනුෂ්‍යත්වය නිර්මාණය වීම කෙරෙහි බලපෑ බව යුක්ති යුක්ත ව නිගමනය කළ හැක.

**කේන්ද්‍රීය වචනඃ** සාංදෘෂ්ටිකවාදය, සිංහල නවකතාව, පරාරෝපණය, මානුෂික මනෝවිද්‍යාව, ආගමික සදාචාරය

## හැඳින්වීම

බටහිර ලෝකයේ දාර්ශනිකයන්ගේ විමර්ශනාවලීන් අතර සාංදෘෂ්ටිකවාදයට සුවිශේෂ ස්ථානයක් හිමි වේ. මිනිසාගේ අධ්‍යාත්මය ගවේෂණය කරමින් මිනිස් ජීවිතයට නව අර්ථකථනයක් ආරෝපණය කිරීමට දැරූ උත්සාහයකි මෙම දර්ශනවාදය. සාංදෘෂ්ටිකවාදීන්ගේ ගණයෙහි ලා සැලකෙන කලාකරුවන් විසින් රචිත කලා කෘති ඇසුරෙන් මතු කරන ලද දාර්ශනික ආකල්පවල සමතාවක් දක්නට නො ලැබුණ ද ඔවුන්ගේ චින්තන විදියත්, කේන්ද්‍රීය අභිප්‍රායත් එකකි. දර්ශනවාදයක් ගොඩනැංවීමට වඩා මානව හිතෛෂී සමාජමය පසුබිමක් නිර්මාණය කිරීම එකල දාර්ශනික කලාකරුවන්ගේ එක ම අභිප්‍රාය විය. ජීවිතයේ යථාර්ථය හා පරම සත්‍ය යනු කුමක් ද යන්න අවබෝධ කර ගැනීම උදෙසා සාංදෘෂ්ටිකවාදය හැදෑරීම බෙහෙවින් ඉවහල් වේ. දෙවෙනි ලෝක යුධමය තත්ත්වය සමඟින් මනුෂ්‍ය වර්ගයාගේ පැවැත්ම සම්බන්ධයෙන් බරපතල වූ අභියෝගයක් එල්ල විය. ප්‍රථම වරට පරමාණුක බෝම්බයක් පුපුරවා හරින ලද්දේ දෙවෙනි ලෝක යුධ සමයේ දී ය. මිනිස් වර්ගයා කාලයේ කුඩා අංශු මාත්‍රයකින් සුණු විසුණු කර දැමීමට හැකි අවි ආයුධ මනුෂ්‍ය වර්ගයා ම සතු වන බව එකී කාල පරිච්ඡේදයේ දී ප්‍රත්‍යක්ෂ විය. එමඟින් ලෝකය අභිමුඛ ව එල්ල වූයේ ප්‍රබල කම්පනයකි. මිනිසා තමන් උසස් සත්ත්වයෙකි යන ආප්තය ස්වයං විවේචනයට ලක් කිරීම පිළිබඳ ව දාර්ශනිකයන් අතර සංවාදමය තත්ත්වයක් ඇති විය. මක් නිසා ද යත් මිනිසුන් මෙතෙක් විශ්වාස කර තිබූ පරමාදර්ශයන් තව දුරටත් වලංගු වන්නේ ද යන්න දෙවෙනි ලෝක යුද්ධයත් සමඟින් ප්‍රශ්නකාරී ලෙස පැන නැගිණ.

සාංදෘෂ්ටිකවාදය ඉස්මතු වන්නේ මෙවැනි සන්දර්භයක් යටතේ ය. 19 වන සියවස අග භාගයේ සිට යුරෝපීය දාර්ශනික මතිමතාන්තරයන්හි සාංදෘෂ්ටිකවාදය පිළිබඳ අදහස පැවතිය ද ස්ථාපිත වූයේ දෙවෙනි ලෝක යුධ සමයෙන් පසු කාලීනවයි. උපතින් හෝ කිසියම් කුලකයකට අයිති වීමෙන් හෝ මිනිස් ආත්මය (**Human Subject**) ගොඩ නො නැගෙන බව සාංදෘෂ්ටිකවාදීහූ පෙන්වා දුන්හ.

නූතන දර්ශනවාදයක් ලෙස කලඑළි ගැන්වීමට පූර්වයෙන් සොක්‍රටීස්, ප්ලේටෝ හා බුදුරජාණන්වහන්සේ වැනි මහා දාර්ශනිකයන් ද තම චින්තනය ඉදිරිපත් කිරීම සඳහා සාංදෘෂ්ටිකවාදී පසුබිම රැගෙන අදහස් පළ කර ඇති බව පෙනී යයි. දෙවන ලෝක යුධ සංග්‍රාමයෙන් අනතුරු ව සංදෘෂ්ටිකවාදය නවීන දර්ශනවාදයක් ලෙස උපත ලබා ඇත. සාංදෘෂ්ටිකවාදය බිහිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑ හේතු දෙකක් හඳුනා ගත හැකි ය.

සමස්ත දර්ශන ඉතිහාසයේ මිනිසාගේ පැවැත්මට ලැබී තිබූ ස්ථානය ඉතා අල්ප වීම ඉන් පළමු සාධකය යි. බටහිර එතෙක් පැවති සාම්ප්‍රදායික දර්ශන සම්ප්‍රදායේ ආත්මය යනු කුමක් ද? මනස කොහි තිබෙන්නේ ද? මිනිසා යනු කවුරුන් ද? මරණින් පසු නැවත උපදී ද? යනාදී ගැටලු පිළිබඳ මූලික අවධානය යොමු කළ ද වත්මනෙහි ජීවත් වන මිනිස් පැවැත්ම නොහොත් සත්තාව කුමක් ද යන්නට වැදගත් තැනක් දී නො තිබුණි. අර්ථ ශූන්‍ය වූ එම දර්ශන වාදයන් උගතුන් හා බුද්ධිමතුන්ගේ සංවාද මණ්ඩපයන්ගෙන් ගිලිහෙන්නට විය. මීට සමාන්තර ව නිස්සාරත්වය, අසහනය, කලකිරීම, ශෝකාකුල බව, සදාචාරාත්මක බව හා සංස්කෘතික සෝදා පාළුව වැනි අපගාමී හා දුස්සමාහිත විචල්‍යයන් එකල සමාජය පුරා පැතිරෙන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස අභිනව දර්ශනවාදයක අවශ්‍යතාව බටහිර සමාජ පසුබිම මත පැන නැගෙන්නට විය.

සාංදෘෂ්ටිකවාදය පෝෂණයෙහිලා තුඩු දුන් දෙවන කරුණ වනුයේ දෙවන ලෝක යුද සමයෙහි ප්‍රතිඵල වශයෙන් සිදු වූ අමානුෂික මනුෂ්‍ය ඝාතනය යි. 18 හා 19 වැනි සියවස්වල බටහිර රාජ්‍යන්හි පැවති අසාධාරණය, කැරලි ගැසීම්, සමාජ අර්බුද, වදකාගාරවල අමානුෂික වදහිංසා ආදී පීඩාකාරී තත්ත්වයන්ට මිනිස් සන්තානය ගොදුරු වීම පිළිබඳ ව සාංදෘෂ්ටිකවාදීන් දුටුවේ ආවේගශීලී චින්තනයකි. මිනිස් ජීවිතවල වටිනාකම, මිනිසාගේ පැවැත්ම පිළිබඳ අදහස් උදහස් ඔවුන්ගේ චින්තනයේ ගැබ් විණි.

මහත් පරිශ්‍රමයකින් ගොඩනගාගත් ජීවිතය කාලයේ අංශු මාත්‍රයකින් කුරිරු ලෙස මරණයට ගොදුරු වන්නේ නම් මිනිසා ජීවත්වීමේ ඇති අර්ථය කුමක් ද? යන්න පිළිබඳ තර්ක විතර්ක මතු විය. තමන්ගේ ජීවිත සන්තානයට වගකිව යුත්තේ කවුරුන් ද? මරණය එතරම් සුළු කොට තකන්නේ මන්ද? මිනිස් ජීවිතවල වටිනාකම කුමක් ද? යන ප්‍රශ්නාවලීන් අතර සාංදෘෂ්ටිකවාදීන්ගේ මනස දෝලනය වන්නට විය. එහෙයින් දෙවන ලෝක යුද සංග්‍රාමය හේතුවෙන් මිනිසා මනෝ ව්‍යාධීන් විසින් පෙළනු ලැබීම සංදෘෂ්ටිකවාදය බිහිවීමටත් ව්‍යාප්තියටත් හේතුකාරක වූයේ යැ යි කියනු ලැබේ.

මෙසේ මෙම දර්ශනවාදයෙන් ආභාසය ලබා සිංහල සාහිත්‍යයෙන් බිහි වූ නවකතාවන් උදෙසා සාංදෘෂ්ටිකවාදී ලක්ෂණ උපයෝගී වූ අයුරු මෙහි දී විශ්ලේෂණයට බඳුන් වේ. නවකතාව වනාහී ගද්‍යමය ප්‍රබන්ධයකි. එය කිසියම් කතා වස්තුවක රාමුවක්හි සිදු වන අවස්ථාවන්ගේ සහ චරිතයන්ගේ නිරූපණයක් වේ. ඒ අනුව,

1.චරිත හා අවස්ථා නිරූපණය
2.ප්‍රබන්ධය හෙවත් කල්පිත කතාන්දර ස්වරූපය
3.ගද්‍ය ලේඛනයක් වීම

යන අංග වත්මන් නවකතාවේ මූලික අංග වශයෙන් හඳුනා ගත හැකි ය. ලෝක සාහිත්‍යය දෙස බලන විට සංකල්පනාත්මක හෙවත් කල්පිත ප්‍රබන්ධකරණයේ තුන්වැනි අවස්ථාව සේ ගැනෙන්නේ නවකතාව යි (වික්‍රමසිංහ, 1985:21). ශ්‍රී ලංකාවේ සිංහල පාඨකයන්ට නවකතාව නමැති කලා මාධ්‍යය පිළිබඳ පළමු වරට දැනගැනීමට ලැබෙන්නේ දහනම වැනි සියවසේ දී ය.

1955-1965 යන දශකයේ දී දාර්ශනික මතාන්තර නිර්මාණාත්මක ලෙස නවකතා සාහිත්‍ය


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පෝෂණයෙහි ලා ඉවහල් විය. නවකතාවන්හි නිරූපිත චරිත ඇතුළු සමස්තය නිර්මාණයෙහි ලා "පැවැත්ම" නම් දාර්ශනික පදනමේ බලපෑම බෙහෙවින් එකල දැක ගත හැකි විය. පුද්ගලයා පුද්ගලයකු ලෙස ජීවත් වීම වනාහි පුද්ගලත්වය යි. එහෙයින් නවකතා සාහිත්‍යය නම් පරායත්ත විචල්‍යය, සාංදෘෂ්ටිකවාදය නම් ස්වායත්ත විචල්‍යය මඟින් පෝෂණය වීම පිළිබඳ මෙම පර්යේෂණයේ විමර්ශනයට බඳුන් කෙරේ.

මනෝ විද්‍යාවේ විෂය පථය මුළුමනින් ම සාංදෘෂ්ටිකවාදයේ පිළිබිඹුවකි. සාංදෘෂ්ටිකවාදය මිනිසාගේ අධ්‍යාත්මය ගවේෂණය කරන්නක් බැවින් එය මනෝ විද්‍යාවේ තෝතැන්න ලෙස හැඳින්විය හැකි ය. සාංදෘෂ්ටිකවාදය මිනිසා පිළිබඳ දර්ශනයකි. මනෝවිද්‍යාවෙන් මිනිසාගේ මානසික චර්යාවන් අධ්‍යයනය කරන බැවින් සාංදෘෂ්ටිකවාදය මනෝවිද්‍යාවේ පර්යේෂණාගාරයක් වැනි ය. අප දකින අසන කියවන සෑම දෙයක් ම යථාර්ථය නොවේ. යථාර්ථය හඳුනා ගැනීමට විද්‍යාවන් අවශ්‍ය ය. මනෝ විද්‍යාවෙන් පුද්ගලයන්ගේ මානසික චර්යාවේ යථාර්ථය ගවේෂණය කරන බැවින් සාංදෘෂ්ටිකවාදී දර්ශනය මනෝ විද්‍යාව පෝෂණය කිරීමටත් සත්‍යය හා යථාර්ථය වටහා ගැනීමටත් ඉවහල් වූ බව නිසැක ය. එසේ ම ඕනෑ ම විද්‍යාවක පරම අභිලාෂය වන්නේ යථාර්ථය හා ක්ෂේත්‍රය සාර්ථක ලෙස භාවිතයට ගැනීම ය. සාංදෘෂ්ටිකවාදී දර්ශනය ද විද්‍යාවකි. එය මනෝ විද්‍යා ක්ෂේත්‍රයට අනුබල දෙමින් මිනිසාගේ පැවැත්ම උදෙසා යහපත් සමාජ වාතාවරණයක් ගොඩ නැඟීම අභිප්‍රාය කොට ගත් දර්ශනයකි. ඒ අනුව මනෝ විද්‍යාවත් සාංදෘෂ්ටිකවාදී දර්ශනයත් එක ම කාසියක දෙපැත්තකි.

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර විසින් රචිත "මළගිය ඇත්තෝ" නවකතාවේ එන "දෙවෙන්දරාසං" චරිතය ද පුද්ගල මනෝ භාවයන් චිත්‍රණය කළ නවකතාවකි. ඒ අනුව දෙවෙන්දරාසංගේ සමස්ත චර්යාව ම ඔහුගේ මනෝභාවයන් විසින් මෙහෙයවා තිබේ. ඔහුගේ අධ්‍යාත්මය ඔහුගේ ම මානසිකත්වය මත පදනම් ව තිබුණි. ඔහුගේ ජීවිතය යම් ගුප්ත බවකින් වෙළී තිබුණි.

පරාරෝපණ ගැටලුව මාක්ස්වාදී ඉගැන්වීම්වල දක්නට ලැබෙන සංකල්පයකි. පරාරෝපණයේ වචනාර්ථය වන්නේ "අන් සතු වීම" යි. එය ශ්‍රම හා සමාජීය පරාරෝපණය ලෙස භෞතිකවාදීන් කරුණු පැහැදිලි කරන අතර සමාජීය පරාරෝපණය කෙරෙහි සාංදෘෂ්ටිකවාදීනගේ අවධානය යොමු වේ. මෙම පරාරෝපණ සංකල්පය දර්ශන ක්ෂේත්‍රයට හඳුන්වා දුන්නේ ජර්මන් දාර්ශනික **ජොහැන් ජී. ෆිච්ටේ** (1762-1814) විසින් ය. සාංදෘෂ්ටිකවාදීහු ද මෙම පරාරෝපණ ගැටලුව පිළිගනිති (රාජපක්ෂ, 2014: 21).

කේ. ජයතිලක විසින් රචිත පරාජිතයෝ" හි උදේනි ආචාර විරෝධී සිතුවිලි සමග බද්ධ වී දැඩි කල කිරීමට පත් වූ පුද්ගලයකු වූයේ කෙසේ ද? යන්නත් එම චර්යාවන් කෙරෙහි පෙරකදෝරු වෘත්තීය චින්තනය, දේශපාලන කටයුතු, චාලනී නම් සුරූපී යුවතිය හා ඇයගේ මානසික ව්‍යාධිය නිසා වූ මරණය උදේනිගේ ජීවිතය අසාර්ථක වීම කෙරෙහි බලපා තිබීම පරාරෝපණය නම් සංසිද්ධියෙන් සාධාරණීකරණය කෙරේ. සාංදෘෂ්ටිකවාදයේ මූලධර්මය පෝෂණය වීමක් පරාරෝපණයෙන් සිදු වී තිබේ.

ඒ අනුව සාහිත්‍ය කලාවේ එන සිංහල නවකතා සාහිත්‍යාංගයේ නිර්මාණශීලීභාවය හා නිරූපණය වන්නා වූ මනුෂ්‍යත්වය ඇතුළු සමස්තය නිර්මාණය වීම කෙරෙහි සාංදෘෂ්ටිකවාදය නම් දාර්ශනික චින්තාව මනෝ විද්‍යාත්මක වශයෙන් ආගමික වශයෙන් හා මාක්ස්වාදී වශයෙන් විමර්ශනයට ලක් කිරීම මෙම පර්යේෂණයේ අපේක්ෂාවයි.

## සාහිත්‍ය විමර්ශනය

ධර්මා රාජපක්ෂගේ සාංදෘෂ්ටිකවාදය හා ආධ්‍යාත්මික පෙරළිය පසුබිම් වූ සිංහල නවකතා (2014), ඒ. ඩී. පී කලංසූරියගේ නූතන බටහිර දර්ශනය(2007), රෝලන්ඩ් අබේපාල හා අරුන්දතී අබේපාලයන්ගේ සාංදෘෂ්ටික හා මානුෂික මනෝවිද්‍යා ප්‍රවේශය (2010) යන කෘති මෙහි දී මූලික වශයෙන් උපයෝගී කරගෙන ඇත. එහි ඇතුළත් සාංදෘෂ්ටිකවාදය පිළිබඳ විවිධ වූ තේමාවන් හා මනෝ විද්‍යාත්මක පදනම මත බිහි වූ මනෝ මූලිකමය වූ න්‍යායන් මෙහි දී අධ්‍යයනයට බඳුන් කර ඇත.

මීට අමතර ව ඒ. වී සුරවීරයන්ගේ සමාජීය සාහිත්‍යය අධ්‍යයනය (1990), සම්ප්‍රදාය නිර්වචනය හා විචාරය (1989), අනුරුද්ධිකා කුමාරිගේ සිංහල මනෝ විද්‍යාත්මක නවකතා (2008) යන කෘති ත්‍රිත්වය හරහා ද සාංදෘෂ්ටිකවාදී සංකල්පයට අදාළ ව සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක කරුණු උකහා ගෙන තිබේ.

එමෙන් ම පී. අතුකෝරලගේ නූතන දේශපාලන හා සමාජ න්‍යාය යන කෘතිය (2005) මගින් මාක්ස්වාදී දර්ශනයේ පරාරෝපණ සිද්ධාන්තය ඇතුළු මූලික ලක්ෂණයන් පිළිබඳ කරුණු අධ්‍යයනයට යොදා ගෙන ඇත.

නවකතාවක් යනු කුමක් ද හා එහි වූ යථාර්ථවාදී පසුබිම වටහා ගැනීම සඳහා මාර්ටින් වික්‍රමසිංහගේ සිංහල නවකතාව හා ජපන් කාම කතා හෙවණැල්ල (1969) යන කෘතිය අධ්‍යයනයට ලක් කොට ඉන් මෙම පර්යේෂණය සඳහා ආලෝකය ලබා ගෙන ඇත.

ඒ. ඩී. පී කලංසූරිය-බර්ට්‍රන් රසල් හා සමකාලීන දර්ශනය (1987), සුචරිත ගම්ලත්-සමකාලීන සාහිත්‍ය විචාරයේ ගැටලු (1990) යන කෘතියන් ද සාංදෘෂ්ටිකවාදයේ මූලික සංකල්පය දාර්ශනික මුහුණුවරකින් යුක්ත ව ඉදිරිපත් කර ඇත.

**Michel Maillard** ගේ **"Sartre Nathan"** (1994), **Razmond Lichet** ගේ **"Lire Camus, Hachette"** (1984), **Shri Shivaji** ගේ **"Existentialism"** (2016), **Walter Kaufman** ගේ **"Existentialism from Dostoevsky to Sartre"** (2020) ආදී


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පර්යේෂණ පත්‍රිකාවන් ද මෙම අධ්‍යයනය සඳහා යොදා ගැනුණි.

එමෙන් ම පී. ගුණවර්ධනගේ සාංදෘෂ්ටිකවාදය (1994), සෝමරත්න බාලසූරියගේ ඇල්බෙයා කැමූගේ පිටස්තරයා (1990), ගල්කැටිය සත්‍යපාලගේ හර්මන් හෙස සහ ඔහුගේ නිර්මාණ (1992) යන කෘතීන්හි ඇතුළත් වන සාංදෘෂ්ටිකවාදී සාහිත්‍යයේ ගැඹුරු වූ දාර්ශනික පදනමේ අන්තර්ගත කරුණු මෙම පර්යේෂණ පත්‍රිකාව සඳහා උපයෝගී කොට ගෙන ඇත.

උක්ත ව දක්වා ඇති ග්‍රන්ථ හා පර්යේෂණ ලිපි මෙම පර්යේෂණයෙහි සාහිත්‍යය විමර්ශන ශානරය පෝෂණය කිරීමට ඉවහල් කර ගනු ලැබේ.

## පර්යේෂණ ගැටලුව

සාංදෘෂ්ටිකවාදී ලක්ෂණ සිංහල නවකතා කෙරෙහි කෙතරම් දුරට බලපා තිබේ ද ?

## පර්යේෂණයේ අරමුණ

සාංදෘෂ්ටිකවාදී ලක්ෂණ සිංහල නවකතා සාහිත්‍යයේ පෝෂණයෙහි ලා කෙතරම් දුරට දායක වූයේ ද යන්න තෝරාගත් සිංහල නවකතා ඇසුරින් විමසුමට ලක් කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. මනුෂ්‍යත්වය නිර්මාණය වීම කෙරෙහි "පැවැත්ම" පදනම් වන බව මනෝ විද්‍යාත්මක ව විග්‍රහ කිරීම, සාංදෘෂ්ටිකවාදය සහ දේවවාදී (ඊශ්වරවාදී) චින්තනය හා අදේවවාදී (ඊශ්වරවාදී නො වන) චින්තනය අතර ඇති සම්බන්ධතාව ආගමික වශයෙන් පැහැදිලි කිරීම, මිනිසාගේ පැවැත්ම තේමා කොට මිනිස් ජීවිතයේ වටිනාකම හා ජීවත් වීමේ අර්ථය සොයා ගිය මාක්ස්වාදී දර්ශනය නිරූපණය කිරීම මෙහි අනු අරමුණු වේ.

## පර්යේෂණයේ වැදගත්කම

සාංදෘෂ්ටිකවාදය වනාහි මිනිසා පිළිබඳ වූ දර්ශනයකි. මිනිසාගේ පැවැත්ම මූලික කොට ගනිමින් ආගමික, මනෝ විද්‍යාත්මක හා මාක්ස්වාදී වශයෙන් පවතින්නා වූ මතවාදයන් මෙහි දී සලකා බැලේ. සිංහල නවකතා සාහිත්‍යයේ නිරූපිත චරිතයන්හි අභ්‍යන්තරයට කිඳා බැස එහි අඩුලුහුඬුකම් හා යථාර්ථය අවබෝධ කර ගැනීමෙහ ලා සාංදෘෂ්ටිකවාදී දාර්ශනයෙන් ලැබෙන මඟ පෙන්වීම සුවිශේෂ වූ අධ්‍යයන වැදගත්කමක් ලෙස සැලකිය හැකි වේ. එමෙන් ම මිනිසාගේ ජීවන පැවැත්ම උදෙසා යහපත් සමාජ වාතාවරණයක් ගොඩ නැඟීමට ද, පවතින සමාජය මිනිසාට වඩාත් නිදහස් සහ හිතකාමී එකක් කිරීමට ද මෙම පර්යේෂණය වැදගත් වේ. හෙයින් මෙම දර්ශනවාදය සිංහල නවකතා සාහිත්‍යයේ එන මනුෂ්‍යත්වය ගොඩ නැඟීම මුළු මහත් මානව වර්ගයාගේ ම ජීවන අපේක්ෂා පුබුදුවා ලීමට සහ මුවහත් කිරීමට ගත් උත්සාහයකැ යි සිතිය හැකි ය. එමෙන් ම මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වැඩිදුර අධ්‍යයනය කිරීමට ද මෙම විමර්ශනය වැදගත් වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙහි දී මූලික වශයෙන් තෝරාගත් නවකතා (1955-1965) සියල්ල ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ගෙන විමර්ශනාත්මක ක්‍රමවේදය ඔස්සේ අධ්‍යයනයට ලක් කෙරේ. මෙය ශුද්ධ පර්යේෂණයකි. ද්විතීයික මූලාශ්‍රය වශයෙන් සාංදෘෂ්ටිකවාදය යන තේමාව ඔස්සේ රචිත නවකතා පිළිබඳ ලියැවුණු විචාර කෘතීන් හා පුවත්පත්වල පළ වූ ලිපි ලේඛන හා අන්තර්ජාල ලිපි උකහා ගෙන ඇත. මෙ මඟින් අධ්‍යයනයට අවශ්‍ය න්‍යායාත්මක කරුණු ගොනු කර ගැනීමට අපේක්ෂා කෙරේ. මෙය පුස්තකාල පරිහරණයෙන් සිදු කරන පර්යේෂණයකි. ගුණාත්මක දත්ත විශ්ලේෂණයක් කිරීමට අපේක්ෂිත ය.

## සාකච්ඡාව

### පරාරෝපණ පිළිබිඹුව

මිනිසා තමා අවට ලෝකය හේතුවෙන් මුහුණ දෙන ඛේදජනක ස්වභාවය මනෝවිද්‍යාත්මක ව පිළිබිඹු කරන පැතිකඩක් ලෙස පරාරෝපණය හැඳින්විය හැකි ය. සාංදෘෂ්ටිකවාදී පුළුල් දර්ශනය තුළ පරාරෝපණය නමැති සංකල්පය "විරාගය" නවකතාවෙහි මැනවින් ප්‍රකට වේ. 1956 සිට සාංදෘෂ්ටිකවාදී දර්ශනය හා එහි වූ පරාරෝපණ සිද්ධාන්තය විරාගය ඇසුරින් සිංහල නවකතා කලාවෙහි රෝපණය කිරීමට මහ ගත්කරු මාර්ටින් වික්‍රමසිංහයන් සමත් විය. "අරවින්ද" අතිශයින් ම සංකීර්ණ හා ගුප්ත චරිතයක් බව සමස්ත විරාගය ඇසුරින් ම පිළිබිඹු වේ. එක් අතකින් අරවින්ද මානව දයාවෙන්, ආදරයෙන් කරුණාවෙන් පිරුණු හදවතක් ඇත්තෙකි. නමුත් ඔහුගේ ගුණාංගයන්හි අඳුරු ගුප්ත ස්වභාවයක් ද පැවැතිණි.

අරවින්ද සමාජ සම්මතයට අභියෝග කළ චරිතයක් ලෙස හඳුනා ගත හැකි ය. හෙතෙම ලෞකික ජීවිතය පිළිබඳ සියලු හැඟීම් සහිත ව සිටිය ද එම ජීවිතයෙන් දුරස්ථභාවයක් තබා ගත් අයෙකු බව පෙනෙයි. හෙතෙම බොහෝ දේ පිළිබඳ සාමාන්‍ය දැනුමකින් යුක්ත වුවත්, විශේෂ වූ ප්‍රාමාණික දැනුමක් ලද්දෙකු නො විය. අරවින්ද වෛද්‍යවරයකු බවට පත් කිරීමේ පියාගේ අභිලාෂය ප්‍රතික්ෂේප කළේ ඔහුගේ අදක්ෂතාව හෝ නො හැකියාව නිසා නො වේ. නග්න ගැහැණු මළ කඳන් කැපීමට ශක්තිය නැතැයි යන ප්‍රාථමික හැඟීම්වලින් ඔහු පෙලුණු නිසා පමණක් ම නො වේ. අතහැරීම, උපේක්ෂා සහිත බව වැනි පරාරෝපණ හැඟීම් ද හේතුවෙනි. අරවින්ද රසායන විද්‍යාව ඉගෙනීමට පියා විසින් පොළඹවා ගත්ත ද ඔහුගේ දෘෂ්ටිය සෘණාත්මක චින්තනයකින් වෙළී පැවතිණි. අරවින්දගේ කලකිරුණු මානසිකත්වය හා උපේක්ෂා සහගත දෘෂ්ටිය ඔහු ව තාත්ත්වික ලෝකයෙන් බැහැරට තල්ලු කොට දැමුවේ ය. තමා වෙත පැවති සියලු ශක්තීන් තමාගෙන් ඉවත් ව යන බව ඔහුට හැඟී යයි. ඉගෙනීම, රැකියාව ආදිය පිළිබඳ ව පැවති ඔහුට ම ආවේණික සිහින ඔහුගේ මනසින් ක්‍රමයෙන් වියැකී යයි. තම ශක්තීන් තමන්ගෙන් ම ඉවත් වී තමාට එරෙහි ව තමාව ම පෙළෙන බවට වන හුදකලා හැඟීමෙන් ඔහු වෙළී යයි.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

අරවින්දගේ ප්‍රේමය සම්බන්ධ භූමිකාව තුළ ද ජීවත්වීමේ අර්ථය පුද්ගලයාගෙන් ඈත් වීම ප්‍රබල කරන ලද සංසිද්ධියකි. සරෝජනීට අරවින්ද සිතින් පෙම් කළ ද එය ක්‍රියාවට නැඟීමට ඔහු අපොහොසත් වූයේ විවාහය ගැන සිතන විටත් ඔහු ඉමහත් භීතියට පත් වූ හෙයිනි. ඉන් පෙනී යන්නේ අරවින්ද තාත්ත්වික නො වන යථාර්ථවාදී නො වන චින්තනයකින් ජීවත් වූ නිසා විය හැකි ය. ඔහුගේ පැවැත්මට, සිතුවිලිවලට, චර්යාවන්ට හේතු සාධක වූ පදනමක් ඔහු සතු ව පවතින්නට ඇත. නමුත් විය යුතු දේ පිළිබඳ අභිමතානුරූපි අදහස් සමඟ ගැටීමක් පවතින බව ඉන් අදහස් කෙරේ.

අරවින්දගේ හා සිරිදාසගේ චරිත ද්විත්වය සැසඳීමේ දී අරවින්ද කොතරම් පරාරෝපණ ගති ලක්ෂණවලින් යුක්ත ද යන්න මැනවින් වටහා ගත හැකි ය. සිරිදාස තමා වෙත පැවති ශක්තිය තමාගේ ම කර ගැනීමට සමත් වන විට අරවින්ද තමා සතු දේ තමාගෙන් ඈත් වී යන්නට ඉඩ හැරියේ ඔහුගේ ම මනෝමූල තත්ත්වය මත ය. සරෝජිනීට අරවින්ද ආදරේ කළ නමුත් එය සැබෑ තාත්ත්වික ආදරණීය සිතුවිල්ලක් නො වීය. ආදරය පිළිබඳ දැඩි ව වැළඳගත් සිතුවිලි පැවතිය ද ආත්මාර්ථකාමී හැඟීමකින් තොර විය. සිරිදාස සරෝජනී සමඟ එක්වීම පිළිබඳ අරවින්දගේ හදෙහි විරෝධාකල්පයක් පැවැතිණි. එය ඍජු ව ප්‍රකාශ කිරීමට තරම් අරවින්දට ශක්තියක් නො තිබූයේ ඔහු සතු ව පැවති තමා තමාව ම තනිකමට තල්ලු කර ගැනීමේ ආවේණික චින්තනය හේතුවෙනි.

> "ඈ මා සමඟ ආශාවෙන් කතා කරනවා. ඈ කවදාවත් අසන්තොෂ වුණේ නෑ. මම යෝජනාවක් කළොත් ඈ ඒක අහක දමන්නේ නෑ..." (වික්‍රමසිංහ, 1956:172) යයි සිරිදාස පවසන විට,
>
> "විවාහ ජීවිතය ගැන සිරිදාස තරම් දුරට සිතන්නට සරාට තාම වයසක් නෑ..."

යනුවෙන් (එම,) අරවින්ද පවසයි .

සිරිදාස ව්‍යවහාරය පමණක් සළකා වඩා තාත්ත්වික ලෙස සරෝජනී ගැන ස්වකීය චින්තන ධාරා ඔස්සේ සිතන විට අරවින්ද ප්‍රේම කතා හා කාව්‍යයන් කියවීමෙන් ලද දැනුම ඇසුරින් සරෝජනී ගැන සිතයි. ඉන් ඔහු ආධ්‍යාත්මික ප්‍රීතියක් ලබන අතර සිරිදාස වඩාත් ප්‍රීතිමත් වනුයේ සරෝජනී හා විවාහ වීමෙනි. මෙයින් අරවින්ද කෙතරම් අතාත්ත්වික මනෝභාවයකින් පෙළුනේ ද යන්න පසක් වන අතර ඈත්වීමෙන් ඉමහත් කම්පනයක් නො ලබන බවත් හැඟවෙයි. තමාගෙන් ඈත් වී, ශක්තියක් වී තමා ව ද පෙළීම මඟින් අරවින්ද ආධ්‍යාත්මික සතුටක් ලැබුවේ ද යන්න පිළිබඳ ව සැකයක් ඇති වේ.

කායික සබඳතාවකට ඇතුළු වීම දිගින් දිගට ම අරවින්ද ප්‍රතික්ෂේප කිරීම තමා ආශා කරන ෆැන්ටසි ශරීරය (සරෝජනී/බතී) පිළිබඳ අරවින්දගේ චින්තනය මානසික රෝගී තත්ත්වයක් ලෙස ද සිතිය හැකි ය. ඔහු විපරීත සතුටක් ලබන්නෙකි. අරවින්ද අත් හලේ පියාගේ අපේක්ෂාවන්, සරෝජනීගේ ප්‍රේමය පමණක් නො වේ. ඔහු සතු දේපළ ද හෙතෙම අත් හලේ ය. මේනකා තම සැමියාගේ නමට ලියූ ගේ සහ ඉඩම පිළිබඳ මව හා අරවින්ද දැනුවත් කරන විට, "අක්කලාට අයිති නම් අපි මේ ගෙයි ඉන්නෙ මොකටද" යැ යි අරවින්ද පැවැසීමෙන් ඔහුගේ උපේක්ෂා සහගත අත් හැරීම ප්‍රකට කරවයි. මෙය වූ කලී අරවින්ද, අරවින්දගෙන් ඈත් වීමේ ප්‍රවණතාවකි. සරෝජනී පිළිබඳ පැවති ආදරයට ද අරවින්දගේ හදවත නො පෙළා අතුරුදහන් වීමට ඉඩ හැරියේ ය. "අරවින්දගේ කාමරය සුන්බුන් එකතු වන බේරුවල් බොක්ක වගේ" යැයි මේනකා පැවසූයේ අරවින්දගේ මනසත් එබඳු සුන්බුන් ගොඩක් බව සංකේතවත් කරමිනි. ඔහුගේ වෙඩි බෙහෙත් පර්යේෂණයේ දී සිදු වූ පුපුරා යාම, අරවින්දගේ මානසික පුපුරායාම සංකේතවත් කරයි. බිඳී විසිරී යන මනෝභාවයන්ට යම් සිසිලසක් එක්කරමින් අරවින්දගේ ජීවිතයට "බතී" පිවිසෙයි. අරවින්ද බතීට දැක්වූයේ අනුකම්පා සහගත ඇල්මකි. ඇයගේ අනාගතය පිළිබඳ සිහිනයක් අරවින්ද තුළ පැවතිණි.

> "බතී කවදහරි හොඳ ගැහැනු ළමයෙක් වේවි. ඈ පොත්පත් ඉගෙනීමට නොව, මැහුම් ගෙතුම්වලට හුඟක් සමර්ථයි..."( එම, 1956:140).

අරවින්ද බතී පිළිබඳ ව දුටු සිහිනය ද බිඳ වැටෙයි. බතී හා ජිනදාසගේ සබඳතාව දැනගන්නා අරවින්ද ඉමහත් කෝපයට පත් වූවත්, නැවතත් ඔහුගේ සුපුරුදු මනෝභාවයන් මතු වී ඇයට ගුප්ත ලෙස ආදරය කරන බව පෙනී යයි. අවසානයේ දී බතී, ජිනදාස හා විවාහ කර දෙන අරවින්ද බතී පිළිබඳ ව ගොඩනගා ගෙන තිබූ ඇයගේ ෆැන්ටසි ශරීරය පිළිබඳ සිහිනය ද බිඳී ගියේ ය. මේ සියලු ආධ්‍යාත්මික මනෝභාවයන් බිඳ වැටෙන විට අරවින්ද කායික වශයෙන් ද පිරිහීමට ලක් විය. ලෝක සම්මත සිරිත් විරිත් නො තකා හුදකලා වූ ජීවිතයක් ගත කරන අරවින්ද සිය සිතුවිලි ලෝකයෙහි අතරමං වේ. එකී තනිකම නිසා හටගත් ආධ්‍යාත්මික පෙරළිය ඔහු පියවි ලෝකයෙන් ඈතට කැඳවා ගෙන යයි. අවසානයේ තමා ආදරය කළ ළඳුන් දෙදෙනාගේ අනුකම්පාව ලබමින් මිය යයි.

**නිදහස, වගකීම, ආත්ම සාක්ෂාත්කරණය හා කාංසාව රැගත් අපේක්ෂාභංගත්වය**

නවකතා සහ කෙටිකතාකරුවෝ ස්වකීය කතා වස්තූන් නිර්මාණය කරලීමේ දී නොයෙක් වූ උපක්‍රම හා ශෛලීන් භාවිත කරති. අභ්‍යන්තර චරිතයන්ගේ සිතුවිලි හා චින්තන ධාරාවන් විශ්ලේෂණය කරන්නේ නම් එවන් කෘතීන් මනෝ විග්‍රහත්මක නවකතා ලෙස නිර්වචනයට පාත්‍ර වේ. මළගිය ඇත්තෝ සහ මළවුන්ගේ අවුරුදු දා යන කෘතීහු ද එවන් මානුෂීය මනෝ විග්‍රහාත්මක ගණයෙහි ලා සැළකෙති. කෘති ද්වයෙහි ම කතා සාරය පෝෂණය වීමෙහි ලා එක ම කතාවක් පදනම් වූ බැවින් එම කෘතීන් එකිනෙක සම්බන්ධ කොට ගනිමින් එහි මනෝ විශ්ලේෂණාත්මක පැතිකඩ විමසීම වටී. දෙවෙන්දරාසං සහ නොරිකෝසං යන චරිත ද්වය කථකයාගේ නො හොත් රචකයාගේ ප්‍රධානතම නිමිත්ත වන්නේ ය. එකී චරිත විමසීමෙන් ස්ත්‍රී පුරුෂයන්ගේ එක්තරා යථාර්ථවාදී සත්‍යයක් හෙළිදරව් කරන්නා සේ ම එමගින් ස්ත්‍රිය හා පුරුෂයා


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පිළිබඳ ව රචකයා තුළ කිසියම් යථාර්ථවාදී චින්තනයක් නො හොත් දර්ශනයක් ද ඉස්මතු කර පෙන්වයි. නිදහස, වගකීම, සංතුෂ්ටිය රැගත් පුද්ගල භාවය හා ආත්ම සාක්ෂාත්කරණය දෙවෙන්දරාසං සහ නොරිකොසංගේ අධ්‍යාත්මය හා අත්‍යන්තයෙන් බැඳී විචල්‍යයන් වේ. සාංදෘෂ්ටිකවාදීහු නිදහස හා පරම සැපත අපේක්ෂා කරති. මළගිය ඇත්තෝ නවකතාව ආරම්භයේ දී ම දෙවෙන්දොරාසංහට මානසික නිදහස, සතුට හා එහි භුක්තිය විඳීමට අවශ්‍යතාව ඇති බව මින් පැහැදිලි වේ.

> "අප රට උගතුන්ගේ සැළකිල්ලට භාජනය වූයේ මා අඳින සිතුවම් හොඳ ද නැද් ද යන ප්‍රශ්නය නොව මා මහණ දම් පුරන්නෙකු ද නැද්ද යන්න ය. මෙහි දී මට සිතුවම් ඇඳීමට සුදුසු ඉඩකඩක් හෝ එවැනි කටයුත්තකට උවමනා කර ඇති මානසික වාතාවරණය හෝ ලබා ගත නො හැකි විය" (සරච්චන්ද්‍ර, 1959:02).

තෝකියෝ නගරයේ හුදකලා ව ජීවත්වන මොහු තම ජීවිකාව හෙවත් ආත්මය තහවුරු කරගැනීම උදෙසා ජපනුන් සඳහා ඉංග්‍රීසි පන්ති පවත්වමින් යම් ප්‍රමාණයක ආදායම් මාර්ගයක් සලසා ගනිමින් ජීවිකාව සරිකර ගැනීමට සමත් විය. නිදහස හා සතුට යන මානුෂීය අභිප්‍රායන් කෙරෙහි තම ජීවිතය රැගෙන යා හැකි එක ම මඟ හුදෙකලාව යැයි ඔහුගේ සිතිවිලි දාමයෙහි ස්ථාපිත විය. එහෙයින් හුදකලාව ප්‍රිය කිරීම ආත්ම සාක්ෂාත්කරණයේ මූලික ලක්ෂණයක් ලෙස හඳුනාගත හැකි ය. සාංදෘෂ්ටිකවාදයේ දී නිදහස ලෙස අර්ථකථනයට බඳුන් වනුයේ තෝරා ගැනීමේ නිදහසයි. දෙවෙන්දරාසං තම ජීවිතය භෞතිකවත් ආධ්‍යාත්මිකවත් යම් දෙයකට ඇලීමට ඉඩ ප්‍රස්ථාව නො දුන්නේ ය. දෙලොවක් අතර අතරමං වූවකු ලෙස තම හැඟීම් හා සට්ටනයකට ඔහු ලක් විය.

බෞද්ධ දාර්ශනික මඟ ප්‍රථමයෙන් ම අනුගමනය කිරීමට පෙළඹුණි ද දෙවෙන්දරාසංගේ මානසික නිදහස රැගත් තේරීම වූයේ ගිහි ජීවිතය යි. ගිහි ජීවිතය අර්ථවත් කරලීම උදෙසා ඔහුගේ තේරීම වූයේ ආත්ම සාක්ෂාත්කරණීය බවයි. එනම් යථාර්ථය හඳුනන සම්ප්‍රදායන් බිඳ නො හෙළමින් ගැටලු කේන්ද්‍රිය කොට ගනිමින් වෙසෙන චරිතයක් වීමයි. ආත්ම සාක්ෂාත්කරණයට ලක් වූවෝ නිර්මාණශීලීහු වෙති. විඥානය තුළ තැන්පත් වී ඇති නිර්මාණ කුසලතා මඟින් නැවුම් නිපැයුම් හා නව සොයා ගැනීම් එළි දැක්වීමට සමත් වේ. භාරතීය චිත්‍ර කලාව මෙන් ම නාට්‍ය කලාව ගැන ද හැඟීමක් හා දැනීමක් ලත් දෙවෙන්දරාසං ජපානයේ දී නෝ සහ කබුකි යන ගැමි නාට්‍ය සම්ප්‍රදායන් පිළිබඳ අධ්‍යයනයක යෙදෙන්නට විය. එකී නාට්‍ය සංදර්ශන නරඹමින් නාට්‍ය ශාලාවක් කරා යාම ද එක්තරා සිරිතක් ලෙස සිය චරිතාපදානය වෙත කැඳවා ගනී. එයින් ඔහු ලැබූ ආස්වාදය සහ තෘප්තිමත් බවින් ජීවිතයේ ආත්ම පූර්ණ සංකල්පය සාක්ෂාත්කරණයට ලක් විය.

> "මා දවස් කිහිපයක් ම ගත කළේ කුල්මත් වූ සිතින් යුතුව හුදෙක් වටපිටාවේ මවා තබන ලද සෞන්දර්ය විඳ විඳ නිදැල්ලේ ඇවිදිමිනි. මම කබුකි ශාලාවට පිවිසියෙමි. නෝ නාට්‍ය බැලීමි. ගේෂා නැටුම් නැරඹුයෙමි" (සරච්චන්ද්‍ර, 1959:10).

ප්‍රේමය වනාහි හුදු මානසික සංකල්පයක් ම නො වේ. කායික හා මානසික යන දෙපාර්ශවයේ ම සංකලනයකි. දෙවෙන්දරාසං සහ නොරිකොසං අතර ඇතිවන ප්‍රේමණීය හැඟුම් සමුදාය වගකීමක් හා බැඳෙමින් අර්ථකථනයට ලක් වේ. දෙවෙන්දරාසං නිවැරදි තෝරා ගැනීමක් හා සම්බන්ධ වූයේ වී නම් නිදහස් ජීවිතයක් ද ඔහුට අත් පත් වන්නට ඉඩ තිබෙන්නට ඇත. නොරිකෝට තම ප්‍රේමය පුද දීමටත් ආපසු පෙරළා ඇයගෙන් ප්‍රේමය යැදීමටත් දෙවොන්දරාසං යොමු විය. කෙසේ වුව ද සාංදෘෂ්ටිකවාදීන් පැහැදිලි කරනු ලබන වගකීම නම් විචල්‍යයෙන් ඔහු නිරතුරුව ම පළා යන්නට තැත් කළේ ය. නොරිකෝගේ ප්‍රේමය, සෙනෙහස හා රැකවරණය ලැබුව ද ආපසු ඇයට එකී සෙනෙහෙවන්ත ප්‍රේමය ලබාදීමට තරම් මානසිකත්වයක් ඔහුට නො තිබිණි. තමා වෙනුවෙන් නිවැරැදි දේ තෝරා ගැනීම වරදකි. සාංදෘෂ්ටිකවාදී වරදකාරීත්වයෙහි දෙවෙන්දරා බැඳුණි. එනම් නොරිකෝහට ස්වකීය හදවතේ ප්‍රේමය පුද ලද නමුත් ඇය සමඟ නීතියෙන් බැඳීමට දෙවෙන්දොරාගේ මනෝභාවයන් ක්‍රියාශීලී නො විණි. තමාගේ මනෝ ලෝකය තුළ තම අභිලාෂයට එරෙහි ව කටයුතු කරමින් ඇතිවන ස්වයං වරදකාරීත්වය දෙවෙන්දරාසං අත් විඳී.

සාංදෘෂ්ටිකවාදී නිදහස අපේක්ෂාවෙන් නොරිකෝසං තිර ලෙසින් ම මොහු සමඟ එක් වීමේ අභිලාෂයෙන් හැසිරෙයි. දෙදෙනා අතර ඇතිවන වාගාලාප මඟින් හා ඒ වගේ දෙවෙන්දරාසංට හැඟෙන පරිදි ඉඟි කළ ද ඔහු එය තේරුම් ගැනීම කෙසේ සිදු කළේ ද යන්න කුකුසකි. කෙසේ නමුදු තම අභිප්‍රායන්ගෙන් මිදීමටත්, තම ආශාවන් නෙරපා දැමීමටත් කිසිවිටෙකත් ඇය උත්සාහ නො කළා ය.

> "ඒකට කමක් නෑ අපි දෙන්නා අඹුසැමි යුවළක් කියලා හිතාවියි. නොරිකෝ සිනාසෙමින් කීවා ය. කෝලයක් නැති ව එසේ කථා කිරීම ගැන මම පුදුම වෙමි" (සරච්චන්ද්‍ර, 1959:34).

සාංදෘෂ්ටිකවාදී ප්‍රවේශය තුළ තම පුද්ගලත්වය වටහා ගැනීම පාරප්‍රාප්තිය හෙවත් සාංදෘෂ්ටිකවාදයේ කේන්ද්‍රය ලෙස දක්නට ලැබේ. තමා සතු නිදහස වටහා ගත් පසු ව පුද්ගලයා පරිපූර්ණත්වයට පත් වේ. දෙවෙන්දොරාසංගේ ජීවිතය දැඩි උදාසීන බවත් පෙලුණු අතර තවත් ජීවිතයකට බැඳීමට ඇති බීරාන්ත ස්වභාවය නිතැතින් ම ඔහුගේ චරිතයෙන් විශද වේ. ඔහු තමා සතු නිදහස වටහා ගන්නා පුද්ගලයකු බවට පත් වෙයි. තම ජීවිතය සතු වගකීම අගය කිරීමට උත්සාහ කළ ද ඉන් ජීවිතයේ පූර්ණත්වයට ළඟා වීමට ඔහු සතු හොඳ සහ නරක යන දෙක ඉක්මවා ගිය පුද්ගලයකු බවට පත් වෙයි. මෙය ආත්ම සාක්ෂාත්කරණයේ මාස්ලෝ ප්‍රකාශ කරන ලෝකෝත්තර ලක්ෂණය වශයෙන් ද සැළකිය හැකි ය.

දෙවෙන්දරාසංගේ ජීවිතය වෙත භව කාංසාව හෙවත් ජීවන කාංසාව ආරෝපණය වීම කෙරෙහි


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

හුදෙකලාව, අපේක්ෂාභංගත්වය, නිස්සාර බව, වැරදිකාරී හැඟීම් වැනි අපගාමී පෞරුෂ ලක්ෂණයන් හේතුකාරක විය. තෝකියෝ නගරයේ දී හුදෙකලා ව ගෙවන ජීවිතය මඟින් ඔහු එක්තරා ලෙසකින් හීනමානයක ජීවමාන වේ. ඊට හේතුව වන්නේ ජපන් බස නිසියාකාර ව නො දැනුවත්කම නිසා ජපන් සමාජය හා ජන ජීවිතය සමඟ මුහු වීමේ ඉඩ ප්‍රස්තාව හීන වී යාම නිසා විය හැකි ය. සමාජගත පුද්ගලයන් හා අන්‍යෝන්‍ය ව එක් වීමෙන් හා අවබෝධයකින් තොර ව අන්තර් සබඳතා පැවැත්විය නොහැකි වේ. මෙකී තත්ත්වය දෙවෙන්දරාසංගේ දෙදරවාලීමට හේතු විය. එහෙයින් ස්වකීය ආත්ම විශ්වාසය බිඳ වැටී චිත්‍ර කලාව කෙරේ ද උදාසීනත්වයක් ඔහු තුළ ජනිත වේ.

> "මගේ නිර්මාණ ශක්තිය හීනවත් ම මගේ නොසන්සුන් ගතියත් අධික වන්නට විය. නිර්මාණයට උවමනා වූ චිත්ත ඒකාග්‍රතාවය කෙමෙන් මා කෙරෙන් ගිලිහී යන්නට විය. උකියෝ-එ සිත්තරුවන් මෙන් මා ද පොදු ජීවිතයෙහි ගැලී සිටිය යුතුය. මගේ ආත්ම විශ්වාසය අඩු වූයේ නිර්මාණයට තුඩුදුන් කිසිවක් මා පරිසරයෙන් උකහා නොගත හෙයිනැයි මම සිතුවෙමි"(සරච්චන්ද්‍ර, 1959:12).

සාංදෘෂ්ටිකවාදීන්ට අනුව මිනිසා සතු ව පවත්නා අධික තෘෂ්ණාව හා කම්සැප පසුපස හඹා යමින් ඒවා ඉෂ්ට නො වීමෙන් ඉච්ඡාභංගත්වයට හා සන්තාපයට පත් වේ. එයින් උපදින ආත්ම අසහනකාරීත්වයෙන් දෙවෙන්දරාසං පීඩනයට ලක් වේ. ඔහු හුදෙකලා භාවයේ පිළිසරණ සොයමින් ජීවත් වේ. දෙවෙන්දරාසං ආදරයේ ව්‍යාජය පැතූයේ මමෙවාකා නම් ගේෂාවගෙනි. ඔහු ලද නිසරු ජීවිතයෙහි ආදරයක පිළිරුවක් වත් හිමි වූයේ මමෙවාකාගෙන් ය. ආදරයේ ප්‍රතිරූපය ආදරයට වඩා අගය කොට සැළකූ ඔහු සත්‍ය ප්‍රේමය පිළිබඳ දැක්වූයේ අපේක්ෂාවන් භංග වූ දෘෂ්ටියකි. සැබෑ ආදරණීය ජීවිතය තුළට කිඳා බැස බැලූ විට එය දුකින් තැවරෙන බව ඔහුගේ මනෝ චෛතසිකය විය.

දෙවෙන්දරාසං වෙලෙන ආශාව, දොම්නස, කලකිරීම හා භීතිය වැනි අපගාමී පෞරුෂ ලක්ෂණයන් හේතුවෙන් සමස්ත ජීවිතය පිළිබඳ විමසනුයේ ශූන්‍යත්වය වැළඳ ගනිමිනි. එහෙයින් ජීවිතයෙහි කිසිදු පූජනීය බවක් නො මැති වන අතර ඉච්ඡාභංගත්වය වැනි මානසික ව්‍යාධීන්ට ඔහු ගොදුරු වේ. මෙකී කාංසාව හේතුවෙන් දෙවෙන්දරාසංගේ මනෝභාවයන් ආධ්‍යාත්මික ආබාධයකට ලක් වේ.

**මරණය නො පැවැත්ම හා ජීවිතයේ අර්ථය සොයා යාම**

ලාංකේය ජන ජීවිතයට හර පද්ධතීන් එක්කොට විනය ගරුක සද් මාර්ගයක ගමන් කරවීමට උපකාරී වූ බුදු දහම අල්ප දෘෂ්ටියකින් විවේචනයට භාජනය කිරීම සාංදෘෂ්ටිකවාදී නවකතාකරුවන් අතින් සිදු විය. හෙවනැල්ල නවකතාවෙන් ද සමස්තයක් ලෙස බුදු දහම සරදමකට ලක් විය. ඒ සඳහා සිරි ගුනසිංහයන් "ජිනදාස" මෙවලමක් කර ගත්තේ ය.

ජිනදාස ගමේ හැදුණු වැඩුණු ගැමි ගුණාංගවලින් පෝෂණය වූ තරුණයෙකි. ඉතා යහපත් දරුවෙකු පිළිබඳ කරන විස්තර කථනයකින් කතුවරයා කෘතිය අරඹන්නේ ම ජිනදාස "හොඳ ළමයෙකි" යන ආප්තය ඉස්මතු කරමිනි. නමුත් ඔහු මෙම සියලු හැඳින්වීම් ඔස්සේ ප්‍රබන්ධය පුරා ම ගොඩනැඟෙන්නේ නිවට නියාලු චරිතයක් ලෙසිනි. ජිනදාස විශේෂයෙන් ම පන්සල කේන්ද්‍ර කොට ගනිමින් ලොකු හාමුදුරුවන්ගේ අවවාද හා අනුශාසනාවලින් ජීවිතය සකසා ගත් පුද්ගලයෙකි. නමුත් කතුවරයා කතානායකයා නිවට චරිතයක් ලෙස ද හුවා දක්වයි. ජිනදාස විශ්වවිද්‍යාලයට ඇතුළු වීමෙන් පසු හෙතෙම පෙරළිකාර පුද්ගලයකු බවට පත් වෙයි. කතුවරයා විශ්වවිද්‍යාලය දකින්නේ බෞද්ධ ආචාර ධර්ම සහමුලින් ම කෙලෙසා දැමූ ආයතනයක් ලෙස ය. එවන් තැනකට පැමිණෙන ජිනදාස තමන් කුඩා කල ගැවසුණු පන්සලේ ආචාරධර්මත් විශ්වවිද්‍යාලයේ නව ඇගයීම් පද්ධතිය අතරත් මානසික ව සිර ගත වෙයි. විශ්වවිද්‍යාලය යනු උගතුන් බිහි කරන පුළුල් අධ්‍යයනයක් කරා මෙහෙය වන ආයතනයකි. ජිනදාස ගොඩනඟා ගෙන තිබූ සදාචාර අගයන් මත ඔහු විශ්වවිද්‍යාලයට නුසුදුස්සෙක් බවට පත් වේ. එවැන්නෙක් විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වුවහොත් ආගමික සදාචාරයත්, විශ්වවිද්‍යාල උප සංස්කෘතියත් අතර ඇති වන මානසික ගැටුම ඔහුගේ විනාශයට හේතු වෙයි. උපාධියක් ද රහිත ව, ගමෙන් ගෙනා ආගමික සදාචාර පද්ධතිය ද රහිත ව මානසික රෝගියෙකුගේ තත්ත්වයට පත් වීමෙන් කතුවරයා අඟවන්නේ මෙය යි. ජිනදාස විශ්වවිද්‍යාලයේ දී නිදහස නො දැමුණු සමාජයට නිරාවරණය වේ. නමුදු ඔහු ක්‍රියාවෙන් එහි පිහිටීමට අපොහොසත් වෙයි. කුඩා වියේ සිට ම ජිනදාස පන්සල සමඟ වූයේ දැඩි බැඳීමකි.

> "පොඩි මහත්තයා පේන්න නැත්තේ පන්සලට ගිහිල්ලා වෙන්න ඇති නේද හාමිනේ. පොඩි මහත්තයාට හැබෑටම පන්සලට නොගොහිල්ල ඉන්න ඇහැක. පොඩි මහත්තයා වගේ රත්තරන් දරුවෙක් දාහකින් හොයාගන්න බැහැ"(ගුනසිංහ, 1965:07).

මෙවන් හැදියාවකින් යුක්ත ව විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වන ජිනදාස නො දැමුණු සමාජයට නිරාවරණය වීමත් සමඟ එම උප සංස්කෘතියට මුහුණ දීමට නො හැකිව මානසික අර්බුදයකට පත් වෙයි. ඕනෑ ම දෙයක් පිළිබඳ කිසිදු ප්‍රශ්න කිරීමකින් තොර ව එය පිළිගැන්වූ සැටියෙන් ම භාරගැනීම අඥාන අවිදග්ධ ක්‍රියාවක් වේ. එසේ ම එය ආගමික තත්ත්වයකි. හෙවනැල්ලේ ජිනදාස මේ අවිදග්ධ යථාර්ථවාදී වටපිටාවෙන් හෙම්බත් වෙයි. මෙය කුමක් දැයි තේරුම් ගැනීමට උත්සාහ නො දරයි. කතුවරයා ජිනදාස වඩා හිඳුවන්නේ සුවච කීකරු ආගම් භක්තිකයකු ලෙස යි.

> "නමුත් ඒ වන විට විටත් ජිනදාස උභතෝකෝටික ස්වයං සංවාදයක යෙදී සිටී. ඉවසිලි නැති වුවත් ජිනදාස පැයක් තරම් දිගු දේශනාව අසා සිටියේ හැට පිරුණු උපාසකයෙකු මෙනි. දේශනාව අවසානයේ


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

> දී ලොකු හාමුදුරුවෝ කියූ හැම දෙයක් ම සත්‍ය යැයි ජිනදාසට සිතෙන්නට විය. ලොකු හාමුදුරුවෝ කියන දෙය අසත්‍යයැයි කවදාවත් හිතුවේ නැත"(ගුනසිංහ, 1965:26).

එය එක් අතකින් අඥාන අවිදග්ධ බවකි. නමුත් ජිනදාසගේ ඊට එදිරි සිතුවිලි ද කතුවරයා හුවා දක්වන්නේ ඔහුගේ මෙම මානසික අර්බුදය තවත් තීව්‍ර වන පරිදි ය.

ජිනදාසගේ අවිදග්ධ යථාර්ථවාදී පසුබිම පිළිබඳ ප්‍රශ්න කිරීමට මැදිහත් වන්නේ ඔහුගේ මිත්‍ර ජයරත්න යි. ජිනදාසගේ චරිතය සමබර ව යම්තාක් දුරට රඳවා ගැනීම සඳහා දූතයෙක් ලෙස කතුවරයා ජයරත්න යොදා ගනී. හෙතෙම අලංකාරවාදී ව දාර්ශනික අදහස් කියාපාන්නෙක් ලෙස ජිනදාස තම ගොදුර කරගත්ත ද යන්න සිතිය හැකි ය.

> "මේ හදන්නේ බණ ටිකක් කියවන්න. මම අහල තියෙන බණ ඇති. බණෙන් තමයි මට ගහලා තියෙන හෙණේ. හාමුදුරුවොන්ට නිදාගන්නැයි කියනව. බණ..බණ.. යේසුස් වහන්සේ, බුදු හාමුදුරුවෝ, අපාය නිර්මාණ, දෙවියන් වහන්සේ.. ඔලුගෙඩිය ලෝක කන්නේ උඹල තමයි. මිනිස්සු පිස්සු කරන්නේ උඹලා තමයි" (එම, 1965:134).

පන්සලේ බලපෑම පුද්ගලයකු උන්මත්තකයෙකු කිරීමට තරම් හේතු වන බව ජිනදාසගේ චරිතයෙන් කතුවරයා පෙන්වා දේ. නමුත් සෑම විටෙක ම ජිනදාස අවිදග්ධ යථාර්ථවාදී ලෝක දැක්ම ප්‍රතික්ෂේප කළේ ය. සදාචාරය පිළිබඳ තම මතවාදයේ දී නැවත නැවත කියා සිටින්නේ පුද්ගලයන් තමාට අවශ්‍ය විටෙක දී ජාතිය, ආගම, භාෂාව වැනි ශික්ෂකයන්ගේ ඉගැන්වීම් බස් අනුව ඍජු යථාර්ථවාදය ලෙස හැදින්වූ අවිදග්ධ යථාර්ථවාදී ලෙස කටයුතු කරන බවත් තවත් අවස්ථාවල දී පුද්ගලයන්ට අවශ්‍ය පරිදි වක්‍ර යථාර්ථවාදී ලෙසත් භාවිත කරන බවයි. හෙවනැල්ල නවකතාවෙන් සාකච්ඡා කිරීමට උත්සාහ ගෙන ඇත්තේ සමාජ ස්තර පිළිබඳ පවත්නා සට්ටනයේ සංකීර්ණ භාවයයි. දැඩි ආගමික භක්තියෙන් ගොඩනැගුණු ජිනදාසගේ ජීවිතයට අන්‍යයන්ගේ බලපෑමකින් තොර ව ස්වාධීන ව සිතීමට හා තීරණ ගැනීමට බාධාවක් වූයේ ද යන්න සැක සහිත කරුණකි. තරුණියකට ආදරය කිරීම වරදක් නො වන බව ජිනදාස වටහා ගත්ත ද තමා හැදුණු වැඩුණු පරිසරයේ ගති සිරිත් විසින් තමා පසුපසට ඇදීම පිළිබඳ ජිනදාස කෝපයට පත් වේ. තමා පසුපස එන ගැමි සාරධර්ම හා ආගමික සෙවනැල්ලට ඔහු ද්වේෂ කරයි. සියලු බැම්වලින් මිදී නිදහස් ලෝකෙට පා තැබීමේ ආශාවෙන් පෙලුණ ද තම මව හා ලොකු හාමුදුරුවන් සිහිවන විට ඔහු අත් පා හකුළුවා කටුව තුළට රිංගා ගනී. යථාර්ථය බුද්ධියෙන් යුතු ව අවබෝධ කරගත්ත ද ක්‍රියාවෙන් ඔහු එම යථාර්ථයේ පිහිටීම ට අපොහොසත් විය. ගැමි සමාජ මූල හා බද්ධ වූ පිරිස ඔවුන් හැදුණු වැඩුණු පරිසරය විසින් දායාද කරන ගනු ලැබූ ගති පැවතුම් ආගමික නැඹුරුව වැනි බන්ධනවලින් මිදී ඉහළ මධ්‍යම අනුකාරක පන්තියට ඇතුළු වීමේ දී ඇති වූ ගැටුම සහේතුක ව පිළිබිඹු කිරීම හෙවනැල්ලේ කතුවරයාගේ අරමුණ වී තිබේ. ගැමි සාරධර්ම පද්ධතීන් හා නාගරික සමාජයේ සංකීර්ණත්වය හමුවේ හෙතෙම උන්මත්තකයෙකු බවට පත් වේ. මෙය සැලසුම් කරන ලද දෙයක් නො ව ස්වභාවයෙන් ම හටගත් ආගමික සදාචාර අර්බුදයකි. මෙවැනි හේතු පදනම් කොට ගෙන ජිනදාස වල්මත් වූවෙකු බවට පත් වෙයි.

ජිනදාසගේ ජීවිතයේ ආරම්භයත්, එහි අවසාන භාගයේ ස්වභාවයත් අතර ඇත්තේ කෙතරම් පරස්පරතාවයක් ද යන්න වැටහේ. ආගමික සංයමයකින් යුක්ත සදාචාරාත්මක ජීවිතය අවසානයේ ජිනදාස තැබෑරුමක් හා ගණිකාවක් ළඟ නතර විය. ආධ්‍යාත්මික පරාරෝපණයට ලක් වූ ජිනදාස අපේක්ෂාභංගත්වයෙන් හා සන්තාපයෙන් පෙලුණු අතර තමාට බෙහෙවින් ආදරය කළ අම්මා ද ඔහුගේ ඛේදජනක ඉරණමට දායක වූ විජේපාල ද තම සිත තුළ හොල්මන් කරද්දී අවසානයේ තමාගෙන් සියල්ල ඈත් වී ඒවා ම ශක්තියක් වී තමා ම පෙලෙන බව දැනෙන මෙම මානව චර්යාව මෙම නවකතාව මගින් ගැඹුරින් විග්‍රහ කෙරේ.

## සමාලෝචනය

සාංදෘෂ්ටිකවාදී දර්ශනය සිංහලයාට තරමක් ආගන්තුක ය. එහෙයින් බටහිර සාහිත්‍ය මතින් ගොඩනැගුණු සාංදෘෂ්ටිකවාදය සිංහල නවකතාකරුවා ග්‍රහණය කොට ගනිමින් ලංකාවට ඓන්ද්‍රිය වශයෙන් සම්බන්ධ නො වන චරිත රාශියක් නිර්මාණය කරලීමට සමත් විය. පරාරෝපණ සිද්ධාන්තය රැගත් මනුෂ්‍යයා පිළිබඳ සාංදෘෂ්ටික දැක්මෙන් මිනිසා තමා අවට ලෝකය නිසා මුහුණ දෙනු ලබන ඛේදජනක ස්වභාවය නිරූපණය විය. විරාගයේ අරවින්ද සමාජ සම්මතයට අභියෝග කළ චරිතයක් ලෙස හඳුනාගත හැකි වේ. ලෝක සම්මත සිරිත් විරිත් නො තකා හුදෙකලා වූ ජීවිතයක් ගත කරන අරවින්ද සිය සිතුවිලි ලෝකයෙහි තනි වන අතර ආධ්‍යාත්මික පරාරෝපණයෙන් ඔහු පියවි ලොවින් ඈතට කැඳවා ගෙන යනු ලබයි. සාංදෘෂ්ටිකවාදයට අනුව සෑම දෙයකින් ම පැන නැගෙන අවසන් ඵලය වනුයේ පරාරෝපණය යි. මෙම පරාරෝපණ සිද්ධාන්තය ඇසුරින් මිනිසාගේ මිනිසත් බව පහත වැටෙන බවත් ක්‍රම ක්‍රමයෙන් සමාජයෙන් දුරස් වෙමින් මනුෂ්‍යත්වය වෙත පවතින පුද්ගලාන්තර සබඳතාවන් බිඳ වැටී යන බවත් හඳුනා ගැනුණි.

සාංදෘෂ්ටිකවාදයේ මානුෂික මනෝවිද්‍යාත්මක ලක්ෂණ වන නිදහස, වගකීම, ආත්ම සාක්ෂාත්කරණය, අපේක්ෂාභංගත්වය, කාංසාව වැනි විචල්‍යයන් මළගිය ඇත්තෝහි දෙවෙන්දරාසං සතු විය. එහි දී දෙවෙන්දරාසං වැනි මානුෂීය නියෝජනය මඟින් සාම්ප්‍රදායික පුරුෂාර්ථ හෙළා දකින, සමාජීය ගැටලුවලට මුහුණ දී ගත නො හැකි, නව පුරුෂාර්ථ මත පෙළ ගැසෙන චරිත විද්‍යමාන විය. සාංදෘෂ්ටිකවාදයේ ආගමික සදාචාර අර්බුදයට ලක් වූ චරිතයන් ද තෝරාගත් නවකතා කෘතීන් අතරින් විචාරක්ෂියට හසු විය. එයින් ලාංකේය ජන ජීවිතයට හර පද්ධතීන් එක් කොට, විනය ගරුක සද් මාර්ගයක ගමන් කරවීමට බුදු දහම හේතුකාරක වූ බව විශද විණි. මරණය, නො පැවැත්ම, ජීවිතයේ අර්ථය සොයා යාම වැනි ආගමික පර්ශදයන් හා බැඳි චරිතයක් ලෙස


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

හෙවනැල්ලේ ජිනදාස හඳුනා ගත හැකි වේ. අධ්‍යාත්මය තුළ ම කුඩු ගැසෙන, විසඳුම් වශයෙන් මරණයේ රමණීය බව දකින සමකාලීන සමාජ ආර්ථික තත්ත්වයෙන් වියෝ වූ ඕපපාතික යැ යි සිතිය හැකි පුද්ගයෙක් ලෙෂ එකී චරිතය හෙවනැල්ල නවකතාවෙහි නිරූපණය විය.

සාම්ප්‍රදායික ලාංකේය නවකතාවල නො තිබූ නමුත් 1950 දශකයේ මැද භාගයේ සිට විරාගය, හෙවනැල්ල, මළගිය ඇත්තෝ හා මළවුන්ගේ අවුරුදු දා වැනි නවකතාවන්හි මෙම සාංදෘෂ්ටිකවාදී දර්ශනය ගැබ් වී තිබුණු බව තර්කානුකූල ව හා සහේතුක ලෙස වටහා ගැනීමට හැකි විය. **ඒ අනුව සිංහල නවකතාවේ මනුෂ්‍යත්වය නිර්ණය වීමටත්, එහි පැවැත්ම හා වටිනාකම සාක්ෂාත් කර ගැනීමෙහි ලා සාංදෘෂ්ටිකවාදයේ ලක්ෂණයන් උපස්තම්භක වන බවත් යුක්ති යුක්ත ව නිගමනය කළ හැකි ය.**

## පරිශීලිත මූලාශ්‍රය


අබේපාල රෝලන්ඩ්, අබේපාල අරුන්දතී. (2010). **සාංදෘෂ්ටික හා මානුෂික මනෝවිද්‍යා ප්‍රවේශ.** කොට්ටාව, සාර ප්‍රකාශන

කලංසූරිය, ඒ. ඩී. පී. (2007). **නූතන බටහිර දර්ශනය,** බත්තරමුල්ල, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

කලංසූරිය, ඒ. ඩී. පී. (1987.) **බ'ට්‍රන්ඩ් රසල් හා සමකාලීන දර්ශනය,** වරකාපොළ, ආරිය ප්‍රකාශකයෝ

ගම්ලත් සුචරිත (1990) **සමකාලීන සාහිත්‍ය විචාරයේ ගැටලු**. කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

ගුණවර්ධන පී. ඩයස් (1994) **සාංදෘෂ්ටිකවාදය.** හොරගොල්ල, නිශාන්ත ප්‍රකාශකයෝ

ගුණසිංහ සිරි. (තු.මු 1967) **හෙවණැල්ල**, රත්න පොත් ප්‍රකාශකයෝ

ගෝඩර් යුස්ටයින්. පරිවර්තනය රාජපක්ෂ සේනාරත්න රාණි (2008) **සොෆීගේ ලෝකය.** නුගේගොඩ, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

ජයතිලක, කේ. (1990). **නවකතාව හා සමාජය.** කොළඹ 12, ප්‍රදීප ප්‍රකාශකයෝ.

ජයතිලක කේ. (1979**) පරාජිතයෝ**, කොළඹ 12, ප්‍රදීප ප්‍රකාශකයෝ

තිලකරත්න මිණිවන් පී. (1990) **අත්දැකීම හා නවකතාකරණය.** කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

ධර්මසිරි ගුණපාල. (1970) **දාර්ශනික ප්‍රශ්න.** බත්තරමුල්ල, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

බාලසූරිය සෝමරත්න. (1990) **ඇල්බෙයා කැමූ පිටස්තරයා.** කැලණිය, සමනල ප්‍රකාශකයෝ.

මැද්දේගම උදය ප්‍රශාන්ත. (1991) **මාර්ටින් වික්‍රමසිංහගේ විරාගය.** වරකාපොළ, ආරිය ප්‍රකාශකයෝ.

රාජපක්ෂ, ධර්මා. (2014). **සාංදෘෂ්ටිකවාදය හා ආධ්‍යාත්මික පෙරළිය පසුබිම් වූ සිංහල නවකතා.** කොළඹ 10, රත්න පොත් ප්‍රකාශකයෝ.

වික්‍රමසිංහ මාර්ටින්. (1969) **සිංහල නවකතාව හා ජපන් කාමකථා හෙවණැල්ල,** ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

වික්‍රමසිංහ මාර්ටින්. (1985 ) **විරාගය.** සීමාසහිත තිසර ප්‍රකාශකයෝ

වීරසිංහ එස්.ජී.එම් (1988) **කාන්ටියානු දර්ශනය පිළිබඳ විචාර පූර්වක අධ්‍යයනයක්.** කැලණිය විශ්වවිද්‍යාලයීය පර්යේෂණ ප්‍රකාශන මාලාව

සත්‍යපාල ගල්කැටිය (1992) **හර්මන් හෙස ඔහු සහ ඔහුගේ නිර්මාණ**. සිරස නිර්මාණ සංසදය.

සරච්චන්ද්‍ර එදිරිවීර. (1959) **මළගිය ඇත්තෝ**. මහරගම, සමන් මුද්‍රණාලය

සරච්චන්ද්‍ර එදිරිවීර. (1976) **මළවුන්ගේ අවුරුදු දා.** සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්මන්ට්ස් සමාගම, කොළඹ

සුරවීර ඒ. වී. (1989) **සම්ප්‍රදාය නිර්මාණය හා විචාරය.** කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

G. DE. PLINVAL. **Histoire de la literature francaise**, Hachette, 1984

JEANPAUL SARTRE. **La nausee**, Gallimard, 1938.

MICHEL MAILLARD. **Sartre, Nathan**, 1994.

RAZMOND LICHET. **Lire camus,Hachette**, 1969.

SHRI SHIVAJI, Existentialism : **A philosophic stand point to existence over essence**. 2016.

WALTER KAUFMAN. **Existentialism from dostoevsky to Sartre**. 2020.



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දහතුන්වන කලාපය 2022 ජූනි
පිටු 32-54
ISSN 1800-1459 eISSN 2386-2041
© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# විවෘත භූමියට ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා ඇති වී තිබෙන සමාජීය, පාරිසරික බලපෑම සහ විවෘත කසළ භූමියක යෝග්‍යතාව තක්සේරුව : මහනුවර ගොහාගොඩ තේක්ක වත්ත කසළ කන්ද ඇසුරින්

# (Social and Environmental Impacts and Land Suitability of Gohagoda Thekkawaththa Garbage Dumping Site in Harispattuwa Divisional Secretariat Division, Kandy)

එච්. එම්. එන්. අයි. සඳරුවන්

භූගෝල විද්‍යා හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා භාෂා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**indrajithnadeesha@gmail.com**

## Abstract

As a result of human activities, considerable amount of solid waste is generated and disposal of solid waste has become one of the major environmental issues in Sri Lanka. This study aimed to analyze the social and environmental effects of Gohagoda Thekkawaththa garbage dump located in Harispattuwa Divisional Secretariat Division (DSD), Kandy District and its land suitability. A questionnaire survey with 50 respondents, field observations and Chi-square test using IBM SPSS 21 software were carried out to find out social and environmental effects of dumping site and model was created based on several criteria with the help of GIS 10.4 software to find the land suitability of garbage dump. Spatial distribution of population density, buildings, roads, water bodies, slope angel, forested areas and land use pattern were selected as suitability criteria. According to the results, 66 percent of respondents mostly suffer from effluvium. There is 32 percent of huge effect for atmosphere and soil in this area and many people suffer from respiratory diseases. All the respondents said that the dumping site affects the physical environment including atmosphere, soil quality, surface and underground water and flora and fauna. Accordingly, the Chi-square tests indicated that there is a significant effect of the site on the community and physical environment in this area. Land suitability assessment carried out for the Kandy District revealed that this dumping site is located under the category of the least suitable land area and study suggests to shift the dumping site in to a location under the category of the most suitable areas which covers 22.37 percent out of entire land area in the Kandy District. This study recommends creating a sanitary landfill, recycling waste, generating power through waste and making fertilizers as the most suitable strategy which does not bring harmful effects to the environment and to the community rather than waste dumping.

**Key words**: Solid waste, Gohagoda dumping site, Social impacts, Environmental impacts, Land suitability

## සාරසංක්ෂේපය

මානවයාගේ විවිධ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් සැලකිය යුතු අපද්‍රව්‍ය ප්‍රමාණයක් ජනනය වේ. වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ ද දෛනික ව ඒකරාශි වන අපද්‍රව්‍ය ප්‍රමාණය දිනෙන් දින වර්ධනය වීම සමාජීය හා පාරිසරික වශයෙන් ප්‍රධාන ගැටලුවක් බවට පත් ව තිබේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ හාරිස්පත්තුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය තුළ විවෘත භූමිය මත ගොඩ ගැසෙන ඝන අපද්‍රව්‍ය නිසා ඇතිවන සමාජ පාරිසරික බලපෑම විශ්ලේෂණය සහ කසළ භූමියේ යෝග්‍යතාව තක්සේරු කිරීමයි. අධ්‍යයනයට අවශ්‍යය ප්‍රාථමික දත්ත රැස්කර ගැනීම සඳහා පහසුතම නියැදි ක්‍රමය භාවිත කර තෝරා ගන්නා ලද ඒකක 50කින් යුත් නියැදිය හරහා ප්‍රශ්නාවලී සමීක්ෂණයක් සිදුකරන ලදී. ඊට අමතර ව ක්ෂේත්‍ර සමීක්ෂණ ආදිය යොදා ගනිමින්, දත්ත විශ්ලේෂණ සඳහා IBM SPSS 21 මෘදුකාංගය භාවිත කොට කසළ කන්ද නිසා ඇතිවන සමාජ පාරිසරික බලපෑම විශ්ලේෂණයට කෛ වර්ග පරික්ෂාවක් සිදුකරන ලදී. එමෙන් ම පර්යේෂණයේ අරමුණක් වන කසළ කන්ද සඳහා අවශ්‍ය භූමි යෝග්‍යතා තක්සේරුව සිදුකිරීමට Arc GIS 10.4 මෘදුකාංගය භාවිත කරන ලදී. එහි දී මහනුවර දිස්ත්‍රික්කයේ ජනගහන දත්ත, ගොඩනැගිලි ව්‍යාප්තිය, මාර්ග ව්‍යාප්තිය, ජලවහණ ලක්ෂණ, බෑවුම් කෝණය, වනාන්තර ව්‍යාප්තිය, භූමිපරිහරණ රටා ආදී අවකාශීය නිර්ණායකයන් භාවිතයෙන් මොඩියුලක් නිර්මාණය කොට බර තැබීම් විශ්ලේෂණයක් සිදුකර අවශ්‍ය භූමි තක්සේරුව සිදුකරන ලදී. ඒ අනුව හාරිස්පත්තුව

ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය තුළ අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය හේතු කොට ගෙන ප්‍රදේශයේ සිදුවී ඇති සමාජ පාරිසරික බලපෑම අනාවරණය කරගත් අතර මෙම ප්‍රදේශය තුළ 66%ක් ජනතාව වැඩි වශයෙන් ම පීඩාවට පත්වන්නේ ප්‍රදේශය පුරා හමායන දුර්ගන්ධය නිසා ය. ප්‍රදේශයේ වායුගෝලයට දැඩි බලපෑමක් එල්ල වී ඇති අතර වැඩි දෙනෙකු ශ්වසන රෝගවලින් පීඩා විඳින බව හඳුනා ගන්නා ලදී. එමෙන් ම කසළ කන්ද නිසා 32%ක බලපෑමක් ප්‍රදේශයේ පසට සහ වායුගෝලයට පාරිසරික වශයෙන් එල්ල වී තිබේ. මහනුවර දිස්ත්‍රික්කය තුළ සිදු කළ භූමි යෝග්‍යතා තක්සේරුවට අදාළ ව දැනට පවතින කසළ කන්ද යෝග්‍යතාවෙන් අඩු භූමියක් තුළ ස්ථාපනය වී තිබෙන බව සොයා ගන්නා ලදී. එහෙයින් ප්‍රදේශයෙන් 22.37%ක ඉහළ යෝග්‍යතා පවතින භූමියක් තුළ සුදුසු ස්ථානයකට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාව පෙන්නා දෙන ලදී. මීට අමතර ව මෙම තෝරා ගන්නා ලද භූමි තුළ සුදුසු ස්ථානයක සනීපාරක්ෂක කසළ රැඳවුම් නිර්මාණය හෝ දැනට පවතින කසළ කන්ද බිම් පිරවුමක් ලෙස වසා දැමීම, අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය, අපද්‍රව්‍යයෙන් බලශක්ති උත්පාදනය කිරීම, පොහොර නිෂ්පාදනය වැනි පරිසරයට හා මිනිසාට අයහපත් බලපෑමක් සිදුනොවන වඩාත් සුදුසු උපාය මාර්ග ලෙස මෙම පර්යේෂණය මගින් ඉදිරිපත් කෙරේ.

**කේන්ද්‍රීය වචන:** ඝන අපද්‍රව්‍ය, ගොහාගොඩ කසළ කන්ද, සමාජ බලපෑම, පාරිසරික බලපෑම, භූමි යෝග්‍යතාව

## හැඳින්වීම

මානව ශිෂ්ටාචාරය ආරම්භ වූ දා සිට අද දක්වා ම මානවයාගේ විවිධ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් අපද්‍රව්‍ය උත්පාදනය කරමින් පවතී. ආදි මානවයා සරල වූ අවශ්‍යතා මත ජීවත් වූ අතර ඔවුන්ගේ දෛනික ක්‍රියාවලියෙහි දී එකතු වන අපද්‍රව්‍ය සරල ලෙස ම පරිසරයට මුදා හරිනු ලැබුවේ එහි දී කිසිදු පාරිසරික බලපෑමක් ඇතිවීමට හේතු කාරණාවන් නොමැති හෙයිනි. මානව ශිෂ්ටාචාරවල වර්ධනයත් සමඟ මිනිසා කාර්මීකරණය සහ නාගරීකරණය මගින් සංකීර්ණ ජීවිතයක් ගත කරන අතර මේ නිසා ඔවුන්ගේ පරිභෝජන රටාවන් ද අවශ්‍යතාවන් මත වෙනස් වීම සිදුවිය.

මෙලෙස මිනිසාගේ සංකීර්ණ දෛනික ක්‍රියාවලීන් නිසා නිර්මාණය වන මෙම අපද්‍රව්‍ය විවිධාකාරයෙන් නිර්වචනය කළ හැකි වේ. එය විටෙක දී මිනිසා කෘෂිකර්මාන්තය, වෙළඳ ව්‍යාපාර කටයුතු, කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන කටයුතුවල නියැලීම නිසා ජනනය වන අබලි කොටස් මෙන් ම නිවාසවලින් ඉවත දමන කොටස් සහ වීදි පවිත්‍රතා මගින් එකතු වන දියර නොවන ද්‍රව්‍ය ඝන අපද්‍රව්‍ය වශයෙන් හඳුන්වා දෙයි (අබේනායක එස්, 1997). අපද්‍රව්‍ය මානව ක්‍රියාකාරකම්වල නොවැළැක්විය හැකි අතුරු ඵලයක් ලෙස ද හඳුනාගත හැකි ය. නාගරීකරණයත් සමඟ මිනිසා සෑම අතකින් ම දියුණු වූ පසුබිමක නාගරික ප්‍රදේශයක සිදුවන ප්‍රාථමික ක්‍රියාවලීන්ගෙන් ජනනය වන හෝ මිනිස් පරිභෝජනයෙන් දැනුවත් ව හෝ නොදැනුවත් ව ඉවත ලද දෑ පරිසරයට ගැටලුවක් වන්නේ අද ගමක් ව පවතින ප්‍රදේශයක් හෙට තව දුරටත් වර්ධනය වූ නගරයක් දක්වා පරිවර්තනය වන බැවිනි. ලෝක බැංකුව පවසන ආකාරයට මිනිසා විසින් සුවිශාල කසළ ප්‍රමාණයක් උත්පාදනය කරන අතර එය වසරකට ටොන් බිලියන 2කට වැඩි ප්‍රමාණයකි. එය 2050 වන විට ගෝලීය කසළ ටොන් බිලියන 3.4ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ (Kaza et al., 2018).

වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ එක් දිනකට කසළ මෙට්‍රික් ටොන් 9000කට වඩා වැඩියෙන් දිවයින පුරා ම වර්ධනය වී පවතින අතර මෙම තත්ත්වය තව දුරටත් වර්ධනය වීම නොරහසකි. එයින් දිනපතා පුද්ගලයෙකු දැනුවත් ව හෝ නොදැනුවත් ව කිලෝග්‍රෑම් 0.5-1ත් අතර ප්‍රමාණයක් ජනනය කිරීම සිදු කරයි (සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය, 2020). මෙසේ බැහැර කරනු ලබන අපද්‍රව්‍ය ඝන, ද්‍රව හා වායුමය වශයෙන් වර්ගීකරණයට ලක් කළ හැකි අතර මෙයිනුත් 60%ක් දිරාපත් වන අපද්‍රව්‍ය ඝනයට අයත් වේ. ඉතිරි 40%ක ප්‍රමාණය දිරාපත් නොවන ඝනයට අයත් වන අතර එය වීදුරු, පොලිතින්, ප්ලාස්ටික්, කඩදාසි ආදි ලෙස වර්ගීකරණයට ලක්වේ. මේ තත්ත්වය තුළ වැඩි ම හානි ගෙන දෙනු ලබන්නේ ද මෙකී දිරාපත් නොවන අපද්‍රව්‍ය ගොඩ ගැසීම හේතුවෙනි. ශ්‍රී ලංකාව තුළ දිනකට මෙට්‍රික්ටොන් 400ක් පමණ ප්ලාස්ටික්, පොලිතින් කිසිදු ඉවක් බවකින් තොර ව විවෘත පරිසරය වෙත මුදා හැරීම සිදුකරනු ලබයි. මෙහි ශෝකජනක තත්ත්වයක් වන්නේ සීමාවකින් තොර ව මිනිසා තුළ පවතින අධි ඉල්ලුම හා අධිපරිභෝජනය දිනෙන් දින වර්ධනය වීමයි. මෙසේ භාවිතයෙන් පසු ව ඉවත ලද සියලු අපද්‍රව්‍ය යම් කිසි න්‍යායාත්මක පසුබිමක් තුළින් ගොඩනැගුනු ලද දෑ වන අතර ඒවාගේ අතුරුඵලයක් ලෙස බැහැර වේ (සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය, 2020).

අතීතයේ මිනිසා සියයට සියයක් ම ජෛව හායනයට පත්වන සුළු අපද්‍රව්‍ය ජනිත කළ අතර එය ස්වාභාවික ව ම හායනයට පත්වීම හේතුවෙන් කසළ කළමනාකරණ සම්බන්ධයෙන් මිනිසාට හෝ පරිසරයට එතරම් ගැටලුවක් සිදු නොවී ය. නමුත් නවෝත්පාදන පරිභෝජන රටාවේ වෙනස්කම් හේතුවෙන් ජෛව හායනයට පත් නොවන අපද්‍රව්‍යය ක්‍රමික ව වැඩිවීම සිදුවීමත් සමඟ අපද්‍රව්‍ය බැහැර කිරීමත් ගැටලුවක් විය. එහෙයින් අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳ ව විවිධ ක්‍රියාමාර්ග ලෝකය තුළ සිදුකරන අතර මෙහි දී අපද්‍රව්‍ය විවෘත ගොඩ කිරීම්, අපද්‍රව්‍ය සංයුත්ක කිරීම්, කොම්පෝස්ට් නිෂ්පාදනය, ජීව වායු නිෂ්පාදනය ආදී ක්‍රම ශිල්පයන් කසළ බැහැර කිරීම සඳහා භාවිත කරනු ලබයි (පරිසර අමාත්‍යාංශය, 2020).

නමුත් අවාසනාවකට මෙන් ශ්‍රී ලංකාව තුළ විවෘත භූමිය මත කසළ ගොඩ කිරීමේ ක්‍රමය භාවිතයට ගනු ලබයි. මෙම ක්‍රියාවලිය පළාත් පාලන ආයතන, ප්‍රදේශීය සභා මගින් රාජ්‍ය අනුදැනුම මත සිදුකරන අතර ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක ම පාහේ විශාල විවෘත කසළ රඳවනයන් දැක ගත හැකිවේ. සංවර්ධනය වෙමින් පවතින ගමන්මගේ ප්‍රමුඛ ව අවුරුදු ගණනක් විවිධ සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුවෙන් ගොඩනගන ලද ශ්‍රී ලංකාව ලෝකයේ ස්භාවධර්මයාගේ අනූන ප්‍රශස්ත දේශගුණ රටාවන් නිරූපණය කරනු ලබන අතර පාරිසරික වශයෙන් සංවේදී කලාප රාශියක් සමන්විත පරිසර


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පද්ධතියකින් සමන්විත වේ. මෙලෙස පිරිසිදු නිර්මල හරිත වන පෙදෙස්වල ඉහළින් ම වැජඹෙන හරිත කඳු සොබාදහමට ආශිර්වාදයක් වේ. නමුත් මිනිසාගේ ඉවක් බවකින් තොර ව සිදුකරන ක්‍රියාකාරකම් හේතු කොටගෙන සොබා දහමේ හරිත කඳු අභිබවා කසළ කඳු තැනින් තැන මතුවන්නේ සමාජ, පාරිසරික වශයෙන් විවිධ බලපෑම් ඇතිකරමිනි.

අපද්‍රව්‍ය එකතුකර විවෘත භූමියට බැහැර කිරීමේ ප්‍රවේශය මගින් පාරිසරික තිරසාරභාවයන්ට, ස්වාභාවික සම්පත්වල පැවැත්මට මෙන් ම මානව සෞඛ්‍යට ද ගැටලු මතුවීම නිසා අපද්‍රව්‍ය කළමනාකරණ අවශ්‍යතා සංකල්ප බිහිවීම සිදුවිය. මෙම අපද්‍රව්‍ය කළමනාකරණයේ ප්‍රධාන අරමුණ අවසානයේ පරිසරයට බැහැර කිරීම සඳහා ඉතිරිවන කසළ ප්‍රමාණය අවම කර ගැනීමයි. ශ්‍රී ලංකාව තුළ කසළ බැහැර කිරීමේ ක්‍රමවේදයට අනුව විවෘත භූමිය මතට කසළ ගොඩ ගැසීම සඳහා සුදුසු ඉඩම් හිඟයක් වර්තමානය වන විට ඇතිවී තිබේ. ජන සංඛ්‍යාව වර්ධනය හා කසළ උත්පාදනය අතර අනුලෝම සම්බන්ධතාවක් හඳුනා ගැනෙන අතර එමනිසා යෝග්‍ය ඉඩම් තක්සේරු කිරීම වර්තමානය තුළ නැගී එනු ලබන විෂය ක්ෂේත්‍රයක් බවට පත් ව තිබේ. මෙම තක්සේරු මගින් කසළ භූමිය මත ගොඩගැසීම නිසා ඇතිවී තිබෙන සමාජීය පාරිසරික බලපෑම් හැකිතාක් අවම කර ගැනීමට හැකියාව ලැබෙන අතර කසළ කඳු සඳහා පුනරුත්ථාපන වැඩසටහන් සැලසුම් කිරීමට අවස්ථා උදාකරගත හැකිවේ (පරිසර අමාත්‍යංශය, 2020).

පර්යේෂණයේ අධ්‍යයනයට බඳුන් වන මහනුවර 'ගොහාගොඩ කසළ කන්ද'ද විවෘත භූමියට කසළ ගොඩ ගසන භූමිභාගයකි. ඒ අනුව ප්‍රදේශයේ අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා ඇතිවන සමාජ පාරිසරික බලපෑම අධ්‍යයනය කිරීමත් විවෘත කසළ බිම් සැලසුම්කරණය කිරීම හා කළමනාකරණයේ කාලීන අවශ්‍යතාව විදහා දැක්වීම මෙමගින් බලාපොරොත්තු වේ.

## සාහිත්‍ය විමර්ශනය.

ඝන අපද්‍රව්‍ය යනුවෙන් හඳුන්වනු ලබන්නේ කාර්මික, වාණිජ, පතල් කැණීම් සහ කෘෂිකාර්මික ක්‍රියාකාරකම් මෙන් ම ප්‍රජා ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන ඝන, ද්‍රව, අර්ධ ඝන හෝ වායුමය ද්‍රව්‍ය ඇතුළත් ඕනෑම අපද්‍රව්‍ය, රොන් මඩ හෝ වෙනත් ඉවතලන ඕනෑම ද්‍රව්‍යයක් මේ යටතට ඇතුළත් වේ (Moeller, 2005).

**Bandara D**. (2015) විසින් ශ්‍රී ලංකාවේ විවෘත අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳ ව පාරිසරික හා ආර්ථික තක්සේරුව යන මැයින් පර්යේෂණයක් සිදුකර ඇති අතර මෙහි වැඩිදුරටත් ප්‍රකාශ කරනුයේ විවෘත භූමිය මතට අපද්‍රව්‍ය බැහැර කිරීම ප්‍රමාණවත් පරිදි නඩත්තු නොවීම නිසා අහිතකර බලපෑම් ඇති වන අතර මේ නිසා පාරිසරික සමාජීය හා ආර්ථිකමය වශයෙන් අහිතකර බලපෑම් රාශියකට මුහුණ දීමට සිදුවන බව මෙම අධ්‍යයනය මගින් පෙන්වා දෙනු ලැබේ. අපද්‍රව්‍ය කළමනාකරණයේ දී එකතු වන කසළ විවෘත භූමි මත ගොඩ ගැසීමේ ක්‍රමය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන අතර මේ නිසා ඒ ආශ්‍රිත ව ඇතිවන බලපෑම් අධ්‍යයනය හා අවම කිරීමේ උපාය මාර්ග තක්සේරුව මෙහි ප්‍රධාන අරමුණු ය. මෙලෙස ව්‍යුත්පන්න වන අපද්‍රව්‍ය අවම කර ගැනීම සඳහා උපකල්පන දෙකක් යොදා ගන්නා අතර එහි දී සිමෙන්ති කර්මාන්තයේ දී භාවිත කරන ගල්අඟුරු සඳහා විකල්ප ඉන්ධනයක් ලෙස භාවිත කිරීමේ හැකියාව සහ විදුලි නිෂ්පාදනය කිරීම සඳහා කසළ ඉන්ධනයක් ලෙස ව්‍යුත්පන්න කිරීමේ හැකියාව පෙන්වා දෙනු ලැබේ. මෙම අවස්ථාවන් දෙක ම යොදා ගෙන ඇත්තේ පාරිසරික දෘෂ්ටි කෝණයකින් වන අතර ආර්ථික දෘෂ්ටි කෝණයෙන් නොවන අතර ම අපද්‍රව්‍ය ප්‍රවාහන දුර ප්‍රමාණය සහ විදුලියේ මිල ගැලපීමෙන් ආර්ථික ලාභ ලබාගත හැකි බවත් වැඩිදුරටත් දැක්විය හැකි ය. එමෙන් ම විවෘත භූමිය මත අපද්‍රව්‍ය ගොඩ ගැසීම නිසා කැළිකසළ ආශ්‍රිත ව ගෝලීය උණුසුම් වීමේ විභවතාව මෙමගින් ඉවත් කළ හැකි අතර මේ නිසා ඇතිවන පාරිසරික සමාජීය ගැටලු සඳහා විසඳුම් ලබා ගත හැකි බව වැඩිදුරටත් මෙමගින් නිගමනය කරනු ලබයි.

**Ajay Singh** (2019) විසින් නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා දුරස්ථ සංවේදනය සහ භූගෝලීය තොරතුරු පද්ධති භාවිතය පිළිබඳව අධ්‍යයනයක් සිදුකර ඇති අතර නව තාක්ෂණික උපක්‍රම භාවිත කරමින් කසළ කළමනාකරණය සඳහා සැලසුම් නිර්මාණය මෙමගින් සිදුකිරීමට බලාපොරොත්තු වේ. මේ සඳහා අධ්‍යයනයන්ට විශ්වාසදායී ප්‍රතිඵල ලබා දෙනු ලබන දුරස්ථ සංවේදන තාක්ෂණය හා භූගෝලීය තොරතුරු තාක්ෂණික ක්‍රම ශිල්ප භෞතික කෝණයෙන් පසුගිය වසර කිහිපය තුළ කසළ කළමනාකරණ සැලසුම් නිර්මාණයට භාවිත වන නව තාක්ෂණික ශිල්ප ක්‍රමයක් බව දැක්විය හැකි ය. මෙහි දී ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ දී අවශ්‍යය තොරතුරු ග්‍රහණය කර ගැනීම, ගබඩාකර ගැනීම, හැසිරවීම, විශ්ලේෂණය කිරීමට හා දත්ත සම්ප්‍රේෂණය කිරීමට සහය දක්වයි. එමෙන් ම මෙය තරමක් අඩු මුදලකට ලබා ගත හැකි මෘදුකාංගයක් වන අතර මෙමගින් අපද්‍රව්‍ය බැහැර කිරීමට සුදුසු ඉඩම් හා පාරිසරික ගැටලු අවම වන පරිදි භූමි තක්සේරු කිරීම විස්තර කරනු ලබයි. මෙහි දී ප්‍රදේශයේ කසළ බඳුන් ස්ථානගත කිරීමේ තැන් සොයා ගැනීමත්, ප්‍රදේශයේ භෞතික, මානව ලක්ෂණ පදනම් කරගනිමින් පාරිසරික හානි අවම වන කසළ ගොඩ කිරීමේ ඉඩම් සොයා ගැනීමට ආකෘති නිර්මාණය කිරීමත් මෙම අධ්‍යයනයෙන් වැඩි දුරටත් බලාපොරොත්තු වේ.

**Boateng, Divune** සහ තවත් අය විසින් (2014) නාගරික ප්‍රදේශවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සමාජ පාරිසරික ප්‍රතිචාර යන මැයින් පර්යේෂණයක් සිදුකර ඇති අතර මෙමගින් බලාපොරොත්තු වන්නේ කසළ කළමනාකරණය කිරීම සඳහා වඩාත් සුදුසු ම ක්‍රමය පිළිබඳව අවධාරණ යොමු කිරීමයි. පර්යේෂණයේ අධ්‍යයන ප්‍රදේශය ලෙස ඝානාවේ කුමාසි මෙට්‍රොපොලිස්හි අටොන්සු උප නාගරික කලාපය යොදා ගන්නා ලදී. නාගරීකරණයත් සමඟ විශාල ප්‍රමාණයෙන් නිපදවන කසළ දිනෙන් දින ඉහළ යන්නේ මිනිසාගේ පරිභෝජන රටාවේ වෙනස් වීම් නිසා බව වැඩිදුරටත් ප්‍රකාශ වේ. එහෙයින් ගැටලුවක් ලෙස වර්ධනය වන කසළ කළමනාකරණය කිරීම සඳහා සමාජ හා පාරිසරික ප්‍රතිචාර විමසා බැලීමට ප්‍රදේශයේ


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නිවෙස්වලට ප්‍රශ්නාවලි 115ක් යොදා ගන්නා ලදී. තව ද කසළ කළමනාකරණ ආයතන දෙකක් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වා දත්ත ලබා ගන්නා ලදී. මෙහි දී අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා එකතු කිරීමේ ක්‍රමයක් හා බැහැර කිරීම සඳහා ගෙවීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන බව අනාවරණය විය. කෙසේ වෙතත් ආදායම හා අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ගෙවන මුදල අතර සහසම්බන්ධතාව සංඛ්‍යාත්මක වශයෙන් දුර්වල ය. අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ගෙවන මුදල අනිවාර්යයයෙන් ම වගඋත්තරකරුවන්ගේ ආදායම් මට්ටම මත රදා නොපවතින බව ප්‍රකාශ වේ. එමනිසා මෙම අධ්‍යයනයේ නිගමනය වන්නේ කසළ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය අධ්‍යාපනය ලබා දීමේ අවශ්‍යතාව සහ ඝන අපද්‍රව්‍ය නැවත භාවිත කිරීමේ ක්‍රම ශිල්ප තුළ ප්‍රතිචක්‍රීකරණයේ අවශ්‍යතාව මතු වන බව ය.

**Fareena Ruzaik** (2021) යන අය විසින් නාගරික ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම හා සම්බන්ධ ගැටලු විසඳීම සඳහා භූගෝලීය මිනුම් යන මැයින් පර්යේෂණ නිබන්ධනයක් සිදු කර ඇති අතර මෙය ශ්‍රී ලංකාව තුළ සිදුකරන ලද සිද්ධි අධ්‍යයනයකි. ශ්‍රී ලංකාවේ මහනගර සභා ප්‍රදේශ තුළ පවතින පොදු ගැටලුව වන්නේ අධික ලෙස අපද්‍රව්‍ය ජනනය වීම, අභඹු අපද්‍රව්‍ය බැහැර කිරීම, භූගෝලීය වශයෙන් සුදුසු බැහැර කිරීමේ ස්ථාන සඳහා පවතින ඉඩම් හිඟය වැනි දෑ වේ. මේ සියලු අඩුපාඩු සමුච්චය වීම නිසා අදාළ නගරසභා ප්‍රදේශවල බහුවිධ සමාජ පාරිසරික සහ සෞඛ්‍ය ගැටලු ඇති කරවයි. ඒ අනුව මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වන්නේ එවැනි සමාජ පාරිසරික හා සෞඛ්‍ය ගැටලු භූගෝලීය දෘෂ්ටිකෝණයෙන් අධ්‍යයනය කිරීමයි. මේ සඳහා ශ්‍රී ලංකාවේ තෙත් හා අතරමැදි කලාප අධ්‍යයනයන්හි අහඹු නියැදි ක්‍රමය භාවිත කරමින් අධ්‍යයනයට අවශ්‍යය භූගෝලීය ලක්ෂණ, විවිධ උන්නතාංශ, ජනඝනත්වය ආදී තොරතුරු නියැදි කුටුම්භ 867 කින් ලබා ගනු ලැබූ අතර මෙහිදී ප්‍රාථමික දත්ත ව්‍යුහගත හා අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලි භාවිත කරමින් ලබා ගන්නා ලදී. මෙසේ ලබා ගන්නා දත්ත විශ්ලේෂණයෙන් අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා ඇති වී තිබෙන සමාජීය පාරිසරික බලපෑමත් මානව සෞඛ්‍ය ගැටලුවල විවිධ රටාවන් හා එහි පරිමාණය අවදානම් මට්ටම ප්‍රතිඵල මගින් අනාවරණය කර ගන්නා ලදී. මේ නිසා ඇති වී තිබෙන ගැටලුවල බලපෑම අවම කර ගැනීම සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියේ පියවර නිසිලෙස අනුගමනය කිරීම, ඒවා අධීක්ෂණය කිරීම සහ පාලනය නිසි අයුරින් සිදු කිරීමත් මේ සඳහා අවශ්‍යය යන්ත්‍රෝපකරණ ස්ථාපනයත් නිර්දේශ ලෙස ඉදිරිපත් කරයි. එමෙන් ම සංයුක්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති විස්තීරණ ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලි මෙම ගැටලුව විසඳීම සඳහා විකල්ප ලෙස ඉදිරිපත් කර ඇත.

## පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලංකාවේ කසළ බැහැර කිරීමේ ක්‍රියාවලියෙහි වගකීම දරන්නේ ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය හා ප්‍රදේශීය සභා ආයතනයි. මෙහි දී ඔවුන් විසින් රැස් කරගනු ලබන කසළ සියල්ල බැහැර කිරීම සිදු කරනු ලබන්නේ ද ප්‍රදේශයේ විවෘත පරිසරයට ය. එම නිසා වර්තමානයේ මෙය අවධානයට යොමු කළ හැකි ප්‍රධාන ගැටලුවක් ලෙස හඳුනා ගෙන තිබේ. මීට හේතුව වන්නේ විවෘත භූමිය මත ගොඩ ගැසෙන කසළ අදවන විට ශීඝ්‍රයෙන් වර්ධනය වීමත්, එම නිසා ප්‍රදේශයේ විවිධ සමාජීය, පාරිසරික ගැටලු ඇති කිරීමට සමත්ව ඇති බවත් ය.

පරිසරයට එකතු වන අපද්‍රව්‍ය විවිධාකාර වන අතර මෙයින් වැඩි බලපෑමක් සිදුවන්නේ නොදිරන ද්‍රව්‍යවලිනි. නමුත් දිරන ද්‍රව්‍ය වුව ද මහාපරිමාණ ලෙස පරිසරයට එකතුවීම ගැටලුවකි. මෙලෙස ඝන, ද්‍රව සහ වායුමය ආකාරයෙන් පරිසරයට කසළ එකතුවීම ප්‍රදේශයේ පාරිසරික මානව සෞඛ්‍යයට පවා දැඩි බලපෑමක් එල්ල කරයි. වර්තමානයේ හඳුනාගත හැකි කසළ කන්දක් සඳහා හොඳ උදාහරණයක් වන්නේ මහනුවර ගොහාගොඩ කසළ කන්දයි. මීතොටමුල්ලට පසු විශාලත්වයෙන් දෙවැනි තැන ගන්නා ගොහාගොඩ කසළ කන්ද ප්‍රදේශය පුරා විවිධ ගැටලු ඇතිකරයි. මහනුවර දිස්ත්‍රික්කයේ එකතු වන කසළ සියල්ල බැහැර කිරීම සිදුකරනු ලබන්නේ මෙම තේක්කවත්ත ප්‍රදේශයට වන අතර මෙය ආරම්භ කළ මුල් අවධියේ ගැටලුවක් ඇති නොවුවත් වර්තමානයේ දී විශාල පාරිසරික සමාජීය බලපෑමක් එල්ල වී තිබේ.

තව ද මෙය ශ්‍රී ලංකාවේ දිග ම ගඟ වන මහවැලි ගඟ නිම්නය අසබඩට වන්නට පිහිටීම නිසා සංවේදී පාරිසරික කලාපයකට මෙහි විවෘත බලපෑම එල්ල වී ඇති අතර එමෙන් ම අහස උසට දිනෙන් දින වර්ධනය වන මෙම කසළ කන්ද නිසා ප්‍රදේශයේ ආසන්න ජනයාගේ දෛනික ජීවිතයට දැඩි බලපෑම් එල්ල වී තිබේ. එමනිසා ඝන අපද්‍රව්‍ය කිසිදු කළමනාකරණයකින් තොර ව විවෘත භූමිය මත ගොඩගැසීම නිසා එම ප්‍රදේශයන්හි ඇති වී තිබෙන විවිධ සමාජීය පාරිසරික බලපෑම හඳුනා ගැනීමත්, මෙලෙස ඇතිවන ගැටලු අවම කර ගැනීම සඳහා භූමි සැලසුම් නිර්මාණය සහ කසළ කඳු පුනරුත්ථාපනයේ තිරසාර පැවැත්මක් ඇති කිරීමේ කාලීන අවශ්‍යතා පෙන්වා දීමත් මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වේ.

## පර්යේෂණ අරමුණු

විවෘත භූමියට ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා ඇතිවී තිබෙන සමාජ, පාරිසරික බලපෑම විමර්ශනය සහ විවෘත කසළ බිම් සැලසුම්කරණ ක්‍රියාමාර්ග හඳුනා ගැනීම මෙහි මුඛ්‍ය පර්යේෂණ අරමුණ වේ.

## අනු අරමුණු

- ඝන අපද්‍රව්‍ය විවෘත භූමි මතට බැහැර කිරීම නිසා ඇතිවී තිබෙන සමාජ බලපෑම හඳුනා ගැනීම.
- ඝන අපද්‍රව්‍ය විවෘත භූමි තුළට බැහැර කිරීම නිසා ඇතිවී තිබෙන පාරිසරික බලපෑම හඳුනා ගැනීම.
- අපද්‍රව්‍ය විවෘත භූමියක් තුළ ගොඩ ගැසීමට අවශ්‍ය භූමිය සතුව පැවතිය යුතු යෝග්‍යතාව තක්සේරු කිරීම.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

- විවෘත කසළ බිම් පුනරුත්ථාපනය සහ කසළ බිම් සැලසුම්කරණ පද්ධති හඳුනා ගැනීම.

## පර්යේෂණයේ වැදගත්කම

මිනිසාගේ පරිභෝජනයෙන් පසු අනවශ්‍ය කොටස් ලෙස බැහැර කෙරෙන ප්‍රමාණය දිනෙන් දින වර්ධනය වන කාලසීමාවක් තුළ මේවා බැහැර කෙරෙන ආකාරය ද දිනෙන් දින ගැටලු ඇතිකරයි. එහෙයින් අවිධිමත් ලෙස විවෘත භූමි ප්‍රදේශ තුළ ගොඩගැසෙන අපද්‍රව්‍ය ප්‍රමාණය වර්ධනය වන අතර මෙය එම ප්‍රදේශ තුළ දීර්ඝ කාලීන සමාජ පාරිසරික බලපෑම් ඇති කිරීමට සමත් වේ. එහෙයින් මෙවැනි බලපෑම් ඇති කරන අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානයන් සඳහා සැලසුම් යාන්ත්‍රණ ඉදිරිපත් කිරීම සහ කළමනාකරණයට මඟපෑදීම් හඳුනා ගැනීම කාලීන අවශ්‍යතාවකි.

එහෙයින් මෙම විශ්ලේෂණය අධ්‍යයන පර්යේෂකයන්ට මෙන් ම විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, පාසල් ශිෂ්‍යයින්, මහජනතාව ඇතුලු මෙම විෂය ක්ෂේත්‍රය කෙරෙහි ඇල්මක් දක්වන ඕනෑ ම පුද්ගලයෙකුට දැනුම ලබා ගැනීම සඳහා මූලාශ්‍රයක් බවට පත්වේ. එමෙන් ම අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්නා රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවලට ඔවුන්ගේ ක්‍රියාවලි, නීතිරීති ප්‍රතිව්‍යුහගත කිරීමටත්, නවෝත්පාදනයන් සඳහා අවශ්‍ය සැලසුම් නිර්මාණයටත්, පවතින ප්‍රතිපත්ති බලාත්මක කිරීමටත් සහය දැක්වීමට මෙවැනි පර්යේෂණ වැදගත්වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

විවෘත භූමියට ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා ඇතිවී තිබෙන සමාජ, පාරිසරික බලපෑම විශ්ලේෂණය සහ විවෘත කසළ භූමියක යෝග්‍යතා තක්සේරුව සිදුකරන මෙම පර්යේෂණයේ අධ්‍යයන ප්‍රදේශය ලෙස ගොහාගොඩ කසල කන්ද අයත් හාරිස්පත්තුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය අධ්‍යයනයට භාජනය කරන ලදී.

හාරිස්පත්තුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය, ඓතිහාසික මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රදේශීය ලේකම් කොට්ඨාස විස්ස අතුරින් එක් ප්‍රදේශීය ලේකම් බලප්‍රදේශයක් ලෙස හඳුනා ගෙන ඇත. මෙය මහනුවර දිස්ත්‍රික්කයේ විශාලතම ප්‍රදේශීය ලේකම් කොට්ඨාස අතුරින් එකක් වන අතර මෙය ඊසාන දෙසින් අකුරණ ප්‍රදේශීය ලේකම් කොට්ඨාසට මායිම්වත්, වයඹ දෙසින් පූජාපිටිය ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයටත්, බස්නාහිරින් ගලගෙදර ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයටත්, නැගෙනහිරින් ගඟවට ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයටත්, ගිනිකොණින් යටිනුවර ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයටත් මායිම්ව පිහිටා ඇත. මෙහි මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 59.04 කි (සම්පත් පැතිකඩ, 2019).

හාරිස්පත්තුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ තේක්කවත්ත ග්‍රාමනිලධාරී බල ප්‍රදේශය තුළ වසර 1969 සිට මහනුවර නගරයේ උත්පාදනය වන ඝන අපද්‍රව්‍ය සියල්ල ප්‍රදේශයේ විවෘත භූමිය මත ගොඩ ගැසීම සිදුකරනු ලබයි. මෙම ප්‍රදේශය පාරිසරික සංවේදී කලාපයක් සහ සුන්දරත්වයෙන් අනූන ප්‍රදේශයක් වන අතර ප්‍රදේශයේ ජල අවශ්‍යතාව සපුරාලීමට දායකත්වය සපයන මහවැලි ගඟ අසබඩට මීටර් 50ක් පමණ ආසන්න ප්‍රදේශය තුළ ස්ථාන ගතවී තිබේ. ඒ අනුව අපගේ අධ්‍යයනයට බඳුන් වන මහනුවර ඝන අපද්‍රව්‍ය විවෘත භූමිය මත ගොඩගසන "ගොහාගොඩ බිම් පිරවුම" (7°18’49.63”N හා 80°37’16.83”E) පොල්වත්ත ග්‍රාමසේවා නිලධාරි වසමේ ස්ථාපනය වී ඇත.




රූපසටහන 01 : පොල්වත්ත ග්‍රා.නි. වසමේ අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානයේ චන්ද්‍රිකා ඡායාරූපය
(මූලාශ්‍රය : Google earth, 2021)


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය


මහනුවර නගරය ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලතම නගරය වන අතර වර්තමානය වන විට ඉතා කාර්යබහුල නගරයක් ලෙස හඳුනාගත හැකිවේ. කොළඹ නගරයට පමණක් දෙවැනි වන වාණිජ, ආර්ථික හා සමාජීය අතින් ඉහළ තැනක් ගන්නා මහනුවර නගරය ලෝක උරුම නගරයක් ලෙස ඉතා ජනප්‍රිය වේ. එහෙයින් පවතින සංස්කෘතික හු දර්ශනය නිසා මහනුවර නගරය ආශ්‍රිත සංචාරක කටයුතුවල වර්ධනයක් දක්නට ලැබේ. එමනිසා මෙකී සංචාරක ව්‍යාපාරයට සේවා සපයන හෝටල් කාමර, ආපනශාලා, වෙළඳසැල් ආදිය විශාල ලෙස වර්ධනය වී ඇත.

එහෙයින් ප්‍රදේශයේ ජීවත්වන ජනතාව මෙන් ම නගරයට පැමිණෙන සංචාරකයන්ගේ වර්ධනයත් සමඟ ප්‍රදේශය තුළ දෛනික සංචලතාව ඉතා ඉහළ මට්ටමක් දක්නට ලැබේ. මේ නිසා නගරය තුළ නිෂ්පාදනය වන කසළ ප්‍රමාණය හා නගරය කරා සංක්‍රමණය වන පුද්ගලයින් විසින් ජනනය කරනු ලබන කසළ ඉතා අධික ලෙස එක් දිනක් තුළ එකතු වීම සිදුවේ. ජන සංගණන වාර්තාවලට අනුව 2012 වර්ෂයේ දී මහනුවර නගරය තුළ භූමි ප්‍රමාණයෙන් 60.11%ක නේවාසික භාවිතයක් දක්නට ලැබෙන අතර නිවාස 218,302ක් දක්නට ලැබේ. 2015 වර්ෂයේ දී සිදුකරන ලද භූමි පරිහරණ සමීක්ෂණයට අනුව සම්පූර්ණ භූමි පරිහරණයෙන් 51.11%ක් මහනුවර මහනගරසභා සීමාව තුළ නේවාසික භාවිතය සඳහා යොදා ගෙන ඇතිබව හඳුනා ගන්නා ලදී.

වගු අංක 01 ඃ දෛනික ව මහනුවර දිස්ත්‍රික්කය තුළ එකතුවන කසළ ප්‍රමාණය

| දිස්ත්‍රික්කය | වර්ගඵලය (ව.කි.මී) | ජනගහනය (2012 ජ.ස.වාර්තා) | දෛනිකව කසළ (මෙ.ටො) |
|---|---|---|---|
| මහනුවර | 1940 | 1,416,000 | 100-200 |

මූලාශ්‍රය ඃ JICA 2021 නවතම වාර්තා




රූපය 02 හාරිස්පත්තුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ සාපේක්ෂ හා නිරපේක්ෂ පිහිටීම

මූලාශ්‍රය ඃ මිනුම්දෝරු දෙපාර්තුමේන්තුව(2015), 1 : 50 000 ඩිජිටල් දත්ත ඇසුරින්.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මීට අමතර ව මහනුවර ආර්ථික, වාණිජ, සේවා කාර්යයන්හි ප්‍රධාන කේන්ද්‍රස්ථානය වන අතර 325,000ක් පමණ වන දෛනික සංචරණයක් අධ්‍යාපනික, පරිපාලන, සෞඛ්‍ය, ආගමික හා සංචාරක කටයුතු සඳහා දෛනික ව වාර්තා කරයි. මහනුවර නගරය තුළ හෝටල් 334ක් පමණ ව්‍යාප්ත ව පවතින අතර කාමර 18,510ට ආසන්න සංඛ්‍යාවක් සේවා සපයනු ලබයි.

මෙකී හේතු සාධක නිසා දෛනික ව නිපදවනු ලබන කසළ ප්‍රමාණය වර්ධනය වන අතර මෙය වර්තමානය වන විට මහනුවර නගරයට විශාල ගැටලුවක් බවට පත් ව තිබේ. මහනුවර නගරය තුළ දැනට පූතික වලවල්වල ඒකාරාශී වන මළ ද්‍රව්‍ය ගලි මගින් ගොහාගොඩට බැහැර කරනු ලබන අතර දිනකට මීටර් කියුබ් 50-60ක් අතර ප්‍රමාණයක් ගලි බවුසර් මගින් බැහැර කරයි. දිනකට ටොන් 150ක් පමණ ඒවකට ඒකරාශි වේ. අද වන විට ශීඝ්‍ර නාගරීකරණය නිසා දෛනික ව එකතු වන කසළ ප්‍රමාණය තවදුරටත් වර්ධනය වී ඇති අතර එය අදවන විට මෙට්‍රික් ටොන් 200ට ආසන්න ප්‍රමාණයක් වී ඇත. මේ අතුරින් දිරාපත් වන කසළ ප්‍රමාණය 88%ක් වන අතර දිරාපත් නොවන කසළ 12%ක් පමණ වේ. මහනුවර නගරය තුළ හෝටල් ආශ්‍රිත ව වැඩි වශයෙන් අපද්‍රව්‍ය බැහැර කරන අතර එය 26.79%ක් පමණ වේ. මීට අමතර ව ගෘහාශ්‍රිත ව බැහැර කරන අපද්‍රව්‍ය, වීදි පවිත්‍රතා මගින් ඇතිවන අපද්‍රව්‍ය, පූජාභූමි ආශ්‍රිත ව ඇතිවන අපද්‍රව්‍ය ආදී ලෙස හඳුනාගත හැකි වේ. මෙසේ මහනුවර මහ නගරසභා බලප්‍රදේශ හයකට බෙදා කසළ ඒකරාශී කිරීම සිදුකරන අතර මේ සියල්ල කටුගස්තොට ගොහාගොඩ පිහිටි අක්කර 32ක් වන විවෘත භූමිය මත බැහැර කිරීම සිදුකරනු ලැබේ.

ඒ අනුව මෙවැනි සමාජ, ආර්ථික පසුබිමක් ඇති හාරිස්පත්තුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ පොල්වත්ත ග්‍රාමසේවා වසමේ ඉතා දීර්ඝ කාලයක පටන් විවෘත ව ගොඩගැසෙන මෙම කසළ කන්ද නිසා විශාල වශයෙන් පාරිසරික හා සමාජීය ගැටලු රාශියකට මුහුණ පෑමට සිදුවී ඇති බව හඳුනාගත හැකිවේ. මෙය ආරම්භයේ බිම් පිරවුමක් ලෙස නිර්මාණය කර ඇති අතර කසළ මතට විශාල පස් තට්ටු අතුරා වසා දැමීම සිදුකරනු ලබයි. නමුත් එය තාවකාලික ව සිදුවන ක්‍රියාවලියක් වන අතර මෙයට පැමිණෙන සියලු ම කසළ මෙම ක්‍රියාවලියට නතුකිරීමට නොහැකි වේ. මේ නිසා විවිධ සෞඛ්‍යමය, පාරිසරිකමය ගැටලු වර්ධනය වීම වර්තමානයේ දක්නට ලැබේ.

එහෙයින් හාරිස්පත්තුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ විවෘත භූමිය මත ඝන අපද්‍රව්‍ය ගොඩගැසීම නිසා ඇති වී තිබෙන සමාජ, පාරිසරික බලපෑම විශ්ලේෂණය සඳහා මූලික වශයෙන් ප්‍රාථමික දත්ත රැස්කිරීම සිදු කෙරේ. එහි දී පර්යේෂණයේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නියැදි ඒකකයක් තෝරා ගැනීම සිදුකරන අතර මේ සඳහා සසම්භාවී නොවන නියැදි ක්‍රමය යටතේ එන පහසුතම නියැදුම් ක්‍රමය භාවිත කෙරේ. මෙහි දී කසළ කන්ද අවට ජීවත්වන හා දෛනික ජීවන කටයුතුවල නිරතවන සමීපතම සජීවී පුද්ගලයින් සංගහනය ලෙස සලකා බලමින් සංගහනය නියෝජනය වන පරිදි පර්යේෂණය සඳහා නියැදි ඒකක 50ක් තෝරා ගන්නා ලදී. ඒ අනුව කසළ කන්ද නිසා සිදුවන පාරිසරික, සමාජීය බලපෑම පිළිබඳ ව පැහැදිලි දත්ත ලබා ගැනීමට හැකි ආකාරයෙන් පුද්ගලයින් 50 දෙනෙකුගෙන් සරල ප්‍රශ්නාවලි 50ක් හරහා දත්ත ලබා ගන්නා ලදී.

එමෙන් ම ක්ෂේත්‍ර නිරීක්ෂණ මගින් ප්‍රාථමික දත්ත රැස්කිරීම සිදුකළ අතර ඒ යටතේ පොල්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය වෙත ගොස් එම ස්ථානය නිරීක්ෂණය කිරීම සිදු කළ අතර ඒ හරහා අවිධිමත් අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා පරිසරයට සිදුව ඇති බලපෑම, ප්‍රදේශයේ සමාජීය වශයෙන් මුහුණපාන ගැටලු, කසළ කන්ද ආශ්‍රිත සිදුවන ක්‍රියාකාරකම් මෙන්ම මේවා මගහරවා ගැනීමට දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග ආදිය හඳුනා ගැනීම සිදුකරයි. ඒ මගින් අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා ඇතිවී තිබෙන බලපෑම පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම මෙන් ම ප්‍රශ්නාවලිය සකස් කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කරගැනීම සිදුවිය.

ද්විතීයික දත්ත රැස් කිරීමේ දී කසල ආශ්‍රිත බලපෑම මෙන් ම කළමනාකරණයේ විවිධ පැතිකඩයන් ආවරණය කරන පර්යේෂණ පත්‍රිකා, ලිපි ලේඛන, වාර්තා, ආයතනික දත්ත, Google Earth ඡායාරූප, සිතියම්, පුවත්පත් හා අන්තර්ජාල වෙබ් අඩවි ආදී දත්ත රැස් කිරීම සඳහා භාවිතයට ගන්නා ලදී.

දත්ත විශ්ලේෂණය සඳහා මූලික ව ම ප්‍රාථමික දත්ත රැස්කිරීම යටතේ ප්‍රශ්නාවලි මගින් ලබාගත් දත්ත විශ්ලේෂණය කිරීමට අනුමිතික සංඛ්‍යාන විද්‍යාත්මක විශ්ලේෂණ ක්‍රමයක් වන කෙෙ වර්ග පරීක්ෂාවක් සිදුකරනු ලැබේ. මේ සඳහා IBM SPSS 21 මෘදුකාංගය යොදා ගන්නා අතර මෙහි දී පර්යේෂණයේ අරමුණු වන හාරිස්පත්තුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා සිදු ව ඇති සමාජීය හා පාරිසරික බලපෑම පිළිබඳ ව සොයා බැලීම සිදු කෙරේ. එහි දී විවෘත භූමියට කසළ ගොඩ ගැසීමත්, සමස්ත ප්‍රදේශයට සමාජීය, පාරිසරික වශයෙන් එල්ල වී ඇති බලපෑමත් අතර සහසම්බන්ධතාවක් පවතී ද යන්න පරීක්ෂාවට කල්පිත ගොඩ නැගීම මෙසේ සිදුකරයි. ඒ අනුව,

- **සමාජ බලපෑම පරීක්ෂාව**

අප්‍රතිශ්ට කල්පිතය ($H_0$) : ප්‍රදේශයේ අපද්‍රව්‍ය ගොඩගැසීමත්, සමස්ත ප්‍රදේශයට සමාජීය වශයෙන් එල්ල වී ඇති බලපෑමත් අතර සම්බන්ධතාවක් නොපවතී.

වෛකල්පිතය ($H_1$) ප්‍රදේශයේ අපද්‍රව්‍ය ගොඩගැසීමත්, සමස්ත ප්‍රදේශයට සමාජීය වශයෙන් එල්ල වී ඇති බලපෑමත් අතර සම්බන්ධතාවක් පවතී.

තීරණ නීතිය : සලකා බලන වෙසිසයා මට්ටම ($a= 0.05$) වඩා සම්භාවිතා අගය කුඩා වේ නම් ($H_0$) ප්‍රතික්ෂේප කිරීම සඳහා ප්‍රමාණවත් සාධක පවතී.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සලකා බලන වෙසිසයා මට්ටම (a= 0.05) වඩා සම්භාවිතා අගය විශාල වේ නම් ($H_0$) ප්‍රතික්ෂේප කිරීම සඳහා ප්‍රමාණවත් සාධක නොපවතී.

- **පාරිසරික බලපෑම පරීක්ෂාව**

අප්‍රතිශ්ට කල්පිතය ($H_0$) : ප්‍රදේශයේ අපද්‍රව්‍ය ගොඩගැසීමත්, සමස්ත ප්‍රදේශයට දීර්ඝ කාලීන වශයෙන් එල්ල වන පාරිසරික ඇති බලපෑමත් අතර සම්බන්ධතාවක් නොපවතී.


වෛකල්පිතය ($H_1$) : ප්‍රදේශයේ අපද්‍රව්‍ය ගොඩගැසීමත්, සමස්ත ප්‍රදේශයට දීර්ඝ කාලීන වශයෙන් එල්ල වන පාරිසරික ඇති බලපෑමත් අතර සම්බන්ධතාවක් පවතී.

තීරණ නීතිය : සලකා බලන වෙසිසයා මට්ටම (a= 0.05) වඩා සම්භාවිතා අගය කුඩා වේ නම් ($H_0$) ප්‍රතික්ෂේප කිරීම සඳහා ප්‍රමාණවත් සාධක පවතී.

සලකා බලන වෙසිසයා මට්ටම (a= 0.05) වඩා සම්භාවිතා අගය විශාල වේ නම් ($H_0$) ප්‍රතික්ෂේප කිරීම සඳහා ප්‍රමාණවත් සාධක නොපවතී යන සිද්ධාන්තය මෙහි දී සලකා බලනු ලබයි.

- **භූගෝලීය තොරතුරු පද්ධති මෘදුකාංගය භාවිතය**

අපද්‍රව්‍ය විවෘත භූමිය මත ගොඩ ගැසීම හෝ බිම්පිරවුම් සඳහා අවශ්‍යය වන භූමි යෝග්‍යතා තක්සේරුව සිදු කිරීම පර්යේෂණයේ උප අරමුණු වන අතර මෙම අරමුණු සාක්ෂාත් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් භූගෝලීය තොරතුරු පද්ධති මෘදුකාංගය (Arc GIS 10.4) භාවිත කිරීම සිදුකරයි. මේ සඳහා අවශ්‍ය වන යෝග්‍යතා සාධක 7ක් සලකා බලමින් DEM ආකෘති නිර්මාණය කිරීමත්, එය උපයෝගී කරගනිමින් Weighed Overlay ක්‍රමවේදය මගින් යෝග්‍යතා සාධක සඳහා බර තැබීම් සිදු කරමින් අදාළ භූමිය තෝරා ගැනීම සිදු කෙරේ. එහි දී තක්සේරුවට අදාළ ව මහනුවර දිස්ත්‍රික්කයේ මතුපිට ජල පෘෂ්ඨය, ගොඩනැගිලි ව්‍යාප්තිය, බෑවුම, ජනගහනය, භූමි පරිහරණය, මාර්ග පද්ධතියේ ව්‍යාප්තිය සහ වනාන්තරවල ව්‍යාප්තිය ආදී සාධක උපයෝගී කරගනු ලැබේ. ඒ අනුව යමින් බර තැබීම් විශ්ලේෂණයට ප්‍රථම බෑවුම් කෝණය ආදී සාධක ප්‍රදේශය තුළ සොයා බැලීම සඳහා රාෂ්ට ආකෘති නිර්මාණය කෙරෙන අතර (DEM) ඉන් පසු අනෙකුත් සලකා බලන සාධකයන් දෛශික ආකෘතියේ සිට රාෂ්ට ආකෘති දක්වා පරිවර්තනය කරන ලදී (E. Distance / Polygon to Raster). මෙසේ සකස් කරගන්නා ලද දත්තයන් වර්ගීකරණයන්ට ලක්කරන අතර ඒ අනුව පන්තිවලට වර්ගීකරණය සිදු කෙරේ (Reclassify). මෙසේ නිර්මාණය කරගත් රාෂ්ට ආකෘති සියල්ල ම බර තැබීමට ලක්කරන අතර මෙහි දී සියලු සාධකයන් කෙරෙහි සමාන ලෙස බරතැබීම් අගයන් ලබාදෙමින් අදාළ භූමි යෝග්‍යතා තක්සේරුව සිදුකරනු ලබයි (Set Equal Influence). ඒ අනුව මෙම විශ්ලේෂණය සිදුකිරීම සඳහා යොදා ගන්නා පියවර සහිත GIS මොඩියුලය බර තැබීමට පෙර ආකෘතිය පහත ගැලීම් සටහන තුළ දක්වා ඇත.





© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය


මීට අමතර ව ඉහත විචල්‍යයන් පරික්ෂාවන්ට අදාළ දත්තවලට අමතර ව ලබා ගන්නා ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රමවේද වන ප්‍රස්තාර, වගු නිර්මාණයට Excel මෘදුකාංගය යොදා ගන්නා ලදී. අධ්‍යයන ප්‍රදේශය තුළ දැක ගත හැකි විවිධ තත්ත්වයන්, ලක්‍ෂණයන් හා ඒවායේ කාලීන වෙනස්වීම් හඳුනා ගැනීමට රූපසටහන් හා Arc GIS 10.4 මෘදුකාංගය යොදා ගැනෙන අතර Buffer ආකෘති සිතියම් වැඩිදුරටත් විශ්ලේෂණ දත්ත ඉදිරිපත් කිරීමට යොදා ගන්නා ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

පර්යේෂණ නියැදීම මගින් ලබාගත් ප්‍රාථමික හා ද්විතීයික දත්ත මගින් හඳුනාගත් හාරිස්පත්තුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ විවෘත භූමිය මත ඝන අපද්‍රව්‍ය ගොඩ ගැසීම නිසා ඇතිවී තිබෙන සමාජ හා පාරිසරික බලපෑමත්, විවෘත කසළ බිම් කළමනාකරණය සඳහා සිදුකරන භූමි තක්සේරුවේ ප්‍රතිඵල සාකච්ඡාව මෙසේ ය.

### විවෘත භූමියට අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා ඇති වන සමාජ බලපෑම විශ්ලේෂණය.


හාරිස්පත්තුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ විවෘත කසළ බැහැර කිරීම නිසා ඇතිවන සමාජ හා පාරිසරික බලපෑම විශ්ලේෂණය සඳහා ප්‍රශ්නාවලි සමීක්ෂණ 50ක් යොදා ගත් අතර ඒ අනුව ප්‍රශ්නාවලි සමීක්ෂණයට සහභාගි වූ ප්‍රතිචාරකයන්ගෙන් ප්‍රදේශයේ අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධ ව තොරතුරු ලබාගැනේ. මෙහි දී ප්‍රතිචාරකයන් ලෙස සහභාගි වූවන්ගෙන් 28(56%) දෙනෙකු ස්ත්‍රීන් වන අතර 22(44%) පුරුෂ පාර්ශවය නියෝජනය කරනු ලබයි. මෙලෙස ප්‍රශ්නාවලි සමීක්ෂණය සඳහා සම්බන්ධ වූවන්ගෙන් වැඩි පිරිසක් ගොහාගොඩ කසළ කන්ද ආරම්භයේ සිට ම ප්‍රදේශයේ ජීවත් වූ මුල් පදිංචිකරුවන් වන අතර එය වයස් කාණ්ඩ ලෙස සැලකීමේ දී අවුරුදු 55ට වැඩි පුද්ගලයින් ලෙස හඳුනා ගනී. ඒ අනුව ප්‍රතිචාරකයින්ගේ වයස් කාණ්ඩ පහත රූපසටහනට අනුව හඳුනා ගෙන ඇත.




රූපසටහන 03 : ප්‍රතිචාරකයන්ගේ වයස් කාණ්ඩ (මූලාශ්‍රය : ප්‍රශ්නාවලි සමීක්ෂණ 2022)

ඒ අනුව වයස අවුරුදු 15-24ත් අතර 8(16%) දෙනෙකු ද 25-34ත් අතර 9(18%)ක් 34-44ත් අතර 7(14%) හා 45-55ත් අතර පුද්ගලයින් 9(18%)ක් ප්‍රතිචාරකයන් ලෙස සමීක්ෂණයට සම්බන්ධ වී තිබේ. හාරිස්පත්තුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ පොල්වත්ත වසම තුළ 1969 දී මෙම කසළ ගොඩ ගැසීම ආරම්භ වූ අතර එකල සිට වසර 53කට අධික දීර්ඝ කාලයක් පුරා සමාජීය හා පාරිසරික වශයෙන් විවිධ පීඩාවන්ට ලක්වෙමින් මෙම ජනයා ජීවිත ගෙනයන අතර මේ බලපෑම සම්බන්ධයෙන් අදහස් දැක්වූවන්ගෙන් වයස අවුරුදු 55ට වැඩි ය. ප්‍රතිචාරකයින් පවසන අන්දමට මෙම කසළ ගොඩ ගැසීම මුල් වකවානුවෙහි දී කසළ කළමනාකරණ ව්‍යාපෘතිවලට මුවාවී ආරම්භ වූවත් වර්තමානයේ එවැනි සාධනීය විසඳුම්වල ඌණතාවක් දක්නට ලැබෙන බවත්, මෙයින් විශාල සමාජ පාරිසරික හානි සිදුවන බවත් ඔවුන්ගේ අදහස විය.


හාරිස්පත්තුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ මෙන් ම මහනුවර නගරයේ එකතු වන අපද්‍රව්‍ය සියල්ල බැහැර කිරීමට යොදා ගනුයේ පොල්වත්ත ග්‍රාමයේ පිහිටි ගොහාගොඩ කසළ කන්දයි. මෙම ප්‍රදේශයේ වැඩි වශයෙන් ග්‍රාමීය ලක්ෂණ දක්නට ලැබෙන නමුත් කසළ කන්ද අවට ද කුඩා පවුල් ලෙස ප්‍රදේශය පුරා පැතිරුණු ජනාවාසකරණයක් හඳුනාගත හැකි ය. මෙහි දී ප්‍රශ්නාවලිය මගින් තෝරාගත් නියැදි 50ක් භාවිතයෙන් ඔවුන්ගේ නිවාස කසළ කන්දට කොපමණ දුරින් පිහිටා ඇතිදැයි විමසීමක් සිදුකරන ලදී. එසේ ලබාගත් දත්ත පහත රූපසටහනෙහි නිරූපණය කොට ඇත.




රූපසටහන 04 : ප්‍රතිචාරකයන් කසළ කන්දේ සිට නිවසට ඇති දුර (මූලාශ්‍රය : ප්‍රශ්නාවලි සමීක්ෂණ 2022)

ඒ අනුව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් වැඩි ම පිරිසක් මීටර් 200-400ත් දුරකින් තම නිවාස ස්ථානගත වී ඇතිබව හඳුනාගත හැකි ය. එමෙන් ම මීටර් 400ට අඩු දුර ප්‍රමාණයක සිට බලපෑමට ලක්වන්නන් මුලු නියැදි ඒකකයන්ගෙන් 72% වේ. මේ අනුව කසළ කන්ද අවට සැලකිය යුතු පුද්ගලයින් සංඛ්‍යාවක් ජීවත් වන අතර මෙහි දී තවදුරටත් මෙම ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා GIS මෘදුකාංගය භාවිත කරමින් බලපෑම් විශ්ලේෂණයක් සිදුකරන ලදී.



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය




රූපසටහන 05 : කසළ කන්ද මගින් බලපෑමට ලක්වන ප්‍රදේශ 1 : 50 000 ඩිජිටල් දත්ත ඇසුරින්

ඒ අනුව හඳුනා ගැනීමට හැකි වූයේ පොල්වත්ත ග්‍රාමසේවා වසම මුලුමනින් ම බලපෑමට ලක්වන අතර ඒ අවට වේගිරිය, මැදපාතගම හා වත්තරන්තැන්න යන වසම් ද මෙමගින් බලපෑමට ලක්වන බවයි. මීට අමතර ව සුළු වශයෙන් රත්මලේ සහ මාපනවතුර වසම් ද බලපෑමට ලක්වන අතර කසළ කන්ද තවදුරටත් මේ ස්ථානය තුළ වර්ධනය වුවහොත් අනාගතයේ මෙම ප්‍රදේශයන් ද සම්පූර්ණයෙන් බලපෑමට ගොදුරුවිය හැකි ය.

පොල්වත්ත වසම තුළ අක්කර 32ක විවෘත භූමියකට මහනුවර මහනගරසභා බලප්‍රදේශ හයක් මගින් ඒකරාශි වන කසළ මෙම ස්ථානයට ගෙන ගොස් බැහැර කිරීම සිදු කෙරෙන අතර එමගින් බහුල ලෙස බලපෑමට ලක්වන සමාජීය සාධක කුමක් දැයි ප්‍රශ්නාවලිය මගින් ප්‍රතිචාරකයන්ගෙන් විමසන ලදී. එහි දී නිවාස, ආයතන, වෙළඳසැල් සහ ඉහත සියල්ල ලෙස කොටස්වලට වෙන් කර විමසීම සිදුකළ අතර ඒ අනුව ප්‍රදේශයේ වැඩි ම බලපෑම නිවාසවලට එල්ලවන බව 46% ප්‍රකාශ මගින් අනාවරණය විය.





රූපසටහන 06 : කසළ කන්ද නිසා බලපෑමට ලක්වන සමාජ සාධක
මූලාශ්‍රය : ප්‍රශ්නාවලි සමීක්ෂණ 2022


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මීට හේතුව වන්නේ ප්‍රදේශය තුළ ජීවත් වන ජනයාගෙන් බහුතරය මුල් ඉඩම් හිමියන් වීමත්, මෙම නිවාසයන් ද පරම්පරාවෙන් උරුම වීමත්, එමනිසා මොවුන් මෙම නිවාස අත්හැර හෝ වෙනත් ස්ථානයක් කරා සංක්‍රමණය වීමට මැලිකමක් දැක්වීමත් ය. එමෙන් ම මොවුන්ගේ රැකියා, ආර්ථික කටයුතු සිදුවන්නේ මෙම ප්‍රදේශය තුළ වීම නිසා වෙනත් ස්ථානයක් කරා යාමේ දුෂ්කරතාව ද පවතී. ග්‍රාමීය මුහුණුවරක් ගන්නා ප්‍රදේශයේ ස්වයං රැකියාවල නිරතවන්නන් දක්නට ලැබෙන නමුත් ආයතනික මට්ටමින් මහාපරිමාන රාජ්‍ය හෝ පෞද්ගලික ස්ථානයන් දක්නට නොලැබෙන අතර ප්‍රතිචාරකයන්ට අනුව 8%ක බලපෑමක් ආයතනයන්ට එල්ලවන බව ප්‍රකාශ කෙරේ. මෙම ප්‍රදේශයේ වෙළඳසැල් දක්නට ලැබෙන අතර කඩවීදිය, ආපනශාල වැනි කුඩා වෙළඳසැල් මෙන් ම ප්‍රදේශයේ සති පොළට ද මෙම කසළ කන්ද නිසා බධා එල්ලවේ. ප්‍රතිචාරකයන්ට අනුව 16%ක බලපෑමක් වෙළඳසැල්වලට සිදුවන අතර සමස්තයක් ලෙස මෙකී සියලු සාධකයන් කසළ කන්ද නිසා බලපෑමට ලක්වන බව 30%ක් විසින් අවධාරණය කරනු ලැබ ඇත.

ප්‍රදේශයට අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය නිසා ජනයා මුහුණ දෙන ගැටලුවල බලපෑමේ ස්භාවය මත පෙළගැස්වීම සිදු කළ අතර එහි දී දුර්ගන්ධය පැතිරීයාම, මැසිමදුරු උවදුර, අපද්‍රව්‍ය පිළිස්සීම හා වර්ෂා සමයේ අපජලය වහනය වීම, කසළ රැගෙන යන රථවලින් සිදුවන අපහසුතා ලෙස වර්ගීකරණයකට ලක්කරන ලදී. මේ ඔස්සේ ප්‍රතිචාරකයන්ගෙන් විමසා බැලීම් සිදුකරන ලද අතර අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම නිසා ජනයා මුහුණ දෙන ගැටලු පිළිවෙළින් මෙසේ හඳුනා ගත හැකි ය.




රූපසටහන 07 ඃ ප්‍රදේශයට අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය නිසා ජනයා මුහුණ දෙන ගැටලු මූලාශ්‍රය ඃ ප්‍රශ්නාවලි සමීක්ෂණ 2022

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 66%ක් දුර්ගන්ධය නිසා පීඩාවට පත්වන බවත්, 14%ක පිරිසක් මැසිමදුරු උවදුරෙන් සහ අපද්‍රව්‍ය පිළිස්සීම හා වර්ෂා සමයේ අපජලය වහනය වීම නිසා පීඩාවට පත්වන බවත්, 6%ක ප්‍රතිචාරකයින් කසළ රැගෙන යන රථවලින් සිදුවන බාධා නිසා පීඩාවට පත්වන බව ප්‍රකාශ කෙරේ. නමුත් සතුන් මගින් කසළ තැන තැන විසුරවා හැරීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් නොදක්වයි.

ඒ අනුව ප්‍රධාන වශයෙන් අපද්‍රව්‍ය ගොඩගැසීම නිසා ප්‍රදේශය පුරා දුර්ගන්ධය පැතිරීයාම හඳුනාගත හැකි ප්‍රධාන ගැටලුවක් වන අතර මීට හේතුව වන්නේ කසළ කන්දට මීටර් 400ක් නුදුරින් විශාල නිවාස ප්‍රමාණයක් පිහිටා තිබීමයි. එසේ ම වර්ගීකරණයකින් තොර ව කසළ එකමත ගොඩ කිරීම නිසා මෙම තත්ත්වය තවත් උග්‍රවන අතර කසළ කන්ද පිහිටීම පවතිනුයේ ද සුළං හමන දිශාවට සමාන්තරවයි. මහනුවර මහනගරසභාවට අනුව ගොහාගොඩ කසළ කන්දට දිනකට වාහන 48කින් අපද්‍රව්‍ය බැහැර කිරීම සිදුකරන අතර මේ සියල්ල රැගෙන යනු ලබන්නේ ප්‍රදේශයේ නිවාස ආශ්‍රිත ව දිවෙන මාර්ගයෙනි. මේ හේතු නිසා ප්‍රදේශය පුරා දුර්ගන්ධය හමායාම සිදුවේ.

තව ද කසළ එකට ගොඩකිරීම නිසා වර්ෂා කාලය තුළ දී මැසිමදුරු ගහනය ද ශීඝ්‍ර ව ව්‍යාප්ත වන අතර මෙය රෝග වාහකයින් බෝවීමත් එසේ ම වර්ෂා කාලය තුළ දී කසළ කන්දේ සිට සෝදාගෙන එනු ලබන අපජලය ප්‍රදේශය පුරා පැතිරෙන අතර එය ප්‍රදේශයේ කාණු පද්ධති පවා අවහිර වන බව ක්ෂේත්‍ර නිරීක්ෂණයෙන් අනාවරණය විය. කසළ පුළුස්සා දැමීම නිසා ප්‍රදේශයේ වායු දූෂණය තරමක් තීව්‍ර වී ඇති අතර එම දුමාරය ද ප්‍රදේශය පුරා විසිර යන ආකාරය දක්නට ලැබේ.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය



රූපසටහන 08 : අවිධිමත් ලෙස අපද්‍රව්‍ය වර්ගීකරණය නොකර බැහැර කිරීම (මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණ)



රූපසටහන 09 : කසළ කන්දෙන් නිකුත්වන අපජලය එකතු වී තිබෙන ආකාරය (මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණ)



රූපසටහන 10 : කසළ පුරවාගත් රථ කසළ කන්ද කරා ගමන් කරන ආකාරය (මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණ)

මෙලෙස සමාජීය වශයෙන් සිදුවන බලපෑම තවදුරටත් විමර්ශනය කිරීම සඳහා ප්‍රශ්නාවලි සමීක්ෂණය උපයෝගී කොට ගෙන කෙෙ වර්ග පරීක්ෂාවක් සිදු කරන ලදී. මෙහි දී ප්‍රදේශයේ අපද්‍රව්‍ය ගොඩ ගසන භූමියේ යෝග්‍යතාවත් එමගින් සමාජයට ඇතිකරන බලපෑමේ ස්වභාවය යන විචල්‍ය භාවිත කරමින් කල්පිතයන් පරීක්ෂා සිදුකරන ලද අතර එහි දී ලබාගත් සංඛ්‍යා විද්‍යාත්මක සම්බන්ධතාව පහත පරිදි හඳුනාගත හැකි ය.

වගු අංක 02 : ප්‍රදේශයේ අපද්‍රව්‍ය ගොඩගැසීමත් සමස්ත ප්‍රදේශයට සමාජීය වශයෙන් එල්ල වී ඇති බලපෑමත් අතර සම්බන්ධතාව


| විචල්‍යය | සම්භාවිතා අගය | තීරණය | නිගමනය |
|---|---|---|---|
| ($H_1$) | 0.04 | ($H_0$) ප්‍රතික්ෂේප වේ | ප්‍රදේශයේ අපද්‍රව්‍ය ගොඩගැසීම නිසා සමස්ත ප්‍රදේශයට සමාජීය වශයෙන් එල්ල වී ඇති බලපෑමක් එල්ල වේ. |

මූලාශ්‍රය : ප්‍රශ්නාවලි සමීක්ෂණ 2022

ඒ අනුව සමස්ත ප්‍රදේශයට අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම නිසා සිදුවන සමාජ බලපෑම සොයා ගැනීම සඳහා සිදු කළ කෙෙ වර්ග පරීක්ෂාවේ සම්භාවිතා අගය 0.04 වේ. ඒ අනුව එය සලකා බලන වෙසිසයා මට්ටමට වඩා අඩු සම්භාවිතා අගයක් වන නිසා අප්‍රතිෂ්ට කල්පිතය ($H_0$) ප්‍රතික්ෂේප කිරීමට තරම් සාධක පවතී. එමගින් පැහැදිලි වන්නේ ප්‍රදේශය තුළට අපද්‍රව්‍ය අවිධිමත් ලෙස ගොඩ ගැසීම නිසා සමස්ත ප්‍රදේශයට ම සමාජීය වශයෙන් බලපෑමක් සිදුවන බවයි. එහෙයින් ගොහාගොඩ කසළ කන්ද ප්‍රදේශයේ සියලු සමාජ සාධක කෙරෙහි බලපෑම් සිදුකරන අතර මේ නිසා ප්‍රදේශයේ ජනයාගේ ජීවිතවලට ද මෙයින් බලපෑම් එල්ල කරයි.

මීට අමතර ව සමාජීය වශයෙන් මෙම විවෘත කසළ බිම නිසා ප්‍රදේශය පුරා විහිදුණු සෞඛ්‍ය ගැටලු ද වර්ධනය වී ඇත. මේවා දිගුකාලීන හා කෙටි කාලීන වශයෙන් ඇතිවන රෝගයන් වන අතර මේ නිසා ප්‍රදේශවාසීන් මහත් ව්‍යසනයකට පත් ව තිබේ. ප්‍රශ්නාවලි සමීක්ෂණය මගින් මෙම රෝගයන් අවධාරණය කර ගැනීමට සමත්විය.

රූපසටහන 11 ෑ කසළ කන්ද ආශ්‍රිත සෞඛ්‍ය ගැටලු




(මූලාශ්‍රය : ප්‍රශ්නාවලි සමීක්ෂණ 2022)

ඒ අනුව සෞඛ්‍ය ගැටලු ලෙස හිසරදය සහ ශ්වසන රෝගය ප්‍රධාන වශයෙන් හඳුනා ගැනෙන රෝග වන අතර සමීක්ෂණයට අනුව පුද්ගලයන් 18 දෙනෙක් (20.68%) හිසරදයෙනුත්, පුද්ගලයන් 22ක් (25.28%)


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ශ්වසන රෝගයෙන් පීඩා විඳිති. මූලික වශයෙන් ම දුගඳ හැමීම නිසා මෙම හිසරදය සහ වමනය යන රෝග ලක්ෂණ ඇති කරනු ලබන අතර ශ්වසන රෝගයට ප්‍රධාන හේතුව වන්නේ ප්‍රදේශයේ කසළ පිළිස්සීමයි. මේ නිසා ප්‍රදේශය පුරා ම දුම පැතිරෙන අතර මෙමගින් අවට වායුගෝලය දූෂණය වේ. එය ආශ්වාස කිරීමට තරම් සුදුසු වාතාවරණයක් නොපවතී. එමෙන් ම කසළ එක තැන ම දීර්ඝ කාලයක් ගොඩගැසීම නිසා විවිධ වායු වර්ග විමෝචනය වන අතර මීතේන්, කාබන්ඩයොක්සයිඩ් වැනි වායු ඉන් ප්‍රධාන වේ. මෙය ප්‍රදේශයේ පුද්ගලයන්හට සමේ රෝග (12.64%) වර්ධනය වීමට ද හේතු වන අතර වැඩිවශයෙන් කසළ කන්දට ආසන්න පුද්ගලයින් වැඩිවශයෙන් මෙයට ගොදුරු වේ. තව ද වර්ෂාකාලය තුළ දී ප්‍රදේශයේ මැසිමදුරු ගහණය වර්ධනය වන අතර මේ නිසා ප්‍රධාන වශයෙන් ඩෙංගු රෝගය (13.79%) ප්‍රබල ලෙස වර්ධනය වී තිබේ. එමෙන් ම කසළ කන්දේ අපජලය ප්‍රදේශයේ ජල මූලාශ්‍ර සමඟ මුසුවීම නිසා පාචනය (2.29%) වැනි රෝගී තත්ත්වයන් හටගෙන ඇති බව හඳුනා ගත හැකි වේ. මීට අමතර ව මෙකී රෝග කිසිවකින් නොපෙලෙන පුද්ගලයින් 14 (16.09%) දෙනෙකු ද මෙහි දී හඳුනා ගැනිණ. මෙසේ වැඩි වශයෙන් සෞඛ්‍ය අවධානමට ලක්වන්නේ වැඩිහිටි සහ ළමා ප්‍රජාව වන අතර තරුණයින් මෙවැනි රෝගයන්ට ගොදුරු වීමේ සම්භාවිතාව අඩුවේ.

හාරිස්පත්තුව වෛද්‍ය නිලධාරී කාර්යාලයේ වාර්තාවලට අනුව පසුගිය වසර 5 තුළ ප්‍රදේශයේ අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා වාර්තා වූ රෝගයන් ලෙස ඩෙංගු රෝගය සහ පාචනය රෝගය හඳුනා ගැනෙන අතර මෙම රෝගීන්ගේ ද විචලනයක් ද දක්නට ලැබේ.

වගු අංක 03 ඃ පොල්වත්ත ග්‍රාම නිලධාරී වසම තුළ පසුගිය වසර 5 තුළ ප්‍රදේශයේ අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා ඇති වූ රෝගී තත්ත්වයන්


| වර්ෂ | රෝගය | ස්ත්‍රී | පුරුෂ | මුළු එකතුව | යථාතත්වයට පත් වූවන් සංඛ්‍යාව | මරණ සංඛ්‍යා |
|---|---|---|---|---|---|---|
| 2017 | ඩෙංගු | 04 | 02 | 06 | 06 | - |
| 2018 | ඩෙංගු | 05 | 01 | 06 | 06 | - |
| | පාචනය | 03 | 01 | 04 | 04 | - |
| 2019 | ඩෙංගු | 07 | 05 | 12 | 12 | - |
| 2020 | පාචනය | 02 | 01 | 03 | 03 | - |
| 2021 | ඩෙංගු | 01 | 01 | 02 | 02 | - |

මූලාශ්‍රය ඃ හාරිස්පත්තුව වෛද්‍ය නිලධාරී කාර්යාලීය වාර්තා 2017-2021

ඒ අනුව වසර 2020 පමණක් ඩෙංගු රෝගය වාර්තා වී නොමැති අතර 2019 තුළ බහුතර ඩෙංගු ආසාදිතයින් සංඛ්‍යාවක් වාර්තා වේ. මීට හේතුව වන්නේ මේ කාලසීමාව තුළ අධික වර්ෂාපතනයක් ප්‍රදේශයට ලැබීමයි. එසේ ම පාචනය රෝගීන් ද ප්‍රදේශය තුළ වර්ධනයක් පෙන්නුම් කරන අතර අපජලය ජල මූලාශ්‍ර කරා එකතුවී අපවිත්‍රවීම මීට මූලික හේතුවයි.

**විවෘත භූමියට අපද්‍රව්‍ය බැහැර කිරීම හේතු කොට ගෙන ඇතිවන පාරිසරික බලපෑම විශ්ලේෂණය**

අවිධිමත් ලෙස දීර්ඝ කාලයක පටන් අපද්‍රව්‍ය විවෘත භූමිය මත ගොඩගැසීම නිසා ප්‍රධාන වශයෙන් හානියට පත්වන්නේ අවට පාරිසරික සාධකයන් ය. පොල්වත්ත වසම තුළ ද දීර්ඝ කලක පටන් අපද්‍රව්‍ය ගොඩකිරීම සිදුකරන අතර මෙය ප්‍රදේශයේ සංවේදී පාරිසරික සාධකයන්ට බලපෑම් එල්ල කරයි. ඒ අනුව මෙකී බලපෑමට ලක්වන පාරිසරික සාධකයන් පිළිබඳව ජනතාව දක්වන අදහස් පිළිබඳ ව ප්‍රශ්නාවලි සමීක්ෂණය මගින් විමර්ශනය කළ අතර පස, ජලය, වායුගෝලය, ශාක, සතුන් යන සාධයන් කෙරෙහි ප්‍රතිචාරකයන්ගේ අදහස් පහත රූපසටහනෙන් පැහැදිලි කළ හැකි ය.




රූපසටහන 12 : කසළ කන්ද ආශ්‍රිත පාරිසරික බලපෑම (මූලාශ්‍රය : ප්‍රශ්නාවලි සමීක්ෂණ 2022)

ඒ අනුව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම නිසා පාරිසරික වශයෙන් සිදුවන බලපෑම බහුල ම සාධක ලෙස පස සහ වායුගෝලය හඳුනා ගත හැකි ය. එය 32%ක ප්‍රතිශතයක් දක්වන අතර දීර්ඝ කාලයක සිට කසළ එක මත ගොඩ ගැසීම නිසා පස ආශ්‍රිත පාංශු ජීවීන්ගේ ක්‍රියාකාරිත්වයට ද බාධා පැමිණේ. මෙම කසළවලින් බොහොමයක් දිරාපත් වීමෙන් තොර ව පස මත දීර්ඝ කාලයක් රැඳී තිබීමෙන් විශාල පාංශු දූෂණයකට ලක්වීම සිදුවේ. එමෙන් ම මෙම කසළවලින් වැස්සෙන අපජලය, විවිධ රසායනික ද්‍රව්‍ය පාංශු ස්තරයත් සමග මුසුවී පසේ ආම්ලිකතාව, පසේ පෝෂණ සංඝටක ආදිය වෙනස් වීම සිදුවේ. එමෙන් ම වායුගෝලය දූෂණය වීමට ප්‍රධාන හේතුව වන්නේ කසළ පිළිස්සීම නිසා ඇතිවන දුමාරයයි. එසේ ම කසළ කන්ද ආශ්‍රිත නිපදවෙනු ලබන විවිධ වායු වර්ග වායුගෝලයට විමෝචනය වීම නිසා ද මෙම තත්ත්වය ඇතිවේ. එමගින් ප්‍රදේශයේ විවිධ ශ්වසන රෝග සමේ රෝග ආදීය වැඩි වශයෙන් දක්නට ලැබේ. ප්‍රතිචාරකයන්ට අනුව ජලය දූෂණයට ලක්වීමේ සම්භාවිතාව 20%ක් වන අතර වර්ෂාකාලයේ දී මෙම කසළ කන්දෙන් සෝදා ගෙන එන අපද්‍රව්‍ය ප්‍රදේශයේ ජලමූලාශ්‍ර කරා ගමන් කිරීම සිදුවේ. එසේ ම මෙම අපජලය වැස්සීම නිසා භූගත ජලය දූෂණයට ලක්වන අතර ඇතැම් ජල උල්පත් පවා සිඳීයාමට ලක්වේ. එසේ ම මීටර් 50 නුදුරු අතිශයින් සංවේදී මහවැලි ගංද්‍රෝණිය ද මෙහි බලපෑමට ලක් ව තිබේ. මීට අමතර ව ප්‍රදේශයේ ශාක හා සත්ත්වයින්ට ද මෙහි බලපෑම දක්නට ලැබෙන බව 16% දෙනෙකුගේ මතය වන අතර මෙම අක්කර


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

32 පැවති ශාක වැස්ස මුලුමනින් ඉවත්වීම දැඩි පාරිසරික හානියකි. එමෙන් ම මෙම අපද්‍රව්‍ය ගොඩගසන ස්ථානයට කපුටන්, කොක්කු වැනි පක්ෂීන් ද මීයන් වැනි රෝග පතුරවන සතුන්ගේ ගහණය ද දිනෙන් දින වර්ධනය වේ. ගවයන් සුණඛයින් මෙම කසළ ආහාරයට ගැනීමට පුරුදුවී සිටින අතර මෙය එම සතුන්ගේ ජීවිතයට පවා හානි ගෙන දෙන්නකි.



රූපසටහන 13 : කසළ කන්ද ආශ්‍රිත ජීවත්වන සුනඛ ගහණය (මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණ)



රූපසටහන 14 : අවිධිමත් ලෙස පරිසරයට අපද්‍රව්‍ය බැහැරකර තිබෙන අයුරු (මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණ)



රූපසටහන 15 : කසළ ආහාරයට ගැනීම සඳහා පැමිණෙන පක්ෂීන් (මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණ)



රූපසටහන 16 ඃ කසළ කන්ද ආශ්‍රිත ශාක පද්ධතියට සිදුවී තිබෙන බලපෑම (මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණ)

මෙලෙස අවිධිමත් ලෙස විවෘත භූමියට අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා සිදුවන බලපෑම තවදුරටත් විමර්ශනය කිරීම සඳහා ප්‍රශ්නාවලි සමීක්ෂණය උපයෝගී කොට ගෙන කෛ වර්ග පරීක්ෂාවක් සිදු කරනු ලැබේ. මෙහි දී ප්‍රදේශයේ විවෘත භූමියට අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීමත්, ඒ නිසා දීර්ඝ කාලීන ව පරිසරයට සිදුවන බලපෑමේ ස්වභාවය යන විචල්‍ය භාවිත කරමින් කල්පිතයන් පරීක්ෂා සිදුකරන ලද අතර එහි දී ලබාගත් සංඛ්‍යා විද්‍යාත්මක සම්බන්ධතාව පහත පරිදි හඳුනාගත හැකි ය.

වගු අංක 04 : ප්‍රදේශයේ අපද්‍රව්‍ය ගොඩගැසීමත් සමස්ත ප්‍රදේශයට දීර්ඝ කාලීන වශයෙන් එල්ල වන පාරිසරික ඇති බලපෑමත් අතර සම්බන්ධතාව

| විචල්‍යය | සම්භාවිතා අගය | තීරණය | නිගමනය |
|---|---|---|---|
| $(H_1)$ | 0.04 | $(H_0)$ ප්‍රතික්ෂේප වේ | ප්‍රදේශයේ අපද්‍රව්‍ය ගොඩගැසීම නිසා සමස්ත ප්‍රදේශයට දීර්ඝ කාලීන වශයෙන් පාරිසරික බලපෑම් ඇතිකරනු ලබයි. |


(මූලාශ්‍රය ඃ ප්‍රශ්නාවලි සමීක්ෂණ 2022)

ඒ අනුව සමස්ත ප්‍රදේශයට අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම නිසා සිදුවන පාරිසරික බලපෑම සොයා ගැනීම සඳහා සිදු කළ කෛ වර්ග පරීක්ෂාවේ සම්භාවිතා අගය 0.04 වේ. ඒ අනුව එය සලකා බලන වෙසිසියා මට්ටමට වඩා අඩු සම්භාවිතා අගයක් වන නිසා අප්‍රතිෂ්ට කල්පිතය $(H_0)$ ප්‍රතික්ෂේප කිරීමට තරම් ප්‍රමාණවත් සාධක පවතී. එමගින් පැහැදිලි වන්නේ ප්‍රදේශය තුළට අපද්‍රව්‍ය අවිධිමත් ලෙස ගොඩ ගැසීම නිසා සමස්ත ප්‍රදේශයට ම දීර්ඝ කාලීන වශයෙන් පාරිසරික බලපෑම් සිදුවන බවයි.

කසළ කන්ද පාරිසරික වශයෙන් පිහිටා ඇත්තේ දැඩි සංවේදී පාරිසරික පද්ධතියකට ආසන්නයේ ය. මහවැලි ගඟට මීටර් 50ක් පමණ දුරකින් පිහිටා ඇති නිසා මෙහි බලපෑම මහවැලි ගං ද්‍රෝණිය කරා ද ගමන් කරයි. මීටර් 126ක් පමණ ප්‍රදේශයක් මහවැලි ගංගාවේ ආවරණය වන අතර මෙය ප්‍රදේශයේ ජල


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

අවශ්‍යතාව සපුරා ගන්නා ප්‍රධාන ජල මූලාශ්‍රයක් ලෙස මහවැලි ගං නිම්නයට සිදුවන බලපෑමත්, පාරිසරික වශයෙන් ගොහාගොඩ කසළ කන්ද නිසා ජල පෝෂක ප්‍රදේශයට සිදුවන බලපෑමත් දැඩි වේ.




රූපසටහන 17 : කසළ කන්දේ බලපෑම ආසන්න මහවැලි ගගේ පෝෂක ප්‍රදේශයට ඇතිවන බලපෑම
1 : 50 000 ඩිජිටල් දත්ත ඇසුරින්

කසළ කන්ද හේතු කොට ගෙන ඇතිවන ආපදාවන් පිළිබඳ සොයා බැලීමේ දී මෙම කසළ කන්ද 2019.03.24 වන දින නාය යෑමට ලක් ව ඇති අතර මෙය වර්ෂා කාලයේ දී ඉහළ පවතින කසළවල බර වැඩිවීම හේතු කොට ගෙන සිදුවන්නකි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූ ගර්භ විද්‍යාව පිළිබඳ මහාචාර්ය අතුල සේනාරත්න මහතාට අනුව මෙය පිහිටා ඇත්තේ බෑවුමක් තුළ ය. එමගින් මෙහි නායයෑමේ අවදානම වැඩි නිසා මහනුවර මහනගරසභාව විසින් පවුල් 21ක් මෙම ස්ථානයෙන් ඉවත් කිරීමට පියවර ගෙන ඇත. මීතොටමුල්ල කසළ කන්දට පසු විශාලතම කසළ කන්ද වන මෙය ප්‍රදේශයේ විශාල සමාජ පාරිසරික හානි ගෙන දෙනු ලබන බව මෙමගින් හඳුනාගත හැකි ය.


### කසළ සැලසුම් යාන්ත්‍රණය නිර්මාණය කිරීම සහ සනීපාරක්ෂිත කසළ බැහැර කිරීමට අදාළ සුදුසු භූමි තක්සේරුව

ගොහාගොඩ කසළ කන්ද ප්‍රදේශය සමාජ පාරිසරික වශයෙන් දැඩි අර්බුදයකට ලක්වී ඇති අතර මෙය ප්‍රදේශයට මහත් ව්‍යසනයක් ඇති කරන තත්ත්වයකි. එහෙයින් මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා සැලසුම්කරණ යාන්ත්‍රණයක අවශ්‍යතාව මතු ව තිබේ. එබැවින් මහනුවර මහනගරසභා බලප්‍රදේශයන්ගෙන් බැහැර කරන කසළ සනීපාරක්ෂක කසළ රැඳවුමක් හෝ සැලසුම් සහගත බිම් පිරවුමක බැහැර කිරීමෙන් මෙලෙස විවෘත ව ගොඩගැසීම නිසා ඇතිවන සමාජ පාරිසරික හානි අවම කරගත හැකි ය. මේ සඳහා භූමියේ ඉඩකඩ පැවති නමුත් සුදුසු භූමියක් තෝරා ගැනීම ප්‍රායෝගික ව වැදගත් වේ. එමනිසා මහනුවර දිස්ත්‍රික්කයේ භූමි යෝග්‍යතා තක්සේරුවක් සිදු කළ යුතු වේ.

වර්ග කිලෝමීටර් 1940ක භූමි ප්‍රමාණයක් නිරූපණය කරන මහනුවර දිස්ත්‍රික්කය තුළ 14,16,000ට වැඩි ජනසංඛ්‍යාවක් ජීවත් වෙති. සුගමතාව අතින් ගත්කල දියුණු මාර්ග පද්ධතියක් දැකගත හැකි අතර A සහ B ශ්‍රේණියේ ප්‍රධාන මාර්ග ජාලාවක් දැකගත හැකි වේ. ගොඩනැගිලි ව්‍යාප්තිය පිළිබඳ ව අවධාරණය යොමු කිරීමේ දී ප්‍රදේශයේ නිවාස, හෝටල්, වෙනත් ගොඩනැගිලි සහ පූජනීය ස්ථාන ආදිය ප්‍රදේශය පුරා ව්‍යාප්ත වී ඇතිබව හඳුනාගත හැකි ය. භූමි පරිභෝගය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී වැඩි වශයෙන් වැවිලි භෝග රටාවක් හඳුනා ගැනෙන අතර භෞතික ලක්ෂණ වන වනාන්තර ව්‍යාප්තිය බෑවුම් සහ මතුපිට ජලව්‍යාප්තිය ආදිය ඉතා හොඳින් හඳුනාගත හැකි ය. ප්‍රදේශයේ වනාන්තර ව්‍යාප්තිය තුළ සංරක්ෂිත ප්‍රදේශ මෙන් ම දළ බෑවුම් හා මදබෑවුම් ප්‍රදේශ, කඳු ආදිය හඳුනා ගැනෙන අතර ප්‍රධාන ලෙස ශ්‍රී ලංකාවේ දිග ම ගඟ වන මහවැලි ගඟ ගලා බැසීම සිදුවන්නේ ද මේ හරහා ය. ඒ අනුව මෙම සියලු ම සාධකයන් සලකා බලා ප්‍රදේශයේ ඒකරාශි වන කසළ නිසි පරිදි බැහැර කිරීමට හෝ සනීපාරක්ෂිත කසළ රැඳවුමකට අවශ්‍ය භූමි තක්සේරුව සිදුකරනු ලැබේ. එහි දී භාවිතයට ගන්නා ප්‍රධාන දත්තයන් පහත පරිදි හඳුනාගත හැකි ය.



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

රූපසටහන 18 ඃ මහනුවර දිස්ත්‍රික්කයේ ගොඩනැගිලි ව්‍යාප්තිය




(මූලාශ්‍රය - මිනුම්දෝරු දෙපාර්තමේන්තුව(2015), 1:50 000 ඩිජිටල් දත්ත ඇසුරින්)


රූපසටහන 19 ඃ මහනුවර දිස්ත්‍රික්කයේ මාර්ග ව්‍යාප්තිය




(මූලාශ්‍රය - මිනුම්දෝරු දෙපාර්තමේන්තුව(2015), 1:50 000 ඩිජිටල් දත්ත ඇසුරින්)



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

රූපසටහන 20 : මහනුවර දිස්ත්‍රික්කයේ මතුපිට ජලව්‍යාප්තිය





(මූලාශ්‍රය - මිනුම්දෝරු දෙපාර්තුමේන්තුව(2015), 1:50 000 ඩිජිටල් දත්ත ඇසුරින්)

රූපසටහන 21 : මහනුවර දිස්ත්‍රික්කයේ ජනගහන ව්‍යාප්තිය (2020)





(මූලාශ්‍රය - ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තුමේන්තුව (2020)


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය





රූපසටහන 22 ඃ මහනුවර දිස්ත්‍රික්කයේ වනාන්තර ව්‍යාප්තිය

(මූලාශ්‍රය - මිනුම්දෝරු දෙපාර්තුමේන්තුව(2015), 1:50 000 ඩිජිටල් දත්ත ඇසුරින්)




රූපසටහන 23 ඃ

(මූලාශ්‍රය - මිනුම්දෝරු දෙපාර්තුමේන්තුව(2015), 1:50 000 ඩිජිටල් දත්ත ඇසුරින්)





රූපසටහන 24 ඃ මහනුවර දිස්ත්‍රික්කයේ බෑවුම් කෝණය

(මූලාශ්‍රය - මිනුම්දෝරු දෙපාර්තුමේන්තුව(2015), 1:50 000 ඩිජිටල් දත්ත ඇසුරින්)


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ඉහත දක්වා ඇති ඩිජිටල් දත්ත ආකෘති භාවිත කරමින් මහනුවර දිස්ත්‍රික්කයේ ගැටලුවක් ව පවතින කසළ විවෘත භූමිය මත ගොඩගැසීම නිසා ඇතිවී තිබෙන සමාජ පාරිසරික බලපෑම අවම කිරීම සඳහා සනීපාරක්ෂක කසළ රඳවනයක් හෝ බිම් පිරවුමකට අවශ්‍ය භූමි තක්සේරුවට අදාළ භූමිය සලකා බැලීම සිදු කරනු ලැබේ.


මේ සඳහා භූගෝලීය තොරතුරු පද්ධතියේ එන බරතැබීමේ ශිල්පීය ක්‍රමය භාවිතයට ගන්නා අතර එහි දී නිර්මාණය කරන ලද පියවර සහිත මොඩියුලයේ බරතැබීමෙන් පසු ආකෘතිය ගැලීම් සටහන තුළ පහත පරිදි හඳුනා ගත හැකි වේ.




ගැලීම් සටහන් අංක 02 : බරතැබීමෙන් පසු GIS මොඩියුල ආකෘතිය
මූලාශ්‍රය : ArcGIS 10.4 මෘදුකාංගය ඇසුරින්.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය


සලකා බලන ලද සාධකයන්හි ආකෘතිමය සිතියම් උපයෝගී කොට ගෙන රාෂ්ට ආකෘති නිර්මාණය කරන අතර ඒවා නැවත වර්ගීකරණය කොට, සිතියම් ආකෘති නිර්මාණය කරන ලදී. එහි දී වර්ගීකරණයට ලක්වන සිතියම් තුළට සමාන බරිතයන් ලබාදීමෙන් පසු ව සකස් කරගත් මහනුවර දිස්ත්‍රික්කයේ භූමි යෝග්‍යතා තක්සේරු සිතියම ප්‍රධාන කොටස් පහක් ඔස්සේ ප්‍රතිඵලය ඉතා අයෝග්‍යය, අයෝග්‍යය, මධ්‍යස්ථ, යෝග්‍යය, ඉතා යෝග්‍යය ලෙස වර්ගීකරණ හඳුනා ගැනේ. එය පහත රූපසටහන මගින් දැක්විය හැකි ය.




රූපසටහන 25 : මහනුවර දිස්ත්‍රික්කයේ භූමි යෝග්‍යතා සිතියම මූලාශ්‍රය - මිනුම්දෝරු දෙපාර්තුමේන්තුව (2015), 1 : 50 000 ඩිජිටල් දත්ත ඇසුරින්.

ඒ අනුව මහනුවර දිස්ත්‍රික්කය තුළ සනීපාරක්ෂක ව කසළ බැහැර කිරීමේ භූමියක් තෝරා ගැනීම සඳහා සිදුකරන ලද විශ්ලේෂණයට අනුව කොතරම් යෝග්‍යතාවක් පවතී ද යන්න සොයා බැලීම වැදගත් වේ.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය




රූපසටහන 26 ඃ මහනුවර දිස්ත්‍රික්කයේ භූමි යෝග්‍යතා ප්‍රස්තාරය (මූලාශ්‍රය - මහනුවර දිස්ත්‍රික්කයේ භූමි යෝග්‍යතා සිතියම ඇසුරින්)

ඒ අනුව මහනුවර දිස්ත්‍රික්කයේ මුලු භූමි ප්‍රමාණයෙන් 22.37%ක් සනීපාරක්ෂණ කසළ රැඳවුමක් හෝ බිම් පිරවීමක් සිදුකිරීමට ඉතා ඉහළ යෝග්‍යයතාවක් දක්වයි. 41.07%ක් මධ්‍යස්ථ වශයෙන් යෝග්‍යතා සපුරාලන ප්‍රදේශ ලෙස හඳුනාගත හැකි ය. 36.56%කට වැඩි භූමි ප්‍රමාණයක් ප්‍රදේශයේ යෝග්‍යතාව නොදක්වන අතර ඒවා ජලාශ්‍රිත, ජනාකීර්ණ සහ බෑවුම් ප්‍රදේශ ලෙස වැඩි වශයෙන් හඳුනා ගනී. තවදුරටත් දැනට පවතින ගොහාගොඩ විවෘත කසළ බැහැර කිරීමේ ස්ථානය මේ සඳහා යෝග්‍යය නොවන බව මෙම GIS තාක්ෂණික විශ්ලේෂණය මගින් තවදුරටත් පැහැදිලි කරයි. ඒ අනුව ප්‍රදේශයේ මාර්ග, ගොඩනැගිලි, ජලවහන රටා, භූමිපරිහරණ, වනාන්තර, ජනඝනත්වය ආදී සියලු සාධකයන්ට බාධා නොවන සුදුසු භූමි සැලසුම් යාන්ත්‍රණයක් සකස් කරගැනීමටත්, සමාජීය හා පාරිසරික වශයෙන් වන බාධාවන් මගහරවා ගැනීමේ හැකියාවත් තවදුරටත් භූමිය සතු වේ.

## නිගමන සහ නිර්දේශ

හාරිස්පත්තුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ පොල්වත්ත වසම තුළ අවිධිමත් ලෙස අපද්‍රව්‍ය ගොඩගැසීම නිසා ප්‍රදේශීය සමාජීය වශයෙන් දැඩි බලපෑමකට ලක්වේ. මීට හේතුව වන්නේ විශාල ජනාවාසකරණයක් කසළ කන්ද අවට හඳුනා ගැනීමයි. ඒ අනුව 72%ක් කසළ කන්දේ සිට මීටර 400ට අඩු දුරක ජීවත් වේ. මෙය ජනයාගේ එදිනෙදා ජීවිතයට පවා දැඩි බලපෑමක් එල්ලවන අතර 66%ක් වඩාත් පීඩාවට පත්වන්නේ කසළ කන්ද ආශ්‍රිත දුර්ගන්ධයෙනි.

මෙම කසළ කන්ද නිසා ප්‍රදේශයේ ජීවත්වන පුද්ගලයන්ගේ සෞඛ්‍යට දැඩි බලපෑමක් ඇති වේ. මෙයින් වැඩි බලපෑමක් ඇතිවන්නේ කුඩා ළමුන්ට සහ වැඩිහිටියන්ට ය. ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන් 25.28%ක් ශ්වසන රෝගයෙන් පෙලෙන බව හඳුනා ගැණෙන අතර එය කසළ පිළිස්සීම නිසා හටගන්නා ප්‍රධාන සෞඛ්‍ය ගැටලුව වේ. මීට අමතර ව 20.68%ක් දුර්ගන්ධය නිසා හටගන්නා දිගු කාලීන හිසරදයෙන් පීඩා විදිනු ලබති. කසළ කන්ද ආශ්‍රිත වසංගත රෝග ව්‍යාප්තිය වැඩිවශයෙන් හඳුනා ගැණෙන අතර 13.79% ඩෙංගු රෝගය ව්‍යාප්තිය හඳුනා ගත හැකි ය. මේ ඇතැම් රෝග ව්‍යාප්තියට වාහකයන් ලෙස කසළ කන්ද ආශ්‍රිත ජීවත් වන සතුන් හේතුවක් වනබව නිගමනය කළ හැකි අතර කසල කන්ද නිසා 46%ක වැඩි බලපෑමක් අසල නිවාසවලට එල්ල වන බව හඳුනා ගනී.

අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා ඍජු ව ම බලපෑමට ලක්වන්නේ පාරිසරික සාධකයන් ය. හාරිස්පත්තුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය ආශ්‍රිත පස, ජලය, භූගත ජලමාර්ග, වායුගෝලය ආදී පාරිසරික සාධකයන් අතරින් වැඩි වශයෙන් 32%ක් පස සහ වායුගෝලීය දූෂණය සිදුවන බව හඳුනා ගත හැකි ය. එසේ ම කසළ කන්ද ආශ්‍රිත ජල දූෂණය 20%ක් පමණ සිදුවේ. එය ප්‍රධාන ලෙස මීටර 50ක් දුරින් ඇති මහවැලි ගඟේ පෝෂක ප්‍රදේශය තුළ ස්ථාන ගත වී ඇති අතර


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පෝෂක ප්‍රදේශයේ මීටර 126ක පමණ වපසරියක් බලපෑමට ලක්වන බව හඳුනා ගත හැකි ය. අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය 16%ක් ශාක මුලුමනින් ම බලපෑමට ලක්ව ඇති අතර ප්‍රදේශය කරා පැමිණෙන සතුන් ද කසළ ආහාරයට ගැනීම නිසා ඔවුන්ගේ ජීවිතවලට ද බලපෑමට ලක්වේ.

ඒ අනුව දීර්ඝ කාලයක පටන් අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා ප්‍රදේශයට දැඩි වශයෙන් බලපෑම් එල්ල වන අතර මේ තත්ත්වය මගහරවා ගැනීම සඳහා සිදුකරන ලද භූමි තක්සේරුවක් මගින් මහනුවර දිස්ත්‍රික්කය තුළ මුලු භූමියෙන් 22.37% මේ සඳහා සුදුසු ඉඩම් පවතින බව හඳුනාගන්නා ලදී. එමෙන් ම දැනට පවතින ගොහාගොඩ කසළ කන්ද පිහිටි ස්ථානය කසළ ගොඩ කිරීමට නුසුදුසු බව හඳුනාගත් අතර මුලු දිස්ත්‍රික්කයෙන් ම 36.56%ක භූමි භාගයක් මේ සඳහා නුසුදුසු වේ. විශ්ලේෂණයට අනුව මහනුවර දිස්ත්‍රික්කයේ ඊසාන දිග හා නැගෙනහිරට දිශානුගත ව මේ සඳහා සුදුසුකම් සපිරෙන භූමි යෝග්‍යතාව පෙන්නුම් කරන ලදී. ඒ අනුව සුදුසුකම් සපිරෙන භූමියක සනීපාරක්ෂක කසළ රඳවනයක් හෝ බිම් පිරවීමකට අමතර ව වෙනත් කසළ කළමනාකරණ සැලසුම් දියත් කිරීමට යෝග්‍යතාව සපුරන බව නිගමනය කරන ලදී.

ඒ අනුව මෙකී බලපෑම කළමනාකරණය කිරීම අභියෝගයක් වන අතර මේ නිසා එම අභියෝගය සාර්ථක ව ජය ගැනීම සඳහා පහත පරිදි යෝජනා ඉදිරිපත් කළ හැකි ය.

වර්තමානයේ කසළවලින් වැඩි කොටසක් අවසාන බැහැර කිරීම ලෙස විවෘත භූමි මත ගොඩ කිරීම සිදුකරනු ලබයි. එහෙයින් මෙම තත්ත්වය මගහරවා ගනිමින් සනීපාරක්ෂක කසළ බිම් නිර්මාණය වැදගත් වේ. ඒ අනුව දැනට පවතින ගොහාගොඩ කසළ කන්ද මෙන් ම තෝරා ගත් භූමිය තුළ සිදු කළ හැකි සාර්ථක ව්‍යාපෘතියක් ලෙස මෙම සනීපාරක්ෂක බිම් පිරවුම් හඳුනාගත හැකි වේ. මෙවැනි සනීපාරක්ෂක බිම් පිරවුමක් කිසිසේත් මානව හෝ පාරිසරික සාධකයන් කෙරෙහි බලපෑම් ඇති නොකරයි. ඒ අනුව මෙවැනි බිම් තුළ,

- හොඳින් සැලසුම් කරන ලද අපාරගම්‍ය ආස්තරණ භාවිත කරයි.
- ක්ෂිරණය එකතුවීමේ ක්‍රමවේද පවතී. එකතුවන ක්ෂිරණය ඉංජිනේරු තාක්ෂණය යොදා සකස් කරන ලද පිරිපහදු පද්ධති වෙත යොමු කරයි.
- නිසි ලෙස නිර්මාණය කරන ලද වායු ප්‍රවාහණය සඳහා සක්‍රිය නළ පද්ධතියක්, මධ්‍යගත වායු එකතු කිරීමේ පද්ධතියක් සහිත ය. මේ සියල්ල පාලිත තත්ත්වයේ සිදුකරන අතර මෙලෙස රැස්කර ගන්නා වායු දහනය කර බලශක්තිය උත්පාදනය කිරීමේ හැකියාව පවතී.
- කසළ බැහැර කිරීමේ ක්‍රියාවලියට, නඩත්තු කිරීමේ ක්‍රියාවලියට, විශාල යන්ත්‍ර සූත්‍ර යොදාගනී. එහි දී බිම් පිරවීමේදී භාවිත කරන ආනත තල පිළිබඳ ව සැලකිලිමත් වේ. දිනපතා පාංශු ස්තරයකින් ආවරණය කරයි.
- නිතරම මතුපිට පස, වායු විමෝචනය, භූගත ජලය ආදිය පරික්ෂාවට ලක් කරයි. එසේ ම පරිසර නීති සහ රෙගුලාසිවලට අනුව ක්‍රියාත්මක වන සැලසුම් ක්‍රියාත්මක කරයි.

ඒ අනුව මෙවැනි හේතු සාධක නිසා සනීපාරක්ෂක භූමි පිරවුම් වැඩි වශයෙන් කසළ බැහැර කිරීම සඳහා යොදා ගත හැකිවේ.

එසේ ම ප්‍රදේශය තුළ ගොඩ ගැසෙන කසළ තුළ දිරාපත් නොවන කාණ්ඩයට අයත් කසළ පවතින අතර මේවා ප්ලාස්ටික්, වීදුරු, පොලිතින්, ලන්ච්ෂීට්, ඍජුෆෝම් වැනි දිරාපත් නොවන ඒවා වන අතර මේවා කොටස්වලට බෙදා වෙන් කිරීමෙන් පසු ප්‍රතිචක්‍රීකරණය සඳහා ලක් කිරීමේ හැකියාව පවතී. එහෙයින් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන මේ සඳහා ඇති කොට එය ප්‍රදේශයේ රැකියා විරහිත පුද්ගලයන් සඳහා ද අවස්ථාව සපයා දී නව රැකියා මාර්ග සැලසිය හැකිවේ.

තව ද මෙලෙස ප්‍රතිචක්‍රීකරණයට ලක් කළ නොහැකි පොලිතීන්, පීවීසී වැනි දෑ අධික උෂ්ණත්වයක් යටතේ දහනය කිරීමේ හැකියාව ද පවතී. (Incinerator Machine) මෙම යන්ත්‍ර මගින් 1000°Cක තරම් අධික උෂ්ණත්වයක් යටතේ කසළ පිළිස්සීමේ හැකියාව පවතී. එහි දී ශරීරයට අහිතකර වායු සියල්ල යන්ත්‍රය මගින් ම ගබඩා කර පෙරා පිරිසිදු කිරීමෙන් පසුව මුදා හැරීම සිදුකරයි. එසේ ම මෙමගින් අවසානයේ ඉතිරිවන අළු යොදා ගෙන ගොඩනැගිලි නිර්මාණය කිරීමේ දී යොදා ගන්නා ගඩොල් සැදීම සඳහා භාවිත කළ හැකි වේ. එමගින් පරිසරයට සිදුවන හානිය ද තවදුරටත් අඩු වේ.

තව ද ගෘහාශ්‍රිත ජීව වායු නිෂ්පාදනය මගින් මේ සඳහා විසඳුම් සොයාගත හැකි වේ. පොල්වත්ත වසම තුළ ගොඩගැසී ඇති කසළ තුළ ජීවයක් පවතින කොටස් මේ සඳහා යොදාගත හැකි අතර මේ මගින් කෙටිකාලයක් තුළ බලශක්තිය නිපදවිය හැකිවේ. එසේ ම මෙමගින් අතුරුඵල ලෙස ඉවත්වන ද්‍රවමය කාබනික පොහොර ලෙස ද, ඉවතලන දියරය කෘෂිරසායන ලෙස ද භාවිත කළ හැකි ය. එසේ ම ප්‍රමිතියෙන් යුතු කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සිදුකළ හැකි අතර එමගින් අමතර ආදායමක් උපායා ගැනීමේ හැකියාව පවතී.

කසළ යනු සම්පතකි. එහෙයින් එහි නිසි ප්‍රයෝජන ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සැකසිය යුතු වේ. එම නිසා කසළ බැහැර කිරීමේ දී ජනතාව දැනුවත් කිරීම වැදගත් කොට සැලකිය හැකි වේ. එහි දී කසළ වර්ගීකරණයේ පවතින වාසි පිළිබඳ ව දැනුවත් කිරීම වැදගත් වේ. පිළිසරු කසළ ව්‍යාපෘතිය මගින් කසළ වර්ගීකරණයට ලක්කළ අතර එහි දී වර්ණ කේත භාවිතා කරන ලදී.

- නිල් - කඩදාසි, කාඩ්බෝඩ්
- රතු - වීදුරු
- තැඹිලි - ප්ලාස්ටික්, පොලිතින්
- දුඹුරු - ලෝහ, පොල්කටු


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

- කොළ - දිරාපත්වන

මේ අනුව මහනුවර මහනගර සභාව සහ හාරිස්පත්තුව කසළ කළමනාකරණ මධ්‍යස්ථාන එක් ව ප්‍රදේශයේ පොදු ස්ථාන තුළ මේවා ස්ථානගත කිරීමත්, කසළ බැහැර කිරීමේ දී ජනයාට කසළ වෙන් කොට රථවලට ලබාදීමත් එසේ ම ජනනය වන කසළ ප්‍රමාණය අඩුකර ගැනීම සඳහා නිවස තුළදී ම කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන් හඳුන්වාදීම සහ ඒ පිළිබඳ ව දැනුම ලබාදීම වර්තමානයේ දී කාලෝචිත ක්‍රියාවකි.

එමෙන් ම ප්‍රදේශයේ ජනයාගේ සෞඛ්‍යය තත්ත්වය නගා සිටුවීමට සෞඛ්‍ය අංශ මැදිහත් වීම් සිදු කළ යුතු අතර ඩෙංගු වැනි වසංගත රෝග පිළිබඳ ව දැනුවත් කිරීම, මේවා මැඩලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සිදු කළ යුතුවේ. තව ද කසළ කන්ද ආශ්‍රිත වැඩිවන සත්ත්ව ගහනය පාලනය කිරීම සඳහා ප්‍රදේශයේ පශු වෛද්‍ය නිලධාරීන් මැදිහත් වීම සිදුවිය යුතුය (සුනඛ ගහනය පාලනය කිරීම).

එසේ ම සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ කසළ කළමනාකරණය කිරීම සඳහා පවතින නීතිරීති යාන්ත්‍රණය බලාත්මක කිරීමත්, මේ සඳහා උපරිම තාක්ෂණික ක්‍රමශිල්ප භාවිත කිරීමත් වැදගත් වේ. මේ අනුව භූමි තක්සේරුව විසින් යෝජනා කරන ලද භූමිය තුළ මෙවැනි නව කළමනාකරණ වැඩපිළිවෙළ සාර්ථක ව ක්‍රියාත්මක කළ හැකි වන්නේ එවැනි භූමියක් තුළ පවතින ගැටලු ස්භාවයන් ඉතා අඩුවන බැවිනි. එහෙයින් දැනට පවතින ගොහාගොඩ කසළ කන්ද එම ස්ථානය තුළ ම භූමි පිරවීමකට යොමු කළ හැකි අතර එමගින් පවතින ගැටලු අවම කරගත හැකි වේ.

## පරිශීලිත මූලාශ්‍රය


පරිසර අමාත්‍යංශය. (2020 - 2021). ශ්‍රී ලංකාවේ නාගරික ඝන අපද්‍රව්‍ය විවෘත බැහැර කිරීමේ හා ආරක්ෂිතව වසා දැමීම සහ පුනරුත්ථාපනය සඳහා වූ මාර්ගෝපදේශ.

පරිසර අමාත්‍යංශය. (2020). පළාත් පාලන ආයතන සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ උපදෙස් මාලාව (B කොටස).

හාරිස්පත්තුව ප්‍රදේශීය ලේකම් කාර්යාලය. (2020). සම්පත් පැතිකඩ

Agrawal, A., Pandey, R., Agrawal, M. (2011). Impact of Solid Waste Leachate on Ground Water Sources - A Case Study. *Int. J. Chem. Environ. Eng* 2, 2011

Boateng, M., Appiah, D. O., Afriyie, K. (2014) Social– environment responses to solid waste management in urban area: the case of Atonsu suburban in Kumasi Metropolis, Ghana, *Interdisciplinary Environmental Review* 15 (1) 48-65, 2014

Gunawardena A. R., Edussuriya C.H., Chandrakanthi K.G., Wimalathilake A.M.A.S.K. (2007). Applications Of Gps, Gis And Remote Sensing To Detect Potential Sites Of Surface Water Contamination Through Solid Waste Dumping In Southern Province Of Sri Lanka. *Central Environmental Authority*

Public Health Accreditation. (2021)., Intermediate Technology Development Group., Intermediate Technology Development GroupWorld Health Organization (WHO). (2016). Niche Agriculture., Illinois Environmental Protection Agency., CCET / IGES. (2021). https://www.idahopublichealth.com/environmental-health/solidwaste

Rahimi, S., Hafezalkotob, A., Monavari, S. M., Hafezalkotob, A., & Rahimi, R. (2019). Sustainable land fi ll site selection for municipal solid waste based on a hybrid decision-making approach : Fuzzy group BWM-MULTIMOORA- GIS. Journal of Cleaner Production, (2019), 119186. https://doi.org/10.1016/j.jclepro.2019.119186

Singh, A. (2019). Remote sensing and GIS applications for municipal waste management. *Journal of environmental management*, 243, 22-29

Velmurugan, R., Selvamuthukumar, S., & Manavalan, R. (2011). Multi criteria decision making to select the suitable method for the preparation of nanoparticles using an analytical hierarchy process. Pharmazie, 66(11), 836–842. https://doi.org/10.1691/ph.2011.1034



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දහතුන්වන කලාපය 2022 ජූනි
පිටු 55-66
ISSN 1800-1459 eISSN 2386-2041
© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# බදුලු ටැම් ලිපිය ඔස්සේ හෙළි වන අතීත වෙළෙඳ පොළ ඇතුළු සමාජ ක්‍රමය පිළිබඳ විමසුමක්

# (A Study on the Past Market and Social System Revealed Through the "Badulu Tem Letter")

ඉන්දික ජයරත්න

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
**Indikamia15@gmail.com**

## Abstract

The Historic "Badulu Tem Letter", which was found near Mahiyanganaya Sorabora Tank by Badulla government sub-agent John Bailey in 1857 is a series of charters on a petition by the people to the king on injustices at Hopitigamuwa market. It was a source for an intellectual who searches for Sri Lanka's history, social, cultural, political and economic background, specially on taxation of the king's policy. When compared with the present society, it confirms there is no change of the situation of the society at that time and it can be observed that the trade regulations are compatible not only with Sri Lanka's society in that statutory class, but also on international trade regulations.

**Key Words**: Past Market, Tem Letter, Tax Imposition, Badulu Tem Letter, Frauds Corruption

## සාරසංක්ෂේපය

1857 දී බදුල්ල උපජ්ජන්ත ජොන් බේලි විසින් මහියංගණයේ සොර බොර වැව අසලින් සොයා ගත් ඓතිහාසික අභිලේඛනයක් වන බදුලු ටැම් ලිපිය හෝපිටිගමුව වෙළෙඳ පොළේ සිදුවන අසාධාරණ පිළිබඳ රජු වෙත ජනතාව ඉදිරිපත් කළ පෙත්සමකට පැන වූ ප්‍රඥප්ති මාලාවකි. ලාංකේය ඉතිහාසයේ සමාජ, සංස්කෘතික, දේශපාලන හා ආර්ථික පසුබිම සොයන විද්‍යාර්ථියෙකුට මහැඟි මූලාශ්‍රයක් වූ එය විශේෂයෙන් ම බදුකරණය පිළිබඳ ශ්‍රී ලංකාවේ රාජ ප්‍රතිපත්තිය හෙළි කරන්නකි. වර්තමාන සමාජය හා සසඳන කල එකල සමාජයේ තිබූ තත්ත්වයට වඩා වෙනසක් නැති බව එමගින් තහවුරු වන අතර, එකී ව්‍යවස්ථා පංතිය තුළ නිර්දේශිත නීති රීති ශ්‍රී ලංකා සමාජය මතු නොව ජාත්‍යන්තර වෙළෙඳ නීති රීති සමඟ ද සමපාත වන බව නිරීක්ෂණය කළ හැකි ය.

**කේන්ද්‍රීය වචන:** අතීත වෙළෙඳ පොළ, ටැම් ලිපි, බදු පැනවීම, බදුලු ටැම් ලිපිය, වංචා දූෂණ

## හැඳින්වීම

ආදි මානවයාට සොබාදහම සමඟ දැඩි සම්බන්ධතාවක් පැවතුන අතර මානවයා ශිෂ්ටාචාරය ගොඩනැඟීමේ දී සංස්කෘතිය ගොඩ නඟා ගත් අතර ඔහු සොබාදහම හා එක්ව ජීවත් වූවේ ය. මානව ශිෂ්ටාචාරයේ විකාසනය හෙවත් නැගීම අප සාකච්ඡා කරන්නේ ජීවත් වූ පරිසරය, සොබාදහම හා මිනිසා අතර පැවති අඛණ්ඩ සම්බන්ධතාව සමගිනි. එය තිරසර ලෙස තමන්ගේ පැවැත්මටත්, තම වර්ගයාගේ උන්නතියටත් යොදා ගැනීමට මිනිසා උත්සාහ දරා ඇත. මීට සමයාන්තර ව සන්නිවේදනයේ උපත සිදුවන්නේ ද මෙම පුරාවෘත්තයේ කොටසක් වශයෙනි.

"මානව ශිෂ්ටාචාරය ගොඩනැගීමේ දී මානව භාෂාව ඉටු කළ මෙහෙය වඩාත් කඩිනම් කරන ලද්දේ ලේඛනය, මුද්‍රණය හා ඒ ආශ්‍රිත මෙවලම් බිහිවීමත් සමඟය" (ලක්ෂ්මන්, පියදාස, ආර්.එල්., 2008, පි. 21). මිනිස් සමාජයේ විකාසනයත් සමග බිහිවන තොරතුරු හා අදහස් හුවමාරු කරගැනීමේ අවශ්‍යතාව ද පුළුල් විය. මානව භාෂාව ලේඛනයෙන් පොහොසත් වීමත් සමඟ ඒ සඳහා අවශ්‍ය වූ මෙවලම් තනා ගැනීම පිළිබඳ ඉතිහාසය ලෝකයේ මානව සංහතියේ විකාසනය හා බැඳී පවතී. ආදි මානවයන්ගේ සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳ ඓතිහාසික තත්ත්වය මෙසේ වෙද්දී ක්‍රි.පූ. 02 වන සියවසේ පමණ සිට අතීත ලාංකිකයා සන්නිවේදනය සඳහා අක්ෂර භාවිත කර තිබේ. බ්‍රාහ්මී අක්ෂර මුල් යුගයේ භාවිත වී තිබෙන අතර, සිංහල භාෂාවේ විකාසනය වූ ආකාරය පිළිබඳව යුග 04 ක් වාග්විද්‍යාඥයෝ පෙන්වා දෙති.

1. සිංහල ප්‍රාකෘත යුගය - ක්‍රි. පූ. 02 වන සියවස සිට ක්‍රි. ව. 04 වන සියවස දක්වා
2. පුරාතන සිංහල යුගය - ක්‍රි. ව. 04 වන සියවස සිට ක්‍රි. ව. 08 වන සියවස දක්වා
3. මධ්‍යතන සිංහල යුගය - ක්‍රි. ව. 08 වන සියවස සිට ක්‍රි. ව. 13 වන සියවස දක්වා

4. නූතන සිංහල යුගය - ක්‍රි. ව. 13 වන සියවස සිට මේ දක්වා (ධම්මානන්ද, 2018, පි. 09).

සිංහල ප්‍රාකෘත යුගයේ භාෂා ලක්ෂණ හැදෑරීමට ප්‍රමාණවත් සෙල්ලිපි කිහිපයක් පවතී. මේවායෙන් බොහොමයක් ක්‍රි. පූ. 02 වන සියවසට අයත් වේ. 04 වන සියවස පුරාතන සිංහල යුගයට අයත් තෝනිගල ලිපිය අලුත් භාෂා යුගයක ආරම්භය පෙන්වන වැදගත් ශිලා ලිපියකි. මෙහි සංකීර්ණ භාෂා ලක්ෂණ දැකිය හැකි ය. මධ්‍යතන යුගයේ ශිලා ලිපි අතර 09-13 සියවස්වල ලියවුණු ලිපි බහුල ය. පුරාතන යුගයේ නොතිබුණු අක්ෂර සංකේත මෙම යුගයේ දී භාෂාවට එක්වී තිබේ. මෙම යුගයේ භාෂාව වර්ධිත අවදියක පැවති බව හඳුනා ගැනීමට සුදුසු ලිපියක් වන්නේ බදුලු ටැම් ලිපියයි. නූතන සිංහල යුගය 13 වන සියවසෙන් ආරම්භ වේ. ක්‍රමික ව විකාසනය වූ එම යුගයේ භාෂාවේ ආර්ය භාෂාවන්ගේ ගති ලක්ෂණයන්ට අමතර ව ද්‍රවිඩ, ඉංග්‍රීසි ආදි භාෂාවන්ගෙන් එකතු වූ වචන මෙන් ම භාෂා ප්‍රයෝග ද නිරූපණය කරයි. එහෙත්, මෙහි දී ප්‍රමුඛ වන්නේ මාතෘ භාෂාවන්හි ප්‍රභවයයි. 13 වන සියවසෙන් පසු ආරම්භ වන නූතන සිංහල භාෂාවේ ලක්ෂණ හඳුනාගත හැකි ලේඛනමය සාක්ෂ්‍ය පවතින්නේ සාහිත්‍ය කෘතිවලයි. උදාහරණ වශයෙන් 13 වන සියවසේ ලියැවුණු "සිදත් සඟරාව හැඳින්විය හැකි ය". ක්‍රි. පූ. 02 වන සියවසේ සිට ක්‍රි. ව. 13 වන සියවස දක්වා කාලය තුළ ලියවුණු සෙල්ලිපි ආධාරයෙන් මුල් යුග 03 හි, (ප්‍රාකෘත, පුරාතන හා මධ්‍යතන) ලංකාවේ භාෂා සන්නිවේදනයේ විකාශනය හඳුනාගත හැකි ය.

## අරමුණ

බදුලු ටැම් ලිපියෙන් සන්නිවේදනය කරන පුරාණ ශ්‍රී ලංකාවේ සමාජ, සංස්කෘතික හා ආගමික පසුබිම කවරේ ද යන්න විමර්ශනය කිරීම ය.

## පර්යේෂණ ගැටලුව

මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ බදුලු ටැම් ලිපියේ අන්තර්ගතය මගින් අතීත සමාජ ව්‍යුහයේ නූතන සමාජ ලක්ෂණ නිරූපිත ද යන්න විමසා බැලීම ය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණ ගුණාත්මක අධ්‍යයනයකි. මෙහි දී අන්තර්ගත විශ්ලේෂණය මගින් දත්ත විශ්ලේෂණය කෙරේ. එහිලා සාහිත්‍ය විමර්ශනය සඳහා පුස්තකාල අධ්‍යයන ක්‍රමවේදය යොදා ගැනේ.

## සාකච්ඡාව

ක්‍රි.ව. 10 වන සියවසේ රාජ්‍ය කළ ශ්‍රී සංඝබෝධි උදය රජ (IV වන මිහිඳු රජු) මහියංගණය විහාරයට පැමිණි අවස්ථාවේ දී ගම්වැසියන් ඉදිරිපත් කළ මහජන පෙත්සමකට ප්‍රතිචාර වශයෙන්, ග්‍රාමීය, වෙළෙඳාම හා එහි පාලනය ක්‍රමවත් කිරීම සඳහා පනවන ලද ව්‍යවස්ථා මාලාවක් ලෙස බදුලු ටැම් ලිපිය හැඳින්විය හැකි ය. මෙම ටැම් ලිපියෙන් එකල පැවති ග්‍රාමීය සමාජයේ අභ්‍යන්තර වෙළෙඳාම, රාජ්‍ය සංවිධාන ව්‍යුහය, අධිකරණ ක්‍රියාවලිය හා රාජ්‍ය නිලධාරීන්ට පැවරුණු වගකීම් සහ ඒ සමයේ ලාංකේය සමාජයේ සිරිත් විරිත් සහ සන්නිවේදන ස්වරූපය මෙම ටැම් ලිපියෙන් විවරණය කරගත හැකි ය. තව ද එකල සමාජය තුළ අවනීතිය අසාධාරණය මෙන් ම දූෂණය හා වංචාව තිබූ බවත් ඊට එරෙහි ව මහජනයා අරගල කළ බවත් මෙයින් සනාථ වෙයි.

ක්‍රි. ව. 1857 දී ඉංග්‍රීසි උපජීජන්තවරයෙකු වශයෙන් සිටි ජෝන් බෙල් මහියංගණ හොරබොර වැව අසළ හෝපිටිගම ප්‍රදේශයෙන් මෙම ටැම් ලිපිය සොයා ගන්නා ලදී. ලංකාවේ මෙතෙක් සොයා ගෙන ඇති භාරදාහකට ආසන්න වන සෙල්ලිපි අතුරින්, ප්‍රමාණයෙන් විශාලතම හා කුඩා ම අක්ෂර සහිත සෙල්ලිපිය වන්නේ බදුලු ටැම් ලිපියයි. එය උසින් අඩි 08 යි අඟල් 05ක් වන අතර, එක් පැත්තක පේළි 47, 49 සහ 58 වශයෙන් පේළි 208 කින් සහ අක්ෂර දෙදහසකින් පමණ සමන්විත වේ.

## ටැම් ලිපියේ අන්තර්ගතය

සිංහල ජන සමාජයේ, ආගමික සහ සංස්කෘතියෙහි දක්නට ලැබෙන සහසම්බන්ධතාව විවිධ අධ්‍යයන විෂය ක්ෂේත්‍ර යටතේ විද්‍යාර්ථීන් ගවේෂණය කර ඇත. එම ගවේෂණ සඳහා ඓතිහාසික සාධක සපයන සුවිශේෂ වටිනාකමක් සහිත ටැම් ලිපියක් ලෙස බදුලු ටැම් ලිපිය හැඳින්විය හැකි ය. ටැම් ලිපියක් යනුවෙන් අදහස් කරන්නේ සෙල් හෙවත් ශෛලමය කණුවක පැත්තක හෝ ඇතැම් විටක සතර පැත්තේ ම ලියන ලද ලිපියකි. ඉතිහාසඥයන්ට අනුව බදුලු ටැම් ලිපිය අනුරාධපුර රාජධානිය යුගයේ අග භාගයේ ලියනු ලැබූවකි. එකල ටැම් ලිපිය පිහිටි ප්‍රදේශය ලෙස හඳුනාගෙන ඇත්තේ සොරබොර වැව ආශ්‍රිත ප්‍රදේශයක් වන හෝපිටිගමයි. 10 වන සියවස වන විට මෙම හෝපිටිගම ප්‍රදේශය ජනාකීර්ණ වාණිජ නගරයක් ලෙස පැවති ප්‍රසිද්ධ ස්ථානයකි. එසේ වුවත්, වාණිජ කටයුතු සිදු වූ මෙම ප්‍රදේශයේ විවිධ ආකාරයේ අක්‍රමිකතා, අයථා සිදුවීම් සිදුව තිබේ. වෙළෙඳ පොළෙන් බදු ගත් සේවකයන් මහජනතාව පීඩා වන අන්දමින් බදු අය කර ගෙන ඇත. සිරි සංඝබෝධි උදය රජු මහියංගණ විහාරස්ථානයට පැමිණි අවස්ථාවක මහජනතාව තමන්ට සිදුවන අකටයුතුකම් පිළිබඳ රජතුමාට පැමිණිලි කර තිබේ. එම මහජන පැමිණිල්ල පදනම් කරගනිමින් හෝපිටිගම වෙළෙඳ නගරයේ පරිපාලනය විධිමත් කිරීම සහ එම විධිමත් ක්‍රමවේදය මහජනතාවට සන්නිවේදනය කිරීම සඳහා රජු විසින් නීති පනවා, එම නීති ඇතුළත් කොට මෙම ටැම් ලිපිය කරවා තිබේ. මෙම සෙල්ලිපිය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී මධ්‍යතන යුගයේ ලාංකේය ජන සමාජයේ සමාජ, සංස්කෘතික, ආගමික පසුබිම පමණක් නොව, එම යුගයේ ක්‍රියාත්මක වූ වාණිජ නීති රීති, වෙළෙඳ නගරයක පරිපාලන ව්‍යුහය, රාජ්‍ය හා මහජනතාව අතර පවතින සම්බන්ධතාව හා බදු නියමයන් පිළිබඳ තොරතුරු ද අනාවරණය කරගත හැකි ය.

මහාචාර්ය සෙනරත් පරණවිතාන මෙකී ටැම් ලිපියේ තොරතුරු චතුර්විධ වර්ගීකරණයකට ගොනු කර ඇත්තේ

1. දඩ අය කර ගැනීම පිළිබඳ නීති.
2. රාජ්‍ය නිලධාරීන් සඳහා නීති.
3. වෙළෙඳ ප්‍රතිපත්තිය.
4. පාරිභෝගික අයිතිවාසිකම්. වශයෙනි.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

බුදුරජාණන්වහන්සේගේ පළමු ලංකාගමනය මහියංගණ රජමහා විහාරය හා සම්බන්ධ බව පුරාවෘත්තවල සඳහන් ය. ඒ අනුව, මහිංයගණය අද ද බෞද්ධාගමිකයන්ගේ වන්දනාවට පාත්‍ර වූ පුදබිමක් ලෙස හැඳින්විය හැකි ය. සිරි සංඝබෝධි උදය රජු මහියංගණ විහාරය වැඳපුදා ගැනීමට පැමිණීමට මෙම ඓතිහාසික කාරණය ද හේතු ප්‍රත්‍ය වන්නට ඇත. මීට අමතර ව, හෝපිටිගම ග්‍රාමයේ බෞද්ධ සංස්කෘතික නැඹුරුව, රාජ්‍ය තන්ත්‍රය ඍජු ව ම විහාර ආරාම හා සහසම්බන්ධ වීම, රාජ්‍ය හා බුදුදහම අතර පැවති සබැඳියාව වැනි කරුණු බදුලු ටැම් ලිපියෙන් අනාවරණය වේ. බදුලු ටැම් ලිපිය ලියවුණු ක්‍රි.ව. 10 වන සියවසේ ම ලියවුණු මිහින්තලා පුවරු ලිපිය නිරීක්ෂණයේ දී ද පෙනී යන්නේ රාජ්‍ය සහ බෞද්ධාගම අතර පැවති සහසම්බන්ධතාවයි. මිහින්තලා පුවරු ලිපිය ද සිරිසංඝබෝධි අභය රජු කරවනු ලැබූවකි. විහාර ආරාම පරිපාලනය සඳහා සකස් කරන ලද ව්‍යවස්ථාමය විධිවිධාන මිහින්තලා පුවරු ලිපියෙන් නිරූපණය වේ. එම රජු විසින් ම කරවන ලද බදුලු ටැම් ලිපිය නිරීක්ෂණය කිරීමේ දී එහි වාණිජ නගරයක පරිපාලන ව්‍යුහය පිළිබඳ ව්‍යවස්ථාමය විධිවිධාන සේ ම, රජු බෞද්ධාගම කෙරෙහි දක්වන ලද ළබැඳියාව ද සියුම් ව නිරීක්ෂණය කළ හැකි ය. ඊට නිදසුන වන්නේ වෙළෙඳ පොළෙහි ක්‍රමවත් පාලනයක් සඳහා නීති පැනවූව ද, බදු අයකිරීම සම්බන්ධයෙන් අනුගමනය කර ඇති මානුෂීය පිළිවෙතයි. බදු අයකර ගැනීම බඹරෙකු මලකින් රොන් ගන්නා අයුරින් කළ යුතු බව බුදුදහමේ කියැවේ. එම නියමයට අනුකූල ව රජු බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර ඇත්තේ බොද්ධාගමික ඉගැන්වීම පිළිබඳව ඔහුට ඇති නැමියාව පෙන්නුම් කරමිනි. පාලකයා ජනතාව පීඩාවට පත්වන බදු අයකරගන්නෙකු නොවිය යුතු ය. ජනතාවට පීඩාවක් නොවන පරිදි බදු අයකර ගැනීමට අවශ්‍ය විධිවිධාන සලසන්නෙකු බව සිරි සංඝබෝධි උදය රජු බදුලු ටැම් ලිපියෙන් පැහැදිලි කර ඇත.

මෙකී ප්‍රඥප්තිය පැනවීම පිළිබඳ විශ්ලේෂණයක යෙදෙන මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමි රචිත ශ්‍රී ලංකාවේ ඉපැරණි ම වෙළෙඳ හා පාරිභෝගික ආරක්ෂක පනත - බදුලු ටැම් ලිපිය යන රචනයෙහි එහි බදු එකතු කිරීමේ එදා තත්ත්වය හා අද අතර සාම්‍යයක් මෙසේ ගොඩනංවයි.

> “වර්තමානයේ පළාත් පාලන ආයතන මගින් වෙළෙඳපොළ මගින් බදු එකතු කරන්නා සේ ම එකල ද පඩිලද් යනුවෙන් රාජ්‍ය නිලධාරීන් පිරිසක් බදු එකතු කිරීමෙහිලා නිරත ව සිටි බව හෙළි වෙයි. මෙම නිලධාරීන්ගේ දූෂිත ක්‍රියා මෙවැනි ලිපියක් පැනවීමට හේතු වූ බව ද පෙනේ. මෙම වෙළඳ පොළට බලපෑම් කළ ප්‍රධාන ආයතන තුනක් පැවති බව ලිපියෙන් හෙළිදරව් වෙයි. එනම්
>
> 1. මන්ද්‍රඩින් - උපදේශක සභාව
> 2. වණිග්‍රාම - වෙළඳ මණ්ඩලය
> 3. මහා ග්‍රාම - ගමේ පරිපාලන සභාව
>
> මෙම මණ්ඩල තුනෙහි ම නිලධාරීන් එකතු ව වෙළෙඳ පොළ පාලනය කිරීම සිදුවිය. මෙම වෙළෙඳපොළෙහි සිදු වූ දූෂිත ක්‍රියා එහි පනවා ඇති ව්‍යවස්ථා පන්තියෙන් හෙළිවෙයි (සිරිසුමන හිමි, 2014).”

ඒ අනුව එදා සමාජය හා අද සමාජය අතර ඇති පොදු ගුණාංග මෙම ලිපිය විශ්ලේෂණයේ දී තහවුරු වෙයි. අද මෙන් එදා අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභා, අල්ලස් මර්දන විශේෂ ඒකක වැනි පරිපාලන හෝ නීති ආයතන නොතිබුණ ද රජු වටා කේන්ද්‍රගත වූ බලය ඔස්සේ වර්තමානයේ ජාත්‍යන්තරික ප්‍රමිතියේ පවා අනුදත් නිර්දේශ බදුලු ටැම් ලිපියෙහි අන්තර්ගත බව පහත කරුණු මගින් සනාථ කළ හැකි ය.

මිනිසා පදිංචි ගෙවල් දොරවල් වටලා බදු අයකර නොගත යුතු බවත්, ස්වාමියාගේ වරදකට අඹු දරුවන් අල්ලා නොගත යුතු බවටත් රජු නියම කොට ඇත. අදාළ පරිදි නිසි පරිදි අයබදු ගෙවිය යුතු බවත් දක්වා තිබේ. දඩ නියම කිරීම විචාරය කොට සිදු කළ යුතු ය. සොර වෙළෙඳාම් නොකළ යුතු ය. වංචනික ලෙස කිරුම් සහ මිනුම් කටයුතු නොකළ යුතු අතර, විකිණීමට නුසුදුසු දෑ අලෙවි නොකරන ලෙස වෙළෙඳුන්ට නියම කර තිබේ. රජුගේ බොද්ධාගමික නැඹුරුව පෙන්නුම් කරන නියමයන් ද බදුලු ටැම් ලිපියෙන් නිරූපණය වන්නේ ය. ආගම දහමට නැඹුරු නොවී වෙළෙඳාම පමණක් නොකරන ලෙසත්, ආගම කෙරෙහි වන වගකීම් ඉටුකරන ලෙසත් දන්වා ඇත. පොහොය දිනයේ වෙළෙඳාමෙන් වැළකීමේ අවශ්‍යතාව ද බදුලු ටැම් ලිපියෙන් අනාවරණය වේ.

මහියංගණ විහාරයේ පහන් පූජාවන් සඳහා තෙල් කාලක් ලබාදීම පිළිබඳ ව ද මෙහි සඳහන් කර ඇත. වංචනික මුදල් භාවිත නොකරන ලෙසත්, පිං පිණිස දුන් ඉඩම්වලින් බදු අය නොකළ යුතු බවත් කියැවේ. එසේ ම පිං පිණිස ලබාදුන් ඉඩම් පෞද්ගලික පරිහරණයට නොගත යුතු බව ද බදුලු ටැම් ලිපියේ සඳහන් වේ. මහියංගණ විහාරය හා ඍජු ව සම්බන්ධ වන නීතිමය විධිවිධාන ටැම් ලිපියට ඇතුළත් වී ඇති බව නිරීක්ෂණය වන්නේ පොහොය දිනවල වෙළෙඳාම් කටයුතු නොකරන ලෙස කරන ලද දැනුම්දීම හා එසේ වෙළෙඳාම් කටයුතු කරන්නේ නම් ඔවුන් පහන් පූජාවට තෙල් ලබාදිය යුතු බවට කර ඇති නියමයෙනි.

බදුලු ටැම් ලිපියේ “මියුගුණ මහවෙහෙර වැපුද පවත්වනු ඉසා” යන ප්‍රකාශයෙන් ග්‍රාමවාසී ජනතාව පුර පසළොස්වක පෙහොය දිනවල පමණක් නොව, එදිනෙදා සාමාන්‍ය දිනයන්හි ද විහාරස්ථානය සමග සහසම්බන්ධතා පැවැත් වූ බව නිරීක්ෂණය වේ. මියුගුණ වෙහෙර හෙවත් මහියංගණ වෙහෙර විහාරස්ථානයත් හෝපිටිගම ප්‍රදේශය අතර සම්බන්ධතාවක් පැවති බව ද නිරීක්ෂණය වේ. එම සම්බන්ධතාව බදුලු ටැම් ලිපියේ ව්‍යවස්ථාමය විධිවිධානවලින් පැහැදිලි වේ. බදුලු ටැම් ලිපියෙන් නිරූපණය වන නීතිමය විධිවිධාන සහ දඩ හා දඬුවම් නිරීක්ෂණයේ දී පෙනීයන වැදගත් කාරණාව වන්නේ ඒවා අමානුෂික දඩ හෝ දඬුවම් නොවූ බවයි. සමාජය සහ පුද්ගලයා නීතියට අවනත කරගැනීමට දඩ හා දඬුවම් නියම කර ඇති අතර, දැඩි හිංසාකාරී හා මර්දනකාරී දඩ හා දඬුවම් ක්‍රම අනුගමනය නොකිරීමට රජු හා රාජ්‍ය ක්‍රියාකර ඇත්තේ බොද්ධාගමික පසුබිම හේතුවෙන් බව නිගමනය කළ හැකි ය.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

බදුලු ටැම් ලිපිය අධ්‍යයනය කිරීමේදී 10 වන සියවසේ මධ්‍යතන ලංකාවේ සමාජ හා සංස්කෘතික පැතිකඩ පිළිබඳ ව ද යම් අවබෝධයක් ලබාගත හැකි ය. රජු සහ පොදු මහජනතාව අතර පැවති සම්බන්ධතාව මෙහි දී සලකා බැලීම වැදගත් ය. මහියංගණ වෙහෙර වන්දනාව සඳහා පැමිණි, රජු හමු වූ මහජනතාව හෝපිටිගම වෙළෙඳ පොලෙහි පැවති අකටයුතුකම් පිළිබඳ ව, කරන ලද පැමිණිල්ලට රජු ඇහුම්කන් දීම සහ ඊට දක්වන ලද ප්‍රතිචාර ලෙස, වෙළෙඳ නගරය විධිමත් කිරීමට අවශ්‍ය නීති සම්පාදනයට කටයුතු කරනු ලැබී ය. රජු සහ පොදු මහජනතාව අතර යම් විධිමත් සන්නිවේදන ක්‍රමවේදයක් පැවති බව මෙයින් පැහැදිලි වන අතර, රජු මහජන හඬට කන්දෙමින් හෝපිටිගම වෙළෙඳ නගරය විධිමත් කිරීමට කටයුතු කිරීමෙන් සන්නිවේදනය කරන්නේ රජු, රාජ්‍ය නිල තන්ත්‍රය සහ පොදු මහජනතාව අතර වන ත්‍රිකෝණමිතික සම්බන්ධතාවයි. එක් එක් ස්ථාන අතර පැවති නිරවුල් සන්නිවේදනයත්, අවසානයේ පොදු මහජන සුබසිද්ධියට හේතුවන නීති පද්ධතියක් පැනවීමට රජු ක්‍රියා කිරීමෙන් නිරූපණය වන්නේ රාජ්‍යයේ පැවති සංවිධිත භාවයයි. සිරි සංඝබෝධි උදය රාජ්‍ය සමයේ, රාජ්‍යකරණයේ පැවති ප්‍රජාතාන්ත්‍රීය ගති ලක්ෂණ ද මෙමගින් සන්නිවේදනය කෙරේ. එම සන්නිවේදනය සිදුකරන පළවෙනි ම කාරණය වන්නේ රටවැසියාට රාජ්‍ය නායකයා ලෙස රජු හමුවීමට පැවති නිදහසයි. 10 වන සියවසේ ලාංකේය සමාජයේ පැවති නිදහස් වටපිටාව මෙයින් නිරූපණය වේ. තව ද පොදු මහජනතාවට අසාධාරණ බදු ක්‍රමයන්ට එරෙහි ව උද්ඝෝෂණය සඳහා ඇති අයිතිය, මහජනතාව පීඩාවට පත්කරන රාජ්‍ය නිලධාරීන් විවේචනයට පැවති නිදහස, ඉල්ලීම් දිනා ගැනීමට සාමකාමී අරගලයකට ඇති ඉඩකඩ ද මෙයින් සන්නිවේදනය කෙරේ. වඩා වැදගත් කාරණය වන්නේ රාජ්‍ය නායකයා රටවැසි හඬට ඇහුම්කන්දීමට දක්වන උනන්දුවයි. තව ද, රටවැසියා පීඩාවට පත්නොවන සේ බදු අයකර ගැනීමට කටයුතු කිරීමෙන් නිරූපණය වන්නේ රජු මහජන පීඩක උපකරණයක් නොවූ බවයි. මෙම කරුණුවලින් පුරාණ ලංකාවේ සමාජ, සංස්කෘතික වපසරිය පැහැදිලි වේ. පුරාණ රාජ්‍ය පාලනය මහජන පීඩාකාරී පාලනයක් නොවූවා සේම, යහ-ආණ්ඩුකරණය පිළිබඳ වැදගත් දේශපාලන සංකල්පවලින් ද පරිනිර්මිත ව තිබුණු බව තහවුරු වන්නේ බදුකරණය සම්බන්ධයෙන් දැක්වූ නම්‍යශීලී පිළිවෙත හා දෘශ්‍යමාන (විනිවිද පෙනෙනසුලු) ප්‍රතිපත්තියයි. රාජ්‍ය සේවකයන්, රටවැසියන් සහ රජු යන ත්‍රිත්වය එකිනෙකා පරයා යාමකින් තොර ව එකිනෙකා පිළිබඳ ව අන්‍යෝන්‍ය අවබෝධයකින් කටයුතු කිරීමේ සංවිධිත, ප්‍රතිපත්තිමය සම්මුතියක් පැවති බව බදුලු ටැම් ලිපියෙන් පැහැදිලි වේ. සමකාලීන ගෝලීය දේශපාලන සන්දර්භයේ සාකච්ඡා කෙරෙන යහ-ආණ්ඩුකරණය පිළිබඳ සාධනීය ගති ලක්ෂණ 10 වන සියවසේ පුරාණ ලංකාවේ රාජ්‍ය පිළිවෙතෙහි අන්තර්ගත ව තිබුණ බව නිරීක්ෂණය කළ හැකි ය.

යම් යම් පුද්ගලයන්ගෙන් වරප්‍රසාද වරදාන ලබමින් මිනිසුන්ට පීඩාකාරී වන ලෙස බදු අයකර ගැනීම් හා ඇතැම් රාජ්‍ය නිලධාරීන්, රාජකීයයන් අල්ලස් වශයෙන් මස්, රා, ගිතෙල්, කහවණු ආදිය ලබාගත් බවට චෝදනා එල්ල වී තිබේ. අල්ලස් දීම, අල්ලස් ගැනීම යන වැරදි දෙක ම සිදු නොකරන ලෙස බදුලු ටැම් ලිපිය රටවැසියන්ටත්, රාජ්‍ය නිලධාරීන්ටත් ස්ථිර ලෙස සන්නිවේදනය කර ඇත. සුචරිත සමාජයක් උදෙසා මෙම නීති පනවා තිබෙන අතර, රජය මෙන් ම රටවැසි ජනතාව ද යහපත් සමාජ සංස්කෘතික වටපිටාවක් සඳහා ක්‍රියා කිරීමේ අවශ්‍යතාව බදුලු ටැම් ලිපියේ අන්තර්ගත ව්‍යවස්ථාමය නීති විධිවිධාන සන්නිවේදනය කරන වැදගත් ම පණිවුඩයයි. මෙම ටැම් ලිපියේ අන්තර්ගත නීතිමය විධිවිධාන මධ්‍යකාලීන ලංකාවේ රාජ්‍ය පාලනයේ ඇති සංවිධිත බවත්, රාජ්‍යය,දූෂණ අකටයුතුකම්වලින් තොර පවිත්‍ර පද්ධතියක් ලෙස පවත්වාගෙන යාමට රජුට පැවති උනන්දුවත් විද්‍යමාන කරයි. නීතියේ ආධිපත්‍ය මධ්‍යකාලීන ලංකාවේ අංක එක වශයෙන් පැවති බව බදුලු ටැම් ලිපිය සන්නිවේදනය කරන වැදගත් ම පණිවිඩයයි. සෞඛ්‍යාරක්ෂාව පිළිබඳ ව ද අවධානය යොමු කරන විධිවිධාන බදුලු ටැම් ලිපියේ අන්තර්ගත ය. අලෙවියට නුසුදුසු තත්ත්වයේ භාණ්ඩ අලෙවි නොකරන ලෙසත්, බුලත් පුවක් වැනි දෑ මණ්ඩපයේ තබා විකිණිය යුතු බවත් සඳහන් වේ. පාරිභෝගික සෞඛ්‍ය හා ආරක්ෂණය පිළිබඳ ව රජයට පැවති උනන්දුව මෙමගින් සන්නිවේදනය වේ.

ප්‍රමාණයෙන් ඉතා විශාල ටැම් ලිපියක් වන බදුලු ටැම් ලිපිය විස්තෘත ව සන්නිවේදනය කරන්නේ මධ්‍යතන යුගයේ (10 වන සියවසේ) ලංකාවේ වූ ආගමික, සමාජ හා සංස්කෘතික පසුබිමේ ධනාත්මක පැතිකඩයි. බදුලු දිස්ත්‍රික්කයේ, මහියංගණයේ, හෝපිටිගම වැනි කුඩා ගමක පරිපාලනය පිළිබඳ රජු දැක්වූ උනන්දුව නිරූපණය කරන්නේ රාජ්‍යයේ ක්ෂුද්‍ර කොටසක් සම්බන්ධයෙන් වන අවධානයයි. එය රජුගේ රාජ්‍ය තාන්ත්‍රික කෘතහස්තභාවයත්, රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ව ඔහු තුළ පැවති උනන්දුවත් නිරූපණය කරයි. "අනුරාධපුර යුගයේ පැවති රාජ්‍ය පාලන ප්‍රතිපත්තිය හුදෙක් ප්‍රජාතාන්ත්‍රීය ලක්ෂණ උසුලන බව කිව යුතු ය. රාජාඥාව රටවැසියන්ගේ මානසික වදයට හේතු වූ බව සිතීම අපහසු ය. ජනතා ප්‍රශ්න විසඳීම හා ඔවුන්ගේ සුඛිත මුදිත පැවැත්ම තහවුරු විය යුතු බව රජය විශ්වාස කළ බව පිළිගත හැකි ය. මේ සඳහා විවිධ සභා, අධිකරණ ශාලා, නිලධාරීන් පත්කොට තිබූ බව දක්නා ලැබේ" (ධම්මානන්ද, මකුරුප්පේ, 2018 පි. 78). බටහිර දේශපාලන චින්තනය රාජ්‍ය යනු පොදු මහජනතාව මර්දනය කරන උපකරණයක් හෙවත් පන්ති පීඩක උපකරණයක් ලෙස හඳුන්වා තිබුණත්, බෞද්ධ දර්ශනය වැනි පෙරදිග චින්තනයන්ගෙන් පොහොසත් වූ මධ්‍යතන යුගයේ ලංකාවේ රාජ්‍ය පාලනය මහජනතාව කෙරෙහි පිහිටා තිබුණු ආයතනයක් ලෙස හඳුනාගත හැකි ය. ඒ බව බදුලු ටැම් ලිපියේ අන්තර්ගත නීතිමය විධිවිධාන වෙතින් පැහැදිලි වේ.

## සමාලෝචනය

පුරාණ ශ්‍රී ලංකාවේ සමාජ, සංස්කෘතික හා ආගමික පසුබිම බදුලු ටැම් ලිපිය මගින් අනාවරණය කර ගත හැකි ය. සමකාලීන සමාජ සන්දර්භයේ පවතින අතිශය දියුණු සන්නිවේදන ක්‍රම 10 වන සියවස තරම් ඈත යුගයක නොපැවතියත්, සෙල්ලිපි වැනි සන්නිවේදන උපාංග මගින් පොදු මහජනතාවට වැදගත් වන තොරතුරු අන්තර්ගත සංදේශ, සෙල්ලිපි වෙතින් සන්නිවේදනය කර තිබේ. සෙල්ලිපිය හුදු සන්නිවේදන මෙවලමක් වූවා පමණක් නොව සෙල්ලිපියේ අන්තර්ගතය ප්‍රතිග්‍රහණය කරගැනීමට


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දියුණු අධ්‍යාපන මට්ටමක්, සාක්ෂරතාවක් සහිත ජනතාවක් මධ්‍යතන යුගයේ ලාංකේය සමාජයේ ජීවත් ව සිටි බව ද තහවුරු වේ. ඒ අනුව, බදුලු ටැම් ලිපිය යනු 10 වන සියවසේ ලංකාවේ සමාජ, සංස්කෘතික හා ආගමික පසුබිම සන්නිවේදනය කරන කැඩපතක් ලෙස හඳුන්වා දීම වඩාත් සුදුසු වන අතර එදා පැවති නීති රීති අද්‍යතනයේ පවතින සමාජ නීති රීති හා සමාන මෙන් ම නූතනයටත් ගැළපෙන ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු ඒවා බව නිගමනය කළ හැකි ය. එසේ මෙම බදුලු ටැම් ලිපිය අරබයා පර්යේෂණ කරන විද්‍යාර්ථියෙකුට එකල අර්ථ ක්‍රමය, බදු ක්‍රමය සහ රාජ පාලනයට අමතර ව එකල තිබූ සමාජයේ සාක්ෂරතාව හෙළි වන බැවින් ඒ ඔස්සේ පරීක්ෂාවට නතු කළ හැක්කේ ප්‍රස්තුත ලිපියට අදාළ ප්‍රදේශය එකල පැවති අර්ධ නාගරික ප්‍රදේශයක් ද ලෙස පැවති බව ය.

මකුරුප්පේ ධම්මානන්ද හිමි 61

# බදුලු ටැම් ලිපිය - සන්නය

ඇ.1-8 **සිරිබර** - සම්පත්තියෙන් බර වූ; **කැත් කුල කොත්** - ක්ෂත්‍රිය වංශයට කොතක් වැනි වූ; **උකාවස් රද් පරපුරෙන් බට** - ඔක්කාක වංශ රාජ පරම්පරාවෙන් පැවතෙන්නා වූ; **ලක්දිව් පොළො යොන් පරපුරෙන්** - ලක්දිව පොළොව නමැති තරුණ කාන්තාවගේ පරම්පරාවෙන්; **හිමි වූ** - ස්වාමියා වූ; **එමෙ කුලෙන් බට** - එම කුලයෙන් පැවතෙන; **සමිදිගොන් බිසො කුමා කුසැ උපැදැ** - සමිදිගොන් නම් උතුම් බිසවගේ කුසෙහි ඉපදී;

ඇ. 8-17 **ඇපා මහයා සිරි විඳැ** - ඇපා හා මහයා කුමරු තනතුරු ලබා; **පිළිවෙළසෙ සෙ රැදැ පැමිණැ** - පිළිවෙළ අනුව රාජ්‍යයට පැමිණ; **රැදැ කළ** - රාජ්‍යය කළා වූ; **සිරිසඟ්බෝ උදා මහරජනු කුමා** - සිරි සංඝබෝධි උදය මහරජතුමා; **සත්ලැඟු** - සේසත් එස වූ; **දෙවන හවුරුදුයෙහි** - දෙවන අවුරුද්දෙහි; **නිකිණිනි ස (ඳ)** - නිකිණි මාසයෙහි; **අව විසෙනියි** - අව විසේනියෙහි (අව 05 වන දා); **සොරබොරහි ආවු** - සොරබොර පෙදෙසෙහි පිහිටි; **හොපිටිගමු පදිය** - හොපිටිගමුව වෙළඳ නගරයෙහි;

ඇ. 17-30 **වැපාරයන්** - ව්‍යාපාරිකයන්; **කුඩින්** - ගෘහවාසීන්; **වත්හිමියන් වහන්සේ මියගුණ් මහවෙර් වැඩි කැලැ** - රජතුමා මහියංගන මහා විහාරයට පැමිණි කල්හි; **ගිය දවස** - පසුගිය කාලයෙහි; **පදිලද් දඬනායකයන් ගැත්තන්** - වෙළඳ නගරය ලබාගත් හමුදා නිලධාරියාගේ සේවකයෝ; **සතළොස පිරිනිවියන් වහන්සේ දවසැ** - සතළොස් වැනි වර්ෂයෙහි පිරිනිවි රජතුමාගේ කාලයෙහි; **කළ වැවස්ථා** - කරන ලද ව්‍යවස්ථාව; **ඉක්මැ** - ඉක්මවා; **අන්නෑයෙන් දඬගත්හ** - අන්‍යායෙන් (අයුතු ලෙස) අය බදු ගත්හ; **නොසිරිත් පඬුරු ගත්හ** - චාරිත්‍රානුකූල නොවන පරිදි පඬුරු ගත්හයි; **ගමින් පියෙයිසි වැඩ තැනා** - ගමෙන් පෙත්සමක් (රජු) පැමිණි කල්හි; **දැන්වූ තැනින්** - දැන්වූ හෙයින්;



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

අ. 30-39 සතලොස (වහන්සේ) දවසැ කළ - සතලොස පිරිනිවි රජතුමාගේ කාලයෙහි කරන ලද; සිරිතක් මිස - චාරිත්‍රයක් විනා; අන්නැයෙන් කරන දැයක් නොකරනා සැටියට් - අන්‍යායෙන් (අයුතු ලෙස) කරන දෙයක් නොකරන හැටියට; වැවස්(ථා)වක් ලියවා තබ (න්න)ට් වදාළෙන් - ව්‍යවස්ථාවක් ලියවා තැබීමට නියම කළ හෙයින්; සභායෙහි ලේකම් ගෙයි සම්ද(රු)වන් හි(ඳැසි)ට් වූ - රාජ සභාවේ ලේකම් කාර්යාලයෙහි නිලධාරීන් රැස්ව හිඳුවන ලද; වැවසථා සිරිත් - ව්‍යවස්ථා චාරිත්‍රය (ලේඛන) යයි.

අ.39-ආ.01 මොහොපිටිගමු (පදිලද්) කෙනෙකුන් - මේ හෝපිටිගම වෙළඳ නගරය ලබාගත් කෙනෙකුගේ; ගැත්තන් ගමට් ආ (කලැ) - සේවකයන් ගමට ආ කල්හි; මණ්ඩරණ්ඩින් - උපදේශකයන්; වණිග්‍රාමයන් - වෙළඳ සංගමයේ සාමාජිකයන්; මහාග්‍රාමයන් - ගම් ප්‍රධානීන්; හින්දැ - රැස්ව; සකලොස පිරිනිවියන් වහන්සෙයි දවසැ - සතලොස පිරිනිවි රජතුමාගේ කාලයේ; වැවස්ථා සෙ - ව්‍යවස්ථාව පරිදි; පෙරෙ සිරිත් දඩගනුත් මිස - පෙර සිරිත් අනුව අය බදු ගැනීමක් විනා; අනි(යා) නොකරනු ඉසා - අයුතු දෙයක් නොකිරීම ද (කළ යුතුය).

ආ. 2-8 ගම් ලද්දන් ගැත්තන් - ගම් ලබාගත් අයගේ සේවකයන්; මන්ඩරණ්ඩින් - උපදේශකයන්; හින්දැ (වි) තාර කොට් - රැස්ව විමසා; පිරිකපා දක්වා දුන් - නියම කොට දුන්- දඩ ගනුත් මිස - අයබදු ගන්නාවා මිස; ගම් වටාගෙන - ගම් වටලාගෙන; ගෙකිරැගෙනැ - ගෙය හිරකොටගෙන; දඩ නොඉල්ලනු ඉසා - අය බදු නොගැනීම ද (කළ යුතුය.)

ආ.9-12 දඩ ගැමැ හින්දැ එ (ල්) වත් මිස - අය බදු ගම හිඳ ඉල්වනු මිස; කුඩින් - ගෙවැසියන්; ගැමින් පිටත් කොටැ නොගෙන යනු ඉසා - ගමෙන් බැහැරට නොගෙන යාම ද (කළ යුතුය.)

ආ.13-15 නොපිරිකැපු දඩට් - සපුරා තීරණය නොකළ අය බදුවලට; වැලැක්මෙ නොගන්නා කොට් ඉසා - වැලැක්මේ නොගැනීම ද (කළ යුතුය.)


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

| | |
|---|---|
| ආ.15-19 | ලි දඬට් - නියම කරන ලද දඩයට; ස්වාමි ගිනුත් මිස - ගෙහිමියා ගන්නවා විනා; අබුදරුවන් වැලැක්මෙ නො ගන්නා ඉසා - අබු දරුවන් වැලැක්මේ නො ගැනීම ද (කළ යුතුය.) |
| ආ.19-22 | ගමට් ආ රදොලන් - ගමට පැමිණි රජයේ නිලධාරීන්; රහ මස් දී ගිතෙල් නොගන්නා ඉසා - රා-මස්-දී ගිතෙල් නො ගැනීම ද (කළ යුතුය.) |
| ආ.22-26 | වතු පෙත් වෙත් වැද - ගෙවලට වතු පිටිවලට ඇතුළුව; රහ නොගන්නා ඉසා - රා නොගැනීම ද; සොර වෙළදාම් නොකරනු ඉසා - හොර වෙළඳාම් නොකිරීම ද (කළ යුතුය.) |
| ආ.26-30 | පොහොදා සල්කළාකුගෙන් - පොහෝ දිනවල වෙළඳාම් කළ අයකුගෙන්; වැපුදයට් - පහන පූජාවට; තෙල් පද්දක් ගන්නා ඉසා - තෙල් පතක් (කාලක්) ගැනීම ද (කළ යුතුය.) |
| ආ.30-36 | මියුගුණ් මහ වෙහෙර - මහියංගන මහා විහාරයෙහි; වැපුද පවත්වනු ඉසා - පහන් පූජාව පැවැත්වීම ද; වැපුදයට් නොලැබුණාකුගෙන් - පහන් පූජාවට (තෙල් පතක්) නොලැබුණ අයෙකුගෙන්; පෙරෙසිරිත් - පෙර සිරිත් පරිදි; දඩ වැපුදයට්; දඩ පහන් පූජාවට; ගන්නා ඉසා - ගැනීම ද (කළ යුතුය.) |
| ආ.36-39 | බඩු ගෙන ගම්වන් - බඩු රැගෙන ගමට ඇතුළුවූ; ගොණීගොන් - තවලම්ගොණුන් (සඳහා අය බදු); නොගන්නා ඉසා - නොගැනීම ද (කළ යුතුය.) |
| ආ.39-41 | මෙගම සිටැ - මේ ගමෙහි සිටැ; රට් දග් නො ගන්නා ඉසා - පිට රටෙහි අයගේ සංඛ්‍යා ලේඛන නොගැනීම ද (කළ යුතුය.) |
| ආ.41-49 | වැළැත වන - සමීප වනයෙහි වසන; උළ්වාඩුකණක්කරුන්. වරදකරුවන් අල්ලන නිලධාරීන් හා ගණකයන්; ගමට් ආකුල නොකරනු ඉසා - ගමට ආකුල නොකිරීම ද; මෙකුන් ගැත්තන් - මොවුන්ට පක්ෂපාතීවූවන් - ගමට් වදනා; ගමට ගෙනෙන; රහ මස් දී ගිතෙල් පැහැර නොගන්නා ඉසා - රා-මස්-දී-ගිතෙල් පැහැර නොගැනීම ද (කළ යුතුය.) |

 © 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

| | |
|---|---|
| ආ - 49<br>-ඉ - 03 | ජදී වදනා බඩු - වෙළඳපළට ගෙනෙන; බඩු පෙරමගට ගොස් නොගන්නා (ඉසා) - පෙර මගට ගොස් නොගැනීම ද (කළ යුතුය.) |
| ඉ. 3 - 7 | ....... කුසලාන් ක(ැ) (රැ) ගෙන දී - පිනට දෙන ලද ඉඩම් කට්ටි කැර බදු ක්‍රමයට ගෙන (ගොවියන්ට) දී; තමාගේ (කැරු) ගිනුත් මිස - තමාගේ බදු අය කර ගන්නවා විනා; නොසිරිතක් නොකරනු ඉසා - නොසිරිතක් නොකිරීම ද (කළ යුතුය.) |
| ඉ. 8-10 | (ගණ) ලහස්සෙන් මිස - ගණ ලහස්සෙන් විනා සෙසු ලහසියෙන් නොමනනු ඉසා - වෙනත් ලහසියකින් නොමිණීම ද (කළ යුතුය.) |
| ඉ. 10-13 | ගම් වන් බඩු ගැමැ වික්කැ මිසැ- ගමට ගෙනා බඩු ගමේදී විකුණුව හොත් විනා; ගෙනැයෙන් - ගම හරහා ගෙන ගිය හොත්; සුන්වත් නොගන්නා ඉසා - අයබදු නො ගැනීම ද (කළ යුතුය.) |
| ඉ. 13-16 | (නො) පෑ විකිබඩියෙහි - නො පෙන්වා විකුණන බඩුවලට; දීණ සුන්වත් ගනුත් මිස - දෙගුණ කොට අය බදු ගන්නවා විනා - ආකුල නොකරනු ඉසා; ආරවුල් ඇති නොකිරීම ද (කළ යුතුය.) |
| ඉ. 17-18 | නොපැවු මදඩියෙන් - අනුමත නොකරන ලද තරාදි පඩි වලින්; (නොයෙන් - නොනීතියෙන්) නොකිරනු ඉසා - නොකිරීම ද (කළ යුතුය.) |
| ඉ. 18-20 | සුන්බඩු - බදු ගෙවිය යුතු භාණ්ඩ; නොතැන හින්දැ නොවිකුණනු ඉසා - නුසුදුසු තැන්වල හිඳ නොවිකිණීම ද (කළ යුතුය.) |
| ඉ. 20-22 | සල් නොකළමනා තැනැ - වෙළඳාම් කිරීමට නුසුදුසු තැන්වල දී; නොකිරනු ඉසා - නොකිරීම ද (කළ යුතුය.) |
| ඉ. 22-24 | සල් නොකළමනවුන් - නො විකිණිය යුතු බඩු; නොකිරනු ඉසා - නොකිරීම ද (කළ යුතුය.) |


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ඉ. 24-27 කළමසු - කුළු මසු නැතහොත් අඩු වටිනාකමෙන් යුතු මුදල්; පුරවත් වී මීසැ - පිරවීමට විතා; වැටෙන මසු - පවතින මුදල්; උනු කොටැ නොගන්නා ඉසා - අඩු කොට නොගැනීම ද (කළ යුතුය.)

ඉ. 27-32 බුලත් පුවක් මඬපයෙ තබා විකුණනු කොට ඉසා - බුලත් පුවක් මණ්ඩපයක තබා විකිණීම ද; නොතැන තබා වික්ක දුටුවා - නොනිසි තැනක තබා විකුණනු දුටු ඒවා; රදොලත් - රාජකීයයන් ලවා; හරවා ගන්නා ඉසා - ඉවත් කිරීම ද (කළ යුතුය.)

ඉ. 32-36 දෙමුළැ බද් වල්වලැ දඹුපත් - උභය මූලායතනවලට අයත් කැලෑවල ලී දඬු; නොකපනු කොට ඉසා - නොකැපීම ද; මෙමෙහකරුනට - කැපකරුවන්ට; ආකුල නොකරනු ඉසා - කරදර නොකිරීම ද (කළ යුතුය.)

ඉ. 36-38 මෙගම්හි අටදෙනාගෙ - මේ ගමෙහි; (ප්‍රධානීන්) අටදෙනාගේ ගෙවල්වල; නවතැන් නොගන්නා ඉසා - නවාතැන් නො ගැනීම ද (කළ යුතුය.)

ඉ. 39-43 වත්හිමියන් වහන්සේ වැඩියැ - රජතුමා පැමිණි කල්හි හෝ; ඈපාරද් දරුවන් වැඩියැ - ඈපා රජ දරුවන් පැමිණි කල්හි; පෙරෙ සිරිත් පඩුරු දෙනු ඉසා - පෙර සිරිත් පරිදි පඬුරු දීම ද (කළ යුතුය.)

ඉ. 43-49 ගමලත්නායක කෙනෙකුන් පදි ආ කලැ - ගම් ලබාගත් ප්‍රධානියෙකු වෙළඳපළට පැමිණි කල්හි; පෙරෙ සිරිත් පඬුරු පස්විස්ස නොගෙනැ - පෙර සිරිත් පඬුරු විසි පහක් නොගෙන; අන්නෑයෙක් - නීති විරෝධී ලෙස;


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## ඊ

ඊ.1-9 ... ගනිති, ... ගනිතැ'යි; කුඩින් ගිගිරි කොට - ගම්වැසියන් උද්ඝෝෂණය කොට; වැඩිතැන දැන් වූ තැනින් - පැමිණ රජුට දැන්වූ කල්හි; පෙරෙ සිරිත් පස්විස්ස ගන්නෙයයි - පෙර සිරිත් පරිදි විසිපහක් ගත යුතු යැයි; වදාළ තැනින් - නියම කළ හෙයින්; පඬුරට පස්විස්ස ගන්නා කොට් ඉසා - පඬුරු පිණිස විසි පහක් ගැනීම ද (කළ යුතුය.)

ඊ.10-13 මෙගම්හිලා මිනී කොටා යෙත් - මෙගමෙහිදී මිනීමරා යත් නම්; රදොලනට (ලැබී) නවත්නා සෙ(යි)න් - රාජකීයනට හසු වී අල්ලා ගන්නා ලෙස; නවතනු ඉසා - නැවැත්වීම ද (කළ යුතුය.)

ඊ.14-16 දෙමළන් (වරටනා) තැන් දරු- ද්‍රවිඩයන්ට රටනායකයන්ගේ දරුවන්; අවා නොදෙනු ඉසා - ආවාහ කොට නොදීම ද (කළ යුතුය.)

ඊ.16-20 මවුවියෙන් බොලා කිරවූ අ(ණ) - මාතොටින් නෙරපීම සඳහා ආඥාව; වියොහා කර - පැහැදිලි කොට; (යව)නු ඉසා - යැවීම ද (කළ යුතුය.)

ඊ.20-23 කුඩින්ගෙ කැරුණු ආකුලයට - ගම්වැසියන්ගේ ගෙවල්වල කෙරුණු ආරවුල්; සම්දරුවන් ලැබී ආකුල හරවනු ඉසා - සම්දරුවන් ලබා ගෙන ආරවුල සංසිඳවීම ද (කළ යුතුය.)

ඊ.24-32 සම්දරුවන් නොලැබුණු කුඩියක් ඇත - සම්දරුවන්ට හසු නොවූ (එබඳු වරදක් කළ) ගම්වැසියෙකු ඇතහොත්; ලහසු හොල්දඬු නොසිරිත් කරනු (පර) කපා - සිල් තැබූ සැරයටිය නොදීමේ නොසිරිත් කිරීම සීමා කොට... බත් නොදෙනු ඉසා - බත් නොදීම ද; වෙළදාම් ගොවිකම් - වෙළදාම හා ගොවිකම... අගැමින් පිටත්ක,.... ගමේ නොවන අය පිටත්කර.... නොවැදෑ..... ඇතුල් නොවී......

 © 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මකුරුප්පේ ධම්මානන්ද හිමි 67

33-38 වරද නොවෙද් - වරදක් නොවේ ද; ගම් අඩවිය අට දෙනා..... - (ම) ගම අසල වන සංරක්‍ෂක නිලධාරීන් අටදෙනා ද; (නිගහ) ලැබුවන් (රද්දඩ) අටදෙනා- නිග්‍රහ ලැබුවන්ට (රජයේ දඬුවම) නියම කරන අටදෙනා ද; පිරිවහන්නා හින්ද්වා ඉල්ලනු ඉසා, පිරිවහන්නා ද රැස් කොට ඉල්ලීම (කළ යුතුය.)

38. මෙවරදට් වැදෑ......, මේ වරදට යොමු වී......,

ඊ.40-44 මෙවැවස්ථා ඉක්මෑ - මේ ව්‍යවස්ථාව ඉක්මවා; ගමට් රදොලන් අනියා කළ - ගම්වැසියන්ට රජයේ නිලධාරීන් අයුත්තක් කළහොත්; සභාගෙ ලෙකම්ගෙයි දරුවන්ට කියා - රාජ සභාවේ ලේකම් කායර්‍යාලයේ නිලධාරීන්ට දන්වා; අවුල් හරවා - ආරවුල් නැති කොට, ........

ඊ. 45. දුන් ..... දෙන ලද....., යුක්ති..... සාධාරණකම්.....,

46-47 (මෙපහණ් හිනුවන්නට් ආ) - මේ සෙල්ලිපිය පිහිටුවන්නට ආ; සභාගෙ හින්දනා - රාජ සභාවෙහි සිටිනා....,

47-49 (තලින්) තරු උදහි ඉසා - (තලින්) තරු උදහි ද; මුල (වස) සෙන් ඉසා - මුල (වස) සෙන් ද,

ඊ. 50-58 වරැ මෙකාප්පර් මනිතිලාකිලියෙම් ඉසා - උතුම් අංගාරක්‍ෂක මනිතිලාකිලියෙම් ද, ගොලොබාගම නිලාදෙවු ඉසා - ගොලබාගම නිලදේව ද, මඟුල්මහලෙ සමන්නා - මඟුල්ගේ නියුක්තයා ද; අරක්සමණන්වරැ - ආරක්‍ෂ නිලධාරි තුමා ද; කුඩසලාවත්කැමිදෙවු ඇතුළ්ව - කුඩසලා වත්කැමිදේව ද ඇතුළුව; මෙතුවාක් සම්දරුවන් අවුද් - මෙකීතාක් නිලධාරීන් පැමිණ; (මෙසම්)වතා පහණ් හි (හැවනුලද්) - මේ සම්මත ගල් ටැඹ හෙවත් අයිතිවාසිකම් තහවුරු කිරීමේ ගල පිහිටුවන ලදී.

(ධම්මානන්ද, මකුරුප්පේ, 2018 පි. 61-67).


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

### පරිශීලිත මූලාශ්‍රය


අමරවංශ හිමි, කේ. (1959). *ලක්දිව සෙල්ලිපි.* කොළඹ, එම් ඩී ගුණසේන සහ සමාගම.

ධම්මානන්ද, එම්. (2008). *විමර්ශනාත්මක සිංහල ශිලාලිපි මාලා.* කොළඹ 10, සමයවර්ධන පොත්හල පොද්ගලික සමාගම.

පියදාස, ආර්. එල්. (2008). *සන්නිවේදන විමර්ශන.* නිව් කැලණි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්.

සිරිසුමන හිමි, ඒ. (2014). *විමසුම් ධාරා.* නුගේගොඩ, සරසවි පොත්හල.

Paranavithana, S. (1970). Inscription of Ceylon. Ceylon, Department of Archeology.

Wickramasinghe, D. M. (1912). Epigraphia Zeylanica, Vol 1-V, ed. Delhi, Gayan Books.




© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දහතුන්වන කලාපය 2022 ජූනි
පිටු 67-74
ISSN 1800-1459 eISSN 2386-2041
© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# සිංහල ශිලාලේඛනවල අන්තර්ගත ප්‍රාස්තාවික භාෂා ස්වරූප පිළිබඳ සමාජවාග්විද්‍යාත්මක අධ්‍යයනයක්

# (A Sociolinguistic Study of the Fixed Linguistic Forms Contained in Sinhala Inscriptions: Based on the Sinhala Inscriptions of the Ninth and Tenth Centuries AD)

කිත්සිරි මිහිරි බණ්ඩාර

සිංහල අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය
**Indikamia15@gmail.com**

## Abstract

The main aim of modern sociolinguistics is to study the human language based on speech community as there is an inseparable relationship between a society and its language, and also these two are inter- dependable. Register which is one of the main part of sociolinguistic scope can be primarily defined as the sort of variety of a language according to usage. Registers can be created or used **for a particular purpose or in a particular communicative situation as wished by speekers or writers. According to the written records of Sinhalese,** registers or varieties of usage of Sinhala language can be identified from 9th century AD. Therefore, the aim of this research is to identity and examine the registers of Sinhala language based on inscriptions related to from 9th Century AD to end of the 10th Century AD under the research problem of what are the Sinhalese registers and its significant features on inscriptional language ?. As a primary source of studying the Sinhala language, inscriptions are strong enough to provide valuable and rare primary facts of each and every components of Sinhalese written language. Using literary survey for collecting primary and secondary data and applying qualitative method in this research, it could find a large number of registers related to the **particular purposes or in particular communicative situations of political-economy as well as socio-cultural facts.**

**Key words:** Inscriptions, Sinhala Language, Registers, Sociolinguistics, Speech community

## සාරසංක්ෂේපය

භාෂාවක ප්‍රායෝගික භාවිතය පදනම් කරගනිමින් භාෂාධ්‍යයනය කෙරෙන බහු-ප්‍රචලිත නූතන විද්‍යාත්මක ප්‍රවේශය සමාජවාග්විද්‍යාව ලෙස අර්ථකථනය කළ හැකි ය. 'භාෂක සමාජය' භාෂාධ්‍යයනයේ ප්‍රමුඛ ප්‍රස්තුතය ලෙස අවධාරණය කෙරෙන සමාජවාග්විද්‍යාව විසින් මානව භාෂාව අර්ථකථනය කෙරෙන්නේ ද දේශපාලන-ආර්ථික සහ සමාජ-සංස්කෘතික වශයෙන් සිදුවන මානව අභ්‍යන්තර-බාහිර ආචරණවල ප්‍රතිඵලයක් ලෙස යි. භාෂාව සහ සමාජය අතර පවතින අත්‍යන්තාබද්ධතාව අන්‍යෝන්‍ය ප්‍රතිපෝෂක මෙන් ම බලපෑම්කාරක බව තහවුරු කෙරෙන සමාජවාග්විද්‍යාව ඕනෑ ම භාෂාවක ප්‍රාස්තාවික පිළිබඳ අධ්‍යයනය කරන්නේ ද යථෝක්ත බලපෑමේ හෝ අන්තර් සම්බන්ධතාවේ ම ප්‍රතිඵලයක් ලෙස යි. ඒ අනුව ප්‍රාස්තාවික යනු භාෂකයාගේ සුවිශේෂ අභිලාෂ සහ අවස්ථා අනුව භාෂාව භාවිත කෙරෙන ස්වරූප ලෙස අර්ථකථනය කෙරෙයි. සිංහල භාෂා විකාසනයේ සන්ධිස්ථානීය කාලයක් ලෙස සැලකෙන ක්‍රිස්තු වර්ෂ නවවැනි සහ දහවැනි සියවස්වල ලාංකේය භාෂක සමාජය විසින් භාවිත ප්‍රාස්තාවික ස්වරූප මෙම පර්යේෂණය මගින් අධ්‍යයනයට ලක්කිරීම ප්‍රමුඛාරමුණ වූ අතර ඒ සඳහා යථෝක්ත යුගයට අයත්යැයි අනාවෘත ශිලාලේඛන සාධක මූලාශ්‍රය කර ගැණුණි. සිංහල ශිලාලේඛන භාෂාවේ අන්තර්ගත ප්‍රාස්තාවික ස්වරූප මොනවා ද? සහ තත් භාවිතයේ සුවිශේෂතා මොනවා ද? යන පර්යේෂණ ගැටලු මත සිදු වූ මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික, ද්විතීයික දත්ත සම්පාදනය, විශ්ලේෂණය සහ අර්ථකථනය සඳහා ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය පාදක කර ගැණුණි. ඒ අනුව ප්‍රස්තුත ශිලාලේඛන භාෂාව මගින් අනාවරණය වෙන තත්කාලීන භාෂා භාවිතයේ විවිධතා හෙවත් ප්‍රාස්තාවික ස්වරූපත්, තදීය භාවිත විශේෂතාත් මෙමගින් විශද කරගත හැකි විය. ප්‍රස්තුත යුගය සිංහල භාෂා විකාසනයේ සාපේක්ෂක අව-පෝෂණීය කාලාවධියක් වුව ද භාෂකයාගේ සුවිශේෂ අභිලාස සහ සුවිශේෂ අවස්ථාවෝචිත ව භාෂා භාවිතයේ යෙදුණු බවත්, ඒ සඳහා තදනන්‍ය වාක්කෝෂයක් මෙන් ම ඇතැම් වාක්‍ය සංස්ථිති ද භාෂක සමාජය සතු වූ බවත් නිරීක්ෂණය විය.

**කේන්ද්‍රීය වචන:** ප්‍රාස්තාවික, භාෂක සමාජය, භාෂාව, ශිලාලේඛන, සමාජවාග්විද්‍යාව

## හැඳින්වීම

දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන ලාංකේය ලේඛන සම්ප්‍රදාය සිංහල භාෂාවේ ඓතිහාසිකත්වය පිළිබඳ සුවිශේෂ සාධකයක් ලෙස අවධානයට ලක්වෙයි. දැනට අනාවෘත ආදිතම අවිනෂ්ට සිංහල ලේඛන සාධක අතර ශිලාලේඛනවලට හිමිවන්නේ ඉහළ මූලාශ්‍රයීය අගයකි. ලාංකේය සමස්ත සමාජ-සංස්කෘතික දේහයත් සමඟ අත්‍යන්තාබද්ධ ශිලාලේඛන වටිනාකම් රාශියක් සහිත අතීත ප්‍රෞඪ උරුමයක් ලෙස ද සම්භාවනාවට පාත්‍ර වෙයි. ශිෂ්ටාචාරගත පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික සමාජ-සංස්කෘතික තොරතුරු සුරක්ෂිත වූ විශ්වසනීය දත්ත ගබඩාවක් බඳු ලාංකේය ශිලාලේඛන වංශය මගින් සිංහල භාෂාධ්‍යයනයෙහිලා සැපයෙන මූලාශ්‍රයීය දායකත්වය අද්විතීය බැවින් වාග්වේදීන්ගේ ද සතතාවධානයට ලක්වෙයි. ක්‍රිස්තු පූර්ව තෙවැනි සියවසේ සිට දාහත්වැනි සියවස දක්වා විවිධ ප්‍රස්තුත ඔස්සේ ලියැවී ඇති දහස් ගණනක් වූ අනාවෘත සිංහල ශිලාලේඛන අතරින් ක්‍රිස්තු වර්ෂ නවවැනි සහ දහවැනි සියවස්වලට අයත් ශිලාලේඛනවල භාවිත ප්‍රාස්තාවික ස්වරූප පිළිබඳ මෙමගින් පර්යේෂණයට ලක්විය.

## සාහිත්‍ය විමර්ශනය

විවිධ පර්යේෂකයින් විසින් මෙතෙක් සිදුකරන ලද පූර්ව අධ්‍යයනවලින් මෙම පර්යේෂණය වෙනස් සහ විශේෂ වන්නේ කෙසේ ද? යන්න සාහිත්‍ය විමර්ශනයේ දී සාකච්ඡාවට ලක් වූ අතර එහි දී තදනුබද්ධ පර්යේෂණ කෘති මෙන් ම ලිපි ද විමර්ශනයට භාජනය විය. ඒ අතර ක්‍රිස්තු වර්ෂ නවවැනි සහ දහවැනි සියවස්වල සිංහල ශිලාලේඛන පිළිබඳ ව කරන ලද පර්යේෂණාත්මක අධ්‍යයන රාශියක් නිරීක්ෂණය විය. එහෙත් ශිලාලේඛන ප්‍රස්තුත වූ යථෝක්ත කිසි ම අධ්‍යයනයක් මගින් ප්‍රාස්තාවික ස්වරූප පිළිබඳ අවධානයට ලක්වී නොමැත. බොහෝ අධ්‍යයන මගින් අක්ෂරවල විකාසනය හෝ පද සහ වාක්‍ය ප්‍රස්තරවල පරිණාමය පර්යේෂණය කිරීම දක්වා සීමා කර ඇති අතර ඇතැම් අධ්‍යයන මගින් අවධානයට ලක්වී ඇත්තේ අන්තර්ගතයට අදාළ ඓතිහාසික සාධක කෙරෙහි ය. එසේ ම සිංහල භාෂාවේ ප්‍රාස්තාවික පිළිබඳ සිදු වී ඇති ඇතැම් ක්ෂුද්‍ර අධ්‍යයන කිහිපයක් නිරීක්ෂණය වුව ද ඒ සඳහා මෙම පර්යේෂණය මගින් ආවරණය කෙරෙන ප්‍රස්තුත යුගයේ ශිලාලේඛන හෝ වෙනත් කාලයකට අයත් ශිලාලේඛන හෝ පාදක වී නොමැති වීම ද මෙම පර්යේෂණය සුවිශේෂත්වයට පත්කෙරෙයි. ඒ අනුව සිංහල භාෂා විකාසනයේ සන්ධිස්ථානීය කාල පරාසයකට අයත් ලේඛන සාධක ආශ්‍රයෙන් ඒ ඒ භාෂක සමාජ විසින් විවිධ ප්‍රස්තාව හෝ ප්‍රකාරණාබද්ධ ව භාෂාව භාවිත කිරීමේ ස්වභාවය නිශ්චිත ව අධ්‍යයනයට භාජනය කෙරෙන නව පර්යේෂණයක් ලෙස මෙය ස්ථානගත කළ හැකි ය.

## පර්යේෂණ ගැටලු

ප්‍රාස්තාවික යනු භාෂා භාවිතයෙහි විවිධත්වය පිළිබඳ එක් වැදගත් සාධකයක් වන අතර එමගින් මානව භාෂාවේ සුවිශේෂත්වය මෙන් ම සංකීර්ණත්වය ද මනාව හඳුනාගත හැකි ය. කාලත්‍රයට අදාළ ඕනෑම ප්‍රපංචයක් සන්නිවේදනය කළ හැකි මානව භාෂාව මගින් ඕනෑම ප්‍රස්තාවබද්ධ සන්නිවේදනයක් ද සිදුකළ හැකි වීම මානව භාෂාවේ විශේෂත්වයකි. සිංහල භාෂාව ද යථෝක්ත ලක්ෂණ සහිත ව විකාසනය වී ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකි ය. ඒ අනුව සිංහල භාෂා විකාසනයේ සන්ධිස්ථාන අවධියක් ලෙස අවධානයට ලක්වෙන නවවැනි සහ දහවැනි සියවස්වල භාෂක සමාජය, ප්‍රකරණය හෝ ප්‍රස්තාව ආබද්ධ ව ලේඛන සන්නිවේදනය සිදු කළේ කෙසේ ද? සිංහල ශිලාලේඛන භාෂාවේ අන්තර්ගත ප්‍රාස්තාවික ස්වරූප මොනවා ද? සහ තත් භාවිතයේ සුවිශේෂ ලක්ෂණ මොනවා ද? යන පර්යේෂණ ගැටලු මෙමගින් විභාග කිරීමට අපේක්ෂිත ය.

## පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණයෙහි විෂය පථය භාෂාධ්‍යයන වන අතර ඒ සඳහා ක්‍රිස්තු වර්ෂ නවවැනි සහ දහවැනි සියවස්වලට අයත් සිංහල ශිලාලේඛන ප්‍රස්තුත මූලාශ්‍රය විය. භාෂාධ්‍යයනය පෘථුල පරාසයක විහිදී ඇති අතර මෙම විශේෂ පර්යේෂණයේ මූලික අරමුණ ප්‍රස්තුත ශිලාලේඛනවල අන්තර්ගත ප්‍රාස්තාවික භාෂා ස්වරූප අධ්‍යයනය කිරීමයි. 'ප්‍රාස්තාවික' යනු සාමාජවාග්විද්‍යා විෂය පථයෙහි අනුශීර්ෂයක් වන අතර එහි ස්වරූපය මනාව නිර්ණය කිරීමේ සුගමාවකාශ සැපයෙන්නේ භාෂක සමාජය පදනම් කරගැනීමෙනි. ඒ අනුව ප්‍රස්තුත යුගයේ භාෂක සමාජය විසින් භෂා භාවිතයේ දී දක්වන ලද විවිධතා, එම විවිධතා සඳහා බලපෑ සමාජ-සංස්කෘතික සහ දේශපාලන-ආර්ථික පරිස්ථිති මෙහි දී අවධානයට ලක්විය. උපභාෂා සහ ප්‍රාස්තාවික අතර ඇත්තේ සමීප සම්බන්ධතාවක් වන අතර ශිලාලේඛන භාෂාවේ අන්තර්ගත විවිධ සමාජ උපභාෂාවල වුව ද නිශ්චිත සන්දර්භයක් තුළ භාෂාව භාවිත කර ඇත්තේ කෙසේ ද?, එම භාවිත විවිධතා විසින් බිහිකරන ලද භාෂා ස්වරූප කවරාකාර ද? යන්න පර්යේෂණය කිරීම මෙහි අරමුණු අතර විය. ඒ අනුව සුවිශේෂ යෙදුම්, අපයෝජන, ශාප, ආශිර්වාද, ගෞරව සහ ප්‍රශස්ති ආදි යෙදුම් සහ තදනුබද්ධ අර්ථමය සංගතියත්, ඒවා ප්‍රස්තාව සමඟ බද්ධවන ආකාරයත් මෙමගින් අධ්‍යයනය විය.

## පර්යේෂණයේ වැදගත්කම

ක්‍රිස්තු වර්ෂ නවවැනි සහ දහවැනි සියවස්වලට අයත් සිංහල ශිලාලේඛන පිළිබඳ විවිධ අධ්‍යයන රාශියක් සිදුවී ඇති ආකාරය නිරීක්ෂණය වෙයි. යථෝක්ත අධ්‍යයන අතර ශිලාලේඛන භාෂාව මෙන් ම සිංහල භාෂාවේ ස්වරූපය පිළිබඳ කරන ලද පර්යේෂණ ද කිහිපයකි. මෙම ප්‍රස්තුත කාලයට අයත් ශිලාලේඛන භාෂාව විග්‍රහාත්මක සහ ඓතිහාසික වාග්විද්‍යා ප්‍රවේශවලින් විවිධාධ්‍යයනවලට ලක්වී ඇතත්, සමාජ වාග්විද්‍යා ප්‍රවේශයකින් මෙතෙක් ගැඹුරු පර්යේෂණයකට ලක්ව නොමැති අතර බොහෝ අධ්‍යයන සිංහල භාෂා පරිණාමයේ ඓතිහාසික ස්වරූපය නිරීක්ෂණය කිරීම සඳහා පමණක් සීමා වී ඇති බැවින් ඒ සඳහා සෑම විට ම පාදක වී ඇත්තේ ඓතිහාසික වාග්විද්‍යාධ්‍යයන ප්‍රවේශයි. එසේ ම ඇතැම් අධ්‍යයනයක් සඳහා තුලනාත්මක වාග්විද්‍යාධ්‍යයන ප්‍රවේශ පාදක වී ඇති අතර මෙම කිසිදු අධ්‍යයනයක් මගින් සිංහල භාෂාවේ ප්‍රාස්තාවික ස්වරූප පිළිබඳ සමාජවාග්විද්‍යාත්මක අධ්‍යයනයක්


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සිදු වී නොමැති වීමේ රික්තය පූරණය කිරීම මෙම පර්යේෂණයෙහි සුවිශේෂ වැදගත්කමකි.

## පර්යේෂණ ක්‍රමවේදය

ප්‍රාථමික සහ ද්විතීයික වශයෙන් ප්‍රවර්ග ද්වයක් යටතේ පුස්තකාලයීය පරිශීලනය මගින් මෙම පර්යේෂණය සඳහා දත්ත සම්පාදනය කෙරුණු අතර එහි දී අභිලේඛන ක්ෂේත්‍රයෙහි ප්‍රාමාණික වියතුන් විසින් සම්පාදිත *Epigraphia Zeylanica* කෘතිවල වෙළුම් සහ කාණ්ඩ ද *Inscriptions of Ceylon* කෘතිවල වෙළුම් සහ කාණ්ඩ ද ප්‍රාථමික මූලාශ්‍රය අතර ප්‍රමුඛ කර ගැනුණි. සිංහල භාෂාවෙන් රචිත ශිලාලේඛන පමණක් දක්වා සීමා වූ මෙම පර්යේෂණය එය ද ක්‍රිස්තු වර්ෂ නවවැනි සහ දහවැනි සියවස්වලට අයත් ශිලාලේඛන පමණක් දක්වා ප්‍රතිසීමා කෙරිණි. ඒ අනුව ප්‍රස්තුත කාලයට අයත් සිංහල ශිලාලේඛන පිළිබඳ සියලු ම ප්‍රාථමික දත්ත යථෝක්ත කෘතිවලින් සම්පාදානය කර ගැනුණි. භාෂා භාවිතයේ සන්දර්භ සහ ප්‍රස්තාව නිරීක්ෂණය සහ නිර්ණය කෙරෙන මෙය සමාජවාග්විද්‍යාත්මක පර්යේෂණයක් බැවින් ප්‍රාස්තාවික භාෂා යෝජනය විභාග කිරීමේ ප්‍රමුඛ පදනම් සාධකය තත්කාලීන 'භාෂක සමාජය'යි. එනිසා ම ඒ ඒ භාෂක සමාජවල හාත්පස සියලු තත්ත්ව ලක්ෂණ වඩාත් පෘථුල සහ සියුම් විමර්ශනයකට ලක්විය යුතු බැවින් දේශපාලන, ආර්ථික, සමාජ-සංස්කෘතික සාධකාධ්‍යයනය සඳහා ඊට අදාළ ද්විතීයික මූලාශ්‍රය ප්‍රවර්ග රාශියක් පරිශීලනය කිරීම අත්‍යවශ්‍ය විය. ඒ අනුව වංශකතා ඇතුළු සිංහල, පාලි, සංස්කෘත සාහිත්‍ය කෘති මෙන් ම ඉතිහාසය සහ පුරාවිද්‍යා විෂයවලට අදාළ ප්‍රාමාණික ශාස්ත්‍රීය පර්යේෂණ කෘති රාශියක පරිශීලනය ද මේ සඳහා අවශ්‍ය වූ අතර එමගින් ප්‍රස්තුත යුගයේ ආර්ථික-දේශපාලන සහ සමාජ-සංස්කෘතික සාධක නිශ්චය කර ගැනුණි.

ප්‍රාස්තාවික යනු සමාජවාග්විද්‍යා විෂය පථයෙහි අනුශීර්ෂයක් බැවින් තත්න්‍යායානුග්‍රහය සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් සම්පාදිත මූලාශ්‍රය රාශියක ආධාරය මේ සඳහා අවශ්‍ය වූ අතර විලියම් ලැබොව් ඇතුළු සමාජවාග්විද්‍යාධ්‍යයන පුරෝගාමීන්ගේ කෘති කිහිපයක් ද ඊට අන්තර්ගත විය. ඒ අනුව සමාජවාග්විද්‍යා න්‍යායානුසාරීව 'භාෂක සමාජය' පදනම් කොටගනිමින් ක්‍රිස්තු වර්ෂ නවවැනි සහ දහවැනි සියවස්වලට අයත් යැයි අනාවෘත සිංහල ශිලාලේඛනවල ප්‍රාස්තාවික ස්වරූප සමාජ-සංස්කෘතික සහ දේශපාලන-ආර්ථික සාධක ගුණාත්මක පර්යේෂණ විධිනියමයන්ට අනුගත ව විශ්ලේෂණ, තුලන සහ අර්ථකථනය කරමින් නිගමනවලට එළඹීම මෙහි පර්යේෂණ විධික්‍රමය විය. ශාස්ත්‍රීය ලේඛනකරණයෙහි පරිභාවිත සම්මත ප්‍රතිමානානුකූල ව ලේඛනගත වූ මෙම පර්යේෂණයෙහි උද්ධරණ-මූලාශ්‍රය දැක්වීම 'හාර්වඩ්' ක්‍රමයට අනුගත ව සිදු කෙරිණි. එසේ ම අක්ෂර වින්‍යාසය සහ වාක්‍ය වින්‍යාසය සඳහා සාම්ප්‍රදායික ලේඛන සිංහල ව්‍යාකරණ රීත්‍යානුගත වූ අතර පද බෙදීමේ දී අර්ථයට හානි නොවන තාර්කික සංස්ථිතියක් අනුගමනය කෙරිණි.

## දත්ත විශ්ලේෂණය

මානව භාෂාව පිළිබඳ අධ්‍යයන අතර වඩාත් ප්‍රායෝගික, සංවිධිත සහ සංවර්ධිත පර්යේෂණ මානයක් ලෙස නූතන සමාජවාග්විද්‍යාවට *(Sociolinguistic)* හිමිවන්නේ සුවිශේෂස්ථානයකි. භාෂාව සමාජ ප්‍රපංචයක් වශයෙන් සමාජ-සංස්කෘතික සහ තත් ඇගයුම් පද්ධති සමග අත්‍යන්තයෙන් සම්බද්ධ ව ඇති ආකාරය සමාජවාග්විද්‍යාව මගින් අනාවරණය කෙරෙයි (Peter Trudgill, 2000, P-8). එසේ ම භාෂාවට සමාජ බලපෑමක් කළ හැකි බව සහ තත් සමජය පාලනය සඳහා භාෂාව මෙවලමක් ලෙස භාවිත කළ හැකි ආකාරය සමාජවාග්විද්‍යා පර්යේෂණ මගින් නිරීක්ෂණය කෙරෙන අතර භාෂාව සහ සමාජ-සංස්කෘතික සාධකවල අන්තර් සම්බන්ධතාව ඒ සඳහා පදනම් කරගැනෙයි. ඒ අනුව භාෂා ආකෘති *(Language forms)*, භාෂා අර්ථ *(Language meaning)* සහ භාෂා සන්දර්භ *(Language in contexts)*, ඕනෑම සමාජවාග්විද්‍යාධ්‍යයනයක දී පදනම් ප්‍රවේශය කරගැනෙන්නේ ද මෙනිසා ය. එහි දී ශබ්ද, පද, වාක්‍ය යන භාෂානුප්‍රස්තර තත් පරිණාමය මෙන් ම භාවිතයේ විවිධතා ප්‍රාර්වර්තික සහ ඓතිහාසික මානවලින් පර්යේෂණයට ලක්කිරීම ද සමාජවාග්විද්‍යාව මගින් සිදුකළ හැකි ය. විග්‍රහාත්මක, තුලනාත්මක මෙන් ම ඓතිහාසික වාග්විද්‍යා ක්ෂේත්‍ර මගින් භාෂානුප්‍රස්තර විවිධ විග්‍රහාත්මක පර්යේෂණවලට ලක්වුව ද සමාජවාග්විද්‍යාධ්‍යයන ක්‍රමවේදය ඉන් ඔබ්බට යයි. සමාජවාග්විද්‍යාවේ දී භාෂාවේ භාවිතයට ප්‍රමුඛතාව යොමු වෙන අතර සමාජ-සංස්කෘතික සහ භූගෝලීය සාධක පදනම් කොටගෙන භාෂාවේ භාවිතය විග්‍රහයට ලක්කෙරෙයි.

සමාජවාග්විද්‍යාව සෙසු වාග්විද්‍යාධ්‍යයන අතර අනන්‍ය වන්නේ සමාජ-සංස්කෘතික දෘෂ්ටිය ප්‍රධාන මූලධර්මයක් ලෙස භාවිත කිරීම කරණ කොටගෙනයි. සමාජවාග්විද්‍යාව භාෂාධ්‍යයනයෙහි අභිනව විද්‍යාත්මක ශික්ෂණයක් ලෙස හඳුන්වා දීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ පුරෝගාමියා ලෙස පිළිගැනෙන්නේ ඇමෙරිකානු ජාතික විලියම් ලැබොව් (*William Labov*) ය. පෙන්සිල්වේනියා විශ්වවිද්‍යාලයේ වාග්විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්යවරයෙකු වන ලැබොව් සමාජ-සංස්කෘතික ප්‍රවේශයකින් භාෂාධ්‍යයනය කිරීමේ වැදගත්කම සහ අවශ්‍යතාව පෙන්වා දී ඇත (බණ්ඩාර, 2021, 212). ඕනෑ ම භාෂාවක භාවිතයේ විවිධතා මෙන් ම පරිණාම ස්වභාවය මනාව හඳුනා ගැනීමේ අවකාශ භාෂක සමාජය පර්යේෂණය කිරීම මගින් උදා කරගත හැකි බව ලැබොව්ගේ නිගමන මගින් පැහැදිලි වෙයි.

මානව භාෂාවේ සමාජ-සංස්කෘතික, දේශපාලන-ආර්ථික සහ භූගෝලීය සාධකවල ප්‍රමුඛ නියෝජනය භාෂක සමාජයයි. භාෂාව කෙරෙහි සමාජ-සංස්කෘතික බලපෑම මෙන් ම මෙම දෙඅංශයෙහි අන්‍යෝන්‍ය අන්තර් සම්බන්ධතාව පිළිබඳ කෙරෙන ඕනෑම සමාජවාග්විද්‍යා පර්යේෂණයක මූලික නියැදි ප්‍රවේශය 'භාෂක සමාජයයි' *(Speech community)*. සන්නිවේදන කාර්යයෙහි මූලික සාධකද්වයක් වන සන්නිවේදක සහ ග්‍රාහක යන දෙපක්ෂය ම භාෂක සමාජය නියෝජනය කරන අතර සන්නිවේදනය සිදුකෙරෙන්නේ මෙම දෙපිරිසෙහි අභිලාෂ, අවශ්‍යතා


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සහ ශක්‍යතා කරණ කොටගෙනයි. ඒ අනුව භාෂා භාවිතයෙහි විශේෂ ස්වරූපයක් වන ප්‍රාස්තාවික අධ්‍යයනය ද සමාජ-සංස්කෘතික සහ දේශපාලන-ආර්ථික සාධක මත පදනම් වෙයි.

'ප්‍රාස්තාවික' මගින් මූලික වශයෙන් අවධානයට ලක්කෙරෙන්නේ භාෂාවක වාක්කෝෂය වුව ද වාගාලාප හෝ වාක්‍යය ද පර්යේෂණය කළ හැකි බවයි. තව ද එහි දීර්ඝකරණයක් ලෙස නූතන අක්ෂර ලේඛන රටා විවිධත්වය අනුව ලේඛන සන්නිවේදනයේ දී ප්‍රස්තාව වඩාත් පැහැදිලි වන පරිදි අක්ෂරයක රූපීය ආකෘතියෙහි භාවිතය ද සලකා බැලීම සමාජවාග්විද්‍යාවට අනුව තාර්කික වෙයි. ඒ අනුව විවිධ සමාජ-සංස්කෘතික සහ දේශපාලන-ආර්ථික සාධක පදනම්කරගත් සමාජ ස්තර හෝ පන්තිවල භාෂාව වුව ද නිශ්චිත සන්දර්භයක් තුළ භාවිත කෙරෙන ආකාරය මෙමගින් අවධානයට ලක්වෙයි. එනම් කිසියම් නිශ්චිත සන්දර්භයක් තුළ 'භාෂාවේ භාවිතය' සහ තත් භාවිතය සන්දර්භගත ව විවිධ වන්නේ කෙසේ ද? යන්න පර්යේෂණය කිරීම ප්‍රාස්තාවික පිළිබඳ සමාජවාග්විද්‍යා ප්‍රවේශයයි.

ඕනෑම භාෂාවක ප්‍රාස්තාවික අධ්‍යයනය කිරීම 'සන්දර්භය' නමැති සාධකය සමඟ අත්‍යන්තාබද්ධ වෙයි. 'සන්දර්භ යන්න බාහිර ලෝකයේ අවස්ථා, තත්ත්ව, සිදුවීම් සහ ලක්ෂණ සමඟ සම්බන්ධ වන අතර එනිසා ම එය භාෂාවේ විවිධ භාවිත මට්ටම්වලට ද අදාළ වෙයි. එනම් කිසියම් වාගාලාපයක් ශබ්ද විචාරාත්මක, පදවිචාරාත්මක, අර්ථ විචාරාත්මක සහ වාක්‍ය විචාරාත්මක ක්ෂේත්‍ර සමඟ සම්බන්ධ වීමයි. 'මැලිනොවුස්කි' විසින් මෙය 'ස්ථානීය සන්දර්භය' *(Context of situation)* ලෙස හඳුන්වනු ලබන අතර කිසයම් වාගාලාපයක් භාවිත කෙරෙන අවස්ථාව හෝ පරිසරය එමගින් අර්ථකථනය කෙරෙයි. එසේ ම මෙහි වඩාත් ගැඹුරු සහ පෘථුල ප්‍රවේශය 'සංස්කෘතික සන්දර්භය' *(Context of culture)* ලෙස මැලිනොවුස්කි පැහැදිලි කරයි' (Halliday, and Hassan, 1985, 5-8.). කිසියම් ස්ථානයකට, අවස්ථාවකට, සන්දර්භයකට උචිත පරිදි හෝ අවශ්‍ය පරිදි භාෂාව භාවිත කිරීම ප්‍රාස්තාවික මගින් සිදුවෙන අතර එය වාක්කෝෂීය විවිධත්වය ඇතුළු භාෂාවක විවිධත්වය සඳහා සෘජු ව ම බලපායි.

'හැලිඩේට' අනුව උපභාෂවක විශේෂත්වය ප්‍රදේශීය වශයෙන් හෝ සමාජ වශයෙන් පවතින වෙනස සහ විවිධත්වයයි. නමුත් ප්‍රාස්තාවික කෘත්‍යමය වෙනස්කම්වලින් යුක්ත වෙයි. හැලිඩේ විග්‍රහ කරන පරිදි භාෂාවේ ප්‍රායෝගික භාවිතය, සන්නිවේදකගේ මානසික ක්‍රියාවලිය සහ කරනු ලබන බලපෑම හෙවත් කිසියම් භාෂකයෙකු හෝ ලේඛකයෙකු භාෂාව භාවිත කරන ආකාරයෙහි ස්වභාවය භාෂාවේ කෘත්‍යයයි. මෙහි දී භාෂාව භාවිත කරනු ලබන්නා අනුව සිදුවෙන විවිධතා හෝ වෙනස්කම් උපභාෂා යටතේත්, භාවිතය අනුව භාෂාවේ බිහිවෙන විවිධතා හෝ වෙනස්කම් 'ප්‍රාස්තාවික' යටතේත් සමාජවාග්විද්‍යාව මගින් අධ්‍යයනය කෙරෙයි (Halliday, and Hassan, 1985, 41). මේ අනුව සමාජ උපභාෂාවක් තුළ විවිධ ප්‍රාස්තාවික පැවතිය හැකි අතර එක් එක් කාර්යය සහ අවස්ථාව සමඟ සමීප ව මෙන් ම නිශ්චිත ව සම්බන්ධ වන භාෂා ස්වරූප ප්‍රාස්තාවික යටතට අන්තර්ගත කිරීම තාර්කික වෙයි.

නවවැනි සහ දහවැනි සියවස්වලට අයත් බොහෝ ශිලාලේඛන ආකෘතික විවිධතා සහිත ව විවිධ අරමුණු සාක්ෂාත්කරණයෙහිලා ලේඛනගත ව ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකි ය. මේ අනුව විශේෂයෙන් ප්‍රස්තුත කාලයේ ශිලාලේඛනගත වාක්කෝෂයේ බහුතර වචන නිශ්චිත සන්දර්භයක භාවිත කරන ලද ප්‍රාස්තාවික ලෙස නිර්ණය කිරීම සමාජ වාග්විද්‍යාවට අනුව තාර්කික වෙයි. එසේ වුව ද ශිලාලේඛන මාධ්‍යයේ 'සන්නිවේදක' සහ 'ග්‍රාහක' යන දෙඅංශය පැහැදිලි ව ම විවිධ සමාජ-සංස්කෘතික ස්තර නියෝජනය කෙරෙන අතර තත් ස්තරාබද්ධ සාධක විසින් භාෂාවේ විවිධත්ව බිහිකිරීමට සමත් වී ඇති ආකාරය පැහැදිලි ය. එබැවින් ප්‍රස්තුත යුගයේ ශිලාලේඛනගත වාක්කෝෂය, වාගාලාප මෙන් ම වාක්‍ය ස්වරූප සමාජ-සංස්කෘතික සන්දර්භ මත මූලික ධාරාද්වයක් යටතේ පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ හැකි ය.

- දේශපාලන-ආර්ථික සන්දර්භගත ප්‍රාස්තාවික.
- සමාජ-සංස්කෘතික සන්දර්භගත ප්‍රාස්තාවික.

දේශපාලන, ආර්ථික ක්ෂේත්‍රාබද්ධ සන්දර්භ සමඟ සම්බන්ධ විවිධ සමාජ සංස්ථා, වෘත්තීන් සහ කණ්ඩායම් දේශපාලන-ආර්ථික සන්දර්භගත ප්‍රාස්තාවික ලෙස වර්ගීකරණය කළ හැකි ය. නවවැනි සහ දහවැනි සියවස්වලට අයත් ශිලා ලේඛනකරණයෙහි අරමුණු මෙන් ම අන්තර්ගතය ද තත්කාලීන දේශපාලන-ආර්ථික සන්දර්භ සමඟ අත්‍යන්තාබද්ධ වෙයි. එනිසා ම මෙම ලේඛනවල වාක්කෝෂය මෙන් වාක්‍ය ප්‍රස්තරය ද තදනුබද්ධ විශේෂතාවලින් සමන්විත ආකාරය නිරීක්ෂණය කළ හැකි ය.

| | |
|---|---|
| ඔකාවස් | කසුබ් |
| කැතකුලකොත් | කිතග්බො |
| කිලිග්අග්බොයිම් | බුදදස් |
| සිරිසග්බොය් | ඔල්කැමි |
| පිරිවහනුවා | වැරි |
| රජන (වික්‍රමසිංහ, 1912, 9-24, 75, 185) | |
| දෙරුවන් | පිටස්සමුන් |
| පෙරෙලැක්කන් | මන්ගිව |
| මාඩබි | මෙලාට්සි |
| මේපිරිවහන්නා | යහන්ගොමු |
| රද්දොල්කැමි | වැස්සන් |
| වෙල්කැමියන් | වෙල්බැඳියන් |
| වෙල්වාස්සන් (රණවැල්ල, 2001, xxxiii.) | |

ප්‍රස්තුත කාලයට අයත් ශිලාලේඛන කිහිපයකින් උද්ධරණය කළ යථෝක්ත නිදර්ශන විසින් දේශපාලන සන්දර්භයත් භාෂාවත් අතර ඓන්ද්‍රිය සම්බන්ධතාව පැහැදිලි වෙයි. වාචික සහ ලිඛිත සන්නිවේදනවල ප්‍රකරණාබද්ධ ඉහත සෑම වචනයක ම භාවිතය මෙන් ම නිරුක්තිය සහ විකාසනය ද දේශපාලන සන්දර්භ සමඟ අත්‍යන්තාබද්ධ බව නිරීක්ෂණය කළ හැකි ය. එනිසා ම මෙහි සඳහන් ඇතැම් වචනයක අර්ථය පැහැදිලි ව ම නිර්ණය කිරීම සඳහා තදනුබද්ධ දේශපාලන සන්දර්භය අත්‍යවශ්‍ය සාධකයක් වෙයි. ඇතැම් වචන වර්තමානය වන විට පොදු ව්‍යවහාරයෙහි ප්‍රචලිත වී ඇති බැවින් ඊට අදාළ ප්‍රාස්තාවික බද්ධතාවෙහි තීව්‍රතර භාවය ගිලිහී ගිය ද ක්‍රිස්තු වර්ෂ නවවැනි සහ දහවැනි සියවස්වල භාෂක

 © 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සමාජය තත් අන්‍යෝන්‍යාබද්ධතාව විශේෂාවධානයට ලක්කර ඇති බව නොඅනුමානයි. මේ අතර ඔල්කැමි, පිරිවහනුවා, වැරි, පිටස්සමුන්, පෙරෙලැක්කන්, මන්ගිව, මාඩබි, මෙලාට්සි, මේපිරිවහන්නා, යහන්ගොමු, රද්දොල්කැමි, වෙල්කැමියන්, වෙල්බැඳියන් සහ වෙල්වාස්සන් වැනි වචන දේශපාලන සන්දර්භ සමඟ අවියෝජනීයාබද්ධ අකාරය මනාව නිරීක්ෂණය වෙන අතර තදර්ථ සුපැහැදිලි ව නිර්ණය සඳහා දේශපාලනාබද්ධ ප්‍රස්තාව ද අත්‍යවශ්‍ය සාධකයක් වෙයි.

පරිපාලන සහ නෛතික ක්ෂේත්‍රවලට අදාළ ශිලාලේඛනගත පහත සඳහන් වචන නිරීක්ෂණය කිරීමෙන් ඒ ඒ වචනවල දේශපාලන සන්දර්භයත් වාගාර්ථත් අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාව පැහැදිලි කරගත හැකි ය.

| | |
|---|---|
| අසම්පඩි | දඩනායක |
| අණ | අයතිය |
| කැරැපාට්ටපාළින් | කිබිගම් |
| කුඩුපසක්කැමි | ගැත්තන් |
| සබවැවස්ථා (පරණවිතාන,1933,10-177) | |
| අකිරිලෙයා | ඇලෙයා |
| උයන්කැමි | උයන්ගොව් |
| විනිස | දෙරුවන් |
| (රණවැල්ල, 2001, xxxiii-180) | |
| ඔල්කැමි | නියම්ජෙටු |
| පසක්කැමියා | සුත්වත් |
| ඇප | එක්තැන්සමියෙන් |
| ගොලිග්ගමුරක්ස | තිරැකොට් |
| රජ්කොල් | වැවස්ථා |
| සම්දරුවන් (වික්‍රමසිංහ,1912,7-177) | |

අසම්පඩි, දඩනායක, කැරැපාට්ටපාළින්, කුඩුපසක්කැමි, ගැත්තන්, අකිරිලෙයා, ඇලෙයා, ඔල්කැමි, නියම්ජෙටු, පසක්කැමියා යන වචන නීති හෝ පරිපාලන ක්ෂේත්‍රාබද්ධ සිදුවීම් සහ අවස්ථා සමඟ වඩාත් සමීප බව නිර්ණය කළ හැකි ය. දඩනායක, නියම්ජෙටු, පසක්කැමියා ආදි වශයෙන් භාවිත තනතුරු/වෘත්තීය නාම ස්ත්‍රියක හෝ පුරුෂයෙකු හැඳින්වෙන පුද්ගල නාම නොවන අතර කිසියම් නිශ්චිත ප්‍රස්තාවක දී පමණක් භාවිත කෙරෙන ව්‍යවහාර හෙවත් ප්‍රාස්තාවික ස්වරූප ලෙස හඳුනාගත හැකි ය. යථෝක්ත වචන ද සහිත පහත සඳහන් වාක්‍ය ඛණ්ඩ සියුම් ව නිරීක්ෂණය කිරීමෙන් දේශපාලනාබද්ධ ප්‍රාස්තාවිකවල ස්වරූපය පැහැදිලි වෙයි.

> '...දෙමුළැ බද්වල් වලැ දඬුපත් නොකපනු කොට ඉසා මෙහෙකරුවනට ආකුල නොකරනු ඉසා මෙ ගැම්හි අටදෙනාගේ නවතැන් නොගන්නා ඉසා වත්හිමියන් වහන්සෙ වැඩිය ඇපා රද්දරුවන් වැඩිය පෙරෙ සිරිත් පඬුරු දෙනු...'(පරණවිතාන,1933,77)
>
> '...සිරිබර කැත්කුල කොත් උකාවස් රද් පරපුරෙන් බට් ලක්දිව් පොළොයන පරපුරෙන් හිමි වූ එමෙ කුලෙන් බට් සමදැ ගොත් බිසො රැද්න කුසැ උපැද ඇපා මහයා සිරිවිඳ පිළිවෙළ සෙ රදැ පැමිණ රැදැ කළ සිරිග්බො උදාමහරද්හු තුමා සත්ලැගු දෙවන හවුරුදුයෙහි නිකින්හි සඳ් අව විසෙනිහි සොරබොරහි ආවු හොපිටිගමු පදිය වැපාරයන් කුඩින් වත්හිමියන් වහන්සේ මියුගුණ් මහවෙහෙර වැඩි කලැහිය දවසැ පදිලද් දඩනායකයන් ගැත්තන්... වැවස්ථා ඉක්ම අන්නැයෙන් දඩ ගත්හ...' (පරණවිතාන, 1933, 74-75)

විධික්‍රියා සහිත වාක්‍ය සංස්ථිති භාවිත කිරීම ප්‍රස්තුත යුගයේ ශිලාලේඛන භාෂාවේ සුලභ ලක්ෂණයක් බව නිරීක්ෂණය කළ හැකි අතර එමගින් පළට කෙරෙන්නේ ද දේශපාලන සන්දර්භය සහ භාෂාව අතර අන්තර් සම්බන්ධතාවයි.

> '...මෙ ගැමැ සිටැ රට්දග නොගන්නා ඉසා වැළැතැ වන උල්වාඩු කණක්කරුවන් ගමට් ආකුල නොකරනු...(පරණවිතාන, 1933, 75)
>
> '...දෙමළුන් වරගත් සම්දරු අව අනොදෙනු ඉසා මහ වුටියෙන් නෙරපින් කරවු අණ වියොහා කර යවනු..(පරණවිතාන, 1933, 74-75)
>
> '...කුඩින්ගෙ කැරුණු ආකුලයට් සම්දරුවන් ලැබි ආකුල හරවනු...(පරණවිතාන, 1933, 74-75)

ඉහත වාක්‍ය සංස්ථිතිවලට අමතර ව ශිලා ලේඛනවලට ම ආවේණික වාක්‍ය සංස්ථිතියක් ලෙස විද්‍යමාන පහත සඳහන් රටාව ද දේශපාලන සන්දර්භය කරණ කොටගත් ප්‍රාස්තාවික ස්වරූපයක් ලෙස තර්ක කළ හැකි ය.

> ...අප මෙයිතුවාක් දෙනා විසින් මෙ වැවස්ථා තබනු ලදි...
>
> (වික්‍රමසිංහ, 1912, 32)
>
> ...සම්දරුවන් විසින් පැරැහැර් දී මේ අත්තාණි කණු හින්ද්වනු ලදි...
>
> (රණවැල්ල,2001, 278)
>
> ...සම්දරුවන් විසින් මෙ වැවස්ථා කරනු ලදි...'
>
> (වික්‍රමසිංහ, 1912, 246)

ඕනෑ ම රටක හෝ ප්‍රදේශයක දීර්ඝ කාලීන ව මෙන් ම කෙටිකාලීන ව පවතින ආර්ථික තත්ත්ව සහ ස්වභාව තත් භාෂක සමාජයට ඍජු ව ම බලපාන ආකාරය සමාජවාග්විද්‍යාවේ දී අවධානයට ලක්වෙයි. ඒ අනුව ආර්ථික විචල්‍යතා මෙන් ම විවිධතා විසින් භාෂක සමාජයේ කායික- මානසික ආචරණ වෙනස් කෙරෙන ආකාරයත්, එහි ම ප්‍රතිඵලයක් වශයෙන් භාෂාවේ ද විවිධතා බිහිකෙරෙන ආකාරයත් මෙමගින් හඳුනාගත හැකි ය. ප්‍රභූ-නිර්ප්‍රභූ, ධනවත්-නිර්ධන, උගත්-නූගත් ආදී සමාජ-සංස්කෘතික පාන්තිකකරණයේ ප්‍රධාන පදනම ආර්ථිකය වන අතර මෙසේ විභජනය වූ විවිධ සමාජ පන්ති ක්‍රිස්තු වර්ෂ නවවැනි සහ දහවැනි සියවස්වල ද පැවති ආකාරය ප්‍රස්තුත ශිලාලේඛනවලින් පමණක් වුව ද අනාවරණය කරගත හැකි ය. පුරාණයේ සිට ම ලාංකේයයන්ගේ ජීවනෝපාය සහ ප්‍රධාන ආදයම් මාර්ගය වශයෙන් කෘෂිකර්මාන්තය සහ වෙළඳාම ප්‍රචලිත ව පැවති ආකාරය නිරීක්ෂණය වෙයි. මේ අතර ජනජීවිතය සමඟ අත්‍යන්තාබද්ධ සංස්කෘතික උරුමයක් ලෙස ද කෘෂිකර්මාන්තයට හිමිව ඇත්තේ සුවිශේෂස්ථානයකි. මෙනිසා ම කෘෂිකර්මාන්තය


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සමඟ බැඳුණු උපභාෂාවක් මෙන් ම ප්‍රාස්තාවික නිර්මාණය වූ ආකාරය නිරීක්ෂණය කළ හැකි ය.

| | |
|---|---|
| අකලහස | අඩක්කලම් |
| අවියකිනිය | අස්සම් |
| ඉඩම්බත් | උන්දි |
| කීණ (පරණවිතාන-EZ, III, V, 1933, 27-155) | |
| උයන්වැජැරුම් | කටුසර |
| කෙතපල | පිවෙල් |
| (රණවැල්ල-IC, V, Part-I, 2001, xxxiii-180) | |
| අමුණ | ආකැම් |
| කැබලි | කෙත්කම් |
| කෙත්වතු | ගොවිකම් |
| තිසැදියෙහි (වික්‍රමසිංහ-EZ,I, 1912, 7-73) | |

කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ශිල්ප වචන ලෙස නිරීක්ෂණය කළ හැකි යථෝක්ත නිදර්ශන තත් සන්දර්භය සමඟ අත්‍යන්තාබද්ධ වෙයි. අකලහස, අඩක්කලම්, අවියකිනිය, අස්සම්, ඉඩම්බත්, කටුසර, කෙතපල වැනි යෙදුම්වල අර්ථ මනාව ගැළපීම සඳහා කෘෂිකර්මාන්තයට අදාළ ඒ ඒ සන්දර්භ සලකා බැලීම අත්‍යවශ්‍ය වෙයි.

සංස්කෘතිය යනු සමාජයක අනන්‍යතා සාධකයකි. එනිසා ම එක් සමාජයක් තවත් සමාජයකින් වෙනස් කෙරෙන ප්‍රමුඛ සාධකයක් ලෙස ද සංස්කෘතියට හිමිවෙන්නේ විශේෂත්වයකි. භාෂාව සංස්කෘතියේ අනුෂංගයකි. ආගම්, දර්ශන, විශ්වාස, අභිචාර, ජනශ්‍රැති, චාරිත්‍ර-වාරිත්‍ර, පුරුෂාර්ථ, ප්‍රතිමාණ, ප්‍රාර්ථනා, ආහාරපාන, ඇඳුම්පැලඳුම් සහ ඇතැම් මානවකෘති නිෂ්පාදන ආදිය සංස්කෘතියක අවශේෂානුෂංග අතරට අයත් වෙයි. සමාජවාග්විද්‍යාව මගින් යථෝක්ත සංස්කෘතිය සමඟ භාෂාව සම්බන්ධ ව වන ආකාරය මෙන් ම විවිධ සමාජ-සංස්කෘතික සන්දර්භවල භාෂාව භාවිත කෙරෙන ආකාරය පර්යේෂණය කෙරෙයි (Ahmad Faizin,2009,69). සමාජ-සංස්කෘතික සන්දර්භ පදනම් වී භාෂා භාවිතයෙහි විශේෂතා පැවති ආකාරය ක්‍රිස්තු වර්ෂ නවවැනි සහ දහවැනි සියවස්වල ශිලා ලේඛනවලින් ද නිරීක්ෂණය කළ හැකි ය. ක්‍රිස්තු පූර්ව තෙවැනි සියවසේ සිට දීර්ඝ කාලයක් තුළ සිදු වූ බෞද්ධාගමික සහ සංස්කෘතික බලපෑම මේ සඳහා ප්‍රබලව හේතු වී ඇත. ඒ අනුව ඒ ඒ ආගමික සිදුවීම් මෙන් ම අවස්ථාවලට ආවේණික වාක්කෝෂ, වාගාලාප මෙන් ම වාක්‍ය සංස්ථිති ද භාවිත කර ඇති ආකාරය නිරීක්ෂණය වෙයි.

| | |
|---|---|
| කරඩිලෙයා | කරඩුඅස්සමු |
| කැබැලි | කියනහිමියන් |
| කුම්බල් | ගණජෙටු |
| ගැල්ලන් | දම්නට් |
| දායක | නකාබලනහිමි |
| නැකැති | බත්ගෙලැදියන් |
| නියම්ජෙටු | පසක්කැම් |
| පහාවැසි | පිසනසලයන් |
| පිළිවරට් (රණවැල්ල-IC, V, Part-I" 2001, 41,75) | |
| දාගෙයි | දායක |
| දුහැට්කිස | ධම් |
| ධමුරුවන් | නකය |
| දාගෙයි | දායක |
| දුහැට්කිස | පරිදෙව |
| පරියායෙන් | පසක්දී |
| පාමොක් | පිණ්ඩ |
| පිරිකපා | පිරිත් |
| පිරිවහනුවා | පිළිබඳුන් |
| පිළිමගෙයි | පුජ |
| පොහො | ලෝකනාත්වර |
| වජාරත් | වත්හිමි |
| වත | වනවළාකියන |
| වසවසික | වළන්දත් (වික්‍රමසිංහ-EZ,I, 1912, 31-75) |

නවවැනි සහ දහවැනි සියවස්වල සුලභ ව ව්‍යාප්ත වූ අත්තාණි ප්‍රදානවල සුවිශේෂ ප්‍රාස්තාවික ස්වරූප දෙවර්ගයක් නිරීක්ෂණය වෙයි.

> ස්වස්ති ශ්‍රී අබය් සලමෙවන් මපුර්මුකා පළමුවැන්නේ...

> ස්වස්ති ශ්‍රී අබය් සලමෙවන් උන්දුවැ පෑ අව...

> සම්දරුවන් විසින් පැරැහැර් දී මේ අත්තාණි කණු හින්ද්වනු ලදි සිද්ධි...

(රණවැල්ල-IC, V, Part-I, 2001, 107-278)

ඉන්දීය අශෝක ශිලා ලේඛනාභාසය ද කරණ කොටගෙන ක්‍රිස්තු පූර්ව යුගයේ සිට ලාංකේය ශිලා ලේඛනවල සුලභව භාවිත 'සිද්ධි, සිද්ධම්, සිධ' වැනි ආශිර්වාදාත්මක යෙදුම්වල දීර්ඝකරණයක් ලෙස ඉහත සඳහන් වාක්‍යවල යෙදී ඇති 'ස්වස්ති ශ්‍රී' සහ 'සිද්ධි' වැනි ප්‍රාස්තාවික ස්වරූප නිරීක්ෂණය කළ හැකි ය. යථෝක්ත වචන හෝ යෙදුම් සංස්කෘතිකාබද්ධ සන්දර්භවල භාවිත කිරීම සඳහා තත්කාලීන භාෂක සමාජ ද පුරුදුව සිටි ආකාරය මෙමගින් අනාවරණය වෙන අතර එනිසා ම 'ශුභ හෝ ඉෂ්ටාර්ථ' ප්‍රාර්ථනා සහිත අවස්ථාවක දී භාවිත කෙරෙන තත් සන්දර්භානන්‍ය ප්‍රාස්තාවික ස්වරූප ලෙස මෙම යෙදුම් අවධානයට ලක්කළ හැකි ය. ඉෂ්ටාර්ථයේ මෙන් ම අනිෂ්ටාර්ථයේ භාවිත ප්‍රාස්තාවික ස්වරූප රාශියක් ප්‍රස්තුත කාලයේ ශිලා ලේඛනවලින් නිරීක්ෂණය කළ හැකි ය.

> ...උලඟනා කළ කෙනෙකුන් නොපැටවූ රද්දරු කෙනෙක් ඇත කවුඩු බලු වෙත්වා... (රණවැල්ල-IC, V, Part-I, 2001, 107-278)

> ...කුම්බුරට් අවුල් කළ කෙනෙක් බුදෙනා බත් නොලැබෙත් පෙර දන්මයෙ බලුකවුඩු වෙත්වයි... (පරණවිතාන-EZ, III, V, 1933, 27-155)

> ...මෙ අත්තාණි පැරහැර් දුන්මගයි මෙ උල්ලගනා කළ බලුකවුඩු වෙත්වයි... (රණවැල්ල-IC, V, Part-I, 2001, 107-278)

> '...මහවොටියෙ ළ මරුවා කළ පා කම් ගතාහ... (පරණවිතාන-EZ, III, V, 1933"27-155)


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

...මෙ අන්නැ උලගනා කළ කෙනෙක් ඇත කොට් වරද කළ කෙනෙකුන් කවුඩු බලු (වික්‍රමසිංහ-EZ, I, 1912, 31-75)

## නිගමනය

සමාජයක් යනු භෞතික සහ අභෞතිකාංගවල අති සංකීර්ණ සංස්ථිතියකි. සාමාජිකයන්ගේ ආධ්‍යාත්මික සහ බාහිර ආචරණ යථෝක්ත සංකීර්ණ සමාජ සංස්ථිතියෙහි ප්‍රමුඛ නියෝජනයක් වන අතර එය භාෂා විකාසනයේ බලපෑම්කාරක සාධකයක් වන ආකාරය ද මෙම පර්යේෂණය මගින් මනාව හඳුනාගත හැකි ය. එක් එක් සමාජ-සාමාජිකයා විසින් කෙරෙන බලපෑම මෙන්ම විවිධ සහලක්ෂණවලින් අනන්‍ය සම-විෂම සමාජ-සංස්කෘතික කණ්ඩායම් විසින් කෙරෙන බලපෑම ද ඕනෑම භාෂාවක විවිධතා හෝ විකාසනය සඳහා හේතු කාරක වන ආකාරය ප්‍රස්තුත කාලයට අයත් ශිලා ලේඛනවලින් මනාව පැහැදිලි වෙයි. මෙම කාලයෙහි සිංහල භාෂාවේ සෑම අනුප්‍රස්තරයක් ම කිසියම් සමාජ-සංස්කෘතිකාදී විචල්‍යවල බලපෑමට ලක්ව ඇති ආකාරය නිරීක්ෂණය වන අතර එහි දී ලාංකේය ඉතිහාසයෙහි බොහෝ සමාජ-සංස්කෘතික සහ දේශපාලන-ආර්ථික සංචලන වෙනුවෙන් සෘජු ව ම සම්බන්ධතා දක්වා ඇති හෝ බලපෑ ඉන්ද්‍රිය සමාජ-සංස්කෘතිකා දී සාධක ද ඉස්මතු ව හඳුනාගත හැකි ය. ඒ අනුව ඒ ඒ සමාජ-සංස්කෘතික සහ දේශපාලන-ආර්ථික සන්දර්භ විසින් සිංහල භාෂානුප්‍රස්තරවල පරිණාමය හෝ විකාසනය සඳහා සෘජු ව ම බලපා ඇති ආකාරයත් එනිසා ම භාෂා විවිධතා බිහි කිරීමේ ප්‍රමුඛ සාධකයක් වී ඇති ආකාරයත් තදනුබද්ධ ප්‍රාස්තාවික ස්වරූප මගින් සනාථ කරගත හැකි ය. ක්‍රිස්තු වර්ෂ නවවැනි සහ දහවැනි සියවස් වන විටත් ඒ ඒ ප්‍රස්තාවට උචිත පරිදි වෙන ම සන්නිවේදනාර්ථ සහිත වචන භාවිතය සඳහා සිංහල වාක්කෝෂය පෝෂණය වී පැවති බවත්, එනිසා ම භාෂාවේ විවිධත්ව පළ වී ඇති බවත් මෙමගින් සනාථ වෙයි.

## පරිශීලිත මූලාශ්‍රය


අමරවංශ කොත්මලේ, 2017, **ලක්දිව සෙල්ලිපි**, කොළඹ, එස්. ගොඩගේ ප්‍රකාශන.

කරුණාතිලක, ඩබ්. එස්., 2006, **ඓතිහාසික වාග්විද්‍යා ප්‍රවේශය**, කොළඹ, එස්. ගොඩගේ ප්‍රකාශන.

කුලතුංග ටී. ජී., 2005, **අභිලේඛන ශාප පාඨ**, කර්තෘ ප්‍රකාශන.

ගමගේ ගුණසේන, 2019, **පැරණි හා මධ්‍ය කාලීන ශ්‍රී ලංකාවේ නීතිය හා අධිකරණ ක්‍රම**, සරස්වතී ප්‍රකාශන.

ගුණතිලක, ඇම්. එච්., **භාෂාවක විකාශය සහ වෙස්සගිරි පුවරු ලිපිය**, ඇපොරිතිකරිස් ප්‍රකාශන.

ජයසේකර, ආනන්ද සහ ජයසේකර, චිත්‍රා, 2000, **තුලනාත්මක වාග්විද්‍යාව,** කොළඹ, එස්. ගොඩගේ ප්‍රකාශන.

තෙන්නකෝන්, විමලානන්ද, 1957, **පැරණි ලංකාව හා ශිලාලිපි**, කොළඹ, එම්. ඩී. ගුණසේන ප්‍රකාශන.

ධර්මදාස, කේ. එන්. ඕ., 2009, **භාෂාවේ සම්භවය හා සංස්කෘතික මුහුණුවර**, එස්. ගොඩගේ ප්‍රකාශන,.

බණ්ඩා කිත්සිරි මිහිර, 2021, ශිලාලේඛනගත කෘෂිවාක්කෝශය පිළිබඳ සමාජවාග්විද්‍යාත්මක අධ්‍යයනයක්,

බලගල්ලේ, විමල් ජී., (පරි), 2001, **සිංහලයේ වාග්විද්‍යාත්මක ස්වරූපය**-විල්හෙල්ම් ගයිගර්, විසිඳුණු ප්‍රකාශන,.

විජේසේකර, නන්දදේව, 1990, (සංස්), **අභිලේඛන, දෙවන වෙළුම,** පුරාවිද්‍යා දෙපාර්තමේනතුව.

Halliday, MAK., and Hassan Rugaiya, 1985, **Language, Context and Text; Aspects of Language in Social Semiotic Perspective**, Deaking Univ.Press.

Labov William, 1972, **Sociolinguistic Patterns,** University of Pennsylvania Press.

Lakoff R., 1975, **Language and Woman's Place,** Happer and Row, Newyork.

Paranavitana, S. 1933, (Ed.), **Epigraphia Zeylanica**, **V0l-III,** London, Oxford University Press.

Paranavitana, S., 1943, **Epigraphia Zeylanica**, **V0l-IV**, London, Oxford University Press.

Paranavitana, S. & Godakumbura, C. E 1963, (Ed.), **Epigraphia Zeylanica, V0l-V, Part-I**, Sri Lanka, Archaeological Survey Department.

Paranavitana S. & Godakumbura, C. E 1963, (Ed.), **Epigraphia Zeylanica, V0l-V, Part-II**, Sri Lanka, Archaeological Survey Department.

Ranawella, G. S., 2001, **Inscriptions of Ceylon, Vol-V, Part-I**, Sri Lanka, Department of Archaeological.

Ranawella, G. S., 2004, **Inscriptions of Ceylon, Vol-V, Part-II**, Sri Lanka, Department of Archaeological.

Ranawella, G. S., 2005, **Inscriptions of Ceylon, Vol-V, Part-III**, Sri Lanka, Department of Archaeological.



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

Wickremasinghe, Don Martino De Zilva, 1912, **Epigraphia Zeylanica, V0l-I,** Oxford University London, Press.

Wickremasinghe, Don Martino De Zilva, 1928, **Epigraphia Zeylanica, V0l-II**, London, Oxford University Press.

Ahmad Faizin, 2020, **Sociolinguistics in Language teaching**. www.htp//mabasan.kemdikbud.go.id/index.php., Accessed on 2022-03-20.



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
# දහතුන්වන කලාපය - 2022 ජූනි


ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය අලි මිනිස් ගැටුම නිර්මාණය වීම සඳහා බලපානු ලබන ආකාරය හඳුනා ගැනීම (හම්බන්තොට දිස්ත්‍රික්කය ඇසුරෙන්) 1-10
**කේ. ඒ. දිනිති ප්‍රතිභා කලුආරච්චි**

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වන සමෘද්ධි ව්‍යාපාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් : ගාල්ල දිස්ත්‍රික්කයේ නෙළුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින් 11-22
**චාමර මධුෂාන්**

සිංහල නවකතාවෙහි නිරූපිත සාංදෘෂ්ටිකවාදී ලක්ෂණ : තෝරාගත් සිංහල නවකතා ඇසුරින් කෙරෙන විමර්ශනයකි 23-31
**කේ.වී. දිනිති දිල්හාරා කරඳන සහ චම්පා එස්. ද සිල්වා**

විවෘත භූමියට ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා ඇති වී තිබෙන සමාජීය, පාරිසරික බලපෑම සහ විවෘත කසළ භූමියක යෝග්‍යතාව තක්සේරුව : මහනුවර ගොහාගොඩ තේක්ක වත්ත කසළ කන්ද ඇසුරින් 32-54
**එච්. එම්. එන්. අයි. සඳරුවන්**

බදුලු ටැම් ලිපිය ඔස්සේ හෙළි වන අතීත වෙළෙඳ පොළ ඇතුළු සමාජ ක්‍රමය පිළිබඳ විමසුමක් 55-66
**ඉන්දික ජයරත්න**

සිංහල ශිලාලේඛනවල අන්තර්ගත ප්‍රාස්තාවික භාෂා ස්වරූප පිළිබඳ සමාජවාග්විද්‍යාත්මක අධ්‍යයනයක් 67-74
**කිත්සිරි මිහිරි බණ්ඩාර**



ISSN 1800-1459
eISSN 2673-1177